328 වන කාණ්ඩය - 12 වන කලාපය
தொகுதி 328 - இல. 12
Volume 328 - No. 12

2026 අගෝස්තු 07වන සිකුරාදා
2026 ஓகஸ்ட் 07, வெள்ளிக்கிழமை
Friday, 07th August, 2026

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**නිවේදන:**

ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් [තීරුව 2069]

**ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා** [තීරුව 2071]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 2074-2120]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**

ජීවන වියදම සහ උද්ධමනය ජනතාව කෙරෙහි බලපාන ආකාරය [තීරුව 2121]

යුද සමයේ උතුරු සහ නැඟෙනහිර සිදු වූ අතුරුදහන්වීම් සහ ඝාතන පිළිබඳ විමර්ශනවල ප්‍රගතිය [තීරුව 2133]

**කොළඹ වරාය නගරයට ලැබුණු ආයෝජන සහ රැකියා උත්පාදනය:**

මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 2140]

**රැකියා වීසා හා විදේශ රැකියා ලබා දීමේදී සිදුවන වංචා:**

මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 2146]

**වරප්‍රසාද:**

පාර්ලිමේන්තුවට පැමිණීමට ගරු චමින්ද විජේසිරි මහතා කළ ඉල්ලීම පිළිබඳ කටයුතු නොකිරීම [තීරුව 2151]

**අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත:**

පළමුවන වර කියවන ලදී [තීරුව 2154]

**පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා:**

කිරි නිෂ්පාදන අංශයෙන් ස්වයංපෝෂිත්වය ප්‍රවර්ධනය කිරීම [තීරු 2155-2166]

කඩොලාන පරිසර පද්ධතිය ආරක්ෂා කර ගැනීමට වැඩසටහනක් සකස් කිරීම [තීරු 2167-2179]

රසායන ද්‍රව්‍ය යොදා පලතුරු ඉදවීම නතර කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම [තීරු 2179-2194]

ශ්‍රී ලංකාවේ වන සතුන් කළමනාකරණය කිරීම සඳහා ජාතික ප්‍රතිපත්තියක් සහ ක්‍රමවේදයක් සකස් කිරීම [තීරු 2194-2206]

මඩකලපුව සිට පොතුවිල් දක්වා දුම්රිය මාර්ගය පුළුල් කිරීම හෝ මාතර සිට කල්මුණේ දක්වා දුම්රිය මාර්ගය පුළුල් කිරීම [තීරු 2206-2220]

කොරෝනා වසංගතය පැවති කාලය තුළ, ඒකපාර්ශ්විකව සහ බලහත්කාරයෙන් මුස්ලිම් ජනතාවගේ මෘතදේහ ආදාහනය කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා කොමිෂන් සභාවක් පිහිටුවීම [තීරු 2221-2235]

සංවර්ධනයේ කලාපීය විෂමතා අවම කිරීම සඳහා වෙන් වූ විශේෂ සංවර්ධන අරමුදලක් පිහිටුවීම [තීරු 2236-2249]

**කල්තැබීමේ ප්‍රශ්න** [තීරු 2250-2258]


---

# பிரதான உள்ளடக்கம்


**அறிவிப்புகள்:**

இலங்கை ஊடக உயர்தொழிலர்களின் பட்டயம்பெற்ற நிறுவகம் சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனு [ப: 2069]

**துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்** [ப: 2071]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 2074-2120]

**தனி அறிவித்தல் மூல வினா:**

வாழ்க்கைச் செலவு மற்றும் பணவீக்கம் மக்கள்மீது செலுத்தும் தாக்கம் [ப: 2121]

யுத்தத்தின்போது வடக்கு மற்றும் கிழக்கில் காணாமல் போனோர் மற்றும் கொலைகள் குறித்த விசாரணைகளின் முன்னேற்றம் [ப: 2133]

**கொழும்பு துறைமுக நகரத்தில் பெறப்பட்ட முதலீடும் உருவாக்கப்பட்ட வேலைவாய்ப்புகளும்:**

நிதி, திட்டமிடல் பிரதி அமைச்சரினது கூற்று [ப: 2140]

**வேலை விசா மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புகள் வழங்கலில் இடம்பெறும் மோசடிகள்:**

பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரினது கூற்று [ப: 2146]

**சிறப்புரிமை:**

பாராளுமன்றத்துக்குச் சமுகமளிப்பது தொடர்பான மாண்புமிகு சமிந்த விஜேசிறியினது கோரிக்கைக்கு நடவடிக்கை எடுக்காமை [ப: 2151]

**ஏற்றுமதிக் கமத்தொழில் ஊக்குவிப்பு (திருத்தம்) சட்டமூலம்:**

முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 2154]

**தனி நபர் பிரேரணைகள்:**

பால் உற்பத்தியில் தன்னிறைவினை ஊக்குவித்தல் [ப: 2155-2166]

கண்டல் தாவர சூழல்தொகுதியைப் பாதுகாப்பதற்கான வேலைத்திட்டமொன்றைத் தயாரித்தல் [ப: 2167-2179]

இரசாயனத் திரவியங்களைப் பயன்படுத்தி பழங்களைப் பழுக்க வைப்பதைத் தடுப்பதற்கான வழிமுறையொன்றைத் தயாரித்தல் [ப: 2179-2194]

இலங்கையில் வன விலங்குகளை முகாமைத்துவம் செய்வதற்குத் தேசியக் கொள்கையொன்றையும் செயன்முறையொன்றையும் வகுத்தல் [ப: 2194-2206]

மட்டக்களப்பிலிருந்து பொத்துவில் வரை புகையிரதப் பாதையை விஸ்தரித்தல் அல்லது மாத்தறையிலிருந்து கல்முனை வரை புகையிரதப் பாதையை விஸ்தரித்தல் [ப: 2206-2220]

'கொவிட்-19' பெருந்தொற்று நிலவிய காலப்பகுதியில், ஒருதலைப்பட்சமாகவும் வலுக்கட்டாயமாகவும் முஸ்லிம் மக்களின் ஜனாஸாக்களைத் தகனம் செய்தமை தொடர்பாக விசாரிப்பதற்கு ஆணைக்குழுவொன்றை நியமித்தல் [ப: 2221-2235]

அபிவிருத்தியில் நிலவும் பிராந்திய ஏற்றத்தாழ்வுகளைக் குறைப்பதற்குத் தனியானதொரு விசேட அபிவிருத்தி நிதியத்தைத் தாபித்தல் [ப: 2236-2249]

**ஒத்திவைப்பு வினாக்கள்** [ப: 2250-2258]

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Chartered Institute of Media Professionals of Sri Lanka Bill: Petition to the Supreme Court [Col. 2069]

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS [Col. 2071]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 2074-2120]

QUESTION BY PRIVATE NOTICE:
Effect of Cost of Living and Inflation on the People [Col. 2121]
Progress of Investigations into Disappearances and Killings in North and East during War [Col. 2133]

INVESTMENT RECEIVED AND EMPLOYMENT GENERATED AT COLOMBO PORT CITY:
Statement by Deputy Minister of Finance and Planning [Col. 2140]

FRAUDS INVOLVING ISSUANCE OF JOB VISA AND FOREIGN EMPLOYMENT OPPORTUNITIES:
Statement by Minister of Public Security and Parliamentary Affairs [Col. 2146]

PRIVILEGE:
Non-Facilitation of Hon. Chaminda Wijesiri's Request to Attend Parliament [Col. 2151]

PROMOTION OF EXPORT AGRICULTURE (AMENDMENT) BILL:
Read the First time [Col. 2154]

PRIVATE MEMBERS' MOTIONS:
Promoting Self-Sufficiency in Milk Production [Cols. 2155-2166]
Developing a Programme to Protect the Mangrove Ecosystem [Cols. 2167-2179]
Formulation of a System to Stop the Ripening of Fruits Using Chemicals [Cols. 2179-2194]
Formulation of a National Policy and Methodology for the Wildlife Management in Sri Lanka [Cols. 2194-2206]
Expanding the Railway Line from Batticaloa to Pottuvil or the Railway Line from Matara to Kalmunai [Cols. 2206-2220]
Establishment of a Commission to Investigate the Unilateral and Forced Cremation of the Remains of Deceased Muslims during the Covid-19 Pandemic [Cols. 2221-2235]
Establishment of a Special Development Fund Dedicated to Reduce Regional Disparities in Development [Cols. 2236-2249]

ADJOURNMENT QUESTIONS [Cols. 2250-2258]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

*2026 අගෝස්තු 07වන සිකුරාදා*
*2026 ஓகஸ்ட் 07, வெள்ளிக்கிழமை*
*Friday, 07th August, 2026*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක්
### இலங்கை ஊடக உயர்தொழிலர்களின் பட்டயம்பெற்ற நிறுவகம் சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனு
### CHARTERED INSTITUTE OF MEDIA PROFESSIONALS OF SRI LANKA BILL: PETITION TO THE SUPREME COURT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සමක පිටපත් මා වෙත අද දින ලැබී ඇති බව දන්වනු කැමැත්තෙමි.

## II

### පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
### பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
### MEETING OF THE COMMITTEE ON PARLIAMENTARY BUSINESS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2026 අගෝස්තු 07වන සිකුරාදා, එනම් අද දින, මධ්‍යාහ්න 12.00 ට කාරක සභා කාමර අංක 2හි දී පැවැත්වීමට නියමිත බැවින්, ඊට පැමිණ සහභාගි වන ලෙස ගරු සාමාජික මන්ත්‍රීවරයන් සියලු දෙනාටම මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.



## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මම 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 14 වගන්තිය සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2026 ජූලි 10 දිනැති අංක 2496/38 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රෙගුලාසි ඉදිරිපත් කරමි.

මෙම රෙගුලාසි රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව; සහ

(ii) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119 (4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව.

මෙම වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, 2023 වර්ෂය සඳහා ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

මෙම වාර්තාව සෞඛ්‍ය, ජනමාධ්‍ය සහ කාන්තා සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2023 වර්ෂය සඳහා තල් සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2024 වර්ෂය සඳහා පොල් වගාකිරීමේ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

මෙම වාර්තා පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi - Minister of Buddhasasana, Religious and Cultural Affairs)

ගරු කථානායකතුමනි, 2025 වර්ෂය සඳහා බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஹால் அபேசிங்ஹ)
(The Hon. (Dr.) Nihal Abeysinghe)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය, ජනමාධ්‍ය සහ කාන්තා සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් "රෝගීන්ගේ ආරක්ෂාව සහ යහපැවැත්ම තහවුරු කිරීම සඳහා වන ප්‍රඥප්තිය" සම්බන්ධයෙන් සකස් කරන ලද වාර්තාව මම ඉදිරිපත් කරමි.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஹால் அபேசிங்ஹ)
(The Hon. (Dr.) Nihal Abeysinghe)

ගරු කථානායකතුමනි, මෙම වාර්තාව ඉදිරිපත් කිරීමට සෑහෙන කාලයක් ගත වුණු නිසා මේ පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්න මම ඔබතුමාගෙන් විනාඩි දෙක තුනක කාලයක් ඉල්ලා සිටිනවා.

ඇත්තටම මෙම වාර්තාවෙන් ඉදිරිපත් කර තිබෙන්නේ රෝගීන්ගේ ආරක්ෂාව සහ යහපැවැත්ම තහවුරු කිරීම සඳහා වන ප්‍රඥප්තියයි. මේක අටවැනි පාර්ලිමේන්තුවට ඉදිරිපත් වෙලා, එවකට සෞඛ්‍ය සහ මානව සුබසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් එම කටයුතු ආරම්භ කර තිබුණා. හැබැයි, එම පාර්ලිමේන්තුව විසුරුවා හැරීම නිසා එම කටයුතු කරගෙන යෑමට ඉඩ ලැබී නැහැ. ඊළඟට, නවවැනි පාර්ලිමේන්තුවේදී හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු මයන්ත දිසානායක මහතාගේ සභාපතිත්වයෙන් මෙම කටයුත්ත නැවත ආරම්භ කර හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා, ගරු ගයාෂාන් නවනන්ද මහතා සහ ගරු එම්. රාමේෂ්වරන් මහතා යන අයගෙන් සැදුම්ලත් අනුකාරක සභාවක් පත් කරගෙන තිබුණා. එම අනුකාරක සභාවෙන් තමයි මෙම ප්‍රඥප්තිය සම්පාදනය කර තිබුණේ. එහිදී සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සිටි විශේෂඥයින්ගේ අදහස් විමසා තමයි මෙම කටයුත්ත සිදු කර තිබුණේ. ඒ අනුව සෞඛ්‍ය අමාත්‍යාංශයේ එවකට හිටපු නිලධාරින්, ලෝක සෞඛ්‍ය සංවිධානය, ජාතික ඖෂධ නියාමන අධිකාරිය, ආයුර්වේද වෛද්‍ය සභාව, ශ්‍රී ලංකා වෛද්‍ය සභාව, ශ්‍රී ලංකා වෛද්‍ය විද්‍යාල සභාව, ශ්‍රී ලංකා හෙද සභාව, රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය, රාජ්‍ය සේවා එක්සත් හෙද සංගමය, රජයේ හෙද නිලධාරින්ගේ සංගමය, ශ්‍රී ලංකා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සංගමය, රජයේ සෞඛ්‍ය කළමනාකරණ සහකාර නිලධාරින්ගේ සංගමය, රජයේ ඖෂධවේදීන්ගේ සංගමය, ශ්‍රී ලංකා දියවැඩියා සංගමය, ඉන්දිරා පිළිකා භාරය, දේශෝදය ව්‍යාපාරය, Positive Women's Network ආයතනය, ශ්‍රී ලංකා වෘත්තීය සංගම් සංවිධානය, සෞඛ්‍ය හා පෝෂණ අනුකමිටුව ඇතුළු අංශ රාශියක අදහස් විමසීමකින් තමයි මෙය පිළියෙල කර තිබුණේ. 2024 සැප්තැම්බර් 03වැනි දින එම වාර්තාව පාර්ලිමේන්තුවට පිළිගැන්වූවත්, පාර්ලිමේන්තුව විසුරුවා හැරීම නිසා මේ කටයුත්ත එතැනින් ඉදිරියට ගිහිල්ලා නැහැ.

ඒ නිසා දසවන පාර්ලිමේන්තුවේ සෞඛ්‍ය, ජනමාධ්‍ය සහ කාන්තා සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විධියට අපි, සෞඛ්‍ය සේවා සපයනු ලැබීමේදී කාර්ය මණ්ඩලය වෙත කරනු ලබන බලපෑම් පිළිබඳව සමාලෝචනය කිරීම සඳහා සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත මෙම වාර්තාව ඉදිරිපත් කළා. එමඟින් අපි සෞඛ්‍ය ක්ෂේත්‍රයට සම්බන්ධ විශේෂඥ වෛද්‍යවරුන්ගේ වෘත්තීමය ආයතනවල නිර්දේශ ද ලබාගෙන, ඒ අනුව සකස් කරපු සංශෝධිත ප්‍රඥප්තිය ලෝක සෞඛ්‍ය සංවිධානයේ ශ්‍රී ලංකා කාර්යාලය වෙත නැවත ඉදිරිපත් කළා. ඒ වාගේම ඔවුන්ගේ අදහස් හා යෝජනාත් ලබාගෙන තමයි මෙය ඉදිරිපත් කරන්නේ.

ගරු කථානායකතුමනි, ජාතික ජන බලවේගය ඉදිරිපත් කළ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 2019දීත්, 2024දීත් අපි එකඟ වෙලා තිබුණා, මෙවැනි රෝගීන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියක් රටට ඉදිරිපත් කරන බවට. ඒ වාගේම එය ප්‍රතිපත්තියක් හැටියටත් ඉදිරිපත් කළා. ඒක තමයි මේ සඳහා කරන අපේ මේ කැපවීම.

ගරු කථානායකතුමනි, මට මතක හැටියට 2008 වර්ෂයේ පමණ සිට මේ සාකච්ඡාව සිදු වෙමින් තිබුණා. නමුත්, 2026 වර්ෂයේ දසවන පාර්ලිමේන්තුවේදී තමයි මේ කටයුතු ඉදිරියට අරගෙන යන්නේ. මම සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා, මෙම ප්‍රඥප්තිය පනත් කෙටුම්පතක් ලෙස නීතිගත කරලා නැවත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලෙස. මා හිතනවා, අපේ රටේ ජනතාව වෙනුවෙන් වාගේම, නිදහස් සෞඛ්‍ය සේවය වෙනුවෙන් මේ ප්‍රඥප්තිය ඉතා වැදගත් කියලා.

මොකද, රෝගීන්ට ලැබිය යුතු මූලික අයිතිවාසිකම්, සෞඛ්‍ය සේවා සපයන්නන්ගේ වගකීම් සහ ආරක්ෂිත, ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් ලබා දීම සඳහා අනුගමනය කළ යුතු මූලධර්ම පිළිබඳව මේ ප්‍රඥප්තියේ සඳහන් වනවා. මෙයින් ලැබෙන ප්‍රධාන ප්‍රතිලාභ තමයි, රෝගීන්ගේ ආරක්ෂාව ප්‍රමුඛ කිරීම සහ වෛද්‍ය ප්‍රතිකාරවලදී සිදුවිය හැකි වැරදි, අනතුරු වාගේම වළක්වා ගත හැකි හානි අවම කර ගැනීමට උපකාරී වීම. ඒ වාගේම රෝගීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීමටත් මේ තුළින් හැකියාව ලැබෙනවා. ගෞරවයෙන් සැලකීම, තොරතුරු දැනගැනීම, කැමැත්ත ලබා දීම සහ රහස්‍යභාවය ආරක්ෂා කිරීමත් මේ මඟින් තහවුරු කරනවා. ඒ වාගේම සෞඛ්‍ය සේවාවේ ගුණාත්මකභාවයත් ඉහළ නංවනවා, ආරක්ෂිත සාක්ෂි මත පදනම් වූ රෝගියාගේ මධ්‍යගත ප්‍රතිකාර ප්‍රවර්ධනය කරනවා, වගවීම සහ විනිවිදභාවය වැඩි කරනවා, සෞඛ්‍ය ආයතන සහ සෞඛ්‍ය වෘත්තිකයින් තම වගකීම් පැහැදිලිව ඉටු කිරීමට දිරිගන්වනවා, රෝගීන්ගේ සහභාගිත්වය ප්‍රවර්ධනය කරනවා, ප්‍රතිකාර සම්බන්ධ තීරණ ගැනීමේදී රෝගියා සහ පවුලේ සාමාජිකයින් සක්‍රියව සම්බන්ධ කරනවා. ඒ වාගේම රෝගීන් හා සෞඛ්‍ය සේවා සපයන්නන් අතර විශ්වාසය සහ හවුල්කාරිත්වය ශක්තිමත් කරනවා, ආරක්ෂිත සංස්කෘතියක් ඇති කරනවා, වැරදි වසන් කිරීම වෙනුවට ඒවායෙන් පාඩම් ඉගෙන ගෙන පද්ධතිය දියුණු කිරීමේ සංස්කෘතියක් ඇති කරනවා, පැමිණිලි සහ ප්‍රතිචාර සඳහා ක්‍රමවේදයක් සපයනවා. ඒ වාගේම රෝගීන්ගේ අදහස් හා පැමිණිලි සලකා බැලීමට විධිමත් පද්ධතියක් ද මේ තුළින් අපට සකස් කර ගත හැකියි. සෞඛ්‍ය සේවකයින්ට පැහැදිලි මාර්ගෝපදේශකයක් ද මේ තුළින් සපයනවා. සියලුම කාර්ය මණ්ඩලය එකම ආරක්ෂිත ප්‍රමිතීන් අනුව ක්‍රියා කිරීමට මේ ප්‍රඥප්තිය උපකාරී වනවා. ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ප්‍රවර්ධනය කරනු ලබන රෝගී ආරක්ෂණ මූලධර්ම හා ගැළපෙන සෞඛ්‍ය පද්ධතියක් ගොඩනැඟීමටත් මේ ප්‍රඥප්තිය උපකාරී වනවා.

මෙම ආංශික අධීක්ෂණ කාරක සභාවේ මතය තමයි, රෝගීන්ගේ ආරක්ෂාව සහ යහ පැවැත්ම සඳහා වන ප්‍රඥප්තියක් යනු, හුදෙක් ප්‍රතිපත්ති ලේඛනයක් නොව, සෞඛ්‍ය පද්ධතිය තුළ "රෝගියා ප්‍රථමයෙන්" - patient first - යන මූලධර්මය ක්‍රියාවට නැංවීම සඳහා අත්‍යවශ්‍ය මෙවලමක් වනවා සහ එය රෝගීන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කරන අතර, සෞඛ්‍ය සේවාවේ ගුණාත්මකභාවය, වගවීම සහ මහජන විශ්වාසය ශක්තිමත් කරනවා කියන එක.

බොහොම ස්තුතියි.

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නිහාල් ගලප්පත්ති මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු කථානායකතුමනි, වෙල්පල්ල, ගනන්කැටේ යන ලිපිනයෙහි පදිංචි පී.එම්. ෂෙහානි කෞශල්‍යා මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுவைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petition ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### මාර්ග අංක 193 පුරහල-කඩවත බස් සේවාව: නැවත ආරම්භ කිරීම
### வழித்தட இல. 193 நகர மண்டபம் - கடவத்தை பேருந்துச் சேவை: மீள ஆரம்பித்தல்
### ROUTE NO. 193 PURAHALA-KADAWATHA BUS SERVICE: RECOMMENCEMENT

784/2025

**1. ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මීට වර්ෂ කිහිපයකට පෙර මාර්ග අංක 193 පුරහල සිට කඩවත දක්වා බස් රථ සේවාවක් ක්‍රියාත්මක වූ බවත්;

(ii) මේ වන විට එම බස් රථ සේවාව ක්‍රියාත්මක නොවන බවත්;

එතුමා දන්නේද?

(ආ) මට්ටක්කුලිය ඩිපෝවේ සහ කඩවත ඩිපෝවේ ලංගම බස් රථ එක බැගින් යොදවා එම බස් රථ සේවාව නැවත ආරම්භ කිරීමට ක්‍රියාමාර්ග ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சில ஆண்டுகளுக்கு முன்னர் நகர மண்டபத்தி லிருந்து கடவத்தை வரை 193 வீதி இலக்கத்தைக் கொண்ட பேருந்துச் சேவையொன்று இயக்கப் பட்டது என்பதையும்;

(ii) இன்றளவில் மேற்படி பேருந்துச் சேவை இயக்கப்படுவதில்லை என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) மட்டக்குளிய மற்றும் கடவத்தை ஆகிய 'டிப்போ' க்களிலிருந்து தலா ஒரு இ.போ.ச. பேருந்து வீதம் ஈடுபடுத்தி மேற்படி பேருந்துச் சேவையை மீள ஆரம்பிப்பதற்கு நடவடிக்கை மேற்கொள்ளப்படுமா என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways and Urban Development:

(a) Is he aware that -

(i) a bus service on Route No. 193 from Purahala to Kadawatha was in operation a few years ago; and

(ii) the said bus service is not in operation at present?

(b) Will he inform this House whether actions will be taken to recommence the said bus service by deploying one SLTB bus each from the Mattakkuliya Depot and the Kadawatha Depot?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා (ප්‍රවාහන සහ මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன - போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Prasanna Gunasena - Deputy Minister of Transport and Highways)

ගරු කථානායකතුමනි, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i), (ii) ඔව්.

වර්තමානයේ 193 මාර්ගයේ පුරහල සිට කඩවත දක්වා තනි බස් රථ සේවාවක් ක්‍රියාත්මක නොවුණද, කඩවත සිට පුරහල දක්වා ප්‍රවාහන අවශ්‍යතා ඇති මගීන්ට කොළඹ කොටුවට පැමිණ කොළඹ සිට පුරහල දක්වා බස් රථ සේවා මඟින් ප්‍රවාහන අවශ්‍යතාව ඉටු කර ගැනීමට හැකිය.

(ආ) ඉදිරියේදී මගී ඉල්ලුම පිළිබඳව සමීක්ෂණයක් සිදුකර මගී ඉල්ලුම අනුව නව ප්‍රවාහන සේවා ආරම්භ කිරීමට සැලසුම් සකස්කර ඇති බැවින් ඒ අනුව මෙම සේවාව සඳහා ද ප්‍රමුඛතාව ලබා දීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

(ඇ) අදාළ නොවේ.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

ගරු කථානායකතුමනි, මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මීට සති දෙකකට කලින් ගරු බිමල් රත්නායක ඇමතිතුමාගෙන් මම වාචික පිළිතුරු අපේක්ෂාවෙන් ප්‍රශ්නයක් ඇහුවා. ඒකෙදි ඔබතුමා කිව්වා, බස් රථ පර්මිට් එක මාරු කිරීමේ කටයුතු මේ වනකොට රජය කරනවා කියලා. ඒ කියන්නේ, බස් රථ හිමියෙකුගේ පර්මිට් එක තව කෙනෙකුට පැවරීමට අදාළ කටයුතු. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ ප්‍රශ්නය මම ඔබතුමාගෙන් ඇහුවාට පසුව පෞද්ගලික බස් රථ හිමියන් බොහෝදෙනෙක් මට කථා කළා. ඒ අය කිව්වා, මෙහිදී මාස තුනකට ආසන්න කාලයකට හෝ ඊට වැඩි කාලයකට රුපියල් ලක්ෂ 20ක fixed deposit එකක් දාන්න ඕනෑය කියලා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාත් දන්නවා, බස් රථ හිමියෙක් කියන්නේ කෝටිපතියෙක් නොවෙයි කියන එක. ඒ වාගේම බස් රථයක් නඩත්තු කරන්න ලොකු වියදමක් යනවා. ඊට අමතරව සේවකයින්ට පඩි නඩි ගෙවන්නත් තිබෙනවා. සමහර දවස්වලට බස් රථවලින් එහෙම ලොකු ආදායමක් ලැබෙන්නේත් නැහැ. ඒ නිසා ඉහතින් මා සඳහන් කළ තැන්පතු මුදල සම්බන්ධව යම් සහනදායී වැඩ පිළිවෙළක් සකස් කරන්න පුළුවන්ද කියලා ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)

ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම ඒක රුපියල් ලක්ෂ 20ක fixed deposit එකක් නොවෙයි, මාස හයක් ඇතුළත account එකක තිබුණා කියන කාරණය තමයි සලකා බලන්නේ. ඒකට හේතුව මම කියන්නම්. වාහන බලපත්‍රයක් දුන්නාට පස්සේ ඒ බස් රථ හිමියාට වගකීමක් තිබෙනවා, ඒ බස් රථය නිරන්තරයෙන් ධාවනය කිරීමට. යම්කිසි කාර්මික ගැටලුවක් නිසා හෝ accident එකක් වෙලා හෝ ඒ පුද්ගලයාට නැවත ඒ බස් රථය සේවයට යොදවන්න යම්කිසි කාලයක් ගත වෙනවා නම්, ඒ සඳහා මූල්‍ය හැකියාවක් ඒ බස් රථ හිමියාට නැත්නම් අපහසුතාවට පත් වෙන්නේ මගියා. ඒ රුපියල් ලක්ෂ 20ක barrier එක දාපු එකෙන් අපි බලාපොරොත්තු වුණේ ඒක බිස්නස් එකක් කර නොගෙන සේවාව සපයන්නයි. ඒ ගැන කථා නොකළාට අපි කවුරුත් දන්නවා, ඒක පිටුපස බිස්නස් එකක් තිබෙන බව. පර්මිට් එක ගන්නවා, ආයෙත් විකුණනවා, අතින් අතට යනවා. හැබැයි, මොකක් හරි දෙයක් වෙලා පර්මිට් එක නැති වුණාට පස්සේ, බස් රථය යොදවන්නේ නැති වුණාට පස්සේ ඒකේ පාඩුව විඳ දරා ගන්න වෙන්නේ මගියාට. ඒක වළක්වා ගැනීමේ අරමුණින් තමයි ඇත්තටම genuinely, buyer කෙනෙකුට ප්‍රවාහන සේවයට මැදිහත් වෙලා සේවාව සපයන්න පුළුවන් වන විධියට ඔය රුපියල් ලක්ෂ 20ක barrier එක දැම්මේ. ඒ ක්‍රමය සාර්ථකව ඉදිරියට ඇවිල්ලා තිබෙනවා.

ඇත්තටම, මාසයකට කලින් NTC එකට ලිඛිත පැමිණිලි එකක්වත් ලැබී තිබුණේ නැහැ, ගරු මන්ත්‍රීතුමනි. හැබැයි, වාචිකව එකින් එක කාරණා කියනවා. ඒ කියන්නේ, රුපියල් ලක්ෂ 20ක මුදල පෙන්වලා තමන්ගේ පර්මිට් එක මාරු කර ගන්න හැකියාව තිබෙනවා. නමුත් ඒකත් අඩු කර ගැනීමේ වුවමනාවෙන් තමයි එහෙම කියනවා ඇත්තේ. නමුත් එහෙම කොන්දේසියක් පනවන්න හේතු වුණේ අඛණ්ඩ මගී සේවාවක් පවත්වාගෙන යන්නයි. එහෙම නැත්නම් යම්කිසි ආකාරයකට මූල්‍ය හැකියාවක් නැති කෙනෙක් බස් රථයක් යොදවලා යම් දෙයක් වුණොත් ඒක insurance cover එකකින් recover කර ගන්න හෝ තමන්ගේ මුදල් යොදවලා හදා ගන්න හෝ වැඩි කාලයක් ගත වුණොත් ඒකෙන් අපහසුතාවට පත් වන්නේ මගියා.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මෙතැන තිබෙන ප්‍රශ්නය මේකයි. බස් රථය ඒ මාස තුන ඇතුළත කැඩුණා කියමුකෝ. Fixed deposit එක withdraw කරලා බස් රථය හදන්න බැහැ නේ. ඒක පළමුවන කාරණය.

දෙවන කාරණය මේකයි. ඔබතුමන්ලා පර්මිට් එක තවත් කෙනෙකුට විකුණයි කියලා අපේක්ෂා කරනවා නම් මාස තුනෙන් පසුවත් විකුණන්න පුළුවන් නේ.

මේ කාරණයත් මම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. මෝටර්සයිකල් දෙකක ගිය ළමයි දෙදෙනෙක් කන්ටේනර් එකක හැප්පිලා සිදු වුණු අනතුරින් ඔවුන්ගේ බඩ හරියෙන් වෙන් වුණා. ඒ සිදුවීම වුණේ මගේ ආසනයේ. බෝලවලානේ තරුණයෝ දෙදෙනෙක් තමයි එහිදී මරණයට පත් වුණේ. එම නිසා මම ඉල්ලීමක් කරන්න ඕනෑ. විශේෂයෙන්ම මීට ඉස්සෙල්ලා කන්ටේනර්, බස් වාගේ ලොකු වාහනවල මැද ලයිට් පේළියක් සවි කරලා තිබුණා. ඒ අනතුර ඇතුළත් වීඩියෝ එකේ ඔබතුමා දකින්න ඇති, කන්ටේනරය reverse කරනකොට තමයි මෝටර්සයිකල් දෙක අනෙක් පැත්තෙන් ඇවිල්ලා හැප්පෙන්නේ කියන එක. එතකොට ඒගොල්ලන්ට පෙනෙන්නේ නැහැ, සමහර වෙලාවට පාර හරහා දිග වාහනයක් තිබෙනවා කියලා. එවැනි වාහනවල සවි කර තිබෙන ලයිට් යම් අවස්ථාවල පොලීසියෙන් ගලවනවා. විශේෂයෙන්ම අනතුරු වළක්වා ගැනීම සඳහා ක්‍රියාමාර්ගයක් ගැනීම වෙනුවෙන්, ඒ කියන්නේ ජීවිත ආරක්ෂාව වෙනුවෙන් බස් රථ, ට්‍රක් රථ වාගේ දිග වාහනවල ලයිට් එකක් හෝ මොකක් හෝ සවි කරන්න පුළුවන් නම් එය ඉතාම වැදගත් කියා මම හිතනවා.

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු මන්ත්‍රීතුමනි, ඒ ලයිට් කියන්නේත් distraction එකක්. ඇත්තටම දිග වාහන හරවද්දී රිය සහායකයෙක් අවශ්‍යයි. මොකද, කන්ටේනරයක් සම්පූර්ණයෙන්ම පෙනෙන විධියට හදන්න පුළුවන් කිසිම ක්‍රමයක් නැහැ.

දෙවැනි කාරණය තමයි, කන්ටේනර්වල, ඒ වාගේම prime moversවල blind spot එකක් තිබෙනවා. ඒක බේරන්න බැහැ. සාමාන්‍ය කාර් එකක් පදවනකොටත් මුහුණ දෙන ප්‍රශ්නයක් තමයි, manufacturer විසින්ම කරන, බේරන්න බැරි blind spots එන එක. ඔබතුමා ඒ ගැන දන්නවා ඇති. සාමාන්‍යයෙන් steering wheel එක ළඟම තිබෙන ඉදිරිපස බාර් එක නිසා යම්කිසි ප්‍රමාණයකින් ඉදිරිය වැහෙනවා.

කන්ටේනරයක් කියන්නේ විශාල වාහනයක්. ඒකට මෝටර්සයිකල් වාගේ පොඩි වාහන පෙනෙන්නේ නැහැ. ඒකට උත්තරය තමයි, reverse කරනකොට රිය සහායකයෙකුගේ උදවු ගන්න එක. අනෙක් එක, පාරේ රේස් යන්නේ නැතිව ජීවිතය වටිනවා කියලා තේරුම් අරගෙන මෝටර්සයිකල් පාවිච්චි කරන එක.

ගරු මන්ත්‍රීතුමනි, අපි දැනට මහන්සි වෙමින් වැඩකටයුතු පටන් ගනිමින් ඉන්නවා, මෝටර්සයිකල් වෙනුවෙන් ක්‍රමානුකූලව අවුරුදු ගාණක් ඇතුළතදී exclusive lane එකක් දීලා, ඒගොල්ලන්ගේ ආරක්ෂාව තහවුරු කරන්න. ඒක එක සැරේට කරන්න බැහැ. අපේ රටේ විශාල පිරිසක් මෝටර්සයිකල් පාවිච්චි කරනවා. ඒ වාගේ උත්තරයක් තමයි හොයන්න වෙන්නේ. එහෙම නැතිව lightsවලින් වෙන්නේ තව distraction එකක් වෙන එකයි.

## නව විදේශ ගමන් බලපත්‍ර: විස්තර
### புதிய கடவுச்சீட்டுகள்: விபரம்
### NEW PASSPORTS: DETAILS

909/2025

**2. ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) විදේශ ගමන් බලපත්‍රයක් ලබා ගැනීමට මේ වනවිට ගෙවිය යුතු මුදල කොපමණද;

(ii) එක් බලපත්‍රයක් සකස් කිරීමට වැය වන මුදල කොපමණද;

(iii) පැරණි විදේශ ගමන් බලපත්‍රයේ සහ නව විදේශ ගමන් බලපත්‍රයේ තිබෙන පිටු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම පිටු සංඛ්‍යාව වෙනස් කිරීමට හේතු කවරේද;

(v) නව විදේශ ගමන් බලපත්‍රයේ ආරක්ෂණ ක්‍රමවේද සම්බන්ධයෙන් ගැටලු පවතින බව දන්නේද;

(vi) නව බලපත්‍රයේ බොහෝ වැරදි තිබෙන බව පිළිගන්නේද;

(vii) එසේ නම්, ඒවා නිවැරදි කිරීමට ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) (i) E-passport මුද්‍රණය කිරීම සඳහා මිල ගණන් කැඳවීමෙන් අනතුරුව තෝරා ගන්නා ලද ආයතනයට සාමාන්‍ය විදේශ ගමන් බලපත්‍ර මුද්‍රණය කිරීමට ලබා දී ඇති බව දන්නේද;

(ii) ඉහත ආයතනයෙන් මිල ගණන් නොකැඳවා සාමාන්‍ය විදේශ ගමන් බලපත්‍ර මුද්‍රණය කිරීමට ලබා දීම, පිළිගත් ක්‍රමවේදයට පටහැනි නොවන්නේද;

(iii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இன்றளவில் கடவுச்சீட்டு ஒன்றைப் பெற்றுக் கொள்வதற்குச் செலுத்த வேண்டிய கட்டணம் எவ்வளவு என்பதையும்;

(ii) கடவுச்சீட்டு ஒன்றைத் தயாரிப்பதற்குச் செல வாகும் பணத்தொகை எவ்வளவு என்பதையும்;

(iii) பழைய கடவுச்சீட்டில் மற்றும் புதிய கடவுச்சீட்டில் உள்ள பக்கங்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(iv) அப்பக்கங்களின் எண்ணிக்கையை மாற்றுவதற் கான காரணங்கள் யாவை என்பதையும்;

(v) புதிய கடவுச்சீட்டின் பாதுகாப்பு வழிமுறையில் சிக்கல் நிலவுவதை அவர் அறிவாரா என்பதையும்;

(vi) புதிய கடவுச்சீட்டில் அநேகமான பிழைகள் காணப்படுவதை அவர் ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(vii) ஆமெனில், அவற்றைச் சரிசெய்வதற்கு மேற் கொள்ளும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) E-passportஐ அச்சிடுவதற்காக விலைமனுக் கோரி, தெரிவுசெய்த நிறுவனத்திடம் சாதாரண கடவுச்சீட்டுகளை அச்சிடுவதற்கு வழங்கி யுள்ளமை பற்றி அவர் அறிவாரா என்பதையும்;

(ii) மேற்படி நிறுவனத்திடமிருந்து விலைமனுக் கோராமல், சாதாரண கடவுச்சீட்டை அச்சிட வழங்கியமை, ஏற்றுக்கொள்ளப்பட்ட வழிமுறைக்கு முரணானதல்லவா என்பதையும்;

(iii) ஆமெனில், அது தொடர்பாக மேற்கொள்ளும் நடவடிக்கை யாது என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Security and Parliamentary Affairs:

(a) Will he state -

(i) the current fee for obtaining a passport;

(ii) the cost of preparing one passport;

[ගරු ගරු මුජිබුර් රහුමාන් මහතා]

(iii) the number of pages in the old passport and the new passport, separately;

(iv) the reason for changing the said number of pages;

(v) whether he is aware that there are problems regarding the security measures of the new passport;

(vi) whether he accepts that there are many errors in the new passport; and

(vii) if so, the measures that will be taken to correct the said errors?

(b) Will he also state -

(i) whether he is aware that the same institution which was selected after calling for quotations to print e-passport has been awarded the contract to print ordinary passports;

(ii) whether awarding the contract to the said institution to print ordinary passports without calling for quotations is in violation of the accepted procedure; and

(iii) if so, the actions that will be taken in that regard?

(c) If not, why?

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i)

| අනු අංකය | සේවාව | අය කරනු ලබන ගාස්තුව (රුපියල්) |
|---|---|---|
| 01 | එක් දින සේවාව යටතේ විදේශ ගමන් බලපත්‍ර සඳහා ගාස්තුව | 20,000.00 |
| 02 | සාමාන්‍ය සේවාව යටතේ විදේශ ගමන් බලපත්‍ර සඳහා ගාස්තුව | 10,000.00 |
| 03 | මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ හදිසි සේවාව යටතේ විදේශ ගමන් බලපත්‍ර සඳහා ගාස්තුව | 15,000.00 |
| 04 | මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ සාමාන්‍ය සේවාව යටතේ විදේශ ගමන් බලපත්‍ර සඳහා ගාස්තුව | 10,000.00 |
| 05 | වයස අවුරුදු 16ට වඩා අඩු අයදුම්කරුවන් සඳහා වසර 03ක වලංගු කාල සීමාවක් දක්වා එක්දින සේවාව යටතේ විදේශ ගමන් බලපත්‍ර සඳහා ගාස්තුව | 9,000.00 |
| 06 | වයස අවුරුදු 16ට වඩා අඩු අයදුම්කරුවන් සඳහා වසර 03ක වලංගු කාල සීමාවක් දක්වා සාමාන්‍ය ක්‍රමවේදය යටතේ විදේශ ගමන් බලපත්‍ර සඳහා ගාස්තුව | 3,000.00 |
| 07 | විදේශ ගමන් බලපත්‍රයක් නිකුත් කළ දින සිට වසරක් ඇතුළත අස්ථානගත වී ඇත්නම් ඒ සඳහා දඩ මුදල (විදේශ ගමන් බලපත්‍ර ගාස්තුවට අමතරව) | 20,000.00 |
| 08 | විදේශ ගමන් බලපත්‍රයක් නිකුත් කළ දින සිට වසරකට වැඩි කාලයක් ගත වූ පසු අස්ථානගත වී ඇත්නම් ඒ සඳහා දඩ මුදල (විදේශ ගමන් බලපත්‍ර ගාස්තුවට අමතරව) | 15,000.00 |

(ii) යන්ත්‍රානුසාරයෙන් කියවිය හැකි විදේශ ගමන් බලපත්‍රයක් - MRP එකක් - නිකුත් කිරීම සඳහා වැය වන මුළු පිරිවැය රුපියල් 4,000.70යි.

(iii) පැරණි N කාණ්ඩයේ විදේශ ගමන් බලපත්‍රයේ පිටු ගණන - පිටු 64

නව P කාණ්ඩයේ විදේශ ගමන් බලපත්‍රයේ පිටු ගණන - පිටු 48

(iv)

| අඩු කරන ලද පිටු ගණන | ඒ සඳහා බලපාන ලද හේතුව |
|---|---|
| පිටු 01 | පැරණි විදේශ ගමන් බලපත්‍රයේ All Country, Middle East Country යනුවෙන් පිටුවක් වෙන් වී තිබුණු අතර, ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ - ICAO - ප්‍රමිතියට අනුව දැනට භාවිත කරනු ලබන විදේශ ගමන් බලපත්‍රයෙන් එම පිටුව ඉවත් කර ඇත. |
| පිටු 04 | පැරණි විදේශ ගමන් බලපත්‍රයේ දරුවන්ගේ තොරතුරු ඇතුළත් කිරීම සඳහා පිටු 04ක් වෙන් වී තිබුණු අතර ICAO ප්‍රමිතීන්ට අනුව දැනට භාවිත කරනු ලබන විදේශ ගමන් බලපත්‍රයෙන් එම පිටු 04 ඉවත් කර ඇත. |
| පිටු 04 | වෙනස්කම් කිරීම සඳහා පිටු 04ක් වෙන් වී තිබූ අතර වර්තමානයේ එම වෙනස්කම් පද්ධතිය තුළින්ම සිදු වන බැවින් එම පිටු 04 ඉවත් කර ඇත. |
| පිටු 02 | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සඳහා පිටු 02ක් වෙන් වී තිබූ අතර ICAO ප්‍රමිතියට අනුව දැනට භාවිත කරනු ලබන විදේශ ගමන් බලපත්‍රයේ විසා පිටු පමණක් ඇතුළත් කර එම පිටු 02ක ඉවත් කර ඇත. |
| පිටු 02 | විදේශ විනිමය ඇතුළත් කිරීමට පිටු 02ක් වෙන් වී තිබූ අතර, එම පිටු 02ක ද ඉවත් කර ඇත. |
| නව විදේශ ගමන් බලපත්‍රයේ විසා පිටු 03ක් පමණක් අඩු වී ඇත. | |

(v) ගැටලු වාර්තා වී නොමැත.

(vi) මුද්‍රණ දෝෂ කිහිපයක් පමණක් වාර්තා විය.

(vii) පැවති මුද්‍රණ දෝෂ, දෙවැනි හිස් විදේශ ගමන් බලපත්‍ර මුද්‍රණ තොගයේ සිට නිවැරදි කිරීමට කටයුතු කර ඇත.

(ආ) (i) ඔව්.

(ii) නැත.

(iii) අදාළ නොවේ.

(ඇ) පැන නොනඟී.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි, මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, passport, එහෙම නැත්නම් විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීමේදී e-passport එක සඳහා තමයි මේ ටෙන්ඩරය ලබා දෙන්න එදා කටයුතු කළේ. නමුත්, අවසානයේ e-passport එක නැතිව, ඒ කියන්නේ N-series passport එක තමයි දැන් නිකුත් කරන්නේ. ඒ කියන්නේ, chip එක නැතිව. නමුත්, chip එකත් එක්ක passports නිකුත් කරන්න තමයි ටෙන්ඩර් එක කැඳෙව්වේ. ඒ ටෙන්ඩර් එක ලබා දුන්නාට පස්සේ ඔවුන් දැන් chip එක නැතිව තමයි passport එක issue කරන්නේ. ගරු කථානායකතුමනි, මේ passport එක ගත්තොත්, ගැටලු රාශියක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වා වාගේම මේ passport එකේ foreign exchange පිටු නැහැ; observation පිටු නැහැ. ඊළඟට, ඒ කොළවල ගුණාත්මකභාවය - quality එක -

පිළිබඳ ගැටලු මතු වෙලා තිබෙනවා. මොකද, සමහර තැන්වල immigration seal එක ගැහුවාම කොළය අනෙක් පැත්තේ තීන්ත මතු වන ගතියක් පෙනෙන්න තිබෙනවා.

ඊළඟට, quality එක බාල නිසාම සමහර රටවලට ගියාම ගැටලු මතු වෙලා තිබෙනවා. මෑතකදී වාර්තා වුණා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු බ්‍රිතාන්‍යයට ගමන් කළාම එහිදී ඔහුව Immigration එකෙන් නවත්වාගෙන තිබෙනවා. මොකද, මේ passport එක read වෙන්නේ නැහැ. මේක forged passport එකක් කියලා තමයි ඔහුව නවත්වා ගත්තේ. නමුත්, ඊට පසුව ඔහුව මුදා හැරියා. ඒ වාගේ ගැටලු රාශියක් මතු වෙලා තිබෙනවා, ගරු ඇමතිතුමනි.

ගරු ඇමතිතුමනි, පරණ passport එකේ පිටු 64ක් තිබුණා. ඒ පිටු 64ට ගෙවපු ගණනම තමයි, දැන් පිටු 48 ගන්නත් ගෙවන්නේ. ඒ අනුව බැලුවොත්, passport ගන්න පුරවැසියාට රුපියල් 6,600ක value loss එකක් තිබෙනවා. ඒ කියන්නේ, කලින් අපි ගෙවපු මුදලට පිටු 64ක passport එකක් ලැබුණා. දැන් අපි ගෙවන මුදලට ලැබෙන්නේ පිටු 48ක passport එකක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මම අතුරු ප්‍රශ්නය අහනවා, ගරු කථානායකතුමනි.

ගරු ඇමතිතුමනි, දැන් රුපියල් 6,600ක value loss එකක් passport ගන්න හැම පුද්ගලයෙක්ම ලබනවා. ඒ සඳහා ආණ්ඩුව ගන්නා වූ ක්‍රියාමාර්ගය මොකක්ද කියලා මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම මේ passport එක නිකුත් වෙන්නේ මෙහෙමයි. එතුමා සඳහන් කළා, e-passport එකට තමයි ටෙන්ඩරය කැඳවන්නේ කියලා. E-passport එක සඳහා තමයි ටෙන්ඩරය කැඳවලා තිබෙන්නේ. අපි බලයට එන්න පෙරාතුව 2023දී මේ e-passport එක මිලියන 5ක් ගන්න ටෙන්ඩර් කැඳවලා තිබුණා. නමුත්, මේ සම්බන්ධයෙන් තවත් පාර්ශ්වයක් අධිකරණයට ගිහිල්ලා කරුණු වාර්තා කිරීමේ ප්‍රතිඵලයක් හැටියට මේ e-passport එක නිකුත් කිරීම තාවකාලික වාරණයකට ලක් කළා. ඒ අතරතුර එකල හිටපු අමාත්‍යවරයා අමාත්‍ය මණ්ඩලයට ගිහිල්ලා ඒ e-passport එක වෙනුවට, passport ප්‍රශ්නය විසඳා ගැනීම සඳහා e-passport එකේ මූලික කොටස, නැත්නම් chip එක රහිතව machine readable passports 750,000ක් ගන්න අමාත්‍ය මණ්ඩල අනුමැතිය අරගෙන තිබුණා, 2024 සැප්තැම්බර් 02වැනි දා. ඒක අරගෙන, ඊට පස්සේ අධිකරණයට ගිහිල්ලා මේ සම්බන්ධයෙන් වාර්තා කරලා තිබුණා. අපි බලයට පත් වුණාට පස්සේ අධිකරණයට කරුණු වාර්තා කළා. ඒ වෙනකොට passports ගන්න ජනතාව දින ගණන් පෝලිමේ හිටියා; දහස් ගණනක් ජනතාව passports නැතිව පීඩාවට පත් වුණා. මේ තත්ත්වය තුළ අපි අධිකරණයට ගිහිල්ලා කරුණු වාර්තා කරලා මේ 750,000 අර e-passport එකේම machine readable passport එකක් හැටියට chip එක රහිතව ගන්න කටයුතු කළා. ඒක තමයි එතැනදී සිද්ධ වුණේ. ඒ වාගේම, මිල ගණන් ගැනත් කිව්වා. ඒ මිල ගණන් passport එකට පමණක් නොවෙයි, Border Control එකටත්, software වලටත් අදාළ වෙනවා. Passport එකට අදාළ කර්තව්‍යයන් රාශියක් තිබෙනවා. ඒ මිල ගණන් සකස් කළේ අපි නොවෙයි, පෙර පැවැති ආණ්ඩුවයි. නමුත්, මේකට වියදමක් දරන්න වෙනවා. ඒ වියදම ගණනය කරලා තමයි මේ විධියට හදලා තිබෙන්නේ.

ගමන් බලපත්‍රයේ පිටු අඩු වීම ගැන කිව්වොත්, පිටු අඩු වීම නිසා කිසිදු බාධාවක් ඇති වෙලා නැහැ. ඒ වාගේම, ප්‍රමිතිය පිළිබඳ ගැටලුවක් මතු වෙලාත් නැහැ. මුල් කාලයේ ප්‍රමිතිය පිළිබඳව ගැටලුවක් මතු වෙලා තිබුණා. ඔබතුමා කිව්වා වාගේම දෝෂ කිහිපයක් තිබුණා. ඒ දෝෂ, අලුත් print එකේ නිවැරැදි කරලා තිබෙනවා. අපි කලින් නම් අවුරුදු 5කට passport එක දීලා අවුරුද්දෙන් අවුරුද්ද renew කළා. ඊට අමතරව, වයස අවුරුදු 18ට අඩු දරුවන්ගේ විස්තර එහි ඇතුළත් කළා, විදේශ විනිමය ඇතුළත් කළා. නමුත්, දැන් අපි සමහර දේවල් එහි ඇතුළත් කරන්නේ නැහැ. එක් එක් රටවල විදේශ ගමන් බලපත්‍රයේ පිටු ප්‍රමාණය ගත්තොත්, චීනයේ පිටු 48යි, වියට්නාමයේ පිටු 48යි, ඕස්ට්‍රේලියාවේ පිටු 37යි, ප්‍රංශයේ පිටු 32යි, කැනඩාවේ පිටු 42යි. සාමාන්‍යයෙන් ලෝකයේ රටවල විදේශ ගමන් බලපත්‍රයේ පිටු ප්‍රමාණය මේ විධියට තමයි තිබෙන්නේ. Passport එකක් පවත්වාගෙන යන්න ඕනෑ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුවයි. මේ වන කොට අපේ passport එක යම් ප්‍රමිතිගතභාවයකට - standards එකකට - ඇවිත් තිබෙනවා. ඒ වාගේම, e-passport එක පිළිබඳව ගැටලුවක් තිබෙන බවකුත් කිව්වා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා නිවැරැදියි. ඒ සම්බන්ධයෙන් අපට දිගින් දිගටම කටයුතු කරන්න සිදු වෙලා තිබෙනවා. ඒ සඳහා මිලියන 5ක ටෙන්ඩරයක් පිරිනමා තිබෙනවා. ඒ ටෙන්ඩරය සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාමාර්ග හරහා යම් යම් තීන්දු තීරණ දීලා තිබෙනවා. ඒ අනුව නීති උපදෙස් අරගෙන, සමහර අවස්ථාවලදී අමාත්‍ය මණ්ඩලයෙන් තීන්දු අරගෙන තමයි කටයුතු කරමින් ඉන්නේ.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, පෙර පැවැති විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදයේ ඉඳන් වර්තමාන ක්‍රමවේදයට මාරු වීමේදී මහජනතාවට දුෂ්කරතාවලට මුහුණ දෙන්න සිදු වෙනවා. ඔබතුමාත් එය පිළිගත්තා. ඒවා සැලකිල්ලට අරගෙන, දැනට යෝජිත විද්‍යුත් ගමන් බලපත්‍ර ක්‍රමය, එහෙම නැත්නම් e-passport ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ වර්තමාන තත්ත්වය ගැනත්, ඒ වාගේම විද්‍යුත් ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ පද්ධතිය සහ ඊට අදාළ Public Key Infrastructure පද්ධතිය ලබා ගැනීම සඳහා වන ප්‍රසම්පාදන ක්‍රියාවලියේ වර්තමාන තත්ත්වය ගැනත්, එය ක්‍රියාත්මක කරන්න කොයි තරම් කාලයක් යනවාද කියන එක ගැනත් පැහැදිලි කරන්න ඔබතුමන්ලාට පුළුවන්ද? ඒ ගන්නා වූ තීරණය ක්‍රියාත්මක කරන්නත්, නැවත ඒ වාගේ ගැටලු මතු නොවීම සඳහාත් ගත්තා වූ ක්‍රියාමාර්ග ගැන ඔබතුමන්ලාගේ අදහස මොකක්ද? ඒ ගැන පැහැදිලි කරන්න පුළුවන්ද?

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු කථානායකතුමනි, e-passport එක සඳහා PKI software එක ගන්න අවශ්‍ය වෙනවා. ඒ සඳහා ටෙන්ඩරයක් ක්‍රියාත්මක වෙමින් තිබුණා. ඒ ටෙන්ඩරයේ අවසාන අදියර වන විට ඒ පිළිබඳව පැමිණිලි කිහිපයක් ලැබුණා, විශේෂයෙන් අභියාචනා කමිටුවට. ඒ පැමිණිලි සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලයට කරුණු ඉදිරිපත් වුණා. ඒ අනුව අමාත්‍ය මණ්ඩලය එය ප්‍රසම්පාදන

[ගරු ආනන්ද විජේපාල මහතා]

කොමිසමට යොමු කළා. ප්‍රසම්පාදන කොමිසමේදී පැහැදිලි වුණා, එහි ප්‍රසම්පාදන ක්‍රියාවලියේ යම් යම් අඩුපාඩු තිබෙනවා කියලා. ඒ නිසා අපි තීන්දු කළා, ඒ සම්බන්ධයෙන් නැවත අලුත් ප්‍රසම්පාදන ක්‍රියාවලියකට යන්න. ඒ අනුව ඉදිරියේදී PKI සම්බන්ධයෙන් අලුත් ප්‍රසම්පාදන වැඩ පිළිවෙළකට යනවා. ඉතාම ළඟ දිනයකදී එහි publicity එක ලබා දෙනවා; එහෙම නැත්නම් ටෙන්ඩර් කැඳවනවා. ඒ වාගේම, සැලසුම් කරලා තිබෙනවා වසරකට අඩු කාලයක් ඇතුළත e-passport එකේ කටයුතු සම්පූර්ණ කරන්න. ඒ අනුව, දැනට e-gates 4ක් Airport එකේ සවි කර තිබෙනවා. ඉදිරි වර්ෂය තුළ e-gates 12ක් සවි කරන්න සැලසුම් කර තිබෙනවා. වසරක් වැනි කාලයක් ඇතුළත e-gates වාගේම e-passport එකත් මේ රටට ලබා දෙන්න කටයුතු කරනවා, ICAO standards අනුව.

## ශ්‍රී ලංකා විදේශ රැකියා නියෝජිතායතන (පුද්ගලික) සමාගම: ලැබුණු විදේශ රැකියා අවස්ථා
## இலங்கை வெளிநாட்டு வேலைவாய்ப்பு முகவராண்மை (தனியார்) கம்பனி: கிடைக்கப்பெற்ற வெளிநாட்டு வேலைவாய்ப்புகள்
## FOREIGN EMPLOYMENT AGENCY OF SRI LANKA (PVT.) LIMITED: FOREIGN EMPLOYMENT OPPORTUNITIES RECEIVED

946/2025

**3. ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකා විදේශ රැකියා නියෝජිතායතන (පුද්ගලික) සමාගමට 2015 වර්ෂයේ සිට මේ දක්වා ලැබුණු විදේශ රැකියා ඇබෑර්තු සංඛ්‍යාව වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම රැකියා ඇබෑර්තු සඳහා උපරිම පිරිසක් යැවීමට නොහැකි වූ හේතු කවරේද;

(iii) රැකියා ඇබෑර්තුවලින් උපරිම ප්‍රයෝජන ගැනීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை வெளிநாட்டு வேலைவாய்ப்பு முகவராண்மை (தனியார்) கம்பனிக்கு 2015ஆம் ஆண்டு தொடக்கம் இற்றைவரை கிடைக்கப் பெற்ற வெளிநாட்டு வேலைவாய்ப்பு வெற்றிடங் களின் எண்ணிக்கை ஆண்டு வாரியாக வெவ்வேறாக யாது என்பதையும்;

(ii) மேற்படி வேலைவாய்ப்புகளுக்கு அதிகமான ஆட்களை அனுப்ப முடியாமல் போனமைக்கான காரணங்கள் யாவை என்பதையும்;

(iii) வேலைவாய்ப்புகள்மூலம் உச்ச பயனைப் பெற்றுக்கொள்வதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Foreign Affairs, Foreign Employment and Tourism:

(a) Will he inform this House the -

(i) annual breakdown of foreign employment vacancies received by the Foreign Employment Agency of Sri Lanka (Pvt) Ltd. from 2015 to date, separately;

(ii) causes behind the shortfall in sending the maximum number of workers for the said job vacancies; and

(iii) measures that will be taken to maximize the utilization of available job vacancies?

(b) If not, why?

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා (විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா - வெளிநாட்டலுவல்கள் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Arun Hemachandra - Deputy Minister of Foreign Affairs and Foreign Employment)

ගරු කථානායකතුමනි, විදේශ කටයුතු සහ විදේශ රැකියා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි (පුද්ගලික) සමාගමට 2015 වර්ෂයේ සිට 2026 ජුනි 30 දක්වා ලැබුණු විදේශ රැකියා ඇබෑර්තු සංඛ්‍යාව වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් පහත දක්වා ඇත.

| වර්ෂය | ඇබෑර්තු සංඛ්‍යාව | විදේශගත වූ සංඛ්‍යාව |
|---|---|---|
| 2015 | 739 | 385 |
| 2016 | 2,784 | 820 |
| 2017 | 1,427 | 806 |
| 2018 | 1,427 | 662 |
| 2019 | 2,070 | 274 |
| 2020 | 227 | 113 |
| 2021 | 2,606 | 140 |
| 2022 | 2,973 | 324 |
| 2023 | 1,518 | 659 |
| 2024 | 1,555 | 558 |
| 2025 | 408 | 379 |
| 2026 ජුලි 31 දක්වා | 1,127 | 93 |
| **එකතුව** | **18,861** | **5,213** |

(ii) මේ ප්‍රශ්නයට අදාළ උත්තරය ගත්තොත්, පළමු කාරණාව තමයි, මේ ආයතනය සමස්තයක් විධියට කඩාගෙන වැටිලායි තිබුණේ. මේ ආයතනය පිහිටෙව්වේ 1996 අවුරුද්දේ. සාමාන්‍යාධිකාරිවරු හැටියට full-timersලා තුන්දෙනායි හිටියේ. මීට පෙර හිටපු දෙදෙනාම ඉතාම කෙටි කාලයක් තමයි සේවය කළේ. ඒ නිසා අපි බලයට පත් වුණාට පසු තීරණයක් ගත්තා, ස්ථිර සාමාන්‍යාධිකාරී කෙනෙක් පත් කරන්න ඕනෑ කියලා. ඒ සාමාන්‍යාධිකාරීවරයා පත් කිරීමත්

එක්කම අපේ කාර්යමණ්ඩලයට අදාළ සියලු සේවකයන් බඳවා ගෙන මේ කටයුතු කරගෙන යනවා. විශේෂයෙන්ම ඒකට PSC approval ගන්න ඕනෑ. ඒ approval අරගෙන අපි ඒ කටයුතු ටික කරගෙන යනවා. ඒ අනුව කාර්ය මණ්ඩලය ශක්තිමත් කිරීමට අදාළ කටයුතු අපි කර තිබෙනවා. අපි දන්නවා, මීට පෙර වැරදි තෝරා ගැනීම් රාශියක් සිද්ධ වෙලා තිබෙන බව. උදාහරණයක් කිව්වොත්, අපට ඇබෑර්තු 500ක් ලැබී තිබෙනවා. මීට පෙර පැවති ආණ්ඩුව 2023 අවුරුද්දේ 219දෙනෙක් යවා තිබෙනවා, E-7 කියන කාණ්ඩය යටතේ දකුණු කොරියාවට. ඒ E-7 කාණ්ඩය යටතේ ගිය 219දෙනා අතරින් සාතිශය බහුතරය දැන් ඒ අයගේ වැඩ පොළවල නිරත වී සිටින්නේ නැහැ. විශේෂයෙන්ම ඒ පුද්ගලයන් වෙන වෙන රස්සා හොයා ගෙන අදාළ තැන්වලින් පැනගොස් ඇති බව වාර්තා වෙලා තිබෙනවා.

ඒ වාගේම රුසියාවෙත් රැකියා සංඛ්‍යාවක් අපට ලැබී තිබුණා. එතැනත් තෝරා ගැනීම් පටිපාටි සම්බන්ධව අපට ගැටලු නිර්මාණ වෙලා තිබුණා. ඒ නිසා අපට ඒ අවස්ථාවත් අහිමි වෙලා තිබෙනවා. ඒ වාගේම රුමේනියාවෙත් යම්කිසි රැකියා සංඛ්‍යාවක් අපට ලැබී තිබුණා. අතරමැදි පාර්ශ්ව සමඟ ඇතිවෙච්ච ගැටුම් නිසා ඒවාත් අපට අහිමි වෙලා තිබෙනවා. ඒ නිසා අපි තීරණය කළා, සම්මුඛ පරීක්ෂණ ඉතාම හොඳ විධියට පවත්වන්න. පසුගිය කාල වකවානුව තුළ මේ ක්ෂේත්‍රය කඩාගෙන වැටෙන්න බලපෑ එක හේතුවක් තමයි සම්මුඛ පරීක්ෂණ අසමත් වීම. ඒ වාගේම ශාරීරික යෝග්‍යතා පරීක්ෂණ පවත්වා රැකියා අපේක්ෂකයන් තෝරා නොගැනීමත් ඒකට හේතු වූ කාරණයක් විධියට අපි දකිනවා.

ඒ වාගේම, විදේශ නියෝජිතයන් විසින් රැකියා අපේක්ෂකයන් ප්‍රතික්ෂේප කිරීම, අවශ්‍ය භාෂා හා තාක්ෂණික හැකියාව නොමැති වීම ඇතුළු කාරණාත් අපි හඳුනාගෙන තිබෙනවා. ඒ හේතු නිසා අපි ඉතාම හොඳ විධියට සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම හා ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය පැවැත්වීම කරනවා. ඒ හරහා විශේෂයෙන් පළමු කණ්ඩායම විධියට යවන කණ්ඩායම ඉතාම සුදුසු කණ්ඩායමක් විධියට යැවීමට අවශ්‍ය කටයුතු ටික අපි මේ මොහොත වෙනකොට කරගෙන යනවා.

(iii) දැනට කොරියාවේ යොන්වාල් ගන් කියන ප්‍රාන්තයත් එක්ක අපි E-8 සම්බන්ධ ගිවිසුම අත්සන් කරලා තිබෙනවා, විශේෂයෙන් කෘෂිකාර්මික කම්කරුවන් සඳහා. ඒ වාගේම අබුඩාබිවල Solapak Limited කියන ආයතනයත් එක්ක අපි agricultureවලට ගිවිසුම අත්සන් කරලා තිබෙනවා. ඒ වාගේම මේ මොහොත වෙනකොට ජපානයේ EUC, ඒ කියන්නේ Enterprise United Cooperative කියන ආයතනයත් එක්ක ගිවිසුම් අත්සන් කරලා SSW කාණ්ඩය යටතේ පුද්ගලයන් යැවීමට අදාළ කරන කටයුතු ටික කරගෙන යනවා. ඒ වාගේම ජපානයේ මෙටා ටෙක්නෝ කියන ආයතනයත් එක්ක සාකච්ඡා කරමින් IT engineers යැවීමට අදාළ කාර්යභාරයත් මේ මොහොත වෙනකොට අපි ඉටු කරලා තිබෙනවා. ඒ වාගේම අබුඩාබිවල Transguard කියන ආයතනයත් එක්ක සාකච්ඡා කරමින්, ගිවිසුම් අත්සන් තබමින් skilled and semi-skilled workers for different disciplines, ඒ කියන්නේ semi-skilled සහ skilled workersලා යවන එකට අදාළ කටයුතු කරලා තිබෙනවා. ඒවාගේම NOSTROY කියන, විශේෂයෙන් රුසියාවේ National Association of Builders කියන ආයතනයත් එක්ක අපි ගිවිසුමකට අත්සන් කර තිබෙනවා. මීට කලිනුත් තිබුණු ගිවිසුමක් ඒක . ඒක අලුත් කරමින් ඒකට අදාළ semi-skilled and skilled workers යැවීමට අදාළ කටයුතු ටිකත් අපි කරගෙන යනවා.

මෙතැනදී ප්‍රමාණය කියන එක එක කාරණයක්. ඒ ප්‍රමාණයත් එක්ක ගුණාත්මක බවක් ඇති කරන්න ඕනෑ කියන විශ්වාසය අපට තිබෙනවා. ඒ නිසා ප්‍රමාණය මෙන්ම ගුණාත්මක කරුණු කාරණාවලට විශේෂ මැදිහත්වීමක් කරමින් අපි මේ කටයුතු ටික කරගෙන යනවා. අපට අදහසක් තිබෙනවා, කෙටි කාලයක් තුළ පුහුණු ශ්‍රමිකයන් යැවීමට අදාළ කටයුතු ටික කරන්න. එතැනදී ලොකු සාර්ථකත්වයක් අත්පත් කරගන්න පුළුවන් කියන බලාපොරොත්තුව අපට තිබෙනවා. ඒ වාගේම මෙතැනදී ජර්මනියත් එක්ක විශේෂ ගිවිසුමක් තිබෙනවා, හෙදියන් යැවීමට අදාළව. ලංකාවෙත් හෙදියන්ගේ පුරප්පාඩු තිබෙනවා. පෞද්ගලික ආයතන හරහා, ඒ කියන්නේ පෞද්ගලික පාඨමාලා හරහා ලියාපදිංචි - register - වෙච්ච හෙදියන් යැවීමට අදාළ අවස්ථාව මේ මොහොත වෙනකොට අපි සකස් කරගෙන යනවා. ඒකට අදාළ සාකච්ඡා ටිකත් අපි පවත්වාගෙන යනවා.

(ආ) අදාළ නොවේ.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු කථානායකතුමනි, පිළිතුර ලබා දීම වෙනුවෙන් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාට මම ස්තුතිවන්ත වෙනවා. ගරු කථානායකතුමනි, මගේ පළමු අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඊයේ ඔබතුමාත් දකින්න ඇති, රැකියා සඳහා ඊශ්‍රායලයට යන්න බලාපොරොත්තුවෙන් සිටින ශ්‍රී ලාංකිකයන් විශාල පිරිසක් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හරහා විදේශගත කළේ නැහැ කියලා එළියට ඇවිල්ලා විශාල වශයෙන් ඉල්ලීම් කරපු ආකාරය, ඒ අයට යන්න අවස්ථාව දෙන්න කියලා. මෙතැනදී අපි වටහා ගන්න ඕනෑ කාරණාවක් තිබෙනවා. විදේශ සේවා නියුක්ති කාර්යාංශය හරහා ඔවුන් විදේශගත කරනවා වාගේම, පනත අනුව ඒ සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන තිබෙනවා. ඒ වාගේම විදේශ සේවා නියුක්ති කාර්යාංශයට අනුබද්ධිත වෙනම ඒජන්සි ආයතන වාගේම පෞද්ගලික ආයතනත් තිබෙනවා. ඔබතුමන්ලා සාමාන්‍යයෙන් රැකියා ඇබෑර්තුවක් සම්බන්ධව රටට ප්‍රකාශ කළාට පස්සේ, එහෙම නැත්නම් නිල නිවේදන නිකුත් කළාට පස්සේ, සියලුදෙනාම ඒකට ලියාපදිංචි වෙනවා. ඒ ලියාපදිංචි වන ප්‍රමාණය ඉතාම විශාලයි. සමහර විට 3,000ක්, 3,500ක්, 4,000ක්, නැත්නම් 5,000ක් විතර පිරිසක් ලියාපදිංචි වෙනවා. මේගොල්ලන් ලොකු බලාපොරොත්තු තියාගෙන තමයි ලියාපදිංචි වෙන්නේ. ඒ හැම කෙනෙකුම තමන්ට යම් කිසි නිශ්චිත කාල සීමාවක් ඇතුළත රැකියාවක් ලැබිය යුතුයි කියලා බලාපොරොත්තු වෙනවා.

හැබැයි, මෙතැන තිබෙන ප්‍රශ්නය මේකයි. එහෙම ලියාපදිංචි කර ගත්තාට, ඒ ලියාපදිංචි වූ සියලු දෙනාම රට යවන්න විදේශ සේවා නියුක්ති කාර්යාංශයට නොහැකි වෙලා තිබෙනවා. ඒ වාගේම සමහර වෙලාවට ඔවුන්ගේ සුදුසුකම් සම්බන්ධයෙනුත්

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

ප්‍රශ්න මතු වෙලා තිබෙනවා. එතකොට එක පැත්තකින් ඔබතුමන්ලා මේ ලියාපදිංචි කිරීම් සිදු කරද්දී, ඒ ලියාපදිංචි කරපු කණ්ඩායම් කැඳවලා විශේෂ සාකච්ඡාවක් කළ යුතුව තිබෙනවා. ඉන්පසු රැකියා අවස්ථා පිළිබඳ ප්‍රශ්නය විසඳීම සඳහා අවශ්‍ය වැඩ කටයුතු කරලා ඒ අයව දැනුවත් කිරීමේ වැඩසටහනක් පළමුවෙන් කරන්න ඕනෑ.

දෙවැනි කාරණාව, මට ප්‍රශ්නයක් හැටියටයි අහන්න තිබෙන්නේ. මේ ලියාපදිංචි කරපු කණ්ඩායමට ඔබතුමන්ලා යම් කිසි වචනයක් දීලා තමයි ලියාපදිංචි කර ගත්තේ. හැබැයි, ඔවුන්ව ලියාපදිංචි කර ගත්තාට ඒ කාලය තුළ ඔවුන්ට රැකියා අවස්ථා ලබා දෙන්න ඔබතුමන්ලා අසමත් වෙලා තිබෙනවා. මේ රැකියා අවස්ථා ලබා දෙන්න බැරි වුණු හේතුව, එහෙම වුණේ ඇයි කියන කාරණාව දැනගන්න එක ඒ දරුවෝ සියලු දෙනාටත් වැදගත් වෙනවා; අපටත් වැදගත් වෙනවා.

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா)
(The Hon. Arun Hemachandra)

ගරු මන්ත්‍රීතුමනි, එම ප්‍රශ්නය මතු කළාට ස්තුතියි. මොකද, මේ සම්බන්ධව පවතින තත්ත්වය පැහැදිලි කරන්න අපිටත් මෙයින් අවස්ථාවක් ලැබෙනවා. ඊයේ උද්ඝෝෂණයට ගිය සමහර දේශපාලන උදවිය ප්‍රකාශ කරපු සමහර සංඛ්‍යාලේඛන, දත්ත සම්බන්ධව දැවැන්ත ප්‍රශ්නයක්, ගැටලුවක් මතු වෙලා තිබෙනවා. ඒ ගැන මම ඇත්තටම කනගාටු වෙනවා. ඔවුන් ඉතාම පරිණත දේශපාලනඥයන් කියලා තමයි අපි හිතාගෙන හිටියේ. ඒ එතැන තිබුණු බැනර්වලත් ගහලා තිබුණා මේ අවුරුද්දට මේ වෙනකන් ඊශ්‍රායලයට ගිහිල්ලා තිබෙන්නේ 200 ගණනක් විතරයි කියලා. ඒක ඉතාම අසත්‍ය කාරණයක්.

මා අතේ තිබෙන මේ සංඛ්‍යාලේඛනවලට අනුව මේ මොහොත වනවිට 2,823දෙනෙක් රජය හරහා ඊශ්‍රායලයට ගිහිල්ලා තිබෙනවා. බලන්න, මේක සාමාන්‍යාධිකාරි අත්සන් කළ document එක. අවශ්‍ය නම් මේ ලේඛනය මට සභාගත කරන්නත් පුළුවන්. මේ අනුව 2,823දෙනෙක් මේ මොහොත වනවිට ඊශ්‍රායලයට ගිහිල්ලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, තව කාරණයක් සඳහන් කර තිබුණා. මේ G2G agreement එකේ සඳහන් වෙලා තිබෙනවාලු, සියයට 70ක් රජය හරහා යවන්න ඕනෑ, සියයට 30ක් තමයි ඒජන්සිය හරහා යවන්න පුළුවන් කියලා. නමුත් එහෙම කිසිම ගිවිසුමක් මෙතැනදී අත්සන් කරලා නැහැ. මේවා අපි බලයට එන්න කලින් අත්සන් කරපු ගිවිසුම්. අපි බලයට පැමිණියාට පසුව එක protocol එකක් අපි sign කළා. ඒ කොතැනකවත් සඳහන් වෙලා නැහැ සියයට 70ක් රජයෙන් යවන්න ඕනෑ කියලාවත්, සියයට 30ක් එළියෙන් යවන්න ඕනෑ කියලාවත්. එහෙම කොතැනකවත් සඳහන් කර නැහැ. ඒ නිසා, සිදු කර තිබෙන එම ප්‍රකාශය පිළිබඳවත් මේ සභාවේදී මගේ කනගාටුව පළ කරනවා.

මේ අවුරුද්ද ආරම්භයේ සිට ඊශ්‍රායලයේ යුදමය තත්ත්වයක් පවතින බව අපි දන්නවා. එම යුදමය තත්ත්වයත් එක්ක G2G ක්ෂේත්‍රයට අදාළව යම්කිසි ප්‍රමාදයක් සිද්ධ වුණා. අපි ඒක පිළිගන්නට ඕනෑ. විශේෂයෙන්ම ඔවුන්ගේ රජයේ මැදිහත්වීමෙන් තමයි මෙම තෝරා ගැනීම් සිදු කරන්නේ. එම තෝරා ගැනීම් සිදු කිරීමට අදාළ කණ්ඩායම් ලංකාවට ඇවිල්ලා තමයි එම සම්මුඛ පරීක්ෂණ කටයුතු සිදු කරන්නේ. ඔවුන්ගේ බෙන් ගුරියොන් ගුවන් තොටුපළ මාස කිහිපයක් වසා තිබුණා. ඒ නිසා මේ බඳවා ගැනීමේ කටයුතුවල යම්කිසි ප්‍රමාදයක් සිද්ධ වුණා. අපි ඒක පිළිගන්නට ඕනෑ. එසේ බඳවා ගැනීම්වල යම් ප්‍රමාදයක් සිද්ධ වුණත් 2,823දෙනෙක් ඒ රටට යැවීමට අපි සමත් වෙලා තිබෙනවා. ඒ වාගේම අපිට බලාපොරොත්තුවක් තිබෙනවා; target එකක් තිබෙනවා, මේ අවුරුද්දේ තවත් 10,000ක් යැවීමට. ඊට අදාළ කටයුතු අපි ඉතාම හොඳ විධියට කරගෙන යනවා. පසුගිය කාල වකවානුව තුළ එම කටයුතු අඩපණ වීම නිසා යවන්න බැරි වුණු සංඛ්‍යාව තව මාස කිහිපයක් ඇතුළත යැවීමට අපි බලාපොරොත්තු වෙනවා. අපි ඊට අදාළ කරන සාකච්ඡා කරගෙන යනවා.

ගරු කථානායකතුමනි, අපි මේ කටයුතු පෞද්ගලික අංශයට දෙනවා කියලා තව චෝදනාවක් එල්ල වෙලා තිබුණා. පෞද්ගලික අංශය කියන්නේ මෙතැන ලියාපදිංචි කළ කොටස්කරුවන්. ද්ගලික අංශයෙන් යවන්නේ ඔවුන් විසින් හොයා ගන්නා රක්ෂාවලට. ඔවුන් ගිහින් විවිධ ආයතනවල අය හම්බ වෙනවා; සාකච්ඡා කරනවා. රජයක් විධියට අපට තිබෙන්නේ ඒ රජයත් එක්ක සාකච්ඡා කරන අවස්ථාව විතරයි. නමුත් මම නායකත්වය දැරූ අපගේ කණ්ඩායම ගිය අවුරුද්දේ එහාට ගිහින් ඒගොල්ලන්ගේ රේඛීය ආයතනවල නිලධාරින් මුණ ගැසුණා; සාකච්ඡා කළා; වැඩිපුර රක්ෂා ප්‍රමාණයක් ඉල්ලා ගත්තා. හැබැයි, පෞද්ගලික අංශයෙන් කරන්නේ බිස්නස් එකක්, ගරු කථානායකතුමනි. පෞද්ගලික අංශයෙන් යනවා; ඒගොල්ලන් විවිධ අවස්ථා උපයෝගී කර ගන්නවා. නමුත් ඒ අවස්ථා සහ රජයක් විධියට අප විසින් උපයා ගත් අවස්ථා අතර කිසිම සම්බන්ධයක් නැහැ. මම මේ උත්තරීතර සභාවේ ස්ථිර ලෙසම එය කියන්නට කැමැතියි. ඒ දෙක අතර කිසිම සම්බන්ධයක් නැහැ.

ඒ වාගේම මේ තිබෙන වැරදි පූර්වාදර්ශ ගැනත් සඳහන් කළ යුතුයි. විශේෂයෙන්ම මීට කලින් ගිය එක එක නිලධාරින්, එක එක කණ්ඩායම් විසින් බලපෑම් සහගත අයුරින් කටයුතු කර තිබුණා. ඊයේ කරපු තව ප්‍රකාශයක් ගැනත් මට ඉතා කනගාටුයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, පිළිතුර කෙටි කරන්න.

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா)
(The Hon. Arun Hemachandra)

තවත් මන්ත්‍රීවරයෙක් කියලා තිබුණා, එතැන ඉන්න අපේ තානාපතිතුමා refugee status ගහන කට්ටියට විරුද්ධ වෙනවා කියලා. ඇත්තටම තානාපතිවරයාගේ රාජකාරිය, කාර්යභාරය තමයි අපේ රටේ සන්නාමය ඉතාම හොඳ මට්ටමින් පවත්වා ගෙන යාම. එතකොට ඒ තානාපතිතුමා තමන්ගේ රාජකාරිය තමයි කරලා තිබෙන්නේ. එහෙම තත්ත්වයන් තුළ තමයි අපි මේ බඳවා ගැනීම් කරන්නේ. මීට කලින් විවිධ විධියට lists හදාගෙන, "උස නම් සිකියුරිටි, කොට නම් කම්කරු" විධියට තමයි බඳවා ගැනීම් සිද්ධ වුණේ. නමුත්, දැන් එහෙම වෙන්නේ නැහැ. දැන් අපි ඉතාම විනිවිදභාවයක් සහිතව බඳවා ගැනීම් කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ පිළිතුර කෙටි කරන්න. ඔබතුමා අතුරු ප්‍රශ්නයට පිළිතුරු ලබා දීමට විනාඩි 4ක් අරගෙන තිබෙනවා.

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா)
(The Hon. Arun Hemachandra)

ගරු කථානායකතුමනි, දැන් website එක open කරනකොටම අපි disclaimer එකක් දෙනවා, "ඔබලා මේකට අයදුම් කරන එකම ඔබලාට සුදුසුකමක් නොවේ" කියන කාරණය අපි ලබා දෙනවා. ඒ

නිසා අපි හැමෝටම කියන්න කැමැතියි, "ඔබලා සුදුසු නම් ඔබලාට අවශ්‍ය කරන ඒ රක්ෂාව ලැබෙන්නට නියමිතයි" කියලා. ඒකට අදාළ කරන මැදිහත්වීම් අපි දිගටම කරගෙන යනවා. ඒ වාගේම පවතින තත්ත්වයත් සලකා බලා, අපේ පැත්තෙන් උපරිම මැදිහත්වීම් කරලා ඉතාම කෙටි කාලයක් තුළ අපේ ඉලක්කය සම්පූර්ණ කිරීමට අපි බලාපොරොත්තු වෙනවා.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු කථානායකතුමනි, මම හිතන විධියට ගරු නියෝජ්‍ය ඇමතිතුමා එතුමාටම රැකියාවක් හදා ගත්තා. එතුමා කොට නිසා, මේ වෙලාවේ එතුමා කම්කරු වුණා. එතුමා කිව්වා, "උස නම් සිකියුරිටි" කියලා. එතකොට ඉස්සරහා ඉන්න කෙනා සිකියුරිටි, ඔබතුමා කොට නිසා කම්කරු වෙලා තිබෙනවා. මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මම දැන් අහනවා.

ගරු කථානායකතුමනි, මේ ඊශ්‍රායල ප්‍රශ්නයත් එක්ක ඔබතුමන්ලා දැන් refugee status ගහලා තිබෙන කණ්ඩායමක් ඒ රටේ ඉන්නවා. ඒත් අපේ ශ්‍රී ලාංකිකයෝ. ඒගොල්ලෝ වැරැදි වෙන්න පුළුවන්, නිවැරැදි වෙන්න පුළුවන්. ඒක වෙනම කාරණාවක්. හැබැයි, අපේ ශ්‍රී ලාංකිකයාට එතැන යම් විධියක වැඩ පිළිවෙළක් හදන්න ඕනෑ. මේ වෙනකොට ඊශ්‍රායල රාජ්‍යය සූදානමින් ඉන්නවා, interview කරලා යම් කිසි වැඩසටහනක් කරන්න. ඒක ඔබතුමාත් දන්නවා. එතැනදී ඔබතුමන්ලා රටක් හැටියට ඉදිරිපත් වෙලා තිබෙනවා. "මේ රටේ ප්‍රශ්න නැහැ. ඕනෑම කෙනෙකුට මේ රටේ ජීවත් වෙන්න පුළුවන්, කොහේවත් යන්න අවශ්‍ය නැහැ" කියන කථාව ඔබතුමන්ලා ඉදිරිපත් කරලා තිබෙනවා. ඒක රාජ්‍යයක් හැටියට, එහෙම නැත්නම් ආණ්ඩුවක් හැටියට ඔබතුමන්ලා ඉදිරිපත් කරන්න ඕනෑ කියන කාරණාව ගැන මම විරුද්ධ වෙන්නේ නැහැ. නමුත්, ඒ අයට එතැන ඊළඟ පියවර ගන්න යම් කිසි වැඩ පිළිවෙළක් අවශ්‍යයි. මොකද, ඒ අයව එකවර ලංකාවට එව්වොත් ඒකත් බරපතළ ප්‍රශ්නයක්, ඒ වාගේම විශාල ප්‍රමාණයක් එතැන ඉන්නවා. ඒ වැරැද්ද නිවැරැදි කරන්න අවශ්‍ය කරන වැඩ පිළිවෙළත් තානාපති කාර්යාල හරහාම සිද්ධ විය යුතුයි.

ගරු කථානායකතුමනි, විදේශ රැකියා ක්ෂේත්‍රය කියන්නේ අනෙක් ආයෝජනවලට වඩා ඉතාම වෙනස් ක්ෂේත්‍රයක්. අපේ මානව සම්පත ගැන ලෝකයේ තිබෙන්නේ ලොකු විශ්වාසයක්. ඒ විශ්වාසයට අවශ්‍ය කරන සැපයීම අපට කරන්න පුළුවන්. ඒ විතරක් නොවෙයි. විදේශ විනිමය එකතු කර ගන්නත් වැඩ පිළිවෙළක් හදන්න අපට පුළුවන්.

ඒ හා සමානවම දැනුම ඒක රාශි කර ගත් ජනතාවක් බිහි කරන්නත් පුළුවන්. මොකද, ඒ රටවලින් ලබා ගන්නා දැනුම අපේ රටේ සංවර්ධනය සඳහා අවශ්‍යයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ඒ නිසා රටේ අනාගතයත් සැලසුම් කරන ගමන්, ඔබතුමන්ලා යම්කිසි වැඩ පිළිවෙළක් සකස් කරන්නේ නැද්ද, තානාපති කාර්යාල මීට වඩා රටවල් එක්ක සම්බන්ධීකරණය කරමින්, අලුත් රැකියා අවස්ථා සොයා ගැනීමට අදාළව? විශේෂයෙන්ම nursing සම්බන්ධව කථා කළා. නමුත් nursing සම්බන්ධයෙන් තවමත් ලංකාවේ නිසි ක්‍රමවේදයක් හදලා නැහැ; ලංකාවේ ඒ අය පුහුණු කරලා නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු කථානායකතුමනි, නියෝජ්‍ය ඇමතිතුමා ලොකු වෙලාවක් කථා කළා. ඉතින් මටත් අවස්ථාව දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක තමයි, ලොකු ලොකු වෙලාවල් ඉල්ලුවාම, ඒක බරපතළ ප්‍රශ්නයක් වනවා. ඔබතුමාට දැන් විනාඩි දෙකක් දුන්නා.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මෙහෙමයි, එතුමා ප්‍රශ්නයට අදාළ නැති කථාත් කිව්වා. *[බාධා කිරීම්]* උස, කොට කථා කියන්නේ, ප්‍රශ්නයට අදාළව නොවෙයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමාටත් ඒ දැනුම්දීම කළා. එතුමාට මම දෙපාරක් ඒ දැනුම්දීම කළා. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමා, එතුමාට මම දෙපාරක් ඒ දැනුම්දීම කළා. ඔබතුමා අතුරු ප්‍රශ්නය අසා අවසන් කරන්න.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ඔබතුමා ආණ්ඩුවේ තමයි. මම පිළිගන්නවා. හැබැයි, කථානායකතුමනි ඔබතුමා ආණ්ඩුවේ කියලා මට අසාධාරණකමක් කරන්න එපා. නියෝජ්‍ය ඇමතිතුමාට වාගේම පුංචි කාලයක් මටත් දෙන්න. ආණ්ඩුවේ පැත්ත රකින්න එපා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, ඔබතුමාට විනාඩි දෙකක් දුන්නා. ගරු මන්ත්‍රීතුමා, දැන් ඒ විනාඩි දෙක ඉවරයි. නියෝජ්‍ය ඇමතිතුමාත් කාලය කෑවා. එතුමා අතුරු ප්‍රශ්නයට විනාඩි පහක් ගත්තා. ඒකත් වැරදියි.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
වැරදියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
වැරදි නම් වැරදියි තමයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු කථානායකතුමා, ඔබතුමාව මැද පුටුවේ තියලා තිබෙන්නේ ඇත්තටම ඔබතුමා දෙපැත්තටම සමාන වෙන්න ඕනෑ නිසා. දකුණයි, වමයි දෙකම සමාන කරන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අතුරු ප්‍රශ්නය අසා අවසන් කරන්න.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මම දැන් ඉවර කරන්නම්. මට තත්පර කිහිපයක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට තව තත්පර 30ක් දෙනවා.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ඇත්තටම වැදගත් දේවල් කථා කරන්න දෙන්නේ නැහැ නේ. ඕපාදූප කථා කරන්නත් බැහැ නේ. වැදගත් දේවල් කථා කරන්න දෙන්නේ නැහැ, කථානායකතුමා නතර කරනවා. කමක් නැහැ.

විශේෂයෙන්ම තානාපති කාර්යාල සම්බන්ධීකරණය කරගෙන, ලෝකයේ රැකියා අවස්ථා තිබෙන අනික් රටවල් ටික සම්බන්ධීකරණය කරගෙන, ශ්‍රී ලාංකිකයන්ට මීට වඩා රැකියා අවස්ථා ලබා දෙන්න අවශ්‍ය වැඩ පිළිවෙළක් සකස් කරනවාද කියන එක තමයි දෙවැනි අතුරු ප්‍රශ්නය හැටියට මම අහන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා, කෙටියෙන් පිළිතුර ලබා දෙන්න.

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா)
(The Hon. Arun Hemachandra)
ගරු කථානායකතුමනි, refugee status අර්බුදය කියන්නේ, නිර්මාණය කරපු එකක්. මම එක උදාහරණයක් කියන්නම්. නුසුදුසු පුද්ගලයෝ මීට කලින් විදේශ ශ්‍රමිකයින් විධියට යවලා තිබෙනවා. නමුත් ඒ පුද්ගලයන්ට අපි බැණලා වැඩක් නැහැ. තෝරා ගැනීමේ පටිපාටි සහ ඒ පුද්ගලයන්ගේ දැනුවත් කිරීමට අදාළව ගැටලු රාශියක් එතැන නිර්මාණය වෙලා තිබුණා. කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළව මීට කලින් 2024 වර්ෂයේ 2,069ක් යවලා තිබුණත්, දැන් තත්ත්වය ගත්තොත්, 100කට අඩු සංඛ්‍යාවක් තමයි එතැන වැඩ කරන්නේ. හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමනි, ඔබතුමා ගිය සැරේ ප්‍රශ්නයක් අහලා තිබුණා, දැන් ශ්‍රමිකයින් විදේශවලට යවනවාද කියලා. ඔව්, මේ අවුරුද්දේ මේ වනකොට 18දෙනෙක් අපි යවලා තිබෙනවා. අපි සමත් වෙලා තිබෙනවා, එතැනට එන්න.

ගරු කථානායකතුමනි, නමුත් මෙතැන ප්‍රශ්නයක් තිබෙනවා. Refugee status, එහෙම නැත්නම් සරණාගතයෙක් විධියට ඉල්ලීමක් කරපු කෙනෙකුට සේවයක් ලබා දීමට අදාළව අපට ප්‍රශ්නයක් නැහැ. ඒ වාගේම තමයි අපි රජයක් විධියට බැඳිලා ඉන්නවා, ඔවුන්ගේ ප්‍රශ්නවලට උත්තර හොයන්නත්. නමුත්, සංවිධානාත්මකව සරණාගතයින් බිහි කරන එකට ආණ්ඩුවක් විධියට අපි විරුද්ධයි. ඒ නිසා අපි ඒ කටයුත්ත හොඳ විධියට කරගෙන යනවා. ඒක ඉතාම පැහැදිලිව මම කියන්න ඕනෑ. කලින් හිටපු විවිධ රාජ්‍ය තන්ත්‍රික නිලධාරිනුත්, ඒ කියන්නේ දේශපාලනික පත්වීම් අරගෙන ගිය නිලධාරිනුත් සම්බන්ධ වෙලා තිබෙනවා, සංවිධානාත්මකව සරණාගතයන් බිහි කරන ක්‍රියාවලියට. නිසි පරිදි නිසි ක්‍රමවේදය පැහැදිලි කරනවා වෙනුවට, ඔයගොල්ලන්ට ගිහිල්ලා refugee status ලබා ගන්න පුළුවන් කියන කාරණාව කියලා තමයි සල්ලි අරගෙන යවලා තිබෙන්නේ. හිටපු ආණ්ඩුවල නිලධාරින්, ඒ වාගේම නොයෙක් දේශපාලනඥයින්, ඒ වාගේම දේශපාලනික පත්වීම් ලබා ගත් රාජ්‍ය තන්ත්‍රික නිලධාරිනුත් - සියලු රාජ්‍ය නිලධාරින් නොවෙයි - ඒකට සම්බන්ධ වෙලා තිබෙනවා. නමුත් අපි මේ ක්‍රියාවලිය සමස්තයක් විධියට පරාජය කරනවාමයි.

ඒ වාගේම අපගේ තානාපති කාර්යාල සම්බන්ධ කරගෙන රැකියා අවස්ථා උත්පාදනය කර ගැනීමට අදාළවත් ප්‍රශ්නයක් මතු කරලා තිබෙනවා. ඔව්, විදේශ කටයුතු සහ විදේශ රැකියා කියන අංශ දෙකම දැන් ඒකාබද්ධ වෙලා එක් අමාත්‍යාංශයක් යටතේ එන්නේ. එක අමාත්‍යවරයෙක් ඉන්නේ. ඒ වාගේම නියෝජ්‍ය අමාත්‍යවරයා විධියට මම ඒකට මැදිහත් වනවා. ගරු විජිත හේරත් ඇමතිතුමාගේ මූලිකත්වයෙන් අපි මේ සම්බන්ධව අපේ සියලුම තානාපති කාර්යාල එක්ක සාකච්ඡාවක් අරගෙන පැහැදිලි කළා. ඒකේ ප්‍රධාන ජයග්‍රහණයක් විධියට තායිලන්තයෙන් අපට රැකියා ගණනාවක් දැන් ලැබී තිබෙනවා. ඒ සම්බන්ධවත් අපි දැන් මැදිහත් වන්න පටන් අරගෙන තිබෙනවා.

අපි දන්නවා, යම් කිසි අඩුපාඩුවක් තිබෙනකොට විශේෂයෙන්ම යුරෝපා රටවල් අපෙන් බඳවා ගැනීම් කරන්න කැමැති නැහැ කියලා. ඒ නිසා අපි දැන් Private Health Services Regulatory Council - PHSRC - එක හරහා ලියාපදිංචිය ලබා ගත්, පෞද්ගලික අංශයේ උපාධි ලබා ගත් හෙදියන් යැවීමට අදාළවත්, ඒ වාගේම සාත්තු සේවිකාවන් යැවීමට අදාළවත් කටයුතු කරමින් ඉන්නවා. මා හිතනවා, ඉතාම කෙටි කාලයක් තුළ එහි ප්‍රගතිය මේ උත්තරීතර සභාවට ඉදිරිපත් කරන්න පුළුවන් වෙයි කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4 -1066/2025- (1), ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා.

**ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)
Hon. Speaker, I ask Question No. 4.

**ගරු සුන්දරලිංගම් ප්‍රදීප් මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுந்தரலிங்கம் பிரதீப் - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் பிரதி அமைச்சர்)
(The Hon. Sundaralingam Pradeep - Deputy Minister of Plantation and Community Infrastructure)
ගරු කථානායකතුමනි, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## එක් පාසලක වසර අටකට වැඩි කාලයක් සේවය කරන විදුහල්පතිවරුන්: ස්ථානමාරු
## ஒரே பாடசாலையில் எட்டு வருடங்களுக்கும் மேலாக சேவையாற்றும் அதிபர்கள்: இடமாற்றம்
## PRINCIPALS SERVING FOR MORE THAN EIGHT YEARS IN ONE SCHOOL: TRANSFERS

1363/2025

**5. ගරු තුරෙයිරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) යම් පාසලක අවුරුදු 08කට වැඩි කාලයක් සේවය කරමින් සිටින විදුහල්පතිවරුන්ගේ සංඛ්‍යාව එක් එක් පළාත අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) විදුහල්පතිවරයෙක් එකම පාසලක අවුරුදු 08කට වැඩි කාලයක් අඛණ්ඩව සේවයේ යෙදීම හේතුවෙන් උද්ගත වී ඇති ගැටලු කවරේද;

(iii) 2012 වර්ෂයේදී අධි සේවක පදනම මත, විදුහල්පතිවරුන් ලෙස අන්තර්ග්‍රහණය කරනු ලැබ ඇති තැනැත්තන්හට උසස්වීම් ලබා දී ඇතත්, ඔවුන්ගේ සේවයට අදාළ පරිපාලන දීමනා ලබා දී නොමැති බව දන්නේද;

(iv) ඒ සඳහා ඇති බාධා කවරේද;

(v) පාසල්වල පවතින විදුහල්පති පුරප්පාඩු සඳහා, අධි සේවක පදනමේ සිටින විදුහල්පතිවරුන්ට අයදුම් කිරීමට පවතින බාධා කවරේද;

(vi) අවුරුදු 08කට වැඩි කාලයක් එකම පාසලක අධි සේවක පදනම මත සේවය කරන විදුහල්පතිවරුන්ට, ස්ථාන මාරු ලබා දීමේ හැකියාව කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) ஏதேனும் பாடசாலையொன்றில் 08 வருடங் களுக்கும் அதிகமான காலம் சேவையாற்றி வருகின்ற அதிபர்களின் எண்ணிக்கை மாகாண ரீதியாக வெவ்வேறாக யாது என்பதையும்;

(ii) அதிபர் ஒருவர் ஒரே பாடசாலையில் தொடர்ச்சி யாக 08 வருடங்களைவிட அதிகமான காலம் சேவையாற்றுவதால் ஏற்பட்டுள்ள பிரச்சினைகள் யாவை என்பதையும்;

(iii) 2012ஆம் ஆண்டு மிகை ஊழியர் அடிப்படையில் அதிபர்களாக உள்ளீர்க்கப்பட்டவர்களுக்குப் பதவியுயர்வு வழங்கப்பட்டுள்ளபோதும், அவர்களுடைய சேவைக்கான நிருவாகக் கொடுப்பனவுகள் வழங்கப்படாததை அறிவாரா என்பதையும்;

(iv) அதற்கான தடைகள் யாவை என்பதையும்;

(v) பாடசாலைகளில் நிலவும் அதிபர் வெற்றிடங் களுக்கு, மிகை ஊழியர் அடிப்படையில் சேவையாற்றும் அதிபர்கள் விண்ணப்பிப்பதற் குள்ள தடைகள் யாவை என்பதையும்;

(vi) 0 8 வருடங்களுக்கும் அதிகமாக ஒரே பாடசாலையில் மிகை ஊழியர் அடிப்படையில் சேவையாற்றும் அதிபர்களுக்கு இடமாற்றம் வழங்குவதற்குள்ள இயலுமை யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) the number of principals who have been serving in a school for more than eight years, separately for each province;

(ii) the problems that have arisen because a principal has served in the same school continuously for more than eight years;

(iii) whether she is aware that while promotions have been given to those who have been absorbed as principals on supernumerary basis in 2012, they have not received the administrative allowances related to their service;

(iv) the obstacles for that;

(v) the obstacles preventing principals on supernumerary basis from applying for the vacant posts of principals in schools; and

(vi) the possibility of granting transfers to principals who have been serving in the same school on supernumerary basis for more than eight years?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன - கல்வி, உயர் கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Madhura Senevirathna - Deputy Minister of Education and Higher Education)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i)

| අනු අංකය | පළාත | වසර 08කට වැඩි කාලයක් පාසලේ ස්ථිර විදුහල්පති තනතුරේ සේවය කරන නිලධාරීන් ගණන | | |
|---|---|---|---|---|
| | | ජාතික පාසල් | පළාත් පාසල් | එකතුව |
| 1 | බස්නාහිර | 02 | 217 | 219 |
| 2 | වයඹ | 01 | 35 | 36 |
| 3 | දකුණ | නැත | 36 | 36 |
| 4 | නැගෙනහිර | නැත | 18 | 18 |
| 5 | උතුර | 01 | 52 | 53 |
| 6 | උතුරු මැද | නැත | 50 | 50 |
| 7 | ඌව | නැත | 57 | 57 |
| 8 | සබරගමුව | 02 | 49 | 51 |
| 9 | මධ්‍යම | නැත | 117 | 117 |
| | එකතුව | **06** | **631** | **637** |

[ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා]

(ii) පාසල තුළ ඒකාකාරී කළමනාකරණයක් හා පරිපාලන ඒකාධිකාරයක් ගොඩනැඟීම කියන කාරණාවත්, මානව සම්පත උපයෝජනයේදී අතෘප්තිදායක තත්ත්වයන් හටගැනීම නිසා එය පාසල්වල අභ්‍යන්තර පරිපාලනයට අහිතකර ලෙස බලපෑම කියන කාරණාවත්, රාජකාරි කටයුතුවල ඒකාකාරී ලෙස නිරත වීම නිසා රාජකාරි කටයුතු නීරස වීම, අකාර්යක්ෂමතාව, හැකියාවන්ගෙන් ප්‍රයෝජන ගැනීමට තිබෙන අවස්ථා අඩු වීම සහ පාසල් පරිපාලනය පිළිබඳ අත්දැකීම් ලබා ගැනීමට ඇති අවස්ථා සීමා වීම වැනි ගැටලු ඇති වීමේ හැකියාවක් තිබෙන බව නිරීක්ෂණය කරන අතර, ඕනෑම වෘත්තියක දීර්ඝ කාලයක් රැඳී සිටින විට විවිධ වංචා, දූෂණ හා මූල්‍ය අක්‍රමිකතා සිදු වීමට ඇති හැකියාවද වැඩියි. මේ වාගේ තත්ත්වයන් තමයි තිබෙන්නේ. විශේෂයෙන්ම රාජ්‍ය සේවයේ එක තැනක රැඳී සිටිනකොට ඇති විය හැකි තත්ත්වය විදුහල්පතිවරුන්ටත් ඒ විධියටම බලපානවා.

(iii) මේ සම්බන්ධයෙන් අපි පාර්ලිමේන්තුවට තුන් වතාවක් පමණ පිළිතුරු සපයා තිබෙනවා.

මෙම ප්‍රශ්නයෙහි පරිපාලන දීමනා ලෙස අර්ථ දක්වා ඇත්තේ, ස්ථිර විදුහල්පතිවරුන් වෙත ලබා දෙන විශේෂ දීමනාව බව උපකල්පනය කළහොත්, 2012.08.08 දින සිට අධි සේවක පදනම මත විදුහල්පති පත්වීම් ලබා දී ඇති නිලධාරින්ගේ පත්වීම් ලිපියේ විධිවිධාන අනුව ඔවුන්ට විදුහල්පති තනතුරට හිමි වැටුප ලබා ගැනීමට පමණක් හිමිකම ඇති අතර, ඔවුන්ට මෙම විදුහල්පති විශේෂ දීමනාව ලබා දීමේ හැකියාවක් නැත.

නමුත්, මෙම නිලධාරින්ගේ ඉල්ලීම් සලකා බලා අදාළ අවශ්‍යතා සම්පූර්ණ කර ඇත්නම්, අධි සේවක පදනම මත ශ්‍රේණි උසස්වීම් ලබා දීමට 2021.06.23 හා 2022.06.02 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණ මඟින් සහනයක් ලබා දී ඇත.

(iv) 2012.08.08 දින අධි සේවක පදනම මත විදුහල්පති තනතුරට පත්වීම් ලැබුවද, මෙම නිලධාරින් ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාවේ නිත්‍ය තනතුරු සඳහා හෝ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ අනුමත කාර්ය මණ්ඩලය සඳහා අන්තර්ග්‍රහණය කර නැත.

ඒක තමයි මෙතැන තිබෙන තාක්ෂණික ගැටලුව, ගරු මන්ත්‍රීතුමනි.

එවකට රජයේ පාසල්වල ස්ථිර විදුහල්පති තනතුරේ රාජකාරි ආවරණය කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවයේ නිලධාරින්ට ඔවුන්ගේ ඉල්ලීම මත යොමු කළ අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව ඔවුන් කරන ලද සේවය ඇගැයීමක් ලෙස මෙලෙස පත්වීම් ලබා දී ඇත. නමුත් මෙම නිලධාරින් සඳහා ඉහත උපදෙස්වලට පටහැනිව ඇතැම් පළාත් සභා විසින් මෙම විදුහල්පති විශේෂ දීමනාව ගෙවා ඇති බව ඔබතුමාත් දන්නවා. ඒ සම්බන්ධයෙන් මධ්‍යම පළාතේ විගණන වාර්තාවක් තිබෙනවා. ඒ අනුව මේ වන විට එම ගෙවීම් නතර කරලා තිබෙනවා. එම තීරණය අරගෙන තිබෙන්නේ මුදල් රෙගුලාසිවලට අනුකූලවයි.

(v) නැවත වාරයක් 2012.08.08 දින අධිසේවක පදනම මත විදුහල්පති තනතුරට පත්වීම් ලද නිලධාරියෙකුට නාමිකව එම තනතුර හිමි වුවද, සේවා ව්‍යවස්ථාවට අනුකූලව බඳවා ගත් නිලධාරියෙකුගේ ජ්‍යෙෂ්ඨත්වයට හා හිමිකම් සඳහා එය බාධාවක් නොවිය යුතුය.

තවද, ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරින් විසින් ඉල්ලුම් කර ඇති පුරප්පාඩු පවතින පාසල් සඳහා නිලධාරින් පත් නොකිරීමට හා එවැනි පාසල් සඳහා ස්ථාන මාරුවීම් ලබා නොදීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිර්දේශ කර, තීරණය කර ඇත.

(vi) එවැනි නිලධාරින් සඳහා ස්ථාන මාරුවීම් නොවෙයි, සුහද මාරු ලබා ගැනීමේ හැකියාවක් තිබෙනවා. ඒ වාගේම තමයි ඉදිරියේදී අමාත්‍ය මණ්ඩල තීරණ හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් පරිදි ශ්‍රී ලංකා විදුහල්පති සේවයට නවක නිලධාරින් බඳවා ගැනීම සඳහා අංක 3463 හා 2025.11.14 දිනැති ගැසට් නිවේදනය අනුව අයදුම්පත් කැඳවා සීමිත ලිඛිත තරග විභාගය 2026.06.07 දින පවත්වා ඇත. ඒ අනුව විදුහල්පති සේවයේ දැනට පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීමට ඉදිරියේදී සම්මුඛ පරීක්ෂණ පවත්වා නවක නිලධාරින් බඳවා ගැනීම සිදු කෙරෙනු ඇත.

අපි දන්නවා, උතුරු පළාතේ විතරක් නොවෙයි, අනෙකුත් පළාත්වලත් විදුහල්පති සේවයේ සිටිය යුතු නිලධාරින් පාසල්වල නොමැති බව. ඒ සම්බන්ධයෙන් සැලකිය යුතු මට්ටමේ විසඳුමක් ලබාගන්න අපට පුළුවන් වෙයි.

(ආ) අදාළ නොවේ.

**ගරු තුරෛරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

கௌரவ பிரதி அமைச்சர் அவர்களே, உங்களுடைய பதிலின் அடிப்படையில் இவர்களுக்கு நியாயமான தீர்வு இல்லை என்றுதான் நான் நினைக்கின்றேன். மிகை ஊழியர் அதிபர்களின் விடயத்தில், ஓர் அரசாக தங்களின் நிலைப்பாடு பாதிக்கப்பட்டோரின் பக்கம் நிற்பதாக அமைய வேண்டுமென நான் எதிர்பார்க்கின்றேன். இவர்கள் இப்பொழுதும் இடர்படுகின்ற இரண்டு பிரச்சினைகளில் ஒன்று, இவர்களுக் குரிய நிருவாகக் கொடுப்பனவு கிடைக்கப் பெறாமை. இவர்களும் ஏனைய அதிபர்களைப் போன்று நூற்றுக் கணக்கான மாணவர்கள், ஆசிரியர்கள் எனப் பெருமள வானோருக்குத் தலைமை வகிக்கின்றார்கள். இருந்தபோதிலும், ஏனைய அதிபர்கள் பெறும் நிருவாகக் கொடுப்பனவு இவர்களுக்கு இதுவரை வழங்கப்படாதுள்ளது.

அண்மைய சில ஆண்டுகளாக வட மாகாணக் கல்வி அமைச்சால் கோரப்படும் அதிபர் பதவிக்கான விண்ணப்பங்களில், மிகை ஊழியர் தவிர்ந்த அதிபர்கள் மட்டுமே விண்ணப்பிக்க முடியுமெனக் குறிப்பிடப்படுகின்றது. கல்விச் சூழமைவில் இதுவொரு நவீன தீண்டாமையாகவே பார்க்கப்படுகின்றது. இவ்வாறு இவர்கள் புறக்கணிக்கப் படுவது நியாயமா? என உங்களிடம் கேட்கின்றேன். எனவே, இந்த விடயத்தில் நீங்கள் கவனமெடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். ஒரே மாகாணத்தில் பணியாற்றும் அதிபர்களில் சில அதிபர்களை ஒரு மாதிரியாகவும், ஏனைய அதிபர்களை வேறொரு மாதிரியாகவும் நடத்த வேண்டாமென தயவாகக் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ අතුරු ප්‍රශ්නය සම්බන්ධයෙන් අපි පාර්ලිමේන්තුවේදීත් කිහිප විටක්ම කථා කර තිබෙනවා. ඇත්තටම මෙයට බලපාන මූලික කාරණය වෙන්නේම බඳවා ගැනීමේ කොන්දේසි. එතැනදී මම කලින් සඳහන් කළා වාගේ පරිපාලන දීමනා සම්බන්ධයෙන් දැනට හිමිකමක් නැහැ. මේ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේදී කාරණා කිහිපයක් මතු වුණු නිසා අපි මෑතකදී නැවත වාරයක් විශේෂයෙන්ම අමාත්‍යාංශ ලේකම්තුමාත් මැදිහත් වෙලා එම අධි සේවක පදනමේ සිටින විදුහල්පතිවරුන්ට මුදල් රෙගුලාසිවලට අනුකූලව යම්කිසි ආකාරයක සහනයක් සැලසිය හැකි ද කියලා හැම ආකාරයකින්ම හොයා බැලුවා. අපට මුදල් රෙගුලාසිවලට අනුකූලව තමයි ක්‍රියා කළ හැක්කේ, ගරු කථානායකතුමනි. අපි ඒ සම්බන්ධයෙන් හොයා බැලුවා.

මූලිකව බඳවා ගැනීමේ ක්‍රියාවලිය මත තිබෙන චක්‍රලේඛ සහ මුදල් රෙගුලාසි මත අපට දැනට පරිපාලන දීමනා දීමේ හැකියාවක් නැහැ. ඒක නිශ්චිතයි. ගරු කථානායකතුමනි, අපි මේ වෙද්දි කිහිප විටක්ම අධි සේවක පදනමේ සිටින විදුහල්පතිවරු එක්ක සාකච්ඡා කරලා තිබෙනවා. මේ සම්බන්ධයෙන් නිලධාරි මට්ටමින් සාකච්ඡා කරලාත් තිබෙනවා. ඒ වාගේම රාජ්‍ය සේවා කොමිෂන් සභාව එක්කත් සාකච්ඡා කරලා තිබෙනවා. එම පිරිස විදුහලේ සැලකිය යුතු මට්ටමේ රාජකාරි ප්‍රමාණයක් ආවරණය කරනවා. අපි ඒ සම්බන්ධයෙන් ඇති හැකියාවන් සියල්ල නිරීක්ෂණය කර තිබෙනවා.

දෙවැනි කාරණාව මෙයයි. විදුහල්පතිවරුන් මාරු කිරීමේදී පළාත් මට්ටමෙන් සමහර නිර්ණායක තිබෙනවා. හැබැයි, සමහර විදුහල්වල අවුරුදු 15ක්, 20ක් තිස්සේම විදුහල්පතිවරුන් නැහැ. නිසි පරිදි ඉල්ලුවේ නැත්නම් විදුහල්පති තනතුරේ තිබෙන පුරප්පාඩුව සම්පූර්ණ වෙන්නෙත් නැහැ. ඒ නිසා අපි මේ මස 11වැනි දා රාජ්‍ය සේවා කොමිෂන් සභාවත් එක්ක සාකච්ඡාවක් කරනවා, ඉල්ලන්නෙත් නැති විදුහල්වලට අපි විදුහල්පතිවරුන් සේවයේ යොදවන්නේ කොහොමද කියන කාරණාව සම්බන්ධයෙන්.

**ගරු තුරෙයිරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

நன்றி! கௌரவ பிரதி அமைச்சர் அவர்களே, என்னுடைய இரண்டாவது மேலதிக வினாவை கௌரவ பத்மநாதன் சத்தியலிங்கம் அவர்கள் கேட்பார்.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)

கௌரவ சபாநாயகர் அவர்களே! கௌரவ துரைராசா ரவிகரன் அவர்களால் கேட்கப்பட்ட கேள்வி மிகவும் முக்கிய மானது. இது தொடர்பாக கௌரவ பிரதமர் அவர்களோடும் கௌரவ கல்விப் பிரதி அமைச்சர் அவர்களோடும் நான் ஏற்கனவே பேசியிருக்கிறேன். தயவுசெய்து, இது தொடர்பில் ஒரு முடிவை எடுங்கள்!

நான் கேட்கப்போகும் விடயம் சற்று வித்தியாசமானது. A/L உயிரியல் வினாத்தாளில் - Biology paperஇல் - கடந்த பல வருடங்களாகத் தொடர்ச்சியாக translation mistakes வருகின்றது. அதாவது, ஆங்கிலத்தில் தயாரிக்கப்படுகின்ற வினாத்தாள் தமிழ் மொழிக்கு மாற்றப்படும்போது, பாரிய மொழிபெயர்ப்புப் பிழைகள் ஏற்படுகின்றன. இதனால் மாணவர்கள் கணிசமான புள்ளிகளை இழக்கிறார்கள். உதாரணத்துக்கு, 2025ஆம் ஆண்டுக்குரிய A/L Biology paperஐ எடுத்துக்கொள்வோம். இந்த வினாத்தாள் மூன்று மொழிகளிலும் என்னிடம் இருக்கின்றது. இதன் MCQ paperஇல் முதலாவது வினாவுக்குரிய விடைகளை எடுத்துக்கொள்வோம். ஆங்கில மொழிமூல வினாத்தாளில் - original paperஇல் - "nuclear envelope" என்று குறிப்பிடப்பட்டுள்ளது. இதற்குரிய தமிழாக்கம் “கருச்சூழி” என தமிழ் மொழிமூல வினாத்தாளில் குறிப்பிடப்பட்டுள்ளது. கருச்சூழிக்கு ஆங்கிலத்தில் "nucleus" எனச் சொல்லப்படும். Nucleus என்பது வேறு; nuclear envelope என்பது வேறு. Nucleus is within the nuclear envelope. So, it is a big translation mistake. That is one example.

நான் இன்னோர் உதாரணத்தையும் சொல்கின்றேன். இதே Biology paperஇல் question no. (3)க்குரிய விடைகளை எடுத்துக்கொள்வோம். ஆங்கில மொழிமூல வினாத்தாளில், "irritability and coordination" எனக் குறிப்பிடப்பட்டு இருக்கிறது. இது தமிழ் மொழிமூல வினாத்தாளில் எப்படி இருக்கின்றது என்றால், “உறுத்துணர்ச்சி, இயைபாக்கம்” என்றுதான். இயைபாக்கம் என்பது "adaptation", not "coordination". ஆங்கில மொழிமூல question paperஇல், "irritability and coordination" என்று குறிப்பிடப்பட்டுள்ள அதேநேரம், தமிழ் மொழிமூல வினாத்தாளில் "coordination"க்குப் பதிலாக "adaptation" என்ற அர்த்தத்தில் "இயைபாக்கம்" எனக் குறிப்பிடப்பட்டுள்ளது. MCQ வினாத்தாளில் ஒவ்வொரு வினாவுக்கும் ஒவ்வொரு புள்ளி வீதம் வழங்கப்படும். இந்த வினாத்தாளில் மாத்திரம் 27 கேள்விகளில் பிழை இருக்கின்றது. A/L பரீட்சை என்பது, மாணவர்களின் எதிர்காலத்தைத் தீர்மானிக்கின்ற பரீட்சை! Biology MCQ வினாத்தாளில் 27 marks இல்லாமல் போகின்றது என்று சொன்னால், அது தமிழ் மொழிமூல மாணவர்களுக்கு இழைக்கப்படுகின்ற மிகப் பெரிய அநீதியாகும்.

நான் இங்கு பேசிக்கொண்டு இருந்தபோது, கௌரவ சாமர சம்பத் தசநாயக்க அவர்கள் என்னிடம் வந்து சொன்னார், இம்முறை நடக்கவிருக்கின்ற A/L Examக்குரிய நேர அட்டவணையில், பாளி மொழியும் சித்திரக்கலையும் ஒரே நாளில் ஒரே நேரத்தில் நடைபெறக்கூடிய வகையில் இடப்பட்டுள்ளதாக. அப்படியென்றால், இந்த இரண்டு பாடங்களையும் எடுக்கும் ஒரு மாணவன், எவ்வாறு ஒரே நேரத்தில் இரண்டு வினாத்தாள்களுக்கும் தோற்றுவது என்ற பிரச்சினை இருக்கின்றது. கௌரவ கல்விப் பிரதி அமைச்சர் அவர்களே, வினாத்தாள்களில் ஏற்படும் மொழிபெயர்ப்புப் பிழைகள் சம்பந்தமாக நான் உங்களோடு பேசியிருக்கிறேன். இனியாவது வினாத்தாள்களில் translation mistakes இடம்பெறாமல் பார்த்துக் கொள்ளுங்கள்! இவ்வாறான தவறு களால் பல மாணவர்களின் எதிர்காலம் பாதிக்கப்படுகின்றது. தயவுசெய்து, இதில் கவனம் செலுத்துங்கள்!

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ඒ ඩොක්ටර්ට මම තමයි කිව්වේ, මෙවර උසස් පෙළ විභාගයේ චිත්‍ර සහ පාලි භාෂාව සඳහා වන papers එකම දවසේ - 14වැනි දා - එකම වෙලාවට වැටිලා කියලා. ඒක හාමුදුරුවන්ට ප්‍රශ්නයක්. මොකද, හාමුදුරුවරු පාලි භාෂාව සහ චිත්‍ර කියන දෙකම එකට කරන්නේ.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)
ගරු කථානායකතුමනි, මම මේ ප්‍රශ්නවලට පිළිතුරු දෙන්නම්. ගරු කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමිය මේ සම්බන්ධව සාකච්ඡා කර තිබෙනවා. එක හාමුදුරු නමයි ඉන්නේ. ඒ හාමුදුරු නම චිත්‍ර කරනවා, පාලි භාෂාව කරන්නේ නැහැ. ඕක තමයි නිශ්චිත පිළිතුර.

දෙවෙනි කාරණාව ගැන නම් අපි දීර්ඝව ගිය අවුරුද්දේ සාකච්ඡා කර තිබෙනවා. විශේෂයෙන්ම උසස් පෙළ විතරක් නොවෙයි, අනෙකුත් ප්‍රශ්න පත්තරවලත් ඒ වචනාර්ථයෙන්ම පරිවර්තනය - translation - වනකොට යම් කිසි ගැටලුකාරී තත්ත්වයක් උතුරු පළාතේ වාර්තා වුණා කියලා අපට සඳහන් වෙලා තිබුණා. අපි විභාග දෙපාර්තමේන්තුවත් එක්ක මේ සම්බන්ධයෙන් සාකච්ඡා කර තිබෙනවා. එකක් තමයි, දෙමළ භාෂාව සම්බන්ධයෙන් වන කාරණය. අනෙක් එක තමයි, වචනාර්ථයෙන්ම translation එකක් නොවෙයි කියන කාරණය. අනෙක් එක, විශේෂ අවශ්‍යතා සහිත ශිෂ්‍යයන්ට වන අසාධාරණයක් පිළිබඳ කාරණය. ඒ නිසා අපි හිතනවා, පාරිභාෂික වචනම, glossary එකම පාවිච්චි කරලා තමයි උසස් පෙළ විභාගය සඳහා ප්‍රශ්න පත්‍ර සැකසෙන්නේ කියලා. මේ සම්බන්ධයෙන් සංවේදීයි. ඒ නිසා මේ සම්බන්ධයෙන් මෙවර උත්තරයක් ලැබෙයි කියලා අපි හිතනවා.

## සමෘද්ධි සංවර්ධන නිලධාරින්: පුරප්පාඩු සහ උසස්වීම්
### சமுர்த்தி அபிவிருத்தி உத்தியோகத்தர்கள்: வெற்றிடங்களும் பதவியுயர்வும்
### SAMURDHI DEVELOPMENT OFFICERS: VACANCIES AND PROMOTIONS

1364/2025

**6. ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වර්ෂ 30ක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ සමෘද්ධි සංවර්ධන නිලධාරින් 18,000ක් පමණ සේවයේ නිරතව සිටින බවත්, මේ දක්වා ඔවුන්ට කිසිදු උසස්වීමක් ලබාදී නොමැති බවත් දන්නේද;

(ii) එම සේවයේ උසස්වීම් ලබාදීම ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යාංශය විසින් සිදු කරනු ලබන්නේද;

(iii) එම සේවයේ මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iv) එම පුරප්පාඩු පිරවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் கடந்த 30 வருடங்களாக சுமார் 18,000 சமுர்த்தி அபிவிருத்தி உத்தியோகத்தர்கள் சேவையில் ஈடுபட்டுள்ளதோடு, இதுவரையில் அவர்களுக்கு எவ்விதமான பதவியுயர்வுகளும் வழங்கப்படவில்லை என்பதை அறிவாரா என்பதையும்;

(ii) கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சினால் மேற்படி சேவைக்கான பதவியுயர்வுகள் வழங்கப் படுகின்றதா என்பதையும்;

(iii) மேற்படி சேவையில் தற்போது நிலவும் வெற்றிடங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iv) மேற்படி வெற்றிடங்களை நிரப்புவதற்கு எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Rural Development, Social Security and Community Empowerment:

(a) Will he inform this House -

(i) whether he is aware that approximately 18,000 Samurdhi Development Officers in Sri Lanka have been serving in that post throughout 30 years without any promotions to date;

(ii) whether the responsibility for giving promotions to officers of the aforesaid service lies with the Ministry of Rural Development, Social Security and Community Empowerment;

(iii) the number of vacancies existing in the said service at present; and

(iv) the measures that have been taken to fill those vacancies?

(b) If not, why?

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව අපි ආරම්භ කරන්නේ 2014 ජනවාරි 03වැනි දා. එදා සිට මේ වනකල් කිසිදු උසස්වීමක් ලබා දීලා නැහැ, ශ්‍රේණි

උසස්වීම් හැර. ඊට පෙර 1995 සිට 2013 අවසානය දක්වා ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය පැවති කාලයේ උසස්වීම් ලබා දී තිබෙනවා. නමුත්, 2014න් පසු සමෘද්ධි සංවර්ධන නිලධාරින්ට උසස්වීම් ලබාදීමේ ක්‍රමවේදයක් පැවතිලා නැහැ, ගරු කථානායකතුමනි.

(ii) මේ නිලධාරින්ට උසස්වීම් ලබාදීම සඳහා වැඩ පිළිවෙළක් - උසස්වීම් පටිපාටියක් - අපි මේ වෙනකොට සකස් කර තිබෙනවා. ඒ අනුව 2025 වර්ෂයේදී උසස්වීම් පටිපාටියක් සකස් කරලා, ඒ උසස්වීම් පටිපාටිය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා යොමු කර තිබෙනවා, ගරු කථානායකතුමනි. නමුත්, මෙහිදී විශේෂ ගැටලුවක් මතුවී තිබෙනවා. විශේෂයෙන්ම මෙතැන අධිකාරින් සහ දෙපාර්තමේන්තු කිහිපයක් එකතු කිරීම නිසා සේවක අර්ථසාධක අරමුදලේ සහ විශ්‍රාම වැටුප් සහිත නිලධාරින් එකම උසස්වීම් පටිපාටියට ඇතුළත් කිරීමේදී ගැටලුකාරී තත්ත්වයක් ඇති වුණා. ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ප්‍රතිපත්තිමය තීරණයක් අපෙන් ඉල්ලා සිටියා. ඒ අනුව කැබිනට් මණ්ඩලයට පත්‍රිකාවක් ඉදිරිපත් කරලා ඒ සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණත් මේ වෙනකොට අරගෙන තිබෙනවා. ඒ අනුව අපි බලාපොරොත්තු වෙනවා, ඉතාම කෙටි කාලයකදී මේ උසස්වීම් පටිපාටිය ක්‍රියාත්මක කරන්නට හැකි වෙයි කියලා.

(iii) දැනට සමෘද්ධි සංවර්ධන නිලධාරි පුරප්පාඩු 4,086ක් තිබෙනවා.

(iv) මේ පුරප්පාඩු පිරවීම සඳහා අපි මේ වෙනකොට කටයුතු කරමින් සිටිනවා, ගරු කථානායකතුමනි. ඒ සම්බන්ධයෙන් අපි රාජ්‍ය සේවයේ බඳවා ගැනීමේ සමාලෝචන කමිටුව වෙත යොමු කර තිබෙනවා. නමුත්, විශේෂයෙන්ම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව 2023දී ඒ වනතෙක් ක්‍රියාත්මක කරමින් තිබුණු සමෘද්ධි සහනාධාර වැඩසටහනෙන් ඉවත් කිරීම නිසා අදට ගැළපෙන විධියට අපට මේ සේවකයන් කළමනාකරණය කර ගැනීමේ අවශ්‍යතාවක් තිබෙනවා. ඒ අනුව අපි විශේෂයෙන්ම විද්වත් කමිටු දෙකක්, බාහිර සහ අභ්‍යන්තර කමිටු දෙකක් පත් කරලා ඒ නිර්දේශ මත අපි මේ වෙනකොට කැබිනට් මණ්ඩලයට සංකල්ප පත්‍රිකාවක් යොමු කරලා තිබෙනවා. ඒ සංකල්ප පත්‍රිකාව අනුව අපි මේ ඉන්න කාර්ය මණ්ඩලය කාර්යක්ෂමව, අදට ගැළපෙන විධියට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මෙහෙයවීම සඳහා යොදා ගනිමින් ඉන්නවා, ගරු කථානායකතුමනි.

(ආ) අදාළ නොවේ.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)

கௌரவ அமைச்சர் அவர்களே, இந்த நாட்டில் கிராம மட்டத்தில் பெரும் பணி செய்து கொண்டிருக்கின்ற சமுர்த்தி அபிவிருத்தி உத்தியோகத்தர்களுடைய பதவி உயர்வுக்காக நீங்கள் எடுத்திருக்கின்ற முயற்சிகளுக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். மிக விரைவில் இந்த ஏற்பாட்டைச் செய்ய வேண்டுமென மக்கள் சார்பில் கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ சபாநாயகர் அவர்களே, 2014ஆம் ஆண்டு சமுர்த்தி அதிகாரசபை உட்பட நான்கு நிறுவனங்களை ஒன்றிணைத்து, 'திவிநெகும' சட்டத்தின் ஊடாக சமுர்த்தி அபிவிருத்தித் திணைக்களம் உருவாக்கப்பட்டுத் தற்போது இயங்கி வருகின்றது. இதில் சுமார் 28,000 ஊழியர்கள் இணைக்கப்பட்டுள்ளனர். இத்திணைக்களம் உருவாக்கப் பட்டதிலிருந்து தேர்வு முறைகள், ETF, EPF எனப் பல பிரச்சினைகள் உருவாகியிருந்தன. பின்னர் EPF நிதி சம்பந்தமாக வழக்கு ஒன்று தாக்கல் செய்யப்பட்டுத் தீர்ப்பும் வழங்கப்பட்டுள்ளது. மேற்கூறப்பட்ட விடயங்கள் அனைத் தையும் ஏற்றுக்கொண்ட உத்தியோகத்தர்கள், அரசாங்கத்தின் சுற்றுநிருபத்திற்கு ஏற்ற வகையில் 12 சதவீத ஊழியர் சேமலாப நிதியினைச் செலுத்திவருவதுடன், இதுவரை இத்திணைக் களத்தில் கடமையாற்றிய சுமார் 8,500 உத்தியோகத்தர்கள் ஓய்வுபெற்றுச் சென்றுள்ளனர். ஆயினும், இவர்களில் 4,500 ஊழியர்கள் மாத்திரமே ஓய்வூதியம் பெற்றுக் கொண்டிருக் கின்றனர்; மிகுதி 4,000 ஊழியர்களுக்கு ஓய்வூதியம் கிடைக்கப்பெறவில்லை.

என்னுடைய முதலாவது மேலதிக கேள்வி: ஓய்வூதியம் கிடைக்கப்பெறாமல் உள்ள மேற்படி 4,000 உத்தியோகத் தர்களுக்கும் ஓய்வூதியம் கிடைக்க கௌரவ அமைச்சர் அவசர நடவடிக்கை எடுப்பாரா?

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)

ගරු කථානායකතුමනි, එතුමා මතු කරපු ප්‍රශ්නය ඉතාම සාධාරණයි. නමුත්, මේ රටේ ජනතාව දැනගන්න ඕනෑ, ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට මේ රටේ අධිකාරින් දෙකක්, දෙපාර්තමේන්තු දෙකක් සහ පදනමක් එකතු කරලා තමයි, 2013දී පැවති රජය සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටෙව්වේ කියන එක. ඒක ව්‍යවස්ථා විරෝධී විධියටයි පිහිටෙව්වේ, ගරු කථානායකතුමනි. ඔබතුමා දන්නවා, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවීමත් සමඟ ශ්‍රේෂ්ඨාධිකරණයේ හිටපු අගවිනිසුරුතුමියට පවා ඒ තනතුර අහිමි වුණු බව. එහෙම කරලා තමයි මේ දෙපාර්තමේන්තුව පිහිටෙව්වේ. එහි ප්‍රතිඵල වසර 30කට ආසන්න කාලයක් එහි සේවය කරන නිලධාරින් අද වනකොටත් භුක්ති විඳිනවා. ඉතාම අසාධාරණ තත්ත්වයක් මතුවෙලා තිබෙනවා, ගරු කථානායකතුමනි. දෙපාර්තමේන්තුවක් කිව්වාම, සේවකයින් විශ්‍රාම වැටුපක් ලබනවා. නමුත්, අධිකාරි සහ පදනම්වල සේවය කරන අයට විශ්‍රාම වැටුපක් නැහැ. ඔවුන්ට තිබෙන්නේ, සේවක අර්ථසාධක අරමුදල. ඒ නිසා 2014දී ඇතිවෙච්ච මේ පටලැවිල්ල අපට ලිහා ගැනීමට අවශ්‍යයි. අපි මේ වෙනකොට ඒක ක්‍රමයෙන් ලිහාගෙන යනවා, මේ අයත් විශ්‍රාම වැටුප් ක්‍රමයට ඇතුළත් කර ගැනීමට. ඒ වාගේම වැටුප් කේතවල ප්‍රශ්නයකුත් තිබෙනවා. අපි ඒ පිළිබඳව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවත් එක්ක සාකච්ඡා කරලා, කැබිනට් මණ්ඩලය ප්‍රතිපත්තිමය තීරණයක් අරගෙන, රාජ්‍ය සේවා කොමිෂන් සභාවට මේ වන විට යොමු කර තිබෙනවා. ඒ අනුමැතිය ලැබුණු විගසම ඒ අයත් විශ්‍රාම වැටුප් ක්‍රමයට එකතු කර ගැනීමට හැකියාව ලැබෙනවා, ගරු කථානායකතුමනි.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)

கௌரவ அமைச்சர் அவர்களே! உங்களுடைய நடவடிக்கைகளை நாங்கள் வாழ்த்துகின்றோம். என்னுடைய இரண்டாவது மேலதிகக் கேள்வி:

தற்போது ஓய்வூதியத்தைப் பெற்றுக்கொண்டிருப்பவர் களின் பின்னுரித்தாளர்களுக்குரிய, அதாவது கணவன் இறந்தால் மனைவிக்கும், மனைவி இறந்தால் கணவனுக்கும் கிடைக்கக்கூடிய ஓய்வூதியத்தைப் பெறுவதற்கான முறையான

[ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා]

நேர்முகப்பரீட்சை இதுவரையில் நடைபெறவில்லை. உதாரண மாகத் தற்போது ஓய்வூதியத்தைப் பெற்றுக் கொண்டிருக்கின்ற கணவர் மரணித்தால், அவரின் மனைவி தனக்குரிய ஓய்வூதியத்தைப் பெறுவதில் இந்நிலைமையானது அதிக காலத்தையும், சிரமத்தையும் ஏற்படுத்தும். எனவே, ஓய்வுபெற்றுச் சென்றுள்ள 8,500 சமுர்த்தி அபிவிருத்தி உத்தியோகத்தர்களினதும் பின்னுரித்தாளர்களுக்குரிய நேர்முகப்பரீட்சையினை நடாத்துவதற்கான ஏற்பாடுகளை நீங்கள் மேற்கொள்வீர்களா?

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)

ගරු කථානායකතුමනි, එතුමා අහන ප්‍රශ්නය එතරම්ම පැහැදිලි නැහැ. සාමාන්‍යයෙන් සියලු රජයේ සේවකයන්ට විශ්‍රාම වැටුප් හිමිකම් ලැබෙන විධියට තමයි මේ අයටත් විශ්‍රාම වැටුප් හිමිකම් ලැබෙන්නේ. නමුත් මෙතැන තිබෙන ප්‍රශ්නය මෙයයි. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවනකොටත් අධිකාරින් වශයෙන් තිබුණු ආයතන දෙකක් වන ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේත්, ඒ වාගේම ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරියේත් හිටපු සේවකයන් විශ්‍රාම වැටුප් හිමි සේවකයන් නොවෙයි. ඔවුන් අනුයුක්ත කිරීමේදී ඇති වෙච්ච ගැටලුවක් නිසා යම් ගැටලුකාරී තත්ත්වයක් මතු වෙලා තිබුණා. නමුත් මම කලින් කිව්වා වාගේ ඒ ගැටලුත් විසඳා ගත්තාට පස්සේ මේ අය අතරින් විශ්‍රාම වැටුප් ලබා ගන්නා රැකියාවට අනුයුක්ත වීමට කැමැත්ත ප්‍රකාශ කරලා තිබෙන අයට අනෙක් අයට වාගේම ඒ විශ්‍රාම වැටුප් ලැබෙනවා. ඒ වාගේම, ඊළඟට ඔවුන්ගේ යැපෙන්නන්ටත් රාජ්‍ය සේවයේ අනෙකුත් අයට වාගේම ඒ විශ්‍රාම වැටුප් ලැබෙනවා.

## මූල්‍ය වංචා සහ දූෂණ චෝදනා ලත් විවිධ සේවා සමුපකාර සමිති සහ ග්‍රාමීය බැංකු: මහනුවර දිස්ත්‍රික්කය

### நிதி மோசடி மற்றும் ஊழல் குற்றச்சாட்டுகளுக்கு உள்ளாகியுள்ள பலநோக்குக் கூட்டுறவுச் சங்கங்களும் கிராமிய வங்கிகளும்: கண்டி மாவட்டம்

### MULTI-PURPOSE CO-OPERATIVE SOCIETIES AND RURAL BANKS ALLEGED OF FINANCIAL FRAUD AND CORRUPTION: KANDY DISTRICT

1378/2025

**7. ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)

වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ විවිධ සේවා සමුපකාර සමිති සහ එම සමිතිවලට අයත් ග්‍රාමීය බැංකු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒවා අතරින් විවිධ මූල්‍ය වංචා හා දූෂණ චෝදනා එල්ලවී ඇති සමිති, ග්‍රාමීය බැංකු සංඛ්‍යාව සහ ඒවායේ නම් කවරේද;

(iii) එම වංචා හා දූෂණ සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා මධ්‍යම පළාත් ආණ්ඩුකාරවරයා විසින් කමිටුවක් පත් කර තිබේද;

(iv) එසේ නම්, එම කමිටු සාමාජිකයන්ගේ නම් කවරේද;

(v) එම වංචා හා දූෂණ ක්‍රියා සම්බන්ධයෙන් කමිටුව ලබා දුන් නිර්දේශ සහ එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கண்டி மாவட்டத்தில் பலநோக்குக் கூட்டுறவுச் சங்கங்களினதும் அச்சங்கங்களுக்குச் சொந்த மான கிராமிய வங்கிகளினதும் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(ii) அவற்றுள் பல்வேறு நிதி மோசடிகள் மற்றும் ஊழல் குற்றச்சாட்டுகளுக்கு உள்ளாகியுள்ள சங்கங்கள் மற்றும் கிராமிய வங்கிகளின் எண்ணிக்கை மற்றும் அவற்றின் பெயர்கள் யாவை என்பதையும்;

(iii) மேற்படி மோசடிகள் மற்றும் ஊழல்கள் குறித்து விசாரிப்பதற்காக மத்திய மாகாண ஆளுநரால் குழுவொன்று நியமிக்கப்பட்டுள்ளதா என்ப தையும்;

(iv) ஆமெனில், அக்குழுவின் அங்கத்தவர்களின் பெயர்கள் யாவை என்பதையும்;

(v) மேற்படி மோசடிகள் மற்றும் ஊழல்கள் தொடர்பில் குழு வழங்கிய விதப்புரைகள் மற்றும் குறித்த விதப்புரைகளை நடைமுறைப்படுத்த மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Trade, Commerce, Food Security and Co-operative Development:

(a) Will he inform this House -

(i) the number of multi-purpose co-operative societies and the number of rural banks affiliated to such societies in the Kandy District, separately;

(ii) the number and the names of such societies and rural banks among them, against which various allegations of financial fraud and corruption have been levelled;

(iii) whether a committee has been appointed by the Governor of the Central Province to investigate into such fraud and corruption;

(iv) if so, the names of the members of the said committee; and

(v) the recommendations made by the said committee in respect of such fraud and corruption and of the steps that have been taken to implement those recommendations?

(b) If not, why?

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Co-operative Development)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ග්‍රාමීය බැංකු සමිති 172යි.

| | | | |
|---|---|---|---|
| 1. | සීමාසහිත මිණිපේ විවිධ සේවා සමුපකාර සමිතිය | - | 04 |
| 2. | සීමාසහිත හසලක විවිධ සේවා සමුපකාර සමිතිය | - | 05 |
| 3. | සීමාසහිත නව උඩුදුම්බර විවිධ සේවා සමුපකාර සමිතිය | - | 05 |
| 4. | සීමාසහිත තෙල්දෙණිය විවිධ සේවා සමුපකාර සමිතිය | - | 08 |
| 5. | සීමාසහිත උඩිස්පත්තුව විවිධ සේවා සමුපකාර සමිතිය | - | 04 |
| 6. | සීමාසහිත කුණ්ඩසාලේ විවිධ සේවා සමුපකාර සමිතිය | - | 12 |
| 7. | සීමාසහිත වත්තේගම විවිධ සේවා සමුපකාර සමිතිය | - | 12 |
| 8. | සීමාසහිත මහනුවර විවිධ සේවා සමුපකාර සමිතිය | - | 12 |
| 9. | සීමාසහිත තලාතුඔය මාරස්සන විවිධ සේවා සමුපකාර සමිතිය | - | 13 |
| 10. | සීමාසහිත ගලහා දෙල්තොට විවිධ සේවා සමුපකාර සමිතිය | - | 05 |
| 11. | සීමාසහිත නාවලපිටිය විවිධ සේවා සමුපකාර සමිතිය | - | 07 |
| 12. | සීමාසහිත ගම්පොල විවිධ සේවා සමුපකාර සමිතිය | - | 10 |
| 13. | සීමාසහිත ගඟ ඉහළ කෝරළේ විවිධ සේවා සමුපකාර සමිතිය | - | 09 |
| 14. | සීමාසහිත යටිනුවර මැද පළාත විවිධ සේවා සමුපකාර සමිතිය | - | 08 |
| 15. | සීමාසහිත යටිනුවර ගඟ පළාත විවිධ සේවා සමුපකාර සමිතිය | - | 03 |
| 16. | සීමාසහිත කඩුගන්නාව විවිධ සේවා සමුපකාර සමිතිය | - | 07 |
| 17. | සීමාසහිත උඩුනුවර විවිධ සේවා සමුපකාර සමිතිය | - | 11 |
| 18. | සීමාසහිත පූජාපිටිය විවිධ සේවා සමුපකාර සමිතිය | - | 04 |
| 19. | සීමාසහිත හාරිස්පත්තුව දකුණ විවිධ සේවා සමුපකාර සමිතිය | - | 12 |
| 20. | සීමාසහිත හාරිස්පත්තුව උතුර විවිධ සේවා සමුපකාර සමිතිය | - | 05 |
| 21. | සීමාසහිත ගලගෙදර විවිධ සේවා සමුපකාර සමිතිය | - | 11 |
| 22. | සීමාසහිත හතරලියද්ද විවිධ සේවා සමුපකාර සමිතිය | - | 05 |

(ii) 05යි.

සීමාසහිත මිණිපේ විවිධ සේවා සමුපකාර සමිතිය - 01 - අඹගහපැලැස්ස බැංකු ශාඛාව

සීමාසහිත මහනුවර විවිධ සේවා සමුපකාර සමිතිය - 02 - නුවරවෙල බැංකු ශාඛාව 01

මාවිල්මඩ බැංකු ශාඛාව 01

සීමාසහිත තලාතුඔය මාරස්සන විවිධ සේවා සමුපකාර සමිතිය - 01 - ගුරුදෙණිය බැංකු ශාඛාව.

සීමාසහිත උඩුනුවර විවිධ සේවා සමුපකාර සමිතිය - 01 - පමුණුව බැංකු ශාඛාව

මේ කියන බැංකු ශාඛා 5හි මූල්‍ය වංචා පිළිබඳව වාර්තා වී ඇති බව දන්වා තිබෙනවා.

(iii) නැත.

(iv) නැත.

(v) මධ්‍යම පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් කළ විශේෂ පරීක්ෂණ මඟින් අනාවරණය කරගත් කරුණු සම්බන්ධයෙන් හා සමුපකාර සමිති මඟින් කළ පරීක්ෂණවලදී අනාවරණය වූ කරුණු සම්බන්ධයෙන්ද ඉදිරි ක්‍රියාමාර්ග ගෙන ඇත.

ඒ අනුව 1982 අංක 12 දරන පනත යටතේ පැමිණිලි කිරීම, අධිභාර කිරීම, තීරක තීන්දු මඟින් අය කර ගැනීමට කටයුතු කිරීම, 46 (1) පරීක්ෂණ සිදු කිරීම මඟින් අනාවරණය වූ වංචා සඳහා නඩු පැවරීම සිදු කර ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

අපි දන්නවා, ජීවිත කාලයක් ඉතිරි කළ මුදල් සමුපකාර බැංකුවල තැන්පත් කළ විශ්‍රාමිකයන්, ගොවීන්, කුඩා ව්‍යවසායකයන්, සාමාන්‍ය ජනතාව තම මුදල් ආපසු ලබා ගැනීමට නොහැකි වී අසරණ වෙලා සිටින බව. ඒ වාගේම, බොහෝ ප්‍රදේශවල ග්‍රාමීය බැංකු මූල්‍ය අක්‍රමිකතා නිසා ණය දෙන එක නතර කරලා තිබෙනවා. දැන් අපේ ගරු අමාත්‍යතුමාත් ඒ ගැන කිව්වා. මා හිතන්නේ තලාතුඔය මාරස්සන ග්‍රාමීය බැංකුවෙන් ණය දෙන එක දීර්ඝ කාලයක් තිස්සේ නතර කරලා තිබෙනවා. අහිංසක මිනිසුන්ට සහනයක් සලසන්න නම් මේ ග්‍රාමීය බැංකු පද්ධතිය අත්‍යවශ්‍ය එකක්. ඉතින් ගරු ඇමතිතුමනි, මේ සම්බන්ධයෙන් ඔබතුමා ගන්නා ක්‍රියාමාර්ග මොනවාද කියා මම දැනගන්න කැමැතියි.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය අසන ලද අතුරු ප්‍රශ්නයට පිළිතුර මෙකයි. ඇත්තටම මෙය සමුපකාර ව්‍යාපාරයේ තිබෙන විශාල ප්‍රශ්නයක්. මොකද, සමුපකාර පනත පාවිච්චි කරලා බැංකු සමිති හදන්න ඉඩ දුන්නේ ඔබතුමිය කිව්වා වාගේ ග්‍රාමීය ජනතාවගේ

[ගරු වසන්ත සමරසිංහ මහතා]

මූල්‍ය ගැටලුවලට පිළිතුරක් ලෙසයි; බැංකු පද්ධතිය හුරු නැති ජනතාවට ඉතිරි කිරීම සඳහා වන මධ්‍යස්ථාන ලෙසයි. හැබැයි අද සිදු වෙලා තිබෙන්නේ මොකක්ද? මේ වන විට ඒවායෙහි මූල්‍ය වංචා පිළිබඳ තොරතුරු අප වෙත වාර්තා වෙලා තිබෙනවා. පළාත් සභාව යටතේ තමයි විවිධ සේවා සමුපකාර සමිති ක්‍රියාත්මක වන්නේ. පළාත් සමුපකාර දෙපාර්තමේන්තුව යටතේ තමයි මේ බැංකු සමිතිවලට අවසර දෙන්නේ. මේවා නිසි ලෙස විගණනයක්, පරීක්ෂාවක් සිදු නොවී ක්‍රියාත්මක වීම හරහා මේ වන විට බැංකු 68ක මූල්‍ය වංචා පිළිබඳ තොරතුරු අප වෙතත් වාර්තා වී තිබෙනවා. මේ බැංකුවල තිබෙන මේ කියන තත්ත්වය අනුව පළාත් සමුපකාරවලට අපි දැනුම් දී තිබෙනවා නව බැංකු පටන් ගන්න එපා කියලා; ඒවාට අවසර දෙන්න එපා කියලා. ගරු කථානායකතුමනි, මේ වන විට ලංකාව පුරා ග්‍රාමීය බැංකු සමිති 9,600කට වැඩි ප්‍රමාණයක් තිබෙනවා. ඒ සමිතිවලින් සමහර ඒවා පුද්ගල සමිති. ඒ වාගේම, සමුපකාර ව්‍යාපාරය සම්බන්ධ විවිධ සේවා සමුපකාර සමිති තිබෙනවා. ග්‍රාමීය සමුපකාර සමිති හැටියට තිබෙන, RCBs හැටියට තිබෙන ඒවා හැම සමුපකාර සමිතියක් සමඟම තිබෙනවා. මේවායේ ශාඛාවල මේ ප්‍රශ්නය මතු වෙලා තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමියනි, මහනුවර දිස්ත්‍රික්කයේ සමුපකාර සමිති 5ක බැංකු ශාඛාවල මූල්‍ය වංචා සිදු වෙලා තිබෙනවා. ඒවාට අදාළ පරීක්ෂණ සිදු වෙමින් පවතිනවා. මේ විධියට 68ක් සම්බන්ධයෙන් තොරතුරු අපට ඇවිල්ලා තිබෙනවා. බිලියන 10කට වඩා මුදල් නැහැ. ඒ වාගේම සමහර සමිති පවත්වා ගෙන යන්න බැහැ. මොකද, තැන්පතුකරුවන්ගේ තැන්පතු ගෙවන්න බැහැ. සෑම මහජන දිනයකම ජනතාවගෙන් එන ප්‍රශ්නය තමයි, තමන්ගේ තැන්පතුව ගන්න උදවු කරන්න කියන එක. හැබැයි, ඒක අද ඇති වෙච්ච ප්‍රශ්නයක් නොවෙයි. කාලයක් තිස්සේම ඇවිල්ලා මේ ප්‍රශ්න දැන් එකතු වෙලායි තිබෙන්නේ. ඒ නිසා අපි දැන් තීරණයක් ගෙන තිබෙනවා, සමුපකාරවල බැංකු සමිති ලියාපදිංචි කිරීම පිළිබඳව වඩා හොඳ පසු විපරමක් කරලා අදාළ සමිති ලියාපදිංචි කරවන්න. ඒ වාගේම බැංකු ශාඛා පටන් ගන්නවා නම්, අදාළ audit කිරීම් කරලා, සේවක මට්ටම් ගැන බලලා, විගණනයන් සහ මූල්‍ය වාර්තා පිළිබඳ පරීක්ෂා කරලා තමයි නැවත අලුත් ශාඛාවකට අවසර දෙන්නේ. මූල්‍ය වංචා සිදු වෙච්ච හැම සමිතියකටම නීතිමය ක්‍රියාමාර්ග ගන්න අවශ්‍ය කරන උපදෙස් අපි ලබා දී තිබෙනවා, ආණ්ඩුකාරවරුත් එක්ක සාකච්ඡා කරලා. පළාත් සමුපකාර ලේකම්වරුන්, පළාත් සමුපකාර කොමසාරිස්වරුන් හරහා අදාළ බැංකුවල හිටපු අධ්‍යක්ෂ මණ්ඩල, ඒ වාගේම, ඒවායෙහි කළමනාකරුවන් ඇතුළු සියලුදෙනාට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමට සහ මූල්‍ය අපරාධ යටතේ නඩු දැමීමට අවශ්‍ය තීන්දු තීරණ අරගෙන තිබෙනවා. පරීක්ෂණ කටයුතු අවසන් වුණාට පසුව තමයි ඒවාට අදාළව විනය ක්‍රියාමාර්ග ගන්න වෙන්නේ.

ඔබතුමිය අහන අනෙක් ප්‍රශ්නයට පිළිතුර මේකයි. ඒ සමිතිවලට එන අයට තමන්ගේ තැන්පතු මුදල් ගන්න නම්, අදාළ පරීක්ෂණය අවසන් වෙන්න ඕනෑ. එම පරීක්ෂණ අවසන් වෙලා ඒ වංචාවට සම්බන්ධ වෙච්ච පුද්ගලයන්ගෙන් ඒවා අය කර ගැනීමකින් තොරව නැවත ගෙවීමක් පිළිබඳව අපට සහතිකයක් දෙන්න බැහැ, ගරු මන්ත්‍රීතුමියනි.

**ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)
පිළිතුර ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු අමාත්‍යතුමනි. මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මේ සමුපකාරවල මූලික පරමාර්ථය තමයි අඩු මිලට ගුණාත්මක භාණ්ඩ ජනතාවට ලබා දීම. විශේෂයෙන්ම මේක වැදගත්. දුෂ්කර පළාත් ගැන, විශේෂයෙන් මහනුවර දිස්ත්‍රික්කය ගැන කථා කළොත්, සමහර ගම්වල මිනිසුන්ට භාණ්ඩ පහසුවෙන් ලබා ගත හැක්කේ, ඒ සමුපකාරවලින්. නමුත්, සමුපකාරවල තිබෙන භාණ්ඩවල ගුණාත්මකභාවය පිළිබඳව සමහර අවස්ථාවලදී ගැටලු ඇති වෙනවා. විශේෂයෙන්ම සහල්, හාල්මැස්සන්, පරිප්පු ආදියෙහි ගුල්ලෝ ඉන්නවා. සමහර ප්‍රදේශවල අත්‍යවශ්‍ය භාණ්ඩවල හිඟයක් තිබෙනවා. ඒ නිසා මිනිසුන්ට කිලෝමීටර 5ක්, 6ක් දුර යන්න සිදු වෙනවා, අත්‍යවශ්‍ය සහ ගුණාත්මක භාණ්ඩ ලබා ගැනීම සඳහා. ඉතිහාසයේ සිට සමුපකාර ක්ෂේත්‍රය විශාල කාර්යභාරයක් ඉටු කරනවා, විශේෂයෙන්ම දුෂ්කර පළාත්වල මිනිසුන්ට. අද තිබෙන භාණ්ඩවල මිල අධික වීම නිසා සමුපකාර පද්ධතිය ශක්තිමත් වීම ඉතාම වැදගත් කියලායි මා හිතන්නේ. ඒ සම්බන්ධයෙන් ඔබතුමා ගන්න බලාපොරොත්තු වන ක්‍රියාමාර්ග මොනවාද කියලායි මා අහන්නේ.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු මන්ත්‍රීතුමිය අහන ප්‍රශ්නය හරි. 1978 විවෘත ආර්ථිකයත් එක්කම අපේ රටේ සමුපකාර ව්‍යාපාරයත් අත් හැරියා. පළාත් සභා ආවාට පසුව කොටසක් පළාත් සභාවලට ගියා. ඒ අනුව, සමුපකාර ව්‍යාපාරයේ තිබෙන වගකීම් අත් හැරියා විතරක් නොවෙයි, ඒක පෞද්ගලික මුදල දක්වා ගමන් කළා. අද වන කොට සමුපකාර ව්‍යාපාරය සතු විවිධ සේවා සමුපකාර සමිතිවලට අයත් වෙළෙඳ සැල් තිබෙනවා, 2,000කට ආසන්න ප්‍රමාණයක්. ඒවා අතරින් 1,500කට වැඩි ප්‍රමාණයක් පාඩු ලබනවා. ඇත්තටම ඒ වෙළෙඳ සැල් ජාලය ක්‍රියාත්මක කරවන්න නම්, සමුපකාරයට බඩු ගන්න තොග මධ්‍යස්ථාන ඕනෑ. ඒ නිසා අපි මේ වන කොට තීරණයක් අරගෙන ක්‍රියාත්මක කරමින් තිබෙනවා. අපි සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව නැවත ස්ථාපිත කළා. ඒක පසුගිය ආණ්ඩු විසින් වසා දමලායි තිබුණේ; 2023 වන කොට ඇවර කරන්න තීරණය කරලායි තිබුණේ. අපි ඒ ඇවර කිරීම අහෝසි කරලා සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව නැවත ස්ථාපිත කළා. අපි සමුපකාර තොග වෙළෙඳ සංස්ථාවේ දිස්ත්‍රික් මට්ටමේ තොග අළෙවි සැල් ආරම්භ කරනවා. එතකොට සමුපකාරයට එතැනට ඇවිල්ලා බඩු මිල දී ගන්න පුළුවන්. දැන් ඒගොල්ලන් භාණ්ඩ මිල දී ගන්නේ පිටකොටුවෙන්; එහෙම නැත්නම් දඹුල්ලෙන්. එතකොට එදිනෙදා තිබෙන වෙනස්කම් වාගේම මිල පිළිබඳවත් ප්‍රශ්නයක් මතු වෙනවා. අපි ඉස්සෙල්ලාම - ලබන සැප්තැම්බර් මාසය වන කොට - සමුපකාර තොග වෙළෙඳ සංස්ථාවේ තොග අළෙවි සැල් පටන් ගන්නවා, මාතර සහ කුරුණෑගල. මේ වන කොට ඒවායේ ඉදි කිරීම් කර අවසන්. දිස්ත්‍රික්ක 24ම තොග වෙළෙඳ සැල් 24ක් පටන් ගන්නවා. සමුපකාර සමිතිවලට ඒවා හරහා බඩු ගන්න පුළුවන්.

COOPFED එක ගැනත් කියන්න ඕනෑ. COOPFED එක, සමුපකාර සමිතිවලට බඩු බෙදන්න තිබිච්ච තවත් ආයතනයක්. ඒවා සම්පූර්ණයෙන්ම පෞද්ගලිකව භුක්ති විඳිමින් තිබුණු ආයතන. ඒවා ඉතා විශාල ණය කන්දක හිර කරලා තිබෙනවා. අපි COOPFED එක ප්‍රතිසංවිධානය කරමින් තිබෙනවා. ඒ හරහාත් සමුපකාර සමිතිවලට භාණ්ඩ මිල දී ගන්න පුළුවන්. ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය අහන අතුරු ප්‍රශ්නයට පිළිතුර මේකයි. මේ සමුපකාර සමිති 2,000ටම, එහෙම නැත්නම් මේ විවිධ සේවා සමුපකාර සමිති 302ටම අවශ්‍ය භාණ්ඩ ප්‍රමාණ තොග වෙළෙඳ සැල් හරහා ලබා ගනිමින් පාරිභෝගිකයාට ගුණත්වයෙන් යුතු භාණ්ඩ ලබා දීම සඳහා වෙච්ච ජාලයක් ගොඩ නැඟීමෙන් පමණයි අපට මේකට උත්තර සොයන්න පුළුවන් වන්නේ. අපි ඒ සඳහා පියවර තබා තිබෙනවා. පළමුවැනි වෙළෙඳ සැල් දෙක මේ සැප්තැම්බර්වලත්, දෙසැම්බර් වනවිට තව වෙළෙඳ සැල් දෙකකුත් එක්ක දිස්ත්‍රික්ක හතරක තොග වෙළෙඳ සැල් 4ක් පටන් ගන්න ගන්නවා, සමුපකාර තොග වෙළෙඳ සංස්ථාවේ. අපි ඉදිරියේදී ඉතිරි දිස්ත්‍රික්කවලත් ඒවා ආරම්භ කරනවා. මේ තොග වෙළෙඳ මධ්‍යස්ථානවලින් සමුපකාරවලට අවශ්‍ය ගුණත්වයෙන් යුතු භාණ්ඩ ලබා දීමට අපි පියවර ගන්නවා. අපි හඳුනාගත් භාණ්ඩ වර්ග 40ක් මේ හරහා බෙදා හැරීමට තමයි උත්සාහ කරන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 8 -1659/2025- (1), ගරු චානක මාදුගොඩ මහතා.
*[සභා ගර්භය තුළ නැත.]*

## වන්නි මැතිවරණ දිස්ත්‍රික්කයේ වැව්: ප්‍රතිසංස්කරණය
### வன்னித் தேர்தல் மாவட்டத்திலுள்ள குளங்கள்: புனரமைத்தல்
TANKS IN VANNI ELECTORAL DISTRICT: RENOVATION

1826/2026

**9. ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) වන්නි මැතිවරණ දිස්ත්‍රික්කයට අයත් -

(i) කුඩා සහ විශාල වාරි වැව් සංඛ්‍යාව;

(ii) වාරි කටයුතු සඳහා භාවිත කරනු ලබන වැව් සංඛ්‍යාව;

(iii) වාරි කටයුතු සඳහා භාවිත නොකරන වැව් සංඛ්‍යාව;

(iv) කුඹුරු ඉඩම් ප්‍රමාණය;

එක් එක් මැතිවරණ කොට්ඨාස අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) (අ)(iii)හි සඳහන් වැව්, වාරි කටයුතු සඳහා භාවිත නොකිරීමට හේතු කවරේද;

(ii) එම වැව් ප්‍රතිසංස්කරණය කර එම වැව්වලට පහළින් පිහිටි ඉඩම්, වගා කිරීම සඳහා ඉඩම් නොමැති පවුල් සඳහා ලබාදීමේ හැකියාවක් තිබේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) வன்னித் தேர்தல் மாவட்டத்திலுள்ள ஒவ்வொரு தேர்தல் தொகுதியிலும் காணப்படும்,

(i) சிறிய மற்றும் பாரிய நீர்ப்பாசனக் குளங்களின் எண்ணிக்கை;

(ii) நீர்ப்பாசன நடவடிக்கைகளுக்குப் பயன்படுத் தப்படும் குளங்களின் எண்ணிக்கை;

(iii) நீர்ப்பாசன நடவடிக்கைகளுக்குப் பயன்படுத் தப்படாத குளங்களின் எண்ணிக்கை;

(iv) வயற் காணியின் அளவு;

ஆகிய விபரங்கள் வெவ்வேறாக யாவை என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) (அ)(iii)இல் குறிப்பிடப்பட்டுள்ள குளங்கள், நீர்ப்பாசன நடவடிக்கைகளுக்குப் பயன்படுத் தப்படாமைக்கான காரணங்கள் யாவை என்பதையும்;

(ii) மேற்படி குளங்களைப் புனரமைத்து, அக்குளங் களுக்குக் கீழே அமைந்துள்ள காணிகளைப் பயிர்ச்செய்கை நடவடிக்கைகளுக்காக காணிகளற்ற குடும்பங்களுக்கு வழங்குவதற்குச் சாத்தியம் உள்ளதா என்பதையும்;

(iii) ஆமெனில், அதற்காக எடுக்கும் காலம் எவ்வளவு என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House, separately, in respect of each district within the Vanni Electoral Division the -

(i) number of minor and major irrigation tanks located therein;

(ii) number of tanks used for irrigation purposes;

(iii) number of tanks that are not used for irrigation purposes; and

(iv) extent of paddy lands?

(b) Will he state -

(i) the reasons for not using the tanks mentioned in (a)(iii) for irrigation purposes;

(ii) whether it is possible to renovate aforesaid tanks and allocate the land below them to landless families for cultivation; and

(iii) if so, how much time will it take?

(c) If not, why?

**ගරු අරවින්ද සෙනරත් මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அரவிந்த செனரத் - காணி மற்றும் நீர்ப்பாசன பிரதி அமைச்சர்)
(The Hon. Aravinda Senarath - Deputy Minister of Land and Irrigation)
ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i)
- වාරිමාර්ග දෙපාර්තමේන්තුව (මධ්‍යම රජය) යටතේ පාලනය හා නඩත්තු වන විශාල වැව් 04ක්, මධ්‍යම ප්‍රමාණය වැව් 04ක් හා අමුණු 01ක් පවතී.
- ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ පාලනය වන කුඩා වැව් 30ක් (මුලතිව් දිස්ත්‍රික්කය තුළ 12, වවුනියාව දිස්ත්‍රික්කය තුළ 18) පවතී.
- ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන කුඩා හා විශාල වාරි වැව් 1,748ක් (මුලතිව් දිස්ත්‍රික්කය තුළ 437ක්, මන්නාරම දිස්ත්‍රික්කය තුළ 449, වවුනියාව දිස්ත්‍රික්කය තුළ 862) පවතී.

[ගරු අරවින්ද සෙනරත් මහතා]

ඒ, අනුව වන්නි මැතිවරණ කොට්ඨාසය තුළ විශාල, මධ්‍යම හා කුඩා ප්‍රමාණයේ වැව් ලෙස පවතින සමස්ත වැව් ප්‍රමාණය 1,786 වේ.

(ii)
- වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ඉහත (i)හි සඳහන් වැව් 08 හා අමුණ වාරි කටයුතු සඳහා භාවිත කරනු ලබයි.
- ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, වැව් 26ක් (මුලතිව් දිස්ත්‍රික්කය තුළ 09, වවුනියාව දිස්ත්‍රික්කය තුළ 17) වාරි කටයුතු සඳහා භාවිත කරනු ලබයි.
- ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, වැව් 1,296ක් (මුලතිව් දිස්ත්‍රික්කය තුළ 406, මන්නාරම දිස්ත්‍රික්කය තුළ 269, වවුනියාව දිස්ත්‍රික්කය තුළ 621) වාරි කටයුතු සඳහා භාවිත කරනු ලබයි.

ඒ අනුව, වන්නි මැතිවරණ කොට්ඨාසය තුළ භාවිත කරනු ලබන මුළු වැව් සංඛ්‍යාව 1,330කි.

(iii)
- වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ වාරි කටයුතු සඳහා භාවිත නොකරන වැව් නොමැත.
- ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ පවතින වැව් 04ක් (මුලතිව් දිස්ත්‍රික්කය තුළ 03, වවුනියාව දිස්ත්‍රික්කය තුළ 01) වාරි කටයුතු සඳහා භාවිත නොවේ.
- ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ පවතින වැව් 453ක් (මුලතිව් දිස්ත්‍රික්කය තුළ 31, මන්නාරම දිසත්‍රික්කයට තුළ 180, වවුනියාව දිස්ත්‍රික්කය තුළ 242) වාරි කටයුතු සඳහා භාවිත නොවේ.

ඒ අනුව, වන්නි මැතිවරණ කොට්ඨාසය තුළ වාරි කටයුතු සඳහා භාවිත නොකරන මුළු වැව් සංඛ්‍යාව 457කි.

(iv)

| | |
|---|---|
| වාරිමාර්ග දෙපාර්තමේන්තුව | අක්කර 46,171 |
| ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය | අක්කර 2,224 (මුලතිව් දිස්ත්‍රික්කය තුළ අක්කර 963, වවුනියාව දිත්‍රික්කය තුළ අක්කර 1,261) |
| ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | අක්කර 193,405.178 (මුලතිව් දිස්ත්‍රික්කය තුළ අක්කර 70,965.85, මන්නාරම දිස්ත්‍රික්කය තුළ අක්කර 59,042, වවුනියාව දිස්ත්‍රික්කය තුළ අක්කර 63,400.33) |

(ආ) (i) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ පවතින වාරි කටයුතු සඳහා භාවිතා නොකරන වැව් භාවිත නොකිරීමට හේතු:

<u>මුලතිව් දිස්ත්‍රික්කය</u>

- සින්නකුලම් - වැව සම්පූර්ණයෙන්ම අලුත්වැඩියා කළ යුතුව ඇත. කිවුල්ඔය ජලාශ ව්‍යාපෘතිය මඟින් කුඹුරු ඉඩම් ලබා දීමට සැලසුම් කර ඇත.

මේ වැවත් ඉදිරියේදී ප්‍රතිසංස්කරණය කරන්න කටයුතු කරනවා. ඒ නිසා තමයි දැනට භාවිත නොකරන්නේ.

- සිවන්තාමුරිප්පු - වැව සම්පූර්ණයෙන් අලුත්වැඩියා කළ යුතුව ඇත. කිවුල්ඔය ජලාශ ව්‍යාපෘතිය මඟින් කුඹුරු ඉඩම් ලබා දීමට සැලසුම් කර ඇත.
- කොරකහවැව - වනාන්තරය තුළ පිහිටා ඇත. වනජීවී අවශ්‍යතා සඳහා වෙන් කර ඇත.

<u>වවුනියාව දිස්ත්‍රික්කය</u>

- රඹවෙට්ටිවැව - ඉඩම් කට්ටි සැලසුම් සකස් කර ඇත. ඉදිරියේදී අපි මෙම වැව ප්‍රතිසංස්කරණය කරලා අවශ්‍යතා සඳහා යොදා ගන්න පුළුවන් මට්ටමට සකස් කරන්නයි බලාපොරොත්තු වෙන්නේ.

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ පවතින වාරි කටයුතු සඳහා භාවිත නොකරන වැව් භාවිත නොකිරීමට හේතු:

<u>මුලතිව් දිස්ත්‍රික්කය</u>

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පවතින ප්‍රදේශවල මේ වැව් පිහිටා ඇත. මන්නාරම දිස්ත්‍රික්කය තුළ තිබෙන වැව් ගත්තත් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ තමයි තිබෙන්නේ. එබැවින්, සමාජ හා පාරිසරික බලපෑම් සලකා බැලීමෙන් පසු පමණක් ඒ වැව්වල සංවර්ධන කටයුතු සිදු කළ හැකිය.

<u>වවුනියාව දිස්ත්‍රික්කය</u>

භාවිතයට නොගන්නා සුළු වාරි වැව් සංඛ්‍යාව 241කි. සාමාන්‍ය ප්‍රදේශවල වැව් 71ක් පිහිටා ඇත. වන සංරක්ෂණ සීමාව තුළ වැව් 170ක් පවතී.

(ii) මහවැලි අධිකාරිය යටතේ පවතින සින්නකුලම්, සිවන්තාමුරිප්පු, රඹවෙට්ටිවැව යටතේ ඇති ඉඩම් කුඹුරු ඉඩම් ලෙස ලබා දීමට හැකියාව ඇත. ඒ සඳහා කටයුතු කරමින් පවතී. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සතු මන්නාරම දිස්ත්‍රික්කය තුළ ඇති ඉඩම් වගා කිරීමට ඉඩම් නොමැති පවුල්වලට - වැව්වලට පහළින් පිහිටි ඉඩම් - වැව් ප්‍රතිසංස්කරණය කළ පසු ලබා දිය හැක. වර්තමානයේ අහස් දියෙන් වගා කටයුතු සිදු කරමින් පවතිනවා, මේ වැව් පද්ධති නවීකරණය කරන තෙක්.

(iii)
- සින්නකුලම්, සිවන්තාමුරිප්පු - කිවුල්ඔය ජලාශ ව්‍යාපෘතිය අවසන්වීමෙන් පසු
- රඹවෙට්ටි වැව - වසරක් තුළ (2027 වසර තුළ)

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව - වනජීවී හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් මන්නාරම් දිස්ත්‍රික්කයේ වැව් ප්‍රදේශ නිදහස් කළ පසු වසර දෙකක් ඇතුළත.

(ඇ) ඉහත පිළිතුරු අනුව අදාළ නොවේ.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)

கௌரவ பிரதி அமைச்சர் அவர்களே, முழுமையான விடையைத் தந்தமைக்கு நன்றி!

எங்களுடைய வன்னித் தேர்தல் மாவட்டத்தில் 457 குளங்கள் பயன்படுத்தப்படாத நிலையில் இருப்பதாக நீங்கள் சொன்னீர்கள். அவற்றில் 242 குளங்கள் வவுனியா மாவட்டத்தில் இருக்கின்றன. புதிய அரசாங்கம் ஆட்சிக்கு வந்த பின்னர், மாண்புமிகு சனாதிபதி அவர்கள், ஒவ்வோர் அங்குல நிலத்தையும் உற்பத்திப் பொருளாதாரத்துக்குப் பயன்படுத்த வேண்டுமென அடிக்கடி சொல்லி வருகிறார். இந்தச் சூழலில், ஒரு தேர்தல் மாவட்டத்தில் மாத்திரம்

முன்னோர்களால் கட்டப்பட்ட 457 குளங்கள் பயன்படுத்தப்படாத நிலையில் இருக்கின்றன. இது பாரியதொரு பிரச்சினை!

கௌரவ பிரதி அமைச்சர் அவர்களே, எங்களுடைய வன்னித் தேர்தல் மாவட்டத்தில், யுத்தத்தால் இடம்பெயர்ந்து அகதி முகாம்களில் இருந்தவர்களின் second, third generations மீளவும் வந்து குடியேறுகிறார்கள். அவர்களுக்கு ஓர் அங்குல வயற்காணிகூட இல்லை. அந்த 457 குளங்களையும் முன்னுரிமை அடிப்படையில் புனரமைத்து, ஒரு குடும்பத்துக்கு ஓர் ஏக்கர் வயற்காணியைக் கொடுப்பீர்களாக இருந்தால், வன்னித் தேர்தல் மாவட்டத்தில் வயற்காணியற்ற ஒரு குடும்பத்தையேனும் காண முடியாத சூழலை உங்களால் ஏற்படுத்த முடியும். உற்பத்திப் பொருளாதாரத்தை மேம்படுத்த வேண்டுமென்ற கொள்கையைக்கொண்ட உங்களுடைய அரசாங்கம், 2027ஆம் ஆண்டுக்குரிய Budgetஇல் - வரவு செலவுத்திட்டத்தில் - கணிசமான அளவு நிதி ஒதுக்கீட்டைச் செய்து, இந்தக் குளங்களைப் புனரமைத்து, வன்னித் தேர்தல் மாவட்டத்தில் காணியற்ற மக்களுக்கு - அவர்கள் வாழ்க்கை முழுக்க கூலித் தொழிலாளர்களாக இருந்து சாகாமல் இருப்பதற்கு - குறைந்தது ஓர் ஏக்கர் வீதம் வயற்காணியைக் கொடுக்க வேண்டும். என்னுடைய இந்தக் கோரிக்கையை ஏற்று, இதனை உங்களால் நடைமுறைப்படுத்த முடியுமா? என்பதை என்னுடைய முதலாவது மேலதிக வினாவாகக் கேட்கின்றேன்.

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)

ගරු මන්ත්‍රීතුමා නඟන පළමුවැනි අතුරු ප්‍රශ්නයේ සමස්ත අර්ථය ගත්තාම, වන්නි දිස්ත්‍රික්කයට අදාළ වාරි ව්‍යාපෘති සහ ඉඩම් බෙදා දීම් ආදී සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් ආණ්ඩුවක් විධියට අපේ තිබෙන ස්ථාවරය මොකක්ද කියන එක තමයි එතුමා විමසන්නේ.

ගරු මන්ත්‍රීතුමනි, අපි මේ වෙනකොට රට පුරාම - විශේෂයෙන්ම දිස්ත්‍රික්ක 10ක - "වාරි මහිම-අපේ උරුමය" කියන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනවා. එහිදී අපි වැඩිම අවධානය යොමු කර තිබෙන්නේ වන්නි දිස්ත්‍රික්කයේ මුලතිව්, වවුනියා සහ මන්නාරම කියන දිස්ත්‍රික්කවලටයි. අපි එම දිස්ත්‍රික්කවලට වැඩි අවධානයක් යොමු කරලා, ව්‍යාපෘති වැඩි ප්‍රමාණයක් සූදානම් කර තිබෙනවා. එහි ජාතික උත්සවය පැවැත්වුයේත් මුලතිව්වල. එහි අරමුණ වන්නේම එම ප්‍රදේශයට සංවර්ධනය ගෙන ඒමයි. එම ප්‍රදේශවලට සංවර්ධනය ගෙන එනවා කියන පණිවුඩය අපි ජනතාවට තහවුරු කරන්න ඕනෑ. ඒ අරමුණින් තමයි අපි එය ක්‍රියාත්මක කර තිබෙන්නේ. ඒ වාගේම ලෝක බැංකු ව්‍යාපෘති සහ ඊට අමතරව වාරි පද්ධතිය නවීකරණය සඳහා රට තුළ ක්‍රියාත්මක කරන ව්‍යාපෘති වශයෙන් විවිධ ව්‍යාපෘති ගණනාවක් උතුරු පළාත තුළ - විශේෂයෙන්ම වන්නි දිස්ත්‍රික්කය තුළ - අපි ක්‍රියාත්මක කරනවා. මම හිතන විධියට මේ වෙනකොටත් ව්‍යාපෘති කිහිපයක ඇස්තමේන්තු සකස් කරලා, ටෙන්ඩර් කරලා එම වැඩ ආරම්භ කරන්න කටයුතු කර තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමා අසන ලද අතුරු ප්‍රශ්නයට අදාළව ගත්තොත්, අපි එම දිස්ත්‍රික්ක කෙරෙහි විශේෂ අවධානය යොමු කර තිබෙනවා. මොකද, එම ප්‍රදේශ යුද්ධයට හසු වී තිබුණා. ඒ වාගේම දශක ගණනාවක ඉඳලා එම ප්‍රදේශවලට ආර්ථිකයේ අරුණලු ලැබී තිබුණේ නැහැ. ඒ නිසා අපි ආණ්ඩුවක් විධියට මූලික අවධානය යොමු කරලා, එම ප්‍රදේශවල වාරි පද්ධතිය නවීකරණය කරන්න සහ කෘෂිකර්මාන්තය දියුණු කරන්න සැලසුම් කර තිබෙනවා. ඊළඟට, ඔබතුමා අවසානයට අහපු කාරණයට පිළිතුරු වශයෙන් කියන්නට තිබෙන්නේ, එම භූමිය තුළ තිබෙන කුඹුරු ඉඩම්වල වෙනත් දිස්ත්‍රික්කවලින් ගෙනැල්ලා කවුරුවත් පදිංචි කරවන්න අපේ සූදානමක් නැහැ කියන එකයි. මේ දිස්ත්‍රික්කවලම සිටින ජනතාවට; ඇත්ත ගොවි ජනතාවට එම ඉඩම් ලබා දෙන්න තමයි අපි කටයුතු කරන්නේ. දේශපාලන අධිකාරිය, නිලධාරින් සහ ජනතාව සම්බන්ධ කරගෙන එම කටයුත්ත ඉතා විනිවිදභාවයකින්, නිසි, විධිමත් වැඩ පිළිවෙළක් යටතේ සිදුකර ජනතාවට එම ඉඩම් බෙදා දීම සඳහා තමයි අපි සැලසුම් කර තිබෙන්නේ. ඒ නිසා කිසිදු ගැටලුවක් තබා ගන්න එපා, ඇත්ත ගොවි ජනතාවට ඒ හැම බිමක්ම ලබා දෙන්න අපි ආණ්ඩුවක් විධියට කටයුතු කරනවා.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)

கௌரவ பிரதி அமைச்சர் அவர்களே, நன்றி! நான் ஒரு விடயத்தைச் சொல்ல விரும்புகின்றேன். அதாவது, நீங்கள் மேற்கொள்கின்ற விடயங்கள் பற்றி அந்தப் பிரதேசத்தில் இருக்கின்ற மக்கள் பிரதிநிதிகளாகிய எங்களுக்கும் சொன்னீர்கள் என்றால், அதில் நாங்களும் கவனம் செலுத்துவோம். எனது இரண்டாவது மேலதிக வினாவை கௌரவ துரைராசா ரவிகரன் அவர்கள் கேட்பார்.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු තුරෛරාසා රවිකරන් මන්ත්‍රීතුමා.

**ගරු තුරෛරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

கௌரவ பிரதி அமைச்சர் அவர்களே, கடந்த முறை உங்களுடைய அமைச்சின் அமைச்சுசார் ஆலோசனைக் குழுக் கூட்டத்தில் நெல் கொள்வனவு விடயம் பற்றி கதைத்தபோது, எங்களுடைய பகுதியில் யூலை மாதம் 13ஆம் திகதி நெல் சந்தைப்படுத்தல் சபைமூலம் நெல் கொள்வனவு மேற் கொள்ளப்படுமெனச் சொல்லப்பட்டது. அப்போது நான் சொன்னேன், அன்றைய தினம் நெல் கொள்வனவு மேற்கொள்ளப்படாது என்று. ஏனெனில், முல்லைத்தீவிலுள்ள அந்த store நிரம்பி வழிகின்றது. அந்தக் கூட்டத்தில் நீங்களும் இருந்தீர்கள்.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මූලික ප්‍රශ්නයට අදාළව අතුරු ප්‍රශ්නය අහන්න. සම්පූර්ණයෙන්ම අදාළ නැති කාරණයක් තමයි ඔබතුමා අතුරු ප්‍රශ්නයෙන් අහන්නේ.

**ගරු තුරෛරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

மன்னார் பகுதியில் இன்னும் நெல் கொள்வனவு இடம்பெறவில்லை. இதற்கான பதிலை நான் கௌரவ பிரதி அமைச்சரிடம் எதிர்பார்க்கின்றேன். வவுனியாவிலுள்ள கனகராயன்குளம் storeக்கு முல்லைத்தீவின் ஒட்டுசுட்டான், துணுக்காய், மாந்தை கிழக்கு பகுதிகளின் நெல்லைக் கொண்டுசெல்ல வேண்டுமென நெல் சந்தைப்படுத்தல் சபை அறிவித்துள்ளது. இந்த இடங்களிலிருந்து -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අදාළ ප්‍රශ්නයක් නොවෙයි අතුරු ප්‍රශ්නය විධියට අහන්නේ. මූලික ප්‍රශ්නයෙන් පැන නඟින ගැටලුවක් නිරාකරණය කර ගැනීම සඳහා තමයි අතුරු ප්‍රශ්නයක් ඇසිය යුත්තේ. නමුත් ඔබතුමා අතුරු ප්‍රශ්නය විධියට අහන්නේ වෙනත් ප්‍රශ්නයක්.

**ගරු තුරෛරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
கௌரவ சபாநாயகர் அவர்களே, நான் கேட்கப்போகும் மேலதிக வினா பிரதான வினாவுடன் சம்பந்தப்பட்டது. இது விவசாய அமைச்சுடன் தொடர்புடையது. இது நெல் கொள்வனவு செய்யவேண்டிய காலப்பகுதியாகும்.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, මෙම මූලික ප්‍රශ්නයෙන් අසා තිබෙන්නේ වැව් ගැන. ඔබතුමා වී වෙළෙඳාමක් ගැන කථා කරනවා.

**ගරු තුරෛරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
அப்படி என்றால், நான் இந்தக் கேள்வியை இந்தச் சபையில் யாரிடம் கேட்பது?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා ප්‍රධාන ප්‍රශ්නයක් විධියට ඔය කාරණය ඉදිරිපත් කරන්න. එතකොට ඔය ප්‍රශ්න අහන්න පුළුවන්. මට මේ මොහොතේ ඊකට අවස්ථාව ලබා දිය නොහැකියි.

**ගරු තුරෛරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
கௌரவ பிரதி அமைச்சர் அவர்களே, குளங்களிலிருந்து நீர் பாய்ச்சி, அதன்மூலம் விளைகின்ற நெல்லை விற்பனை செய்ய முடியாமல் இருக்கின்றது. நீங்கள் அமைச்சுசார் ஆலோசனைக் குழுக் கூட்டத்தில் சொன்னீர்கள், யூலை மாதம் 13ஆம் திகதி நெல் கொள்வனவு செய்வதாக. ஆனால், 15ஆம் திகதிதான் நெல் கொள்வனவு செய்யப்பட்டது.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අතුරු ප්‍රශ්න ඇසීමේදී ඔබතුමා මේ කාරණාව හැල්ලුවට සහ විහිළුවට ලක් කර ගන්න එපා. මම ඒ ගැන බොහොම කනගාටු වෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

## ගවේෂණාත්මක පුවත් වාර්තා කරන ප්‍රාදේශීය මාධ්‍යවේදීන්: දීමනා
பிராந்திய ஊடகவியலாளர்கள் சேகரிக்கும் புலனாய்வுச் செய்திகள்: கொடுப்பணவு
REGIONAL JOURNALISTS REPORTING INVESTIGATIVE NEWS: PAYMENTS

1829/2026

**10.** ගරු ලාල් ප්‍රේමනාත් මහතා
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ප්‍රාදේශීය මාධ්‍යවේදීන් තමන්ගේ වියදමෙන් වාර්තා කරන පුවත් සඳහා මාධ්‍ය ආයතන ගෙවනු ලබන මුදල පිළිබඳව දන්නේද;

(ii) එසේ නම්, එම ගෙවීම් ප්‍රමාණවත් නොවන බව පිළිගන්නේද;

(iii) ඔවුන්ට නිශ්චිත අවම දීමනාවක් හඳුන්වාදීමට කටයුතු කරන්නේද;

(iv) ප්‍රාදේශීය මාධ්‍යවේදීන් එවනු ලබන ගවේෂණාත්මක පුවත් විවිධ හේතු මත මාධ්‍ය ආයතන විසින් වාරණය කිරීමට හෝ විකෘති කිරීම වැළැක්වීමට ඇති වැඩපිළිවෙළකවරේද;

(v) ප්‍රාදේශීය මාධ්‍යවේදීන් මාධ්‍ය ආයතන වෙත යොමු කරන ගවේෂණාත්මක පුවත් සඳහා මාධ්‍ය ආයතන පමණක් සම්මාන දිනා ගැනීම නතර කිරීමට මැදිහත් වන්නේද;

(vi) ප්‍රාදේශීය මාධ්‍යවේදීන් සපයන තොරතුරු සහ දර්ශන හේතුවෙන් ඔවුන් දෝෂාරෝපණයට ලක්වීම හෝ අනාරක්ෂිතවීම වැළැක්වීමට ගන්නා පියවර කවරේද;

(vii) ප්‍රාදේශීය මාධ්‍යවේදීන් මුහුණ දෙන අසාධාරණයන් සම්බන්ධයෙන් සොයා බැලීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பிராந்திய ஊடகவியலாளர்கள் தங்கள் செலவில் அறிக்கையிடும் செய்திகளுக்காக ஊடக நிறுவனங்களால் செலுத்தப்படுகின்ற கொடுப்பனவு குறித்து அறிவாரா;

(ii) அவ்வாறாயின், அக்கொடுப்பனவுகள் போது மானவை அல்ல என்பதை ஏற்றுக்கொள்வாரா;

(iii) அவர்களுக்காக உறுதியான, குறைந்தபட்ச கொடுப்பனவொன்றை அறிமுகம் செய்வதற்கு நடவடிக்கை எடுப்பாரா;

(iv) பிராந்திய ஊடகவியலாளர்களின் புலனாய்வுச் செய்திகள் ஊடக நிறுவனங்களால் பல்வேறு காரணங்களின் அடிப்படையில் தணிக்கை செய்யப்படுவதை அல்லது திரிபுபடுத்தப் படுவதை தடுப்பதற்காகத் தற்போதுள்ள வேலைத்திட்டம் யாது;

(v) பிராந்திய ஊடகவியலாளர்களின் புலனாய்வுச் செய்திகளுக்காக, ஊடக நிறுவனங்கள் மாத்திரம் விருதுகளை தட்டிச்செல்வதை நிறுத்துவதற்கு இடையீடு செய்வாரா;

(vi) பிராந்திய ஊடகவியலாளர்கள் வழங்கும் தகவல்கள் மற்றும் காணொளிகள் காரணமாக இவர்கள் குற்றம் சாட்டப்படுவதை அல்லது பாதுகாப்பற்ற நிலைக்குத் தள்ளப்படுவதைத் தடுப்பதற்காக எடுக்கவிருக்கும் நடவடிக்கை யாது;

(vii) பிராந்திய ஊடகவியலாளர்கள் எதிர்கொள்ளும் அநீதிகள் சம்பந்தமாக ஆராய நடவடிக்கை எடுப்பாரா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House -

(i) whether he is aware of the amount paid by media institutions for the news reported by regional journalists at their own expense;

(ii) if so, whether he accepts that such payments are inadequate;

(iii) whether actions will be taken to introduce a specific minimum allowance for them;

(iv) the programme available to prevent the investigative news sent by regional journalists from being censored or distorted by media institutions for various reasons;

(v) whether any intervention will be made to stop media institutions from winning awards by themselves for the investigative news sent by regional journalists to the media institutions;

(vi) the steps taken to prevent regional journalists from being subjected to criticism or facing security threats due to the information and footage provided by them; and

(vii) whether steps will be taken to look into the injustices faced by regional journalists?

(b) If not, why?

**ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය (ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன - வெகுசன ஊடக பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne - Deputy Minister of Mass Media)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) රජය විසින් නොවෙයි, පෞද්ගලික මාධ්‍ය ආයතනවල කාර්ය මණ්ඩල වෙත සේවා ලබා ගැනීම වෙනුවෙන් සිදු කරනු ලබන ගෙවීම් තීරණය කරන්නේ. ඒ නිසා අමාත්‍යාංශයේ මැදිහත්වීමක් ඒ පිළිබඳව සිදු කරන්නේ නැහැ.

(ii) පෞද්ගලික ආයතනවල ගෙවීම් සම්බන්ධයෙන් රජය මැදිහත් වෙන්නේ නැහැ.

(iii) ඔවුන්ට දීමනාවක් හඳුන්වා දෙන්න අමාත්‍යාංශයට මැදිහත්වීමක් කරන්න බැහැ.

(iv) පෞද්ගලික මාධ්‍ය ආයතන විසින් වාර්තා කරනු ලබන ලිපිවල අන්තර්ගතයන් සම්බන්ධ කටයුතු පාලනය කිරීමට රජය ලෙස අපට හැකියාවක් නැහැ. ඒක මාධ්‍ය නිදහස සම්බන්ධ කාරණයක්.

(v) ඒක මාධ්‍ය ආයතනවල තිබෙන තරගවල නීති-රීති අනුව කරන දෙයක්. ඒ නිසා ඒකට මැදිහත්වීමේ හැකියාවක් නැහැ.

(vi) ඇත්තටම ප්‍රාදේශීය මාධ්‍යවේදීන් පෞද්ගලික ආයතනවලට වැඩ කිරීම සම්බන්ධයෙන් අපට මැදිහත් වෙන්න බැරි වුණත්, අපි රජයක් ලෙස ඇත්තටම ඔවුන්ගේ ආරක්ෂාව තහවුරු කරන වැඩවලට සම්බන්ධ වෙනවා. යම් හෙයකින් ඔවුන් සමාජයෙන් මොනවා හරි ගැටලුවකට මුහුණ දෙනවා කියලා දැනගත් වහාම අපි එයට මැදිහත් වෙලා තිබෙනවා. රජය ලෙස අපි ඔවුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමට බැඳී සිටිනවා කියන කාරණය තමයි කියන්න තිබෙන්නේ.

(vii) මාධ්‍ය ආයතනවලින් සිදු වන අසාධාරණ සම්බන්ධව ඇත්තටම කම්කරු නීතිය යටතේ තමයි පියවර ගත යුත්තේ. නමුත්, ඒක හැරුණාම ඔවුන්ගේ රැකියා සුරක්ෂිතභාවය සම්බන්ධයෙන් ගැටලු ඇති වූ විට අපි ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ලෙස මැදිහත් වෙලා තිබෙනවා. ඒ වාගේම ඔවුන්ගේ විවිධ සුබසාධන වැඩසටහන් සඳහා අපි රජය ලෙස මැදිහත් වෙලා තිබෙනවා.

(ආ) අදාළ නොවේ.

**ගරු ලාල් ප්‍රේමනාත් මහතා**
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)

ගරු කථානායකතුමනි, පසුගිය රජයන් බොහොමයක් විසින් මේ රටේ බිම් මට්ටමේ ඉඳගෙන ජනතාව වෙනුවෙන් සේවය කරන සහ ලේ, කඳුළු, දහඩිය වගුරන මිනිස්සු අමතක කරපු කාලයක් අපි ගත කරලා තිබෙන බව අපි දන්නවා. ඒ අනුව අපි නව රජයක් විධියට පත් වුණාට පස්සේ, ඒ සියලුදෙනා වෙනුවෙන් ඉතාම වැදගත් තීන්දු-තීරණ රාශියක් අරගෙන තිබෙනවා. ඒ නිසා මම මේ ප්‍රශ්නය යොමු කිරීමෙන් අරමුණු කළේ, රටට ප්‍රවෘත්ති සපයන ඉතාම ජීවිත අවදානමකින් යුතුව කටයුතු කරන, මෙවන් පිරිසක් පිළිබඳව ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අවධානය යොමු කිරීමත්, සමහර පෞද්ගලික මාධ්‍ය ආයතන විසින් නොසලකා හැරීමට ලක් කර තිබෙන ඔවුන් වෙනුවෙන් පෙරමුණ ගෙන, ඒ පෞද්ගලික මාධ්‍ය ආයතනවලට ආදර්ශයක් සැපයීම සඳහා අපේ රජයේ අවධානය යොමු කිරීම සඳහාත්ය. ගරු නියෝජ්‍ය ඇමතිතුමියගේ පිළිතුර පිළිබඳව මා සෑහීමකට පත් වෙනවා. ඒ නිසා මට වෙනත් අතුරු ප්‍රශ්න ඇසීමට නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දෙවන වටය.

## කළමනාකරණ සේවා නිලධාරි තනතුර: බඳවා ගැනීම් සහ පුරප්පාඩු

## முகாமைத்துவ சேவை உத்தியோகத்தர் பதவி: ஆட்சேர்ப்பு மற்றும் வெற்றிடங்கள்

## POST OF MANAGEMENT SERVICE OFFICER: RECRUITMENTS AND VACANCIES

1659/2025

**8. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු චානක මාදුගොඩ මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு சானக மாதுகொட சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Chanaka Madugoda)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අවසන් වරට පැවති සීමිත සහ විවෘත තරඟ විභාගය මඟින් කළමනාකරණ සේවා නිලධාරි තනතුර සඳහා බඳවාගෙන ඇති මුළු සංඛ්‍යාව කොපමණද;

(ii) එම තනතුර සඳහා සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලබා ඇති සහ මේ වනවිට වැඩ භාරගෙන ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

(iii) එම බඳවාගැනීම්වලින් පසුව මේ වනවිට එම තනතුරේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iv) එම පුරප්පාඩු සඳහා පැවති තරඟ විභාගයේ කඩඉම් ලකුණු ආසන්නයට ලකුණු ලබා සිටින අපේක්ෂකයන් බඳවා ගැනීමට අපේක්ෂා කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இறுதியாக நடைபெற்ற மட்டுப்படுத்தப்பட்ட மற்றும் திறந்த போட்டிப் பரீட்சையினூடாக முகாமைத்துவ சேவை உத்தியோகத்தர் பதவிக்கு ஆட்சேர்ப்பு செய்யப்பட்ட மொத்த உத்தியோகத் தர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) மேற்படி பதவிக்காக நேர்முகத் தேர்வின் போது தகைமைபெற்ற மற்றும் தற்பொழுது கடமைகளைப் பொறுப்பேற்றுள்ளவர்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(iii) மேற்படி ஆட்சேர்ப்பின் பின்னர் தற்பொழுது அப்பதவியில் நிலவும் வெற்றிடங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iv) மேற்படி வெற்றிடங்களுக்காக நடத்தப்பட்ட போட்டிப் பரீட்சையில் வெட்டுப்புள்ளிக்கு அண்மித்த புள்ளிகளைப் பெற்றுள்ள பரீட்சார்த் திகளை ஆட்சேர்ப்புச் செய்வதற்கு உத்தேசித் துள்ளீர்களா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Will he inform this House -

(i) the total number recruited to the post of Management Service Officer through the recently held limited and open competitive examinations;

(ii) separately, the number of applicants who have qualified at the interview for the said post and the number of those who have assumed duties to date;

(iii) the number of vacancies that currently exist in the said post following the said recruitments; and

(iv) whether it is expected to recruit the candidates who scored just below the cut-off marks at the competitive examinations that were held for the recruitment to the said post?

(b) If not, why?

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
* சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :
* *Answer tabled:*

(අ) (i) කළමනාකරණ සේවා නිලධාරි තනතුර සඳහා සීමිත පදනම යටතේ නිලධාරින් 692ක් බඳවා ගැනීමට අනුමැතිය හිමි වූ අතර, එයින් සුදුසුකම් ලද අයදුම්කරුවන් 670ක් බඳවා ගන්නා ලදී.

විවෘත පදනම යටතේ නිලධාරින් 1,615ක් බඳවා ගැනීම සඳහා අනුමැතිය හිමි වූ අතර, ඒ අතුරින් සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් 1,252ක් බඳවා ගැනීමට කටයුතු කර ඇත.

(ii) සීමිත පදනම යටතේ නිලධාරින් 670ක් සම්මුඛ පරීක්ෂණය මඟින් සුදුසුකම් ලබා ඇති අතර, යාවත්කාලීන වී ඇති දත්ත අනුව එයින් වැඩ භාර ගෙන නොමැති නිලධාරින් සංඛ්‍යාව 18කි.

විවෘත පදනම යටතේ නිලධාරින් 1,252ක් සම්මුඛ පරීක්ෂණය මඟින් සුදුසුකම් ලබන ලද අතර, මෙම නිලධාරින් 2026.07.15 දින සිට ක්‍රියාත්මක වන පරිදි සේවා ස්ථාන වෙත අනුයුක්ත කර ඇත. එම නිලධාරින්ට රාජකාරි භාර ගැනීම සඳහා සති දෙකක කාලයක් හිමි වන අතර, ඒ අනුව 2026.07.29 දින දක්වා රාජකාරි භාර ගැනීමේ හැකියාව පැවතිණි. එම නිලධාරින්ගේ රාජකාරි භාර ගැනීම සම්බන්ධ සියලු තොරතුරු මෙතෙක් යාවත්කාලීන වී නොමැති බැවින් වැඩ භාර ගත් සංඛ්‍යාව මේ අවස්ථාවේ දී නිශ්චිතව සඳහන් කිරීමේ හැකියාවක් නොමැත.

(iii) ආයතන මඟින් යාවත්කාලීන කර ඇති දත්ත සහ විශ්‍රාම යාම මත ඇති වූ පුරප්පාඩු සැලකීමේදී මේ වන විට පවතින පුරප්පාඩු සංඛ්‍යාව දළ වශයෙන් 3,500කි.

(iv) එම පුරප්පාඩු මේ වන විට බඳවා ගැනීම් සිදු කර ඇති විවෘත සහ සීමිත තරග විභාග සඳහා අනුමැතිය හිමි වූ පුරප්පාඩු ගණනය කළ දිනට පසුව යාවත්කාලීන වූ පුරප්පාඩු වන බැවින් එම පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා නව තරග විභාගයක් පැවැත්විය යුතු වන අතර, ඒ සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව ලබා දී ඇති නියෝගද ප්‍රකාරව නව තරග විභාගයක් පැවැත්වීම සඳහා අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමින් පවතී.

(ආ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න, ගරු සජිත් ප්‍රේමදාස මහතා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු කථානායකතුමනි, මගේ ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට පෙර මම ඔබතුමාගෙන් බොහොම කාරුණිකව ඉල්ලීමක් කරනවා. අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා ඇමතිතුමා මේ ගරු සභාවට ඇවිල්ලා විශේෂ දැනුවත් කිරීමක් කිරීම යුතුකමක්. ඊයේ දවසේ මැගසින් බන්ධනාගාරයේ ඇති වූ සිද්ධියෙන් මරණයක් සිදු වෙලා තිබෙනවා. අද දවසේ කුරුවිට බන්ධනාගාරයේ ඇති වූ සිද්ධියෙන්

මරණ දෙකක් සිදු වෙලා තිබෙනවා. ඒ වාගේම පල්ලන්සේන බන්ධනාගාරයේ රැඳවියන් සිටින ස්ථානයේත් ලොකු කලබලයක් ඇති වෙලා තිබෙනවා කියලා දැන් වාර්තා වෙනවා.

මම විශ්වාස කරනවා, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයා විසින් මැගසින් බන්ධනාගාරයේත්, කුරුවිට බන්ධනාගාරයේත්, පල්ලන්සේන බන්ධනාගාරයේත් සිදුවී ඇති මේ සිද්ධි පිළිබඳව සභාව දැනුවත් කිරීම ඉතාම වැදගත් බව. ස්ථාවර නියෝග 27(2) යටතේ මගේ ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට පෙර ගරු කථානායකතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ඒ සම්බන්ධව කටයුතු කරන්න කියලා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### ජීවන වියදම සහ උද්ධමනය ජනතාව කෙරෙහි බලපාන ආකාරය
### வாழ்க்கைச் செலவு மற்றும் பணவீக்கம் மக்கள்மீது செலுத்தும் தாக்கம்
### EFFECT OF COST OF LIVING AND INFLATION ON THE PEOPLE

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකාවේ ආර්ථිකය ස්ථාවර වී ඇති බවත්, ආර්ථික වර්ධනයක් අත්කරගෙන ඇති බවත් රජය විසින් නිරන්තරයෙන් ප්‍රකාශ කරනු ලබනවා. එහෙත් සමාජ සුබසාධනයේ මූලික අරමුණ වන්නේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සහ ආර්ථික පීඩනයට ලක්වන පවුල්වලට ප්‍රමාණවත් ආරක්ෂාවක් සැලසීමයි. වර්තමානයේ අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවාවල මිල ගණන් අඛණ්ඩව ඉහළ යෑම, සැබෑ ආදායම හා මිලදී ගැනීමේ ශක්තිය පිරිහීම හේතුවෙන් විශේෂයෙන් අඩු හා මධ්‍යම ආදායම්ලාභී පවුල් වැඩි ජීවන පීඩනයකට මුහුණ දී සිටින බව පැහැදිලිවම පෙනී යනවා. එම නිසා රජය ක්‍රියාත්මක කරන සමාජ සුබසාධන ප්‍රතිපත්ති සහ වැඩසටහන් ජනතාවගේ ජීවන වියදම් පීඩනය අවම කිරීමට සහ ඔවුන්ගේ ජීවන තත්ත්වය සැබෑ ලෙස වැඩිදියුණු කිරීමට ප්‍රමාණවත් වී තිබේද යන්න පිළිබඳව පැහැදිලි කිරීමක් ලබා ගැනීම සඳහා පහත සඳහන් ප්‍රශ්න මා යොමු කරමි.

1. රජය සතුව ඇති නවතම නිල දත්ත අනුව, ශ්‍රී ලංකාවේ සාමාන්‍ය පවුලකට මූලික අවශ්‍යතා සපුරාලීම සඳහා සාමාන්‍ය මාසික ජීවන වියදම - cost of living - විධියට කොපමණ මුදලක් අවශ්‍යද? ඒ කියන්නේ මාසික ජීවන වියදම - monthly living expenditure - සාමාන්‍ය පවුලක මාසික ආදායමට සාපේක්ෂව දරාගත හැකි මට්ටමක පවතින බවට වූ රජයේ නිල ඇගැයීම කුමක්ද?

2. පසුගිය මැයි, ජූනි, ජූලි මාසවල උද්ධමනය පිළිවෙළින් සියයට 5.5, 6.8 සහ 7.3ක් ලෙස වාර්තා වෙලා තිබෙනවා. අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය මත, ඖෂධ මිල මත ඇති කර තිබෙන අනවශ්‍ය පීඩනය සමඟ සාමාන්‍ය ජනතාවගේ ක්‍රය ශක්තිය හීන වීම පිළිබඳව රජයේ ඇගැයීම කෙබඳුද?

3. ජීවන වියදම ඉහළ යෑම හේතුවෙන් ජනතාවට ණය මත වැඩි වශයෙන් යැපීමට සිදුව ඇති අතර, ස්ථාවර තැන්පතු පොලී අනුපාතද පහළ යෑම හේතුවෙන් විශ්‍රාමිකයින් සහ ඉතුරුම් මත යැපෙන පවුල්වල ආදායමද සැලකිය යුතු ලෙස අඩු වී ඇති බව රජය පිළිගන්නේද? මෙම කණ්ඩායම් දෙකම මුහුණ දෙන ආර්ථික පීඩනය අවම කිරීම සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද?

4. 2026 මාර්තු මස වන විට සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය හරහා පවුල් 1,695,843ක් දිළිඳු ප්‍රජාව ලෙස හඳුනාගෙන ඇති බව වාර්තා වනවා. එම සංඛ්‍යාව 2024 හා 2025 වසරවල සංඛ්‍යා සමඟ සසඳන විට කොපමණ ප්‍රමාණයකින් වෙනස් වී තිබේද? එම සංඛ්‍යාවේ වෙනස්වීම තුළ මෙරට ආර්ථික දුෂ්කරතා සහ දුප්පත්කම තවදුරටත් ව්‍යාප්ත වී ඇති බව රජය පිළිගන්නේද? නොඑසේ නම්, ඒ මන්ද?

   විශේෂයෙන්ම මම කියන්න කැමැතියි, මේ කාරණයත්. Centre for Poverty Analysis වැනි ආයතන විසින් අපේ රටේ දුප්පත්කම ශීඝ්‍ර ලෙස ඉහළ ගිහින් තිබෙන බව ප්‍රකාශ කරනවා. ඒ වාගේම තවත් සමීක්ෂණ ආයතන කියනවා, දුප්පත්කම රටේ ජනගහනයෙන් සියයට 30ත්, 40ත් අතර ප්‍රමාණයක් බව. ගරු ඇමතිතුමනි, ඒ නිසා මේ කාරණාව පිළිබඳව ඔබතුමාගෙන් පැහැදිලි විග්‍රහයක් අවශ්‍යයි.

5. රුපියල් මිලියන 25,000ක ප්‍රතිපාදන වෙන් කෙරුණු ප්‍රජා ශක්ති වැඩසටහන මඟින් - රුපියල් මිලියන 25,000ක් කියන්නේ, රුපියල් බිලියන 25ක්; රුපියල් ලක්ෂවලින් ගත්තොත් 250,000ක් - මේ දක්වා ප්‍රතිලාභ ලැබුණු පවුල් සංඛ්‍යාව කොපමණද කියලා අපි දැනගන්න කැමැතියි. ස්ථිර ආදායම් මාර්ගයක් ඇති කර ගත් පවුල් සංඛ්‍යාව කොපමණද? එම වැඩසටහන්වල කාර්ය සාධනය පිළිබඳව ස්වාධීන ඇගැයීමක් සිදු කර තිබේද? එසේ නම්, එම වාර්තා සභාගත කරන්නේද?

6. ජාතික සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තිය (2025-2035) සහ එහි උපාය මාර්ගික සැලැස්ම අනුව 2026 වසර සඳහා නියමිත ඉලක්කවලින් මේ දක්වා සපුරා ඇති ප්‍රගතිය කොපමණද? ඒ පිළිබඳව නිල කාර්ය සාධන වාර්තාවක් සභාවට ඉදිරිපත් කරනවාද?

   ඒ වාගේම මම ගරු ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි, ප්‍රාථමික අතිරික්තය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් හැටියට 2.3ක් විය යුතුයි කියලා IMF එක කියනකොට, බදු බර වැඩි කරලා, ඒක 5.4 දක්වා වැඩි කරගෙන තිබෙන්නේ ඇයි කියලා. ඒ වාගේම රාජ්‍ය ආදායම් ඉලක්කය සියයට 13.9ක් කියන එක තමයි IMF ඉලක්කය. ඒක සියයට 15.4ක් දක්වා ඉහළ නංවා තිබෙනවා, බදු බර වැඩි කරලා. එහෙම බදු බර වැඩි කරලා, ඇත්තවශයෙන්ම රටේ ජනතාව අතිශය පීඩනයකට ලක් කරන්නේ ඇයි කියලා මම අහන්න කැමැතියි.

7. 2025 ගෘහස්ථ ආදායම් හා වියදම් සමීක්ෂණයේ ප්‍රතිඵල 2026 ඔක්තෝබර් මාසයේදී නිකුත් කිරීමට නියමිත බව රජය ප්‍රකාශ කර තිබෙනවා. එම සමීක්ෂණයේ මූලික දත්ත මේ වන විට රජය සතුව පවතින්නේද? එම දත්ත සභාගත කිරීමට කටයුතු කරන්නේද? ඒවා 2027 අය වැය සකස් කිරීමේදී භාවිත කරන්නේද?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු අනිල් ජයන්ත ඇමතිතුමනි, ඔබතුමා විපක්ෂ නායකතුමාගේ ප්‍රශ්නයට පිළිතුරු දෙන්න සූදානමින් ඉන්නවා. මට තත්පර කිහිපයක් දෙන්න.

ගරු විපක්ෂ නායකතුමාත් මේ කාරණය මතු කළා. අධිකරණ ඇමතිතුමා මේ වෙලාවේත් මීට අදාළ විශේෂ සාකච්ඡා කිහිපයකට සම්බන්ධ වෙලා ඉන්නේ. මම හිතන විධියට, මහජන ආරක්ෂාව පිළිබඳ විෂය භාර ඇමතිතුමා අද ෂාණක්කියන් මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයකට පිළිතුරු දීමට නියමිතව තිබෙනවා. ඊට පෙර එතුමා විසින් දැනට තිබෙන තත්ත්වය පිළිබඳව ප්‍රකාශයක් සිදු කරන්නත් බලාපොරොත්තුවෙන් ඉන්නවා. ඒ සඳහා අවසර ලබා දෙන්න කියලාත් ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි.

ස්ථාවර නියෝග 27(2) යටතේ ගරු විපක්ෂ නායකතුමා විසින් අසන ලද ප්‍රශ්නයට පිළිතුර ලබා දීම, ගරු මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා විසින් ස්ථාවර නියෝග 27 (2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1. ඇත්තටම නිල දරිද්‍රතා රේඛාව ගණනය කරන ක්‍රමවේදය ලෝක පරිමාණයෙන් තිබෙන ක්‍රමවේදයක්. ලංකාවේත් ඒ පවතින රාජ්‍යය විසින් කරන ගණනය කිරීමක් මිසක් මේ අගය ආණ්ඩුව විසින් වෙනම ඇස්තමේන්තු කරන අගයක් නොවෙයි. 2026 ජූනි මාසයේ නිල දරිද්‍රතා රේඛාවට අනුව එක් පුද්ගලයෙකුගේ මූලික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා - මා නැවතත් අවධාරණය කරනවා, මූලික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා - අවශ්‍ය අවම මුදල 2026 ජූනි මාසය වනකොට රුපියල් 17,592ක්. ලංකාවේ සාමාන්‍ය පවුලක හතරදෙනෙකුට ආසන්න සංඛ්‍යාවක් ඉන්නවා. ඒ අනුව හතරදෙනෙකුගෙන් සමන්විත පවුලකට අවම මූලික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා අවශ්‍ය මුදල රුපියල් 70,368ක් වනවා.

   ඒ වාගේම ගෘහ ඒකක ආදායම් වියදම් සමීක්ෂණය සිදු කරලා එම වාර්තාව ඉදිරිපත් කරන්න නියමිත වන්නේ 2026 ඔක්තෝබර් මාසයේදී. ඒ සඳහා අදාළ දත්තවල නිවැරදි කිරීම් මේ වන විට සිදු කරමින් පවතිනවා. ඒ අනුව ඒවා නිසි පරිදි ඉදිරියේදී ඉදිරිපත් කරනවා.

2. අපි මාස්පතා උද්ධමන අගය ඉදිරිපත් කරනවා. 2026 මැයි, ජූනි, ජූලි වනකොට සියයට 7.3 දක්වා උද්ධමනයේ ඉහළ යෑමක් පෙන්නුම් කරනවා.

   අපේ ආණ්ඩුව පත් වනකොටමත් මහ බැංකුව සහ මුදල් අමාත්‍යාංශය ඒකාබද්ධව පවත්වන ක්‍රමවේදය අනුව රටේ උද්ධමනය පාලනය කිරීමේ අවශ්‍යතාව මත නම්‍යශීලී උද්ධමනය ඉලක්ක කිරීමේ රාමුවකට අනුව තමයි වැඩ කටයුතු කරමින් හිටියේ. අපි ඒ රාමුව ඇතුළේම තමයි වැඩ කටයුතු කරන්නේ. ඒ රාමුවට අනුව උද්ධමනය පාලනය කිරීම පවත්වා ගත යුතු වන්නේ සියයට 5ක මට්ටමක. එම නිසා ඒ සියයට 5 යටතේදී සියයට 2ක් වැඩිවීම අපි අපේක්ෂා කරනවා වාගේම සියයට 2ක් අඩුවීමත් අපේක්ෂා කරනවා. ඒ නිසා පහළ මට්ටම විධියට සියයට 3ක් පවත්වා ගැනීමත්, ඉහළ මට්ටම විධියට සියයට 7 දක්වා පවත්වාගෙන යාමත් කියන්නේ උද්ධමනය පාලනය කිරීමේ අර්බුදයක් හෝ ගැටලුවක් වෙලා නැහැ කියන එකයි. මේ කාල පරිච්ඡේදයේදී කිසිදු අවස්ථාවක ඒ සීමාව පැන්නුවේ නැහැ. හැබැයි, ජූනි මාසයේදී ඉහළ සීමාවට - සියයට 7.3ට - ඇවිල්ලා තිබෙනවා. එලෙස උද්ධමනය පවතිද්දී මහ බැංකුවත්, මුදල් අමාත්‍යාංශයත් මැදිහත් වෙලා යම් යම් ක්‍රියාමාර්ග ගන්නවා. දීර්ඝ කාලීන ක්‍රියාමාර්ගවලට යන්නේ ප්‍රවණතාවක් විධියට උද්ධමනය අඛණ්ඩව ඉදිරියට යනවා නම් පමණයි. දැන් කරුණු අධ්‍යයනය කරලා බැලුවාම එය සියයට 7.3 දක්වා වර්ධනය වීම තුළ තිබෙන්නේ ප්‍රවණතාවකට වඩා නිශ්චිත කාරණා. විශේෂයෙන්ම මැද පෙරදිග යුද තත්ත්වයේදී ඉන්ධන ඇතුළු මිල ගණන් ඉහළ යාම, රක්ෂණ සහ ප්‍රවාහන ගාස්තු වැඩිවීම නිසා ඇති වුණු තෙරපුම, ඩොලරයට සාපේක්ෂව රුපියල අවප්‍රමාණය වීම නිසා ඇති වුණු තාවකාලික තත්ත්වයක්. අපි ඉදිරියේදී කල්පනා කරලා බලනවා, කෙසේද මේ තත්ත්වය පාලනය කරන්නේ කියලා. තවමත් එය තිබෙන්නේ අපට පාලනය කර ගත හැකි මට්ටමක. ඒ නිසා ඒක තාවකාලික තත්ත්වයක්. ඒ ප්‍රවණතාව අධ්‍යයනය කරලා ඉදිරියේදී ඒ සඳහා සුදුසු පරිදි අදාළ ක්‍රියාමාර්ග ගනු ලබනවා.

3. රටක පොලී අනුපාතය ඇත්තටම ස්ථාවරව පහළ මට්ටමක, volatility එක අඩුවෙන් පවත්වා ගැනීම තමයි ඉතාම වැදගත් වෙන්නේ. අපි ආණ්ඩුව පටන් ගන්න කලින් මේ පොලී අනුපාතයේ උච්චාවචනය - ඉහළ පහළ යාම - අසාමාන්‍ය පරිදි තිබුණු නිසා තමයි මූල්‍ය ස්ථාවරත්වයත්, මිල ස්ථාවරත්වයත් පිළිබඳ ප්‍රශ්නයක් පැන නැඟිලා තිබුණේ. දැන් අපට පොලී අනුපාතය ඉහළ පහළ යාමකින් තොරව ස්ථාවරව පවත්වා ගැනීමට හැකියාව ලැබිලා තිබෙනවා. ඒ නිසා පොලී අනුපාතය හිතුවක්කාරීව ඉහළ දැමීම හෝ පහළ දැමීම මඟින් මේ ස්ථාවරත්වය අත්පත් කර ගන්න බැහැ. අපි අනුගමනය කරමින් යන්නේ ඒ ස්ථාවරත්වය පවත්වා ගෙන යාමයි.

   ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ආදායම් තත්ත්වය ඔවුන්ට තිබෙන ස්ථාවර ආදායම් මත ස්ථාවරව පවත්වා ගැනීමේ අරමුණින් ඔවුන්ගේ තැන්පතු මත අතිරේක පොලියක් ලබා දීමට රජය විසින් වැඩසටහනක් ක්‍රියාත්මක කළා. 2025.07.01 දින සිට 2025.12.31 දක්වා ක්‍රියාත්මක වුණු එම වැඩසටහන තුළදී ජ්‍යෙෂ්ඨ පුරවැසි තැන්පතු රුපියල් බිලියන 243ක් වෙනුවෙන් මේ සහනාධාරය ලබා දීලා තිබෙනවා. ඊට කලින් අවස්ථාවේදී මෙවැනි සහනාධාර ලබා දීලා බැංකුවලට ගෙවිය යුතු පොලිය නොගෙවා තිබීමෙන් අතිරේක බරක් භාණ්ඩාගාරයට පැනවිලා තිබුණා. ඒ ප්‍රමාණයත් අපේ ආණ්ඩුව යටතේ 2025 වර්ෂයේදී ගෙවා දමා තිබෙනවා.

   ඒ වාගේම ප්‍රජාව ඇතුළේ ඉන්න ක්ෂුද්‍ර හා සුළු පරිමාණ කර්මාන්තකරුවන්ට අඩු පොලියට ණය ලබා ගැනීමේ විවිධ වූ වැඩසටහන් ගණනාවක් කර්මාන්ත අමාත්‍යාංශයත්, මුදල් අමාත්‍යාංශයත්, ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශයත් ක්‍රියාත්මක කරමින් තිබෙනවා.

   ඒ වාගේම වැටුප පිළිබඳ කාරණයේදී යම් දෙයක් මම සඳහන් කරන්න ඕනෑ. භාණ්ඩ දෙක තුනක් ගත්තාම මතුපිටින් යම් යම් භාණ්ඩවල මිල ඉහළ යාමක් සිදුව තිබෙන බව පෙනෙනවා. නමුත් සමස්තයක් වශයෙන් වැටුප්වල ක්‍රය ශක්තිය - මිලදී ගැනීමේ හැකියාව - මනින මූර්ත වැටුප් දර්ශක තිබෙනවා. මම කියන්න ඕනෑ, අපි අනුගමනය කළ වැටුප් වැඩිවීම අනුව 2025දී එයින් සියයට 35කුත්, 2026දී තව සියයට 35කුත්, ඉතුරු ප්‍රමාණය 2027

ජනවාරි 01වැනි දාත් ලැබෙන්න නියමිත බව. මම දැන් මේ පිළිතුරටම අදාළව මේ කාරණයත් ඉදිරිපත් කරනවා.

2025 වර්ෂයේ මහ බැංකුව විසින් නිකුත් කරන ලද "වාර්ෂික ආර්ථික විවරණය" අනුව 2022 වර්ෂයට සාපේක්ෂව 2025 වර්ෂයේදී පමණක්, - 2026-2027දීත් වැටුප් වැඩිවීම නිසා ක්‍රය ශක්තිය ඉහළ යාමේ වර්ධනයක් තිබෙනවා - අපේ මූර්ත වැටුප් දර්ශකය සියයට 70 සිට 77.8 දක්වා වැඩි වෙලා තිබෙනවා. මූර්ත වැටුප් වැඩිවීම ප්‍රතිශතයක් හැටියට ගත්තාම 14.7ක්. මේ ප්‍රමාණය තිබෙන්නේ රාජ්‍ය අංශයේ. ඊළඟට, විධිමත් පෞද්ගලික අංශයේ මූර්ත වැටුප් දර්ශකය වැඩි වෙලා තිබෙනවා, 2022ට සාපේක්ෂව සියයට 112 සිට 119 දක්වා. 2024 වර්ෂයට සාපේක්ෂව එහි සියයට 30ක වර්ධනයක් පෙන්නුම් කරනවා.

ඒ වාගේම, අවිධිමත් ක්ෂේත්‍රයේත් මූර්ත වැටුප් දර්ශකය සියයට 88.3 සිට සියයට 90 දක්වා වැඩි වෙලා තිබෙනවා. 2024 වර්ෂයට සාපේක්ෂව එහි සියයට 5.1ක වර්ධනයක් පෙන්නුම් කරනවා.

4. සමාජ සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය හරහා අස්වැසුම ලබා දීමේදී දිළිඳු, අන්ත දිළිඳු, අවදානම් සහ සංක්‍රාන්ති කියලා සෘජුව කාණ්ඩ 4කට බෙදා ගන්නේ ප්‍රතිලාභ ලබා දීම සඳහා කරන වර්ගීකරණයක් සඳහා මිසක් දුප්පත්භාවය මැනීම හෝ වෙනත් ක්‍රියාකාරකමක් සඳහා නොවෙයි. කෙසේ වෙතත්, ඒ දත්ත අනුව දුප්පත්, අන්ත දුප්පත්, අවදානම් සහ සංක්‍රාන්ති කියන කාණ්ඩ හතරේම එකතුව විධියට ගත්තාම, 2024 වර්ෂයේදී පවුල් 1,766,098කට එම ප්‍රතිලාභ ගෙවලා තිබෙනවා. 2025 වර්ෂයේදී හඳුනා ගැනීම් මත එම කාණ්ඩ හතරේම එකතුව විධියට පවුල් 1,766,098කට ප්‍රතිලාභ ගෙවීම් සිද්ධ කරලා තිබෙනවා. 2025 වර්ෂයේ ඉඳලා හඳුනා ගැනීමේ ක්‍රමවේදයේදී යම් යම් දුර්වලතා තිබුණු බවත්, සමාජයෙන් ඇති වුණු ප්‍රශ්නවලට පැමිණිලි ඉදිරිපත් කිරීම මතත්, ඒ වැඩසටහනේම අංගයක් විධියටත් මෙය නැවත සහතික කර ගැනීම අත්‍යවශ්‍යයි. 2026 වර්ෂයේදීත් අපි මෙය නැවත සහතික කර ගැනීමේ ක්‍රියාවලියේ නිරත වෙලා ඉන්නවා. ඒ ක්‍රියාවලිය මේ සැප්තැම්බර් මාසයේදී අවසන් කරනවා. ඒ වනකොට අපි මේක graduation මට්ටමට ගෙනෙනවා. ඒ තුළින් සංක්‍රාන්ති කණ්ඩායමත්, අවදානම් කණ්ඩායමත් මෙතැනින් අයින් කරලා ඔවුන්ව සවිබලගන්වනවා. එතකොට තවදුරටත් ඉතුරු වෙන්නේ දුප්පත් සහ අන්ත දුප්පත් කියන කාණ්ඩ දෙක පමණයි. ඒ අනුව 2026 වසරේ මේ දක්වා recertification එක ඉවර වෙන්න කලින් තිබෙන තත්ත්වය තමයි, පවුල් 1,263,803ක ප්‍රමාණයක් ඉතුරු වීම. ඒ කියන්නේ, 2025ට සාපේක්ෂව ඒ ප්‍රමාණය අඩු වෙලා තිබෙනවා. නමුත්, ඒ ප්‍රමාණයේ යම් වැඩි වීමක් සිද්ධ වෙන්න පුළුවන්. මොකද, අවදානම් කාණ්ඩයත්, සංක්‍රාන්ති කාණ්ඩයත් නැවත සහතික කිරීම මඟින් සුදුසුකම් ලැබීමේ ඉඩකඩ තිබෙනවා. එම නිසා මෙතැනට ඒ ප්‍රමාණය එකතු වෙන්නට ඉඩ තිබෙනවා.

5. "ප්‍රජා ශක්ති" වැඩසටහන පිළිබඳව තමයි මෙම ප්‍රශ්නයෙන් අහලා තිබෙන්නේ. බහුමාන දරිද්‍රතාව අවම කිරීමට ඉවහල් වන කෘෂි කාර්මික යටිතල පහසුකම් සංවර්ධනය, පානීය ජලය, විදුලිය, සනීපාරක්ෂක පහසුකම් ඇතුළු අත්‍යවශ්‍ය යටිතල පහසුකම් සහ නිෂ්පාදන ආර්ථිකයට බලපාන යටිතල පහසුකම් සංවර්ධනයට අදාළව ව්‍යාපෘති 15,319ක් මේ වනකොටත් අනුමත කරලා ක්‍රියාත්මක අදියරේ පවතිනවා. එම ව්‍යාපෘති අතරින් ව්‍යාපෘති 9,137ක් ප්‍රතිලාභීන්ගේ ආදායම් උත්පාදනයට සෘජුව ඉවහල් වෙනවා. ඒ අනුව මුළු ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව 556,422යි.

මෙම වැඩසටහන යටතේ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය යෝජනා මූලික වශයෙන් ප්‍රජා සංවර්ධන සභා මඟින් ග්‍රාමීය මට්ටමින් හඳුනාගෙන, එම ව්‍යාපෘති සඳහා අනුමැතිය ලබා දී මේ වනවිට ඒවා ක්‍රියාත්මක අදියරේ තමයි පවතින්නේ. එම ව්‍යාපෘතිවල ඇස්තමේන්තු සකස් කිරීම, ප්‍රසම්පාදන කටයුතු, අදාළ මිලදී ගැනීම්, ඉදිකිරීම් ආදී වශයෙන් විවිධ වූ අදියරයන් යටතේ අපි ප්‍රගතිය අධීක්ෂණය කරමින් ඉන්නවා. 2026.12.31 වනවිට ඒ සියලු ව්‍යාපෘතිවල වැඩකටයුතු සම්බන්ධයෙන් අනිවාර්යයෙන්ම සියයට සියයක ප්‍රගතියක් අත්පත් කර ගැනීමට අපි බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම, ප්‍රතිලාභීන් සඳහා පොදුවේ භාවිත කිරීමට අවශ්‍ය යෙදවුම් පමණක් මෙහිදී ලබා දෙන අතර, ඔවුන් සඳහා වූ ජීවනෝපාය සංවර්ධන සැලැස්මක්ද අදාළ වසම්, ප්‍රජා සවිබලගැන්වීමේ නිලධාරින් විසින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස, සහකාර සැලසුම් අධ්‍යක්ෂ හා නියෝජ්‍ය සැලසුම් අධ්‍යක්ෂ, ප්‍රාදේශීය ලේකම්ගේ අධීක්ෂණය යටතේ සකස් කරනු ලබනවා. ඒ වාගේම, ප්‍රතිලාභීන්ගේ ජීවනෝපාය සංවර්ධනය ඇගැයීමට ලක් කිරීම, ප්‍රජා සංවර්ධන සභා හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස, නියෝජ්‍ය සැලසුම් අධ්‍යක්ෂ, ප්‍රාදේශීය ලේකම් විසින් සිදු කරනු ලබන අතර, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුද මේ පිළිබඳව නිරන්තර ඇගැයීමක් කරමින් තිබෙනවා.

ගරු කථානායකතුමනි, මෙම ව්‍යාපෘතිය ජාතික විගණන කාර්යාලය විසින්ද ඇගැයීමට ලක් කරනවා. කෙසේ වෙතත්, 2026දී ක්‍රියාත්මක කරන මෙම ඇගැයීමේ අවසන් ප්‍රතිඵලය - සමස්ත ප්‍රතිඵලය - 2026 වර්ෂය නිම වෙන්න කලින් අපට කොහොමත් බලන්න බැහැ. 2026 වර්ෂය අවසන් වුණත් මෙහි ප්‍රතිඵලය අදියර ගණනාවකින් තමයි ලැබෙන්නේ. මෙහි ආර්ථික ප්‍රතිඵල අපට 2027දී යම් ප්‍රමාණයක් ලබා ගන්න පුළුවන් වාගේම සමාජයීය ප්‍රතිඵල සහ සංස්කෘතික ප්‍රතිඵල අපට ඉදිරියේදී ලබා ගන්න පුළුවන් වනවා. මේ හා ගැට ගැහුණු සමාජ සවිබලගැන්වීමේ වැඩසටහන් කිහිපයක් තිබෙනවා.

ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා එතුමාගේ ප්‍රශ්නයේ මුලින් අහලා නොතිබුණු කොටසකුත් මතු කළා. ඒකටත් මම කෙටි උත්තරයක් ලබා දෙන්නම්. බදු බර පටවලා ප්‍රාථමික ශේෂය සියයට 2.3 සිට සියයට 5.4 දක්වා වැඩි කර ගත්තාය කිව්වා. බදු වැඩි කරලා ඒක සියයට 15.4 දක්වා ඉහළ නංවා තිබෙනවාය කියාත් එතුමා කිව්වා. ඇත්තටම ප්‍රාථමික ශේෂය කියන එක ඒ විධියට හිතාමතා වැඩි කරන්න පුළුවන් එකක් නොවෙයි. ඒක නියත වශයෙන් එන අගයක්. ඒ කියන්නේ, ආණ්ඩුවේ ආදායම වැඩි කරලා, ප්‍රාථමික වියදම් අඩු වුණොත්, ස්වයංක්‍රීයව එන අගයක්. එය වෙනමම බදු පනවලා අය කර ගත්ත එකක් නොවෙයි. ඇත්තටම අපි අලුතෙන් බදු පනවලා හෝ මිනිසුන්ට අතිරේක බදු බරක් පැටෙව්වේ නැහැ, ගරු විපක්ෂ නායකතුමනි. අපි කළේ, පැවතුණු බදු ව්‍යුහය තුළ ඉලක්කගත, ඇස්තමේන්තු ගත බදු ඉතාම කාර්යක්ෂමව හා විධිමත්ව බදු පදනම පුළුල් කරමින් අය කර ගැනීම පමණමයි. ඒ හැර වෙන කිසිදු අතිරේක බද්දක් පනවලා නැහැ. ඒ අනුව තමයි අපට හැකියාව ලැබුණේ අපේක්ෂා කළ මට්ටමට වඩා බදු ආදායම් විශාල වශයෙන් වැඩි කර ගන්න. ඒක ඉදිරියටත් පවත්වාගෙන යෑමේ වාසිය තමයි, ප්‍රාථමික ශේෂය ඉහළ යෑම. ප්‍රාථමික ශේෂය ඉහළ ගියාම ඒක අපට පාවිච්චි කරන්න පුළුවන් අතීතයේදී කලින් ආණ්ඩු විසින් ලබා ගත්තු විශාල ණයවලට තිබෙන පොලිය ගෙවීමට. ඒ සඳහා යම් පහසුවකුත් අපට ඒක තුළින් ලැබිලා තිබෙනවා.

6. ජාතික සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තිය අනුව සැකසූ 2025-2035 උපාය මාර්ගික සැලැස්ම අනුව පාර්ශ්වකරුවන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් 2025 අගෝස්තු 21වැනි දා ඉඳලා පැවැත්වූ අතර, එහිදී අදාළ අමාත්‍යාංශ හා

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

දෙපාර්තමේන්තු ප්‍රධාන ක්‍රියාකාරි සැලසුම් හඳුනා ගැනීම උදෙසා දැනුවත් කර ඇති අතර, මේ වන විට සමාජ රැකවරණය - social care - කියන කොටස සඳහා ක්‍රියාකාරී සැලැස්මක් කම්කරු අමාත්‍යාංශය විසින් සකස් කරලා තිබෙනවා. එය ඉදිරියේදී අමාත්‍ය මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කරන්න අපි බලාපොරොත්තු වනවා.

7. මේ වන විට 2025 වර්ෂයේ පැවැති ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ දත්ත පිරිසිදු කිරීම්, සංස්කරණය කිරීම් සහ සත්‍යාපනය කිරීම් සිදු කරමින් පවතිනවා. පරිහරණය කිරීම සඳහා මහ ජනතාවට එම සමීක්ෂණයේ දත්ත ලබා ගන්න පුළුවන් වන්නේ එම කටයුතු අවසන් වුණාට පසුව ඔක්තෝබර් මාසයේදී. ගෘහ ආදායම් හා වියදම් සමීක්ෂණයේ ප්‍රධාන අරමුණ වන්නේ, රටේ ගෘහ ඒකකවල ආදායම්, වියදම් සහ පරිභෝජන රටා පිළිබඳව විශ්වසනීයත්වයෙන් යුතු යාවත්කාලීන සංඛ්‍යා, දත්ත හා තොරතුරු සම්පාදනය කිරීමයි. එම තොරතුරු මඟින් දරිද්‍රතාව, ජීවන තත්ත්වය, ආදායම් බෙදා හැරීම සහ පාරිභෝගික වියදම් රටා විශ්ලේෂණය කිරීමටත්, ජාතික සංවර්ධන සැලසුම්, සමාජ සුබසාධන වැඩසටහන් සහ ආර්ථික ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා අවශ්‍ය දත්ත ලබා ගැනීමත් සිදු කරනවා.

දැනට 2027 වර්ෂය සඳහා වූ අය වැය සකස් කරමින් පවතිනවා. මේ වාගේ අමාත්‍යාංශ සහ අනෙකුත් ආයතනවලින් එක්රැස් කර ගත්ත දත්ත පාවිච්චි කරන ගමන්ම රට ඇතුළේ ක්‍රියාත්මක වන අනෙකුත් පාර්ශ්වකරුවන් - stakeholdersලා - එක්ක සාකච්ඡා පවත්වමින් තිබෙනවා. ගරු කථානායකතුමනි, සියලුදෙනා දකින්නත් ඇති, ජනාධිපතිතුමා මේ වනකොට විශේෂයෙන්ම අය වැයට අදාළව අමාත්‍යාංශ සියල්ලක්ම ගෙන්වමින් පැය 3ක්, 4ක් සාකච්ඡා පවත්වන බව. ඒ තොරතුරුත් මෙතැනදී සම්බන්ධ කර ගන්නවා. ඊට අමතරව එතුමා ආර්ථිකයට සම්බන්ධ වන විවිධ වූ ව්‍යාපාර ක්ෂේත්‍රවල ඉන්න කණ්ඩායම් ගෙනැල්ලා සාකච්ඡා පවත්වනවා. ඒවායේ ප්‍රතිඵල විධියට තමයි 2027 සඳහා පොදුවේ තිබෙන අය වැය යෝජනාවලට අමතරව අතිරේකව මිනිසුන් සවිබලගැන්වීමත්, ආර්ථිකය වර්ධනය කර ගැනීමත් අපි ඉලක්ක කර තිබෙන්නේ. සියලුදෙනා සම්බන්ධ කරගෙන සියයට 7ක ඉලක්කයට එහා යන තිරසර සහ ආර්ථික වර්ධනය සඳහා වූ වැඩසටහනේ සියලු තොරතුරු 2027 අය වැයට සම්පිණ්ඩනය කරන්න අපි බලාපොරොත්තු වනවා.

බොහොම ස්තුතියි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, ඉතාම සවිස්තරව උත්තර ලබා දීම ගැන ගරු අමාත්‍යතුමාට මම ස්තුතිවන්ත වනවා. හැබැයි ගරු ඇමතිතුමනි, පිළිතුරු පිළිගැනීමට පුළුවන්කමක් නැහැ. සවිස්තරව උත්තර ලබා දුන්නා. නමුත්, පිළිගන්න බැහැ. ගරු ඇමතිතුමනි, එක පුද්ගලයෙකුට මේ රටේ දින 30ක් ජීවත් වෙන්න අවම වශයෙන් අවශ්‍ය වන්නේ රුපියල් 17,592ක්ය කියන එක අපට කිසිසේත්ම පිළිගන්න බැහැ. ඒ පිළිබඳව ඔබතුමා අවබෝධයක් ලබා ගෙන, ඒ දත්ත නිර්මාණය කිරීමේ තිබෙන දුබලතාව නිවැරදි කර ගන්නට වැඩ පිළිවෙළක් යොදන්න.

ඔබතුමා ජීවන වියදම ගැන විග්‍රහයක් කළා. හැබැයි, ඇත්තවශයෙන්ම ජීවන වියදම ගැන මොන කථාවක් කිව්වත් අපි මහ පාරට බැහැලා ජනතාවගෙන් භාණ්ඩවල මිල ගැනයි, ක්‍රය ශක්තිය ගැනයි ඇහුවොත් මම හිතන්නේ හොඳ එකෙන්ම අහ ගන්න පුළුවන්. ජීවන බර ගැනයි, උද්ධමනය - මිල ඉහළ යෑම - ගැනයි හොඳ එකෙන්ම අහ ගන්න පුළුවන්. අපට ඒ පිළිබඳව විද්‍යානුකූල සූත්‍ර ගැන කථා කරන්න පුළුවන්. හැබැයි ඇත්තටම උද්ධමනයේ අඩු වීමක් සිදු වෙලා තිබෙනවා නම් ඒක ජනතාවට දැනෙන්න ඕනෑ. උද්ධමනයේ වැඩිවීමක් වෙලා තිබෙන එක ගැන තමයි හැම වෙලාවේම කියන්නේ. හැම වෙලාවේම කියන්නේ, බඩු මිල වැඩි වෙලා තිබෙන බව. හැබැයි, මෙතැන උත්තරය දෙන්න භාණ්ඩාගාරයේ සහ මහ බැංකුවේ ඉන්න ආර්ථික විශ්ලේෂකයන් කොහොම මේ සූත්‍ර සකස් කරනවාද කියලා මම දන්නේ නැහැ. ඒක ජනතාවට දැනෙන ආකාරයෙන් යථාර්ථවාදී විය යුතුයි කියලා මා විශ්වාස කරනවා.

ඒ වාගේම ඔබතුමා කිව්වා, පොලී අනුපාතය හිතුවක්කාර අන්දමට වෙනස් කරන්න බැහැ කියලා. ඔව්, මම ඒක පිළිගන්නවා. හැබැයි, හිතුවක්කාරකම පැත්තක තියලා වැඩිහිටි ප්‍රජාවට විශේෂ පොලියක් ලබා දෙන්න පුළුවන්. ගරු ඇමතිතුමනි, දැන් ඒ පොලිය සියයට 15 සිට සියයට 7ට අඩු වෙලා, කොච්චර සහන ලබා දෙනවා කිව්වත්. ඒ වාගේම ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන්ට පමණක් අඩු පොලියකට වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න පුළුවන්. ඒකෙන් අපි අදහස් කරන්නේ නැහැ, සාමාන්‍ය පොලී අනුපාතය තමන්ට ඕනෑ ඕනෑ විධියට, හිතුවක්කාර අන්දමට වෙනස් කරන්න පුළුවන් කියලා. නමුත්, මේ විශේෂිත කොට්ඨාසය විශ්‍රාමිකයන් - pensioners, ඒ වැඩිහිටියන්, ඒ වාගේම ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන් අපේ රටේ දළ දේශීය නිෂ්පාදිතයට සියයට 52ක් දායකත්වය ලබා දෙනවා, ලක්ෂ 40කට රැකී රක්ෂා ලබා දෙනවා. ඒ කාරණාවත් මම ඔබතුමාට කියනවා.

ගරු ඇමතිතුමනි, මම මේ ඔබතුමාට සමච්චල් කරන්න හදනවා නොවෙයි. ඔබතුමා පුදුමාකාර උත්තරයක් දුන්නා, දිළිඳුකම ගැන. ඔබතුමා "අස්වැසුම" දිළිඳුකම සඳහාම ක්‍රියාත්මක වන වැඩසටහනක් නොවෙයි කියලා, ඊට පස්සේ වර්ගීකරණය කරනවා, "දිළිඳු, අන්ත දිළිඳු, සංක්‍රාන්තික සහ අවදානමට ලක් වූ" යනුවෙන්. මම ඔබතුමාට මුල ඉඳන්ම කියපු කාරණාවක් තමයි, "අස්වැසුම" කියන්නේ, දුප්පත්කම තුරන් කිරීම සඳහා හොඳ වැඩසටහනක් නොවෙයි කියන එක. එය ප්‍රශස්ත වැඩසටහනක් වන්නට නම්, පරිභෝජනය, ආයෝජනය, අපනයනය, නිෂ්පාදනය, ඉතිරි කිරීම කියන ගුණාංග 5 තිබෙන්නට ඕනෑ. මේ ගුණාංග 5 අස්වැසුම වැඩසටහනේ නැහැ. ඒ නිසා මම ඔබතුමාට යෝජනා කරනවා, ඇත්ත වශයෙන්ම සත්‍යවාදී, කාල වකවානු සහිත දුප්පත්කම තුරන් කිරීමේ වැඩසටහනකට ප්‍රවේශ වෙන්න කියලා.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. ඔබතුමා කියනවා, 2026 ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණය පිට වෙන්නේ ඔක්තෝබර් මාසයේ කියලා. ඔබතුමා හොඳින් දන්නවා, මුදල් අමාත්‍යතුමා නොවැම්බර් මාසයේ Budget එක ඉදිරිපත් කරන බව. එතකොට Budget එක ඉදිරිපත් කරන්න ඔන්න මෙන්න තිබෙද්දී තමයි, ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණය පිට වෙන්නේ, ඔක්තෝබර් මාසයේ. දරිද්‍රතා රේඛාව සත්‍යවාදීව නිර්මාණය වෙන්නේ ඔය සමීක්ෂණය හරහා. මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, කරුණාකරලා පුළුවන් නම් මූලික දත්ත ටික හරි සහාගත කරන්න කියලා. ඒ වාගේම ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණය වසර දෙකකට වරක්වත් සිදු කරන්න කියා අපි යෝජනා කරනවා.

ස්තුතියි.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

බොහොම ස්තුතියි, විපක්ෂ නායකතුමනි. මම උත්සාහ කරන්නම්, ඉතා කෙටි පිළිතුරු කිහිපයක් ලබා දෙන්න. මම නැවතත් අවධාරණය කරනවා, මේ දරිද්‍රතාව මැනීම කර තිබෙන්නේ, - මේ ලේඛනයෙන් ඉදිරිපත් කරන්නේ - අවම අවශ්‍යතාව සපුරා ගන්න දරිද්‍රතා රේඛාව මොකක්ද කියලා දැනට නිර්වචනය කර තිබෙන එක යටතේ පමණමයි. ඒ වාගේම සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය හරහා සමාජ සුබසාධනය සඳහා ගෙනාපු විශේෂ වැඩසටහනක් තමයි අස්වැසුම. අස්වැසුම කියන්නේ, සමාජ සුබසාධන ප්‍රතිලාභ ලබා දීමේ එක් වැඩසටහනක් පමණයි. ඒ වැඩසටහනේදී පනතට ඇතුළත් කර තිබුණා, ප්‍රධාන කාණ්ඩ 4ක්. ඒ අනුව වර්ගීකරණය කරන හැටි, මනින හැටි තිබෙන නිසා තමයි දුප්පත්, අන්ත දුප්පත්, කියන කාණ්ඩවලට ගෙනැල්ලා තිබුණේ. රජයේ වගකීම බවට පත් වෙන්නේ, ඒවා අයින් කරගෙන සමාජය සවිබලගන්වමින් ඉදිරියට යාම. ඒ කාරණා දෙක පැහැදිලි කරන්න ඕනෑ. එහෙම නැතිව, ඒක ඇතුළේ දුප්පත්කමයි, දුප්පත් රේඛාව මනින එකයි ඇත්තටම දෙකක්. ඒක එකක් නොවෙයි.

ඊළඟට, වෙළෙඳ පොළේ මිල ඉහළ යාම සහ උද්ධමනය පිළිබඳව ගත්තොත්, ඇත්තටම උද්ධමනය කියන්නේ, අපි තෝරාගත් භාණ්ඩයක මිල කෙටි කාලයක් ඇතුළත වැඩි වීම නොවෙයි. උද්ධමනය කියන්නෙම දීර්ඝ කාලීන ප්‍රවණතාවක්. ලෝකයෙත් ඒක ගණනය කරන්නේ එහෙමයි. එතකොට අපි පිළිගන්නවා, පැවති තත්ත්වයේදී විශේෂයෙන්ම සමහර භාණ්ඩ මිල වෙළෙඳ පොළෙහි උච්චාවචනය වුණු බව. විශේෂයෙන්ම ආහාර ද්‍රව්‍ය, එළවලු, පලතුරු, මාළු වාගේ දේවල්. ඒ නිසාම උද්ධමනය ගණනය කිරීමේදී නිර්ණායක දෙකක් පාවිච්චි කරනවා, headline inflation and core inflation කියලා. එතකොට core inflation ගණනයේදී අපි ඉවත් කරනවා, ආහාර සඳහා වූ භාණ්ඩවල මිල ගණන්. ඒකට හේතුවක් තිබෙනවා. ඒක උච්චාවචනයට භාජන වනවා. ඒ නිසා එක සතියක බඩු මිල වැඩි වුණ ගමන් රටේ ජීවත් වෙන්න බැහැ, උද්ධමනය වැඩි වෙලා කියලා ඒකට ක්‍රියාමාර්ග ගන්නේ නැහැ. නමුත් ගරු විපක්ෂ නායකතුමනි, අපි පිළිගන්නවා, වෙළෙඳ පොළ තත්ත්වය අනුව සමහර භාණ්ඩවල මිල ඉහළ පහළ යෑම් සිදු වනවා කියලා. ඒ සඳහා මැදිහත් වීම් වෙලා තිබෙනවා.

ඒ වාගේම මැදපෙරදිග යුදමය තත්ත්වයේ බලපෑම නිසා රුපියල් බිලියන 100ක විශේෂ සහන පැකේජයක් ලබා දෙමින් යම් ආකාරයක සහනයක් අපි ලබා දුන්නා. පොලී අනුපාත තත්ත්වයෙනුත් අපි ඒ අදාළ ස්ථාවරත්වය අත්පත් කර ගන්නවා. ක්ෂුද්‍ර හා සුළු පරිමාණ කර්මාන්තකරුවන් සඳහා විශේෂ ණය පොලී වාරික සම්බන්ධයෙන් වන වැඩසටහන් ගණනාවක් මම ඉදිරිපත් කළා. මා සතුව තිබෙනවා, ඉතාම අඩු පොලී අනුපාත යටතේ, එනම් සියයට 3, 5, 7 වාගේ පොලී අනුපාත යටතේ ලබා දීමට යෝජනා කරපු රුපියල් බිලියන 95.6ක ණය ප්‍රමාණයක් හා සම්බන්ධ විස්තර. ගරු කථානායකතුමනි, එම තොරතුරු ඇතුළත් ලේඛන මම **සභාගත*** කරනවා.

ගරු විපක්ෂ නායකතුමා මතු කළා කුටුම්භයන්ගේ ආදායම් සහ වියදම් පිළිබඳ සමීක්ෂණ ගැනත්. ඇත්ත වශයෙන්ම මේ දත්ත පිරිසිදු කරලා අපට එක පාරටම මහජනතාවට දෙන්න බැහැ, මේ දැන් තිබෙන මට්ටමින්. ඔක්තෝබර් තමයි දෙන්න පුළුවන් වෙන්නේ. හැබැයි, අපි ඒ අභ්‍යන්තර සාකච්ඡාවලදී ඒ තොරතුරු දැනටත් භාවිත කරනවා, 2027 අය වැය සහ අනෙකුත් ප්‍රතිපත්තිමය තීන්දු ගැනීම සඳහා.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Shanakiyan Rajaputhiran Rasamanickam, you may proceed with your Question under Standing Order No. 27(2).

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

Hon. Deputy Speaker, I think the Hon. Leader of the House said that the Hon. Minister of Public Security and Parliamentary Affairs will make a Statement on the current situation before responding to my Question. Anyway, I can raise my Question, if you want me to.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Minister, please.

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දිනයේ කුරුවිට බන්ධනාගාරයේ ඇති වෙච්ච නොසන්සුන්කාරී තත්ත්වය පිළිබඳව ගරු විපක්ෂ නායකතුමා විසින් මතු කරන ලද ප්‍රශ්නයටයි මේ පිළිතුර ලබා දෙන්නේ. *[බාධා කිරීමක්]* ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය දින කිහිපය පුරාම මීගමුව බන්ධනාගාරය තුළ සිදු වූ ගැටුමෙන් පසුව මහර බන්ධනාගාරය තුළත්, ඊයේ දිනයේ රාත්‍රි 10.15ට පමණ මැගසින් බන්ධනාගාරය තුළත් යම් නොසන්සුන්කාරී තත්ත්වයක් නිර්මාණය වුණා. අද උදෑසන 6.30ට පමණ කුරුවිට බන්ධනාගාරයේ යම් කලහකාරී තත්ත්වයක් නිර්මාණය වුණා. මේ වන කොට පල්ලන්සේන බන්ධනාගාරය තුළත් නොසන්සුන්කාරී තත්ත්වයක් නිර්මාණය වෙලා තිබෙනවා. මීගමුව බන්ධනාගාරයෙන් ආරම්භ වූ මේ බන්ධනාගාර ගැටුම් මේ වන විට පල්ලන්සේන බන්ධනාගාරය දක්වා ක්‍රමිකව වර්ධනය වෙලා තිබෙනවා. මේ පිළිබඳව ලැබුණු බුද්ධි තොරතුරු වාගේම මේ දක්වා කරන ලද විමර්ශන දෙස

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ආනන්ද විජේපාල මහතා]

බැලුවාම අපට සැකයක් ඇති වෙලා තිබෙනවා, මෙය කුමන්ත්‍රණකාරී සහ කඩාකප්පල්කාරී ක්‍රියාවක ප්‍රතිඵලයක් ද කියලා. නමුත්, මේ සිද්ධිවල ආසන්නතම ප්‍රතිඵල හැටියට, ආසන්නතම හේතු හැටියට හඳුනාගෙන තිබෙන්නේ මත්ද්‍රව්‍ය සහ පාතාල ක්‍රියාකාරකම්. ඒ අනුව ඒවා මර්දනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගෙන තිබෙනවා.

ඊයේ රාත්‍රී 10.15ට පමණ මැගසින් බන්ධනාගාරය තුළ නොසන්සුන්කාරී තත්ත්වයක් ඇති වුණා. එක් වාට්ටුවක් කඩාගෙන 40ක පමණ පිරිසක් එළියට පැමිණ, යම් කලහකාරී විධියට හැසිරීමක් සිද්ධ වුණා. එය පාලනය කිරීම සඳහා බන්ධනාගාර නිලධාරින් මැදිහත් වුණා. ඒ වාගේම, විශේෂ කාර්ය බලකායේ නිලධාරින් මැදිහත් වෙලා ඒ තත්ත්වය සම්පූර්ණයෙන් පාලනය කර තිබෙනවා. ඒ සිද්ධියේදී එක් අයෙක් මිය ගිහින්, 10දෙනෙක් තුවාල ලබා තිබෙනවා. දැන් ඒ 10දෙනා ජාතික රෝහලේ ප්‍රතිකාර ලබනවා. මා ඉහතින් කී පරිදි අද උදෑසන 6.30ට පමණ තමයි කුරුවිට බන්ධනාගාරයේදී කලහකාරී තත්ත්වයක් ඇති වෙලා තිබෙන්නේ. එම සිද්ධියේදී රැඳවියන් දෙදෙනෙක් මිය ගොස් තිබෙනවා; 13දෙනෙක් තුවාල ලබා තිබෙනවා. ඔවුන් දැනට රත්නපුර රෝහලේ ප්‍රතිකාර ලබමින් ඉන්නවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බන්ධනාගාර තුළ ඇති වන නොසන්සුන්තාවන් පාලනය කිරීමේදී බන්ධනාගාර පාර්ශ්වයෙනුත්, අධිකරණ අමාත්‍යාංශය යටතේ තිබෙන බන්ධනාගාර දෙපාර්තමේන්තුව පාර්ශ්වයෙනුත්, පොලීසිය පැත්තෙනුත් අපි දැඩි ලෙස උත්සාහයක් දරමින් ඉන්නවා, කිසිදු රැඳවියකුගේ ජීවිත හෝ නිලධාරියකුගේ ජීවිත අහිමි නොවන ආකාරයට වැඩ කටයුතු කරන්න. ඒ සියලු දේ පිළිබඳව වග බලා ගනිමින් තමයි අප මේ දේවල් පාලනය කිරීමට උත්සාහ දරමින් ඉන්නේ.

මීට පැය කිහිපයකට පෙරාතුව පල්ලන්සේන බන්ධනාගාරයේ රැඳවියන් රඳවා තබන වාට්ටුවක වහලය මතට 30ක පමණ පිරිසක් නැඟ මේ වන කොට උද්ඝෝෂණ පවත්වමින් ඉන්නවා. ඒ අය උදෑසන ආහාර සඳහා බන්ධනාගාර වාට්ටුවලින් එළියට දමපු අවස්ථාවේදී ඇතුළට ගිහිල්ලා නැහැ. නමුත්, මේ වන කොට පොලීසියත්, බන්ධනාගාර නිලධාරිනුත් උත්සාහ කරමින් ඉන්නවා පල්ලන්සේන බන්ධනාගාරයේ තත්ත්වය පාලනය කිරීමට. අනෙකුත් බන්ධනාගාර සියල්ලේම තත්ත්වය පාලනය කර තිබෙනවා. ආරක්ෂාව පිළිබඳව කිසිදු ගැටලුවක් නැහැ. මම හිතනවා තවත් ස්වල්ප මොහොතකින් පල්ලන්සේන බන්ධනාගාරයේ තත්ත්වයත් පාලනය කර ගන්න හැකියාව ලැබෙයි කියා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ සම්බන්ධයෙන් තොරතුරු මෙපමණයි මේ වෙලාවේ ඉදිරිපත් කරන්න පුළුවන්.

ඒ බන්ධනාගාර සියල්ලේම සිදු වූ සිද්ධීන් ඒකාබද්ධ කරලා ගත්තාම, ඒවා යම් සැලැස්මකට අනුව සිද්ධ වන ආකාරයක් නිරීක්ෂණය වෙනවා. ඒ වාගේම යම්කිසි කඩාකප්පල්කාරී, කුමන්ත්‍රණකාරී ස්වභාවයක් ඒ තුළ නිරීක්ෂණය වෙනවා. ඒ පිළිබඳව පූර්ණ විමර්ශනයකින් පසුව තමයි ප්‍රකාශයක් කිරීමට හැකියාව ලැබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හැම කෙනෙකුගේම ජීවිත ආරක්ෂා කර ගනිමින්, මේ සියලු නොසන්සුන්තාවන් සහ කැරලිකාරිත්වයන් මර්දනය කිරීම තමයි ආණ්ඩුවේ වුවමනාව. අපි ඒ වෙනුවෙන් කැප වී සිටිනවා.

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Leader of the Opposition, you can have a clarification on that.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු ඇමතිතුමනි, මමයි ඒ ප්‍රශ්නය මතු කළේ. ඔබතුමා ඒ සම්බන්ධයෙන් ප්‍රකාශයක් සිදු කළා. මම ඔබතුමාට කියන්න කැමැතියි, ඇත්තවශයෙන්ම මේක බරපතළ තත්ත්වයක් බව. කවුරු මොනවා කිව්වත්, මේක ජාතික ආරක්ෂාවටත් ප්‍රශ්නයක්. අපි මේ බන්ධනාගාර ප්‍රශ්නය කේන්ද්‍ර කරගෙන අධිකරණ අමාත්‍යවරයාට එරෙහිව විශ්වාස භංග යෝජනාවක් ගෙන ආවා. එහිදී ඇමතිතුමා වෙනුවෙන් ඡන්ද 152ක් දුන්නා; ඇමතිතුමාට විරුද්ධව ඡන්ද 36ක් දුන්නා. ආණ්ඩුවේ තමුන්නාන්සේලා ඒ වෙලාවේ අත්පුඩි ගැහුවා; ඔල්වරසන් දුන්නා; කෑ ගැහුවා. නමුත් ඒ ජයග්‍රහණයෙන් පසුව මහර බන්ධනාගාරයේත් ප්‍රශ්නයක් ඇති වුණා. ඊයේ රෑ මැගසින් බන්ධනාගාරයේත් ප්‍රශ්නයක් ඇති වුණා. අද උදේ කුරුවිට බන්ධනාගාරයේත් ප්‍රශ්නයක් ඇති වුණා. ගරු ඇමතිතුමනි, ඔබතුමා දැන් කියන ආකාරයට පල්ලන්සේන බන්ධනාගාරයේත් ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. මේ පිළිබඳව ඔබතුමන්ලා දැඩි පියවර ගන්න ඕනෑ. හැබැයි, එකක් මතක තබා ගන්න. අපි මත්ද්‍රව්‍ය ජාවාරම් සහ අපරාධ ක්‍රියා කිසිසේත් අනුමත කරන්නේ නැහැ. මේ ප්‍රශ්නය පිළිබඳව මීට වඩා ලොකු අවධානයක් යොමු කරන්න. ඔබතුමන්ලා මේක ජාතික ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නයක් හැටියට අරගෙන විසඳුමක් ලබා දෙන්න කියා මම මේ අවස්ථාවේ ඉල්ලා සිටිනවා.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේවා සිදු වන්නේ අධිකරණ අමාත්‍යවරයා පිළිබඳ ගැටලුවක් නිසා නොවෙයි. මම මුලිනුත් මේ ගැන පැහැදිලි කළා. මීගමුව බන්ධනාගාරයෙන් පටන් ගෙන අද වන කොට පල්ලන්සේන බන්ධනාගාරය දක්වා ව්‍යාප්ත වෙලා තිබෙන මේ නොසන්සුන්කාරී තත්ත්වය, සැලසුම් සහගතව සිදු කරන යම් කඩාකප්පල්කාරී ක්‍රියාවක්ය කියන සැකය අපට මතු වෙලා තිබෙනවා. මම කලිනුත් කිව්වා වාගේම මේ පිළිබඳව පූර්ණ විමර්ශනයක් කරන්න අවශ්‍යයි. මේ තත්ත්වයන් බරපතළ තත්ත්වයක් හැටියට සලකා අපි කටයුතු කරනවා. මේක කිසිසේත් ජාතික ආරක්ෂාවට බලපාන ප්‍රශ්නයක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. නමුත් අපි මේ රටේ සියලු ජනයාගේ ආරක්ෂාව වෙනුවෙන් මැදිහත් වෙනවා; මහජන ආරක්ෂාව සහතික කරනවා. ඒ වාගේම බන්ධනාගාර තුළ සිටින රැඳවියන්ගේත්, බන්ධනාගාරය තුළ වැඩ කරන සියලු නිලධාරින්ගේත් ආරක්ෂාව වෙනුවෙන් කැප වෙමින් තමයි අප මේවා යම් පාලනයකට නතු කර ගැනීමට උත්සාහ කරමින් ඉන්නේ. ඒ සඳහා කෙටි කාලීන වාගේම දීර්ඝ කාලීන වැඩ පිළිවෙළ කිහිපයක් යෝජනා වෙලා තිබෙනවා. ඒ සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් මේ වන විට ගරු අධිකරණ ඇමතිතුමාගේ සභාපතිත්වයෙන් යුත් කමිටුවකුත් පත් කර තිබෙනවා. ඒ වාගේම ජනාධිපතිතුමා අද අදාළ පාර්ශ්වකරුවන් සමඟ විශේෂ සාකච්ඡාවකුත් කැඳවා තිබෙනවා. ඒ අනුව අපි මේ සම්බන්ධයෙන් වහ වහා - කඩිනමින් - පියවර ගැනීමට අවශ්‍ය කටයුතු කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The next Question under Standing Order No. 27(2), the Hon. Shanakiyan Rajaputhiran Rasamanickam.

## II

### යුද සමයේ උතුරු සහ නැඟෙනහිර සිදු වූ අතුරුදහන්වීම් සහ ඝාතන පිළිබඳ විමර්ශනවල ප්‍රගතිය
### யுத்தத்தின்போது வடக்கு மற்றும் கிழக்கில் காணாமல்போனோர் மற்றும் கொலைகள் குறித்த விசாரணைகளின் முன்னேற்றம்
### PROGRESS OF INVESTIGATIONS INTO DISAPPEARANCES AND KILLINGS IN NORTH AND EAST DURING WAR

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

Hon. Deputy Speaker. I would like to pose this Question to the Hon. Minister of Public Security and Parliamentary Affairs.

This refers to the investigation conducted by the Homicide Investigation Division of the Criminal Investigation Department into the Sathurukondan killings and disappearances of September, 1990 in Batticaloa. Pursuant to this investigation, the Officer-in-Charge of the Homicide Investigation Division issued a Sri Lanka Police Message Form dated 20th March, 2026 under Reference No. 2026/03/20, requiring a person to appear before the Homicide Investigation Division, 4th Floor, New CID Headquarters on 14th August, 2026 at 9.00 a.m.

Will the Hon. Minister -

(a) inform this House what the present status of the investigation under Reference No. 2026/03/20 is, including the progress made to date, the facts established through the investigation, the number of witness statements recorded, the number of persons summoned and questioned, whether any suspects have been identified, arrested or charged and whether the investigation has been referred to the Attorney-General or any recommendations have been made in that regard?

Hon. Minister, the reason why I raised that first part of the Question is because my Friend, the Hon. G. G. Ponnambalam, at an event in Jaffna, had said that the ITAK's new Parliamentary Group Leader is promoting a domestic investigation. But, that is incorrect. We have rejected any domestic investigations, but certain individuals go ahead and file complaints. So, this is one such case.

Hon. Minister, if we take this case, during the Sathurukondan massacre, 185 Tamils were killed. கௌரவ அமைச்சர் அவர்களே, 1990ஆம் ஆண்டு செப்ரெம்பர் மாதம் 09ஆம் திகதி 185 தமிழர் கொல்லப்பட்டனர். அது சம்பந்தமாகப் பொலிஸ் நிலையத்தில் முறைப்பாடும் செய்யப்பட்டிருக்கின்றது. எனது கேள்வியின் முதற் பகுதி அந்த முறைப்பாடு சம்பந்தமானதுதான். ஏனென்றால், இப்பொழுது அந்த முறைப்பாட்டைச் செய்தவரை, கொழும்பு CID பிரிவினர் 4ஆம் மாடிக்கு அழைத்திருக்கிறார்கள். கௌரவ அமைச்சர் அவர்களே, இந்த விடயம் சம்பந்தமாகக் கடந்த 1997ஆம் ஆண்டு சந்திரிகா அம்மையார் நியமித்த ஒரு குழுவினால் மூன்று இராணுவத் தளபதிகள் மற்றும் ஊர்காவற் படையைச் சேர்ந்த மேலும் சிலர் அதற்கு நேரடியாகப் பொறுப்புக்கூற வேண்டியவர்கள் எனக் குறிப்பிடப் பட்டிருக்கின்றது. ஆனால், அவர்களை விசாரிக் காமல், இப்பொழுது இந்த முறைப்பாட்டைச் செய்தவரை CIDக்கு அழைத்திருக்கிறார்கள். இது சம்பந்தமாக உங்களுடைய விளக்கமான பதில் தேவை.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Shanakiyan Rajaputhiran Rasamanickam, would you please stick to the Question handed over?

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

Okay, Sir. I am allowed to make a few clarifications on the Question because its word limit is 350. So, I cannot include everything.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

But, you are deviating a bit too much.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

Otherwise, the Hon. Minister would not know what the Question is about. That is why I clarified.

(b) inform how many incidents relating to alleged enforced disappearances, killings, massacres and other serious offences committed during the armed conflict in the Northern and the Eastern Provinces are presently registered in the records of the Sri Lanka Police and/or the Criminal Investigation Department?

The reason why I say this, Hon. Minister, is Sathurukondan is one incident out of hundreds and thousands of incidents that happened across the North and the East. In Vavuniya, we had massacres happening in Chettikulam and Semamadu and in Othiyamalai in Mullaitivu. All those three massacres happened on the same day. Then, in Jaffna, we had the Kumuthini Boat incident; in Ampara, we had Thiraikerny, Udumbankulam and Veeramunai incidents. In Batticaloa, we had Vantharumoolai University incident and Mahiladitivu incident. So, the list goes on and on. படுகொலைகள் சம்பந்தமான பட்டியல் நீண்டுகொண்டே போகின்றது. இவை சம்பந்தமாக பொலிஸார் இதுவரைக்கும் என்ன நடவடிக்கை எடுத்திருக்கிறார்கள்?

(c) table the list of the incidents referred to in paragraph (b), indicating only the name or location of each incident and the year in which it occurred?

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

(d) inform this House of the incidents referred to in paragraph (b), how many investigations are presently active, how many have resulted in prosecution and how many have been concluded without prosecution?

(e) inform this House whether any investigations, criminal proceedings or prosecutions have been commended by the Sri Lanka Police, the Criminal Investigation Department or any other law enforcement authority in respect of allegations contained in the "Channel 4" documentaries relating to the armed conflict and if so, how many investigations, criminal proceedings or prosecutions have been initiated?

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இந்தக் கேள்விக்கான பின்னணியையும் ஓரளவு சொன்னால் தான் கௌரவ அமைச்சருக்கு விளங்கும் என்பதனால் சில விடயங்களை அதிலே சேர்த்துக்கொள்ளவேண்டி ஏற்பட்டது.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Make it very brief, Hon. Member.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Okay, Sir. We have a standard time to - [Interruption.]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, you can clarify a small point, but make it brief.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Okay. Thank you, Sir.

கௌரவ அமைச்சர் அவர்களே, இந்தக் கேள்விகளை நாங்கள் எழுப்பும்பொழுது, இலங்கைத் தமிழரசுக் கட்சியின் பாராளுமன்றக் குழுத் தலைவர் மாறியதை வைத்து, கௌரவ ஜீ.ஜீ. பொன்னம்பலம் அவர்கள் எங்களுடைய கட்சி உள்ளகப் பொறிமுறையை ஆதரிக்கின்றது என்ற ஒரு கூற்றினைச் சொல்வது முற்றுமுழுதாகத் தவறு. சர்வதேச விசாரணைதான் வேண்டும் என்ற நிலைப்பாட்டிலேதான் நாங்கள் எப்பொழுதும் இருக்கிறோம். அரசாங்கம் உள்ளகப் பொறிமுறையின்கீழ் சில விசாரணைகளை மேற்கொள்வதாக இருந்தால், அது சம்பந்தமாகக் காணப்படுகின்ற சில பிழைகளைச் சுட்டிக் காட்டுகின்ற செயற்பாட்டையே நான் செய்துவருகின்றேன். கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நான் இந்தக் கேள்விகளைக் கேட்கின்றபொழுது, சத்துருக்கொண்டான் கிராமத்தில் மாத்திரமல்ல, வடக்கு, கிழக்கு உட்பட நாடு முழுவதும் நடந்திருக்கின்ற எத்தனையோ படுகொலைகள் சம்பந்தமாகவும் எந்தவித விசாரணையும் மேற்கொள்ளப் படவில்லை என்ற விடயத்தையும் இங்கே சொல்லிக்கொள்ள விரும்புகிறேன். உதாரணமாக, திருகோணமலையில் கிளிவெட்டி, குமாரபுரம் பிரதேசத்திலே - *[இடையீடு]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Shanakiyan Rajaputhiran Rasamanickam, could you make it brief? We are so short of time.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Okay, Sir. But, we have been allotted a certain amount of time to raise Questions under Standing Order No. 27(2). Just because the House has taken too long for its Proceedings, -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
But, what you have been stating is not at all mentioned in the Question. So, I have given you a concession, Hon. Member.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Okay, Sir, I am winding up. But, I need to be given enough time to raise the Question.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Your Question has already been raised. So, those are some additional minutes that I have given you.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Okay, Sir, I am finishing up.

In Kumarapuram in Trincomalee, six people were arrested at the time and later, they were sent to Anuradhapura. The case is over; it is there no more. With regard to the Sathurukondan incident, investigations are not proceeding. That is precisely why we do not agree with any domestic investigation because there is no point in having it and even the victim community rejects it. If the Government is going to investigate, then, there are certain things they should do within that procedure which could give us some confidence. That is what I have said. So, I pose this Questions to the Hon. Minister.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Minister.

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, would you wait till the Hon. Minister replies?

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
Sir, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, Hon. Member, what is your point of Order? By the way, make it very brief.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, கௌரவ உறுப்பினர் சாணக்கியன் அவர்கள் என்னுடைய பெயரைக் குறிப்பிட்டு, இலங்கைத் தமிழரசுக் கட்சி உள்ளக விசாரணையை வலியுறுத்துவதாக நான் குறிப்பிட்டதாகவும், இலங்கைத் தமிழரசுக் கட்சி அப்படி எந்தவொரு இடத்திலும் வலியுறுத்தவில்லை என்றும் தங்களுடைய நிலைப்பாடு சர்வதேச விசாரணையே என்றும் குறிப்பிட்டதோடு, நான் இந்தச் சபையிலும் வெளியிலும் இலங்கைத் தமிழரசுக் கட்சியின் நிலைப்பாடு சம்பந்தமாகத் தவறான கருத்துகளைத் தெரிவித்ததாகவும் சொல்லியிருந்தார்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Shanakiyan Rajaputhiran Rasamanickam, do not use names hereafter. You are an experienced Parliamentarian.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
இந்தச் சபையிலே செம்மணி மனிதப் புதைகுழி சம்பந்தமாக நிலையியற் கட்டளை 27(2)இன் கீழ் எழுப்பப்பட்ட கேள்விகளுக்குப் பதிலளிக்கப்பட்ட சந்தர்ப்பத்தில், கௌரவ உறுப்பினர் சாணக்கியன் அவர்கள் "இது தொடர்பில் அரசாங்கத்தின் விசாரணையை நடத்துகின்றபொழுது சர்வதேச கண்காணிப்பு அவசியம்" என்ற கருத்தைத் தெளிவாகச் சொல்லியிருக்கின்றார். இவர்கள் உள்ளக விசாரணைக்கு எதிர்ப்பு என்றால், அதைப்பற்றி கதைக்கவே இயலாது. உள்ளக விசாரணைக்குத் தாங்கள் தயார் இல்லையென்றால், "நாங்கள் இதை ஏற்கவில்லை, சர்வதேச விசாரணை மட்டும்தான் தேவை" என்பதையே வலியுறுத்த வேண்டும்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, let us proceed with the Hon. Minister's reply.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
அரசாங்கம் விசாரணையைச் செய்யப்போகிறது என்பதற்காக, அரசாங்கம் இப்படிச் செய்யவேண்டும், அப்படிச் செய்யவேண்டும் என்று சொல்வது, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Minister, you can carry on.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා විසින් මතු කරපු ප්‍රශ්නයට අදාළව තොරතුරු විශාල ප්‍රමාණයක් අනාවරණය කර ගැනීමට තිබෙන බැවින් එයට පිළිතුරු ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෙසේ වුවත් එතුමා විසින් මීට පෙරාතුව ස්ථාවර නියෝග 27(2) යටතේ මතු කරපු ප්‍රශ්නයකට පිළිතුරු දෙන්න මම අද අවස්ථාව ඉල්ලා තිබෙනවා. ඒ සඳහා මට මේ අවස්ථාව ලබා දෙන මෙන් ඉල්ලා සිටිනවා. එතුමා ස්ථාවර නියෝග 27(2) යටතේ ඒ ප්‍රශ්නය තුළින් කරුණු 20ක් අහලා තිබෙනවා. එම පිළිතුර ඉතා දීර්ඝ පිළිතුරක් නිසා එහි යම් කොටස් සභාගත කරමින් මම පිළිතුරු ලබා දෙන්නම්. විශේෂයෙන්ම විදේශ රැකියා වංචා, වීසා වංචා, සංක්‍රමණික වංචා, මිනිස් ජාවාරම් හා සම්බන්ධ ගැටලු ප්‍රමාණයක් ගැන එතුමා අහලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Minister, you will be given the opportunity to reply to that Question later.

Now, Ministerial Statements. The first Ministerial Statement is to be made by Hon. (Dr.) Anil Jayantha.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Ananda Wijepala will answer your Question after that.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
That is right. But, now, I am raising a point of Order, Sir.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

What is your point of Order, Hon. Shanakiyan Rajaputhiran Rasamanickam?

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

Sir, the Hon. G.G. Ponnambalam referred to my name.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Because you mentioned his name.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

Hon. Deputy Speaker, hold on. Just give me a minute. The Hon. Member raised a point of Order and made some allegations misleading the House. So, it is my right to respond, according to the Standing Orders.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Okay, I will give you a minute, Hon. Member.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

Okay, Sir.

இந்த விடயம் சம்பந்தமாக, இலங்கைத் தமிழரசுக் கட்சி அப்படிச் செய்கிறது, இப்படிச் செய்கிறது என்றில்லாமல், "சர்வதேச குற்றவியல் நீதிமன்றத்துக்கு இலங்கை அரசாங்கத்தைக் கொண்டுசெல்வோம்" என்று சொன்னதற்கான வேலையை அவர்கள் செய்யட்டும்! நாங்கள் செம்மணி மனிதப் புதைகுழி தொடர்பான அரசாங்கத்தின் முன்னெடுப்புகளில் எங்களுக்குத் திருப்தியில்லை என்றுதான் சொல்கின்றோம். அது அவருக்குப் பிடிக்கவில்லை என்றால், அது அவரின் நிலைப்பாடு! இலங்கைத் தமிழரசுக் கட்சியின் கருத்துகளைப்பற்றி அவர் ஏன் கவலைப்பட வேண்டும் என்பது எனக்குப் புரியவில்லை. இப்படியான தேவையில்லாத விவாதங்களுக்குக் கௌரவ சபாநாயகர் அவர்களே நேரம் ஒதுக்காதீர்கள். நன்றி!

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Member, there would be no debate on that.

Now, we will move onto Ministerial Statements. The Hon. (Dr.) Anil Jayantha, Minister of Labour and Deputy Minister of Finance and Planning to reply, on behalf of the Minister of Finance, Planning and Economic Development, to the Question raised by the Hon. Shanakiyan Rajaputhiran Rasamanickam on 10.07.2026 under Standing Order No. 27(2)

## කොළඹ වරාය නගරයට ලැබුණු ආයෝජන සහ රැකියා උත්පාදනය: මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## கொழும்பு துறைமுக நகரத்தில் பெறப்பட்ட முதலீடும் உருவாக்கப்பட்ட வேலைவாய்ப்புகளும்: நிதி, திட்டமிடல் பிரதி அமைச்சரினது கூற்று
## INVESTMENT RECEIVED AND EMPLOYMENT GENERATED AT COLOMBO PORT CITY: STATEMENT BY DEPUTY MINISTER OF FINANCE AND PLANNING

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා විසින් 2026.07.10වැනි දින ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

1. ප්‍රධාන බදු ගිවිසුම යටතේ CHEC පෝට් සිටි සමාගම වෙත බදු දී ඇති හෙක්ටෙයාර 116.1ක භූමි ප්‍රමාණයෙන් හෙක්ටෙයාර 12.99ක් සංවර්ධන කටයුතු සඳහා මේ දක්වා ආයෝජකයන් වෙත ලබා දී ඇත. මෙම ව්‍යාපෘති සමාගම වෙත වෙන් කරලා තිබෙන සමස්ත ඉඩම් ප්‍රමාණයෙන් සියයට 11.2ක් වෙනවා. ඒ සමාගම් 7ක් තිබෙනවා.

| අංකය | ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ප්‍රාථමික ව්‍යාපාරයේ - PBSI - නම | සංවර්ධන පාලන රෙගුලාසි - DCR - * අනුව ඉඩම් කොටසේ වර්ගප්‍රමාණය (වර්ග මීටර්) | හිමිකාරිත්වය දරන රට |
|---|---|---|---|
| 1 | සිලෝන් රියල් එස්ටේට් හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 30,629.92 | ශ්‍රී ලංකාව |
| 2 | කොළඹ මැරිනා ඩිවලොප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් | **30,776.00 | ශ්‍රී ලංකාව |
| 3 | අයි සී සී පෝට් සිටි (ප්‍රයිවට්) ලිමිටඩ් | 13,945.87 | ශ්‍රී ලංකාව |
| 4 | අයි එෆ් සී කොලොම්බෝ 1 (ප්‍රයිවට්) ලිමිටඩ් | 12,561.60 | චීනය |
| 5 | මැරිනා හොටෙල් හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 13,005.71 | ශ්‍රී ලංකාව |
| 6 | හෝම් ලෑන්ඩ්ස් පෝට් සිටි (පුද්ගලික) සමාගම | 12,527.80 | ශ්‍රී ලංකාව |
| 7 | ප්‍රයිම් මෙල්වා පෝට් සිටි (පුද්ගලික) සමාගම | 16,406.35 | ශ්‍රී ලංකාව |
| | බදු දී ඇති සමස්ත ඉඩම් කොටස්වල වර්ගප්‍රමාණය (වර්ග මීටර්) | 129,853.25 | |

* සංවර්ධන පාලන රෙගුලාසි - DCR

** ඉඩම් කොටස් 4ක වර්ග ප්‍රමාණවල එකතුව (වර්ග මීටර්)

- 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභා පනතේ 6(1) සහ (ඇ) වගන්ති සහ 38(අ) සහ (ආ) වගන්ති යටතේ කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ පිහිටි රජයේ අළෙවි කළ හැකි ඉඩම් සහ ව්‍යාපෘති සමාගමේ අළෙවි කළ හැකි ඉඩම් බදු දීමට කොමිෂන් සභාවට බලතල පැවරිලා තිබෙනවා.
- ඒ යටතේ ලබාදෙන බදු කාලසීමාව අවුරුදු 99ක් වේ.

2. ඉඩම් බදු දීමෙන් රජය උපයා ඇති ආදායම පිළිබඳව 2021 සිට 2026 දක්වා දත්ත තිබෙනවා.

(අ) ඉඩම් බදු දීමෙන් රජය උපයා ඇති ආදායම

| | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 |
|---|---|---|---|---|---|---|
| 2021 අංක 11 දරන කොළඹ වරාය නගර පනතේ 23(2) (ආ) වගන්තිය ප්‍රකාරව කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභාවේ 1%ක පහසුකම් සැලසීමේ ගාස්තුව **(ශ්‍රී ලංකා රුපියල් මිලියනවලින්)** | 405.07 | - | - | - | 141.86 | 314.78 |

(ආ) ඉඩම් බදු දීමෙන් CHEC පෝර්ට් සිටි (ව්‍යාපෘති සමාගම) ලැබූ ආදායම

| | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 |
|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති සමාගමේ අළෙවි කළ හැකි ඉඩම්වල බදු වටිනාකම **(ශ්‍රී ලංකා රුපියල් මිලියනවලින්)** | 40,102.40 | - | - | - | 14,044.35 | 31,163.16 |

3. (අ) කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභාව (2021-2026)

| වර්ෂය | සෘජු විදේශ ආයෝජන ගලා ඒම (ඇමෙරිකානු ඩොලර් මිලියන) |
|---|---|
| 2021 | - |
| 2022 | - |
| 2023 | 6 |
| 2024 | 73 |
| 2025 | 258 |
| 2026* | 70 |

* සටහන - 2026 වර්ෂය සඳහා ඉදිරිපත් කර ඇති විදේශීය සෘජු ආයෝජන - FDI - සංඛ්‍යාලේඛන දැනට පවතින දත්ත මත පදනම් වූ යෝජිත ආයෝජන අගය නිරූපණය කරයි. ඒ සඳහා 2026 වසරේදී උපායමාර්ගික වැදගත්කමක් ඇති ව්‍යාපාර - BSIs - ලෙස නම් කරන ලද බලය ලත් තැනැත්තන් විසින් ලබා දෙන ලද පස් අවුරුදු ආයෝජන සැලැස්මේ 1වන වසරේ යෝජිත FDI අගය මේ සඳහා භාවිත කර ඇත. ඒ අනුව 1 වන වසර 2026 මුදල් වර්ෂයට අනුරූප වන බවට උපකල්පනය කර තිබේ.

(ආ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය - ලැබුණු සෘජු විදේශ ආයෝජන (2021-2026)

| වර්ෂය | සෘජු විදේශ ආයෝජන ගලා ඒම (ඇමෙරිකානු ඩොලර් මිලියන) |
|---|---|
| 2021 | 780 |
| 2022 | 1,076 |
| 2023 | 737 |
| 2024 | 614 |
| 2025 | 1,063 |
| 2026 (පළමු මාස 6) | 302 |

4. මේ රැකිරක්ෂා අවස්ථා ජනනය වීම, බලයලත් පුද්ගලයින් - authorized persons - යටතේ තිබෙන්නේ.

| රැකියා උත්පාදනය (ශ්‍රී ලාංකික) | රැකියා උත්පාදනය (විදේශීය) | 2025 දෙසැම්බර් වන විට සමස්ත රැකියා උත්පාදනය |
|---|---|---|
| 6,115 | 3,756 | 9,871 |

5. (අ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මූල්‍ය කාර්යසාධනය (පස් අවුරුදු සැසඳීම)

| වර්ෂය | පුනරාවර්තන වියදම්* (A) | ප්‍රාග්ධන වියදම් (B) | මුළු වියදම (C) | ස්වයං උත්පාදිත ආදායම (D) | භාණ්ඩාගාර අරමුදල් (E) | සෘජු විදේශ ආයෝජන ලැබීම(F) | ඇමෙරිකානු ඩොලරයක් වෙනුවෙන් දැරූ වියදම (C/F) |
|---|---|---|---|---|---|---|---|
| | ශ්‍රී.ල.රු (මිලියන) | ශ්‍රී.ල.රු (මිලියන) | ශ්‍රී.ල.රු (මිලියන) | ශ්‍රී.ල.රු (මිලියන) | ශ්‍රී.ල.රු (මිලියන) | ඇ.ඩො. (මිලියන) | ශ්‍රී.ල.රු |
| 2021 | 3,877.54 | 533.85 | 4,411.39 | 5,240.95 | - | 780.00 | 5.66 |
| 2022 | 4,453.59 | 481.42 | 4,935.01 | 7,375.25 | - | 1,076.00 | 4.59 |
| 2023 | 6,763.27 | 847.33 | 7,610.60 | 10,864.99 | - | 737.00 | 10.33 |
| 2024 | 6,790.45 | 1,166.36 | 7,956.81 | 10,329.19 | - | 614.00 | 12.96 |
| 2025 | 7,059.88 | 936.44 | 7,996.32 | 11,000.31 | - | 1,063.00 | 7.52 |
| 2026 (පළමු මාස 6) | 3,425.71 | 388.40 | 3,814.11 | 5,525.22 | - | 302.00 | 12.63 |

* පුනරාවර්තන වියදම් සඳහා වැටුප් හා වේතන සහ වෙනත් ආදායම් වියදම් ඇතුළත් වේ.

(ආ) කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභාව මූල්‍ය කාර්යසාධනය (පස් අවුරුදු සැසඳීම)

| වර්ෂය | පුනරාවර්තන වියදම් * - A - | ප්‍රාග්ධන වියදම් - B - | මුළු වියදම - C - | ස්වයං උත්පාදිත ආදායම - D - | භාණ්ඩාගාර අරමුදල් - E - | සෘජු විදේශ ආයෝජන ලැබීම - F - | ඇමෙරිකානු ඩොලරයක් වෙනුවෙන් දැරූ වියදම - C/F - |
|---|---|---|---|---|---|---|---|
| | ශ්‍රී.ල.රු (මිලියන) | ශ්‍රී.ල.රු (මිලියන) | ශ්‍රී.ල.රු (මිලියන) | ඇ.ඩො. (මිලියන) | ශ්‍රී.ල.රු (මිලියන) | ඇ.ඩො. (මිලියන) | ශ්‍රී.ල.රු |
| 2021 | 39.97 | 8.22 | 48.20 | 2.09 | - | 0 | - |
| 2022 | 264.21 | 2.81 | 267.02 | 0.11 | - | 0 | - |
| 2023 | 165.42 | 0.89 | 166.31 | 4.06 | - | 6 | 27.72 |
| 2024 | 152.70 | - | 152.70 | 5.23 | - | 73 | 2.09 |
| 2025 | 208.53 | 40.10 | 248.63 | 6.99 | - | 256 | 0.97 |
| 2026 (පළමු මාස 6) | 116.37 | 0.15 | 116.52 | 1.19 | - | 70 | 1.66 |

* පුනරාවර්තන වියදම් සඳහා වැටුප් හා වේතන සහ වෙනත් ආදායම් වියදම් ඇතුළත් වේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Shanakiyan Rajaputhiran Rasamanickam, you can have a short clarification.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

Thank you, Sir.

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, මෙහිදී ඉතා වැදගත් කාරණයක් මම මතු කරන්න කැමැතියි. මෙහි ප්‍රාග්ධන වියදම්වලට අමතරව පඩි-නඩි සම්බන්ධ වියදම් පිළිබඳව සඳහන් කළා. මම හිතන විධියට එහි අවසානයට කියපු එක රුපියල් මිලියන 7,059යි, ඊට කලින් රුපියල් මිලියන 6,790යි. එහෙම යම් සංඛ්‍යාවක් තමයි කිව්වේ, salaries ඇතුළුව මුළු total එක ලෙස. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මේක ඇතුළේ මගේ ගැටලුව වුණේ මේකයි. මේ පඩි-නඩි පිළිබඳව මම මීට පෙරත් ප්‍රශ්නයක් ඇහුවා. සමහර නිලධාරින් රුපියල් මිලියන 1.5ක්, 2ක් වාගේ පඩි ගන්නවා කියලා අපට දැනගන්න ලැබෙනවා. මේ පිළිබඳ තොරතුරු කාටවත් දෙන්නේ නැහැ. තොරතුරු දැන ගැනීමේ පනත හරහා ඉල්ලා සිටියත් ඒ තොරතුරු දෙන්න බැහැ කියලා කියනවා. රටේ ඇමතිවරුන්ගේ, ජනාධිපතිගේ, අගමැතිගේ, කථානායකගේ, නියෝජ්‍ය කථානායකගේ පඩි-නඩි එළියට දමනකොට, - ඊයේ අර්ච්චුනා මන්ත්‍රීතුමා මන්ත්‍රීවරුන්ගේ වැටුප් පිළිබඳව හෙළිදරවු කළා, අපි දැක්කා. එහෙම තොරතුරු එළියට දෙන්න පුළුවන් අවස්ථාවක් තිබෙනකොට, මේ වරාය නගරයේ අයගේ විතරක් තොරතුරු දෙන්න බැරි ඇයි? ඒ වාගේම මට ලබා දී තිබෙන දත්ත අනුව නම්, මේ වරාය නගරය ව්‍යාපෘතිය හරහා කරන්න උත්සාහ කරපු ඒ වැඩ පිළිවෙළ සාර්ථකව කෙරෙන බවක් පෙනෙන්නට නැහැ. මොකද, ඒ සඳහා යන වියදමට සාපේක්ෂව ඒක වෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ ප්‍රශ්නයේම තිබෙනවා "The Colombo Port City was promised to bring US Dollars 15 billion in investments and generate over 80,000 jobs" කියලා. But, how many jobs have they created so far? How much money out of the promised US Dollars 15 billion did they bring in?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Shanakiyan Rajaputhiran Rasamanickam, could you please make it brief?

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

So, my suggestion to you, Hon. Minister, is this. Normally, if an ordinary businessman gets a land on lease and does not fulfil the conditions agreed to when they gave their proposal, the Government cancels the lease. So, I urge you to cancel the lease of the Colombo Port City given to the Chinese and take that land back to the Government of Sri Lanka so that we could use it.

Secondly, I would also like to urge you to summon the Colombo Port City Economic Commission to the CoPF to investigate into this matter further. Yesterday also, I saw on news that some Chinese man, who had stolen a mobile phone, had been arrested. All these scammers are allegedly Chinese. We have not got anything out of Colombo Port City, but only scammers and thieves! So, that is what I would urge the Hon. Minister to look into. Thank you.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Minister, your response please, if there is one.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ඇත්තටම ඒ ප්‍රශ්නය අසනකොට පඩි නඩි ඇතුළුව පුනරාවර්තන වියදම් අහලා තිබෙන නිසාම වෙන්න ඇති, මේ සියල්ල එකතු කර තිබෙන්නේ. නමුත් අපි ඒ තොරතුර වෙනමම ගන්න බලන්නම්. අපි පිළිගන්නවා, පැවති තත්ත්වයන් කළමනාකරණය කරමින් මේවා ඉහළ තැනකට ගෙනෙන්න ඕනෑය කියලා. ගැටලු, අඩුපාඩු තිබෙනවා. හැබැයි, ක්‍රමිකව 2023ට සාපේක්ෂව 2025 වර්ෂය වනකොට ඩොලරයක් ගෙන ඒම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය දරන ලද වියදම ඩොලරයට සාපේක්ෂව රුපියල් 10.33 සිට 7.52 දක්වා අඩු වෙලා තිබෙනවා. ඒ වාගේම Colombo Port City එකේත් ඩොලරයක් වෙනුවෙන් දරන ලද වියදම රුපියල් 27.72 සිට ඩොලර් දශම 75 දක්වා විශාල ප්‍රමාණයකින් අඩු වෙලා තිබෙනවා. නමුත් වෙනත් අකාර්යක්ෂමතා, ගැටලු තිබෙනවා නම් අපි ඒ පිළිබඳව සොයා බලනවා. රැකී රක්ෂා සම්බන්ධයෙනුත් අපි අවධානය යොමු කරන්න ඕනෑ. අපට තිබෙන වගකීම තමයි, ඒ තිබෙන තත්ත්වය කළමනාකරණය කරමින් ආයෝජන කැඳවන තැනකට සම බිමක් නිර්මාණය කිරීම. ඒ අනුව ප්‍රතිපත්ති මත ආයෝජන කැන්දන දිශාවකට තමයි දැන් ගමන් කරමින් තිබෙන්නේ. ඉදිරි කාල පරිච්ඡේදයේදී අපි බලාපොරොත්තු වනවා, මේ කටයුතු වේගවත් කරලා අපේක්ෂිත ඉලක්ක ළඟා කර ගැනීමට.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. (Dr.) Ramanathan Archchuna, what brings you to your feet?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 111හි (3), (4), (7) ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. ඒ යටතේ මේ කාරණය මම අහන්න කැමැතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Member, please make it very brief.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

ගරු නලින්ද ජයතිස්ස ඇමතිතුමනි, අපේ COVID-19 වංචා, දූෂණ ගැන සඳහන් Krishnapuram and Maruthankerny audit report එක ගැන අපි Sectoral Oversight Committee එකේදී කථා කළා. කථා කරලා Member කෙනෙක් විධියට මම Parliament letterhead එකෙන් Northern Provincial Council එකේ Secretaryට ලියුමක් යැව්වා, 2022 audit report එක

දෙන්න කියලා. හැබැයි, අද වෙනකල් ඒක මට ලැබුණේ නැහැ. මට ලියුමක් එවලා තිබෙනවා, ඒක එළියට දෙන්න බැහැ කියලා. නලින්ද ජයතිස්ස ඇමතිතුමනි, පාර්ලිමේන්තුවට submit කරන්නවත් ඒක දෙන්න බැහැ කියන්නේ බරපතළ චෝදනාවක්. Sectoral Oversight Committeesවලට අදාළ sections කිහිපයක් මම කියෙව්වා. ඒවායේ පැහැදිලිව තිබෙනවා, ඕනෑම කෙනෙක්ව ගෙන්වා විමර්ශනය කරන්න පුළුවන්, ඒක යටතේ එන ඕනෑම report එකක් අපට බලන්න පුළුවන් කියලා. ඒ නිසා මේ ලියුම සම්බන්ධයෙන් අපට උත්තර දෙන්න.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන ඇමතිතුමා මඟින් විමසීමක් කරලා මම ඒ ගැන දැනුම් දෙන්නම්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Second Ministerial Statement to be made by the Hon. Ananda Wijepala, Minister of Public Security and Parliamentary Affairs, in reply to the Question raised by the Hon. Shanakiyan Rajaputhiran Rasamanickam under Standing Order No. 27(2) on 23.07.2026.

## රැකියා වීසා හා විදේශ රැකියා ලබා දීමේදී සිදුවන වංචා: මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## வேலை விசா மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புகள் வழங்கலில் இடம்பெறும் மோசடிகள்: பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரினது கூற்று
## FRAUDS INVOLVING ISSUANCE OF JOB VISA AND FOREIGN EMPLOYMENT OPPORTUNITIES: STATEMENT BY MINISTER OF PUBLIC SECURITY AND PARLIAMENTARY AFFAIRS

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා විසින් 2026.07.23 දින ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ)

| අනු අංකය | වර්ෂය | විදේශ රැකියා වංචා ආශ්‍රිතව වාර්තා වූ පැමිණිලි සංඛ්‍යාව | වීසා වංචා ආශ්‍රිතව වාර්තා වූ පැමිණිලි සංඛ්‍යාව | විදේශගතවීම් ආශ්‍රිතව වාර්තා වූ පැමිණිලි සංඛ්‍යාව | මිනිස් ජාවාරම් ආශ්‍රිතව වාර්තා වූ පැමිණිලි සංඛ්‍යාව | අත්අඩංගුවට ගත් සැකකරුවන් සංඛ්‍යාව | ගොනු කරන ලද නඩු සංඛ්‍යාව | වරදකරුවන් සංඛ්‍යාව | දැනට සිදු කෙරෙමින් පවතින විමර්ශන සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | 2021 | 245 | 172 | 0 | 187 | 626 | 365 | 322 | 191 |
| 02 | 2022 | 394 | 259 | 1 | 286 | 852 | 562 | 329 | 219 |
| 03 | 2023 | 973 | 173 | 0 | 183 | 1,024 | 777 | 449 | 483 |
| 04 | 2024 | 1,269 | 183 | 0 | 238 | 1,431 | 933 | 373 | 630 |
| 05 | 2025 | 1,516 | 259 | 0 | 193 | 1,439 | 975 | 426 | 660 |
| 06 | 2026.06.30 | 612 | 90 | 1 | 71 | 342 | 185 | 89 | 225 |

(ආ)

| අනෙකුත් නීති ක්‍රියාත්මක කරන ආයතන වෙත යොමු කිරීම | 2022 | 2023 | 2024 | 2025 | 2026 ජූනි දක්වා |
|---|---|---|---|---|---|
| | 185 | 240 | 430 | 530 | 329 |

❖ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතෙහි විෂය පථයට අයත් වන පැමිණිලි අදාළ දේශීය පොලිස් ස්ථාන වෙත යොමු කර ඇති බව කාරුණිකව දැනුම් දෙමි.

ගෙන ඇති පියවර, ක්‍රියාත්මක කර ඇති විමර්ශන, අත්අඩංගුවට ගැනීම්, ගෙන ඇති නෛතික ක්‍රියාමාර්ග, නීතියෙන් තහවුරු කිරීම් සහ දැනට උසාවියෙහි පවත්නා නඩු ඇතුළු එවැනි පැමිණිලි ආශ්‍රිතව සිදුකර ඇති සියලුම ගවේශනයන්හි විස්තර ඔබගේ කාරුණික දැනගැනීම සඳහා (අ) පිළිතුර යටතේ දක්වා ඇත.

(ඇ) මෙම කාල වකවානුව තුළ එවැනි සිදුවීම් වාර්තා වී නැත.

(ඈ)

| අනු අංකය | වර්ෂය | ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව | අත්අඩංගුවට ගත් සැකකරුවන් සංඛ්‍යාව | ගොනු කළ නඩු සංඛ්‍යාව | වරදකරුවන් සංඛ්‍යාව | දැනට සිදු කරමින් පවතින විමර්ශන සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| 01 | 2021 | 0 | 0 | 0 | 0 | 0 |
| 02 | 2022 | 0 | 0 | 0 | 0 | 0 |
| 03 | 2023 | 0 | 0 | 0 | 0 | 0 |
| 04 | 2024 | 0 | 0 | 0 | 0 | 0 |
| 05 | 2025 | 2 | 3 | 2 | 0 | 2 |
| 06 | 2026.06.30 | 0 | 0 | 0 | 0 | 0 |

[ගරු ආනන්ද විජේපාල මහතා]

(ඉ) සෑම පැමිණිල්ලකම ස්වභාවය සහ තත්ත්වය අනුව අදාළ බලප්‍රදේශයේ පොලිස් ස්ථාන සහ පාලන කොට්ඨාස මඟින් විදේශ රැකියා වංචා, වීසා වංචා, සංක්‍රමණ වංචා සහ මිනිස් ජාවාරම් ආශ්‍රිත පැමිණිලි ලැබෙන අතර, ඒවා විමර්ශනය කරනු ලැබේ. සංකීර්ණ සංවිධානාත්මක, මහා පරිමාණයෙන් හෝ ජාත්‍යන්තර සීමා ඉක්මවන අපරාධ ක්‍රියාකාරකමක් හෝ විශේෂිත විමර්ශන ප්‍රවීණත්වයක් අවශ්‍ය වූ අවස්ථාවකදී එවැනි පැමිණිලි ශ්‍රී ලංකා පොලිසියේ අදාළ විශේෂිත විමර්ශන ඒකකයට (CID ඇතුළු) මධ්‍යම අපරාධ පරීක්ෂණ කාර්යාංශය (මිනිස් බලපෑම් හා ජාවාරම් විමර්ශන සහ සමුද්‍රික අපරාධ පැමිණිලි ඒකක) මූල්‍ය සහ වෙළෙඳ අපරාධ විමර්ශන අංශය හෝ වෙනත් අදාළ විශේෂිත ඒකක වෙත යොමු කරනු ලැබේ.

විදේශ රැකියා ආශ්‍රිත වංචා සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ද, වංචාකාරී රැකියා නියෝජිත ආයතන සහ වෙනත් විදේශ රැකියා ක්ෂේත්‍රයේ නීති විරෝධී ක්‍රියාකාරකම් ආශ්‍රිත පැමිණිලි ලබාගනිමින් නීති විරෝධී බඳවාගැනීම් ආශ්‍රිත විමසුම් පවත්වමින් සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරනු ලබනවා. පොලිස් විමර්ශන අවශ්‍ය අවස්ථාවන්හිදී එය සම්බන්ධීකරණය කර ශ්‍රී ලංකා පොලිසිය වෙත අදාළ අපරාධ විමර්ශන සහ නීතිමය ක්‍රියාමාර්ග සඳහා යොමු කරනවා.

ඵලදායී ක්‍රියාමාර්ගයක් ගැනීමකින් තොරව වින්දිතයන් එක් ආයතනයකින් හෝ පොලිස් කොට්ඨාසයකින් වෙනත් ස්ථානයකට අනවශ්‍ය ආකාරයකින් යොමුවීම අවම කිරීමට ශ්‍රී ලංකා පොලිසිය මේ වන විට ක්‍රියාමාර්ග ගෙන ඇත. මූලික ක්‍රියාමාර්ග සඳහා පහත කරුණු ඇතුළත් වේ.

- පැමිණිලි මූලිකව භාර ගැනීම.

  වරද සිදු වූ ස්ථානය නොසලකා ආසන්නතම පොලිස් ස්ථානයට පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට වින්දිතයාට හැකියාව තිබෙනවා. පැමිණිල්ල මූලිකව පිටපත් කරගන්නා අතර එය පරීක්ෂා කිරීම කරනු ලැබේ. පසුව එම කරුණු වරදෙහි ස්වභාවය මත අදාළ විමර්ශන අධිකාරියක් වෙත යොමු කරයි. ඒක එක ක්‍රමවේදයක්.

- විශේෂ විමර්ශන ඒකකයන්ට යොමු කිරීම.

  මානව ජාවාරම්, මිනිස් වෙළෙඳාම, සංවිධානාත්මක අපරාධ, මහා පරිමාණයේ මූල්‍ය වංචා හෝ අන්තර්ජාතික අපරාධ ක්‍රියාකාරකම් වැනි කරුණු සඳහන් කරන අවස්ථාවන්හිදී වින්දිතයා කිහිපවරක් විවිධ ආයතනවලට යොමු කරනු වෙනුවට වැඩිදුර විමර්ශනය සඳහා විශේෂිත ඒකකයකට එම කරුණු යොමු කිරීමේ හැකියාව තිබෙනවා.

- **අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණය.**

  විදේශ රැකියා වංචා සහ සංක්‍රමණ ආශ්‍රිත වැරදි සම්බන්ධ සිදුවීම්වලදී ශ්‍රී ලංකා පොලිසිය, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සහ වෙනත් අදාළ ආයතන අතර එම සිදුවීමෙහි තත්ත්වය අනුව සම්බන්ධීකරණයක් පවත්වාගෙන යයි. මෙමඟින් තොරතුරු හුවමාරුව පහසු කරන අතර, අනවශ්‍ය ලෙස එකම පරීක්ෂණ නැවත සිදුකිරීම ද වළක්වාලයි.

- **සෘජු පැමිණිලි කිරීම.**

  "පොලිස්පතිට කියන්න" - "Tell IGP" - මහජන පැමිණිලි සේවාව මඟින් පැමිණිලි සහ තොරතුරු පොලිස්පති වෙත සෘජුවම ඉදිරිපත් කිරීමට මහජනතාවට අවස්ථාවක් ලබා දී ඇත. මෙමඟින් ලැබෙන පැමිණිලි අදාළ පොලිස් අධිකාරින් වෙත යොමු කෙරෙන අතර, අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට විමර්ශන නිලධාරින් වෙත ලබා දේ. එසේ ලබා දුන් පියවර පිළිබඳව පැමිණිලිකරු ප්‍රසාදයට පත් නොවන්නේ නම් එකී කරුණු නැවත පොලිස්පති වෙත යොමුවන ආකාරයෙන් අවස්ථාව ලබා දී තිබෙනවා.

- **වින්දිතයා කේන්ද්‍ර කරගත් විමර්ශන ප්‍රවේශය.**

  පැමිණිලිකරුගෙන් අදාළ තොරතුරු සහ උපකාරක ලේඛන හැකි ඉක්මනින් ලබාගැනීමට විමර්ශන නිලධාරින් අපේක්ෂා කරන අතර, වින්දිතයා විවිධ ආයතන වෙත නිරන්තරව යොමු කිරීමකින් තොරව අදාළ ආයතන සම්බන්ධීකරණය කිරීමට මේ වන විට කටයුතු කරමින් සිටිනවා.

- **බරපතළ සිද්ධි සඳහා විශේෂ පරීක්ෂණ.**

  වින්දිතයන් විශාල ප්‍රමාණයක් හෝ විශාල මූල්‍ය හානියක් හා සම්බන්ධ සිද්ධීන්හිදී විශේෂ ඒකක මඟින් පරීක්ෂණ සිදුකරනු ලබනවා. උදාහරණ වශයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ FCID මඟින්, විදේශ රැකියා ලබා දීමේ ව්‍යාජ පොරොන්දු සම්බන්ධ මහා පරිමාණ සංකීර්ණ සිදුවීම් සම්බන්ධයෙන් විශේෂ පරීක්ෂණ මෙහෙයවා ඇත.

  මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් ලැබෙන ඉහත පරීක්ෂණ සම්බන්ධව පැමිණිලි පරීක්ෂා කිරීමට ශ්‍රී ලංකා පොලිසියේ මධ්‍යම අපරාධ විමර්ශන කාර්යාංශයට අනුයුක්තව පොලිස් කණ්ඩායමක් මේ වන විට යොදවා තිබෙනවා.

- **ධාරිතා නැංවීම සහ අන්තර් ආයතන** සහයෝගීතාව.

  මෙරට හා ජාත්‍යන්තර ආයතන සහයෝගීත්වය ඇතිව නිලධාරින්ගේ පරීක්ෂණ ධාරිතාව ශක්තිමත් කිරීමට විශේෂ පුහුණු වැඩසටහන් සංවිධානය කිරීමට ශ්‍රී ලංකා පොලිසිය අඛණ්ඩව ක්‍රියාකරනු ලබනවා. උදාහරණ වශයෙන් 2026 මාර්තු මසදී ශ්‍රී ලංකා පොලිසිය සහ අනෙකුත් අදාළ ආයතනවල නිලධාරින් විශේෂයෙන්ම මිනිස් ජාවාරම් සහ මානව වෙළෙඳාම ගවේෂණය පිළිබඳව විශේෂයෙන් ඉලක්ක කරගත් ඕස්ට්‍රේලියානු පොලිසිය මඟින් සිදුකරන ලද දින 12ක වැඩසටහනකට සහභාගී කරවනු ලැබුවා.

  මේ අනුව ශ්‍රී ලංකා පොලිසියේ ප්‍රතිපත්තිය වන්නේ, වරදක් සිදුකළ බවට වාර්තා වූ වින්දිතයින් හුදෙක් වෙනත් ආයතනයක විශේෂ අවශ්‍යතා හෝ නීතිමය තත්ත්වයන් මත අදාළ වන කරුණක් හෙයින් ඵලදායී විමර්ශනාත්මක ප්‍රතිචාරයකින් තොරව අතහැර දැමිය යුතු නොවන බවය. යම් පැමිණිල්ලක් වෙනත් ආයතනයකට යොමු කිරීමට අවශ්‍ය වන අවස්ථාවක එය අදාළ නිල මාර්ග ඔස්සේ ආයතනයෙන් ආයතනයට කළ යුතු අතර, සුදුසු සම්බන්ධීකරණ හා පසු විපරම් ක්‍රියාමාර්ග ද සහතික කළ යුතුය. එමෙන්ම පැමිණිල්ල පිළිබඳව වැඩිදුර විමර්ශන සම්බන්ධව පැහැදිලි තොරතුරු පැමිණිලිකරුට ලබා දීමට ආයතනය බැඳී සිටී. වැරදිකරුවන්ට එරෙහිව සුදුසු නෛතික ක්‍රියාමාර්ග ගැනීමට ප්‍රවීණ විමර්ශන අධිකාරියකට හැකිවන්නේ ඵලදායී, කාලීන හා වින්දිතයන් කේන්ද්‍ර කරගත් ප්‍රතිචාර ලැබෙන බව වින්දිතයාට සහතික වීම මේ වැඩ පිළිවෙළ මඟින් සිදු කරනු ලබනවා.

(ඊ) මෙවැනි වංචා හේතුවෙන් සිදුවූ සිය දිවි හානි කරගැනීම් 2024දී එකක් හා 2025දී එකක් වාර්තා වෙලා තිබෙනවා.

(උ) විදේශ රැකියා වංචා, වීසා වංචා, සංක්‍රමණික වංචා, මිනිස් ජාවාරම් ආශ්‍රිත සංවිධානාත්මක අපරාධ ජාල අවහිර කිරීමට ශ්‍රී ලංකා පොලීසිය පියවර රැසක් මේ වන විට ගෙන තිබෙනවා. වැරදිකරුවන් පමණක් නොව ඒ අපරාධයට සම්බන්ධ, මුදල් රැස් කිරීම, කූට ලේඛන, නීති විරෝධී සංක්‍රමණ හා අපරාධ සැඟවීමට තැත් කරන පුළුල් ජාලවලට එරෙහිව මේ වනවිට පරීක්ෂණ පවත්වාගෙන යනු ලබනවා.

CID, CCIB ඇතුළු විශේෂ පොලිස් ඒකක මඟින් පුළුල් විමර්ශන සිදු කෙරෙනවා. බැංකු ගිණුම්, මුදල් හුවමාරු සහ වෙනත් මූල්‍ය හුවමාරු ආශ්‍රිත ක්‍රම මඟින් වංචාවලට ගොදුරු වූවන්ගේ මුදල් සෙවීම සඳහා මූල්‍ය විමර්ශනද සිදු කෙරෙනවා. ප්‍රමාණවත් සාක්ෂි ඇති විට නෛතික ප්‍රතිපාදනවලට යටත්ව වත්කම් නැවත අත්පත් කර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගනු ලබනවා.

උදාහරණයක් වශයෙන් ගත්තොත්, විදේශ රැකියා හෝ වීසා පොරොන්දු මත කූට ලෙස මහා පරිමාණ මූල්‍ය වංචා සිදු කර ඇති සිදුවීම්වල බැංකු ගනුදෙනු, දුරකථන සංවාද, සමාජ මාධ්‍ය සන්නිවේදන හා අනෙකුත් සාක්ෂි හරහා එම ජාල පිටුපස සැඟවුණු පුද්ගලයන් සොයා ගැනීමට පුළුල් පරීක්ෂණ මෙහෙයවනු ලබනවා.

එසේම, ශ්‍රී ලංකා පොලීසිය, විදේශ සේවා නියුක්ති කාර්යාංශය, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව ඇතුළු ආයතන සමඟ සම්බන්ධ වෙමින් වංචා සහගත ක්‍රම, සංක්‍රමණික ජාල හා මිනිස් ජාවාරම් ආශ්‍රිත තොරතුරු සෙවීමට උත්සුක වෙනවා. විධිමත් ක්‍රම මඟින් වීසා ආශ්‍රිත කරුණු සහ විදේශ රැකියා තොරතුරු තහවුරු කර ගැනීමටත්, සැක කටයුතු ක්‍රියාකාරකම් ඉතා කඩිනමින් දැනුම් දීමටත්, මහජනතාව දැනුවත් කිරීමටත් කටයුතු කරමින් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Shanakiyan Rasamanickam, you may seek a very brief clarification, if you would wish to.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

I am not in a mood to debate this with you, Hon. Deputy Speaker. We will take it up at the Committee on Parliamentary Business.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Okay. So, shall we move to the next item?

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ගරු අමාත්‍යතුමනි, ඔබතුමා දීර්ඝ පිළිතුරක් ලබා දුන්නා. ඒ සම්බන්ධව මට කාරණා ගොඩක් අහන්න තිබුණත් ගරු නියෝජ්‍ය කථානායකතුමා මට ඒ සඳහා අවස්ථාව ලබා දෙන්නේ නැහැ. නමුත් මම කාරණා දෙකක් සම්බන්ධව ඉතා කෙටියෙන් අහන්න කැමතියි.

මේ complaints ගැන මම ඉතා ඕනෑකමින් කිව්වේ මේකයි. ඔබතුමා සඳහන් කළා, 2024දී පැමිණිලි 430ක්, 2025දී පැමිණිලි 530ක් සහ 2026 අවුරුද්දේ මේ වනකොට පැමිණිලි 329ක් ඇවිල්ලා තිබෙනවාය කියලා. ඒ කියන්නේ, හැම අවුරුද්දේම ටිකෙන් ටික පැමිණිලි වැඩි වීගෙන යනවා. ගරු අමාත්‍යතුමනි, මේ අවුරුද්දේ මේ වනකොට ලැබිලා තිබෙන්නේ පැමිණිලි 329ක් වුණාට මට පෞද්ගලිකවම පැමිණිලි 20කට කිට්ටු ප්‍රමාණයක් ඇවිල්ලා තිබෙනවා, මඩකලපුවෙන් විතරක්. ඒකට හේතුව මේකයි. මේ අය මිනිස් ජාවාරම්, එහෙම නැත්නම් Sri Lanka Foreign Employment Bureau එක හරහා යන අය නොවෙයි. මේ අය, UKවල work permit එකක් අරගෙන elderly care, home care වාගේ වැඩ කරන්න යවනවා කියලා අරන් ඊට පස්සේ යවන්නේ නැති කට්ටිය. ඒගොල්ලන්ගෙන් මිලියන 25ක්, 30ක් ගන්නවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Member, would you curtail that please?

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

Sir, then you take off these Ministerial Statements. This is ridiculous!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

You agreed to make it very brief and said that -

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

Sir, on the day I raised the Question, the Hon. Minister did not respond. Then, it was answered in the way of a Ministerial Statement.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Okay, now, you seek your clarification.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

Just because it is close to lunch time, you want me to stop. Then, do not schedule three Ministerial Statements for a single day.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

You move on to seeking your clarification straightaway, please.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

Okay.

ගරු අමාත්‍යතුමනි, මගේ ඉල්ලීම වන්නේ තැන තැන යන්නේ නැතිව එක තැනකට ඇවිල්ලා එතැනදී පැමිණිල්ල දුන්නාම ඒ මිලියන 25, 30 ගන්න පුළුවන් වන විධියට කොළඹ හෝ කොහේ හරි තැනක ආයතනයක් පිහිටුවන්න කියන එකයි. ඒක තමයි, පළමුවන කාරණය.

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

දෙවන කාරණය මෙයයි. මගේ ප්‍රශ්නය එදා මතු කරනකොට මම ඉදිරිපත් කළා, Department of Immigration and Emigration සහ Airport එක ඇතුළේ සිදු වන අක්‍රමිකතා පිළිබඳව. ඒ කියන්නේ, Department of Immigration and Emigration ඇතුළේදී සහ Airport එක ඇතුළේදී රට යන අයගෙන් මුදල් ලබා ගැනීම සම්බන්ධයෙන්. ඩොලර් කිහිපයක් ඉල්ලා ගන්නවා, වීසා එක check කරනවා කියලා. මේක ලොකු මාෆියාවක්. මේ කාරණය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේදී මම මතු කළාට පස්සේ ගොඩාක් අය මේ පිළිබඳව තොරතුරු අපට ලබා දීලා තිබුණා. ඒ ගැනත් විශේෂ පරීක්ෂණයක් කරන්න කියලා මම මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා අවසානයේදී මතු කරපු කාරණා දෙක පිළිබඳව මම අවධානය යොමු කරන්නම්. මේ වනකොට විශේෂයෙන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය යටතේ ලියාපදිංචි නොවී ඊට පරිබාහිරව සිදු වන වංචා සම්බන්ධව තමයි එතුමා මතු කරන්නේ. ඒ පිළිබඳව මම අවධානය යොමු කරන්නම්. ඒ වාගේම ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ සහ Airport එකේ සිදු වන යම් යම් අක්‍රමිකතා ගැනත් එතුමා සඳහන් කළා. අපි මේ වනකොට එවැනි දේවල් විශාල වශයෙන් පාලනය කර තිබෙනවා. එවැනි සිද්ධීන් වාර්තා වෙනවා නම් ඒ සම්බන්ධයෙන් තිබෙන තොරතුරුත් ලබා දෙන්න. එතකොට ඒ පිළිබඳව අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න අපි කටයුතු කරන්නම්.

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, Question of Privilege to be raised by the Hon. Sajith Premadasa, Leader of the Opposition.

## වරප්‍රසාද: පාර්ලිමේන්තුවට පැමිණීමට ගරු චමින්ද විජේසිරි මහතා කළ ඉල්ලීම පිළිබඳ කටයුතු නොකිරීම
## சிறப்புரிமை: பாராளுமன்றத்துக்குச் சமுகமளித்தல் தொடர்பான மாண்புமிகு சமிந்த விஜேசிறியினது கோரிக்கைக்கு நடவடிக்கை எடுக்காமை
## PRIVILEGE: NON-FACILITATION OF HON. CHAMINDA WIJESIRI'S REQUEST TO ATTEND PARLIAMENT

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා පාර්ලිමේන්තුවට කැඳවීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීමට කටයුතු නොකිරීම හේතුවෙන් විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ පාර්ලිමේන්තු වරප්‍රසාද කඩවීම සම්බන්ධවයි.

ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමාට 2026.07.28 දින බදුල්ල මහාධිකරණය විසින් දඬුවම් නියම කර ඇති අතර, එදිනම එතුමා අභියාචනා ඉල්ලුම් පත්‍රයක් ගොනුකර ඇති බැවින්ද;

2026.07.30 දින මහාධිකරණය විසින් අභියාචනාව භාරගෙන, එය අභියාචනාධිකරණයට යොමු කර, එතුමාට ඇප ඉල්ලීම සඳහා අවසර ලබා දී ඇති බැවින්ද;

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(5) වගන්තිය අනුව, අවසාන තීන්දුවක් ලැබෙන තෙක් නිර්දෝෂීභාවයේ පූර්ව නිගමනයේ ආරක්ෂාව එතුමාට හිමි වන බැවින්ද, එතුමා දැනට "අභියාචනයට යටත් සිරකරුවෙකු" වශයෙන් සලකනු ලබන බැවින්ද;

මීට පෙර අභියාචනයට යටත්ව සිරගතව සිටි පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පාර්ලිමේන්තුවට කැඳවා දිවුරුම් දීමට පහසුකම් සලසා දුන් පූර්වාදර්ශයක් පාර්ලිමේන්තු ඉතිහාසයේ පවතින බැවින්ද;

2026.08.03 දින ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා සහ එතුමාගේ නීතිඥවරයා විසින් පාර්ලිමේන්තුවට පැමිණීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීමට ලිඛිතව ඉල්ලීමක් කර ඇතත්, එතැන් සිට අද දක්වා,- මම මේක පොඩ්ඩක් සංශෝධනය කරනවා. මොකද, චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා දැන් පාර්ලිමේන්තුවට ඇවිල්ලා තිබෙනවා. හැබැයි මම මතක් කරන්න කැමැතියි, ඇත්තවශයෙන්ම එතුමාගේ ඉල්ලීම පැහැර හැරලා විශේෂයෙන්ම එතුමාගේ වරප්‍රසාද කඩකර තිබෙන බව. පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ 3වන වගන්තිය සහ 5වන වගන්තිය බලන්න. ඇත්තවශයෙන්ම ගරු කථානායකතුමාත්, එතුමා එක්ක වැඩ කටයුතු කරන කාර්ය මණ්ඩලයත් මේ කරුණු පිළිබඳව දැන ගන්නට ඕනෑ. ඒ නිසා අනීතිකව, ව්‍යවස්ථා විරෝධීව චමින්ද විජේසිරි මන්ත්‍රීතුමාගේ වරප්‍රසාද කඩ වෙලා තිබෙනවා.

එහි ප්‍රතිඵලයක් වශයෙන් ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමාට 2026 අගෝස්තු 04, 05, 06 යන දිනවල පැවති පාර්ලිමේන්තු විවාදවලට සහභාගි වීමේ අයිතිය අහිමි වී ඇති අතර, 2026 අගෝස්තු 04 දින එතුමාට නියමිතව තිබුණු වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නයක් විමසීමේ අවස්ථාවද අහිමි වී ඇති අතර, එතුමා සාමාජිකත්වය දරන කාරක සභා රැස්වීම්වලට සහභාගි වීමේ අවස්ථාද අහිමි වී ඇති බැවින්ද;

ඒ කියන්නේ, එතුමාව පාර්ලිමේන්තුවට ගෙන එන්නට නෛතිකව පුළුවන්. නමුත් එතුමාව ගෙනාවේ නැහැ. එතුමාට කථා පවත්වන්න පුළුවන්. නමුත් ඒ අවස්ථාව ලැබුණේ නැහැ. එතුමාගේ ප්‍රශ්නත් තිබුණා. නමුත් ඒ ප්‍රශ්න අහන්න අවස්ථාව තිබුණේත් නැහැ. එතුමා කාරක සභාවල සාමාජිකයෙක්. ඒවාට සහභාගි වෙන්නත් බැරි වුණා. මෙසේ අවස්ථා ගණනාවකදී එතුමාගේ වරප්‍රසාද කඩ වෙලා තිබෙනවා.

පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ 3වන වගන්තිය යටතේ, තේරී පත් වූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට පාර්ලිමේන්තුවේදී භාෂණයේ, විවාද කිරීමේ සහ කටයුතුවල නිරත වීමේ අයිතිය ව්‍යවස්ථාපිතව සහතික කර ඇති බැවින්ද;

එක් මන්ත්‍රීවරයෙකුගේ මෙම අයිතිය කඩවීම හුදෙක් එතුමාගේ පුද්ගලික අයිතියක කඩවීමක් නොව ඒ හරහා මුළු පාර්ලිමේන්තුවේම විශේෂයෙන්ම විපක්ෂ මන්ත්‍රීවරුන්ගේ සාමූහික නියෝජන අයිතියද, එසේම ඔහු නියෝජනය කරන විපක්ෂයේ විපක්ෂ නායකවරයා ලෙස මාගේද පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ 3වන වගන්තිය යටතේ භාෂණයේ, විවාද කිරීමේ සහ කටයුතුවල නිරත වීමේ අයිතියද කඩවීමක් වී ඇති බැවින්ද;

එසේම, අප කණ්ඩායමේ මන්ත්‍රීවරයා බදුල්ල බන්ධනාගාරයේ සිට 2026.08.06 දින රැගෙන ආවත්,- ඒ කියන්නේ එතුමාව රැගෙන ඇවිල්ලා තිබෙන්නේ ඊයේ. ඊයේ ඉඳලාම පාර්ලිමේන්තුවට ගෙන එන එක නතර කර තිබෙනවා. කවුද එහෙම කළේ? අපි ඒ ගැන දැන ගන්න කැමැතියි. එතුමා බදුල්ලේ ඉඳලා කොළඹ ගෙනාවේ වෙන මොනවටවත් නොවෙයි නේ, පාර්ලිමේන්තුවට එන්න. කාගේ උපදෙස් මතද, කාගේ නියෝග මතද ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා මේ පාර්ලිමේන්තුවට ගෙනාවේ නැත්තේ?

මම දැන් මේක පොඩ්ඩක් සංශෝධනය කරනවා. මේකේ තිබෙන, "තවමත් පාර්ලිමේන්තු පරිශ්‍රයට නොපැමිණීම විමතියට කරුණක්" කියන කොටස මම ඉල්ලා අස් කරගන්නවා. මොකද, එතුමා දැන් ඇවිල්ලා තිබෙනවා. හැබැයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. එතුමාගේ නොපැමිණීම සිද්ධ වුණේ කාගේ උපදෙස් මතද? එතුමාට මේ පාර්ලිමේන්තුවේ කථා කිරීමේ අයිතිය අහිමි වුණා; ප්‍රශ්න කිරීමේ අයිතිය අහිමි වුණා; කාරක සභා රැස්වීම්වලට සහභාගි වීමේ අයිතිය අහිමි වුණා. ඒවාට කවුද වග කියන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? මට පොඩ්ඩක් ඒකට උත්තර දෙන්නකෝ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Sajith Premadasa, would you please finish that up?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

I have finished.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

There is one more small paragraph left of your Question of Privilege.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න.

මෙම වරප්‍රසාද කඩවීම පාර්ලිමේන්තුවේ ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කරන ලෙස මම ඉල්ලනවා. මේක මන්ත්‍රීවරයෙකුගේ වරප්‍රසාද බරපතළ ලෙස උල්ලංඝනය වීමක්. මම ඔබතුමාගෙන් කාරුණිකව මේ කාරණය අහන්න කැමැතියි.

මම පෞද්ගලිකව පිළිගන්නවා, ඔබතුමා මේකට වගකියන්න අවශ්‍ය නැහැ කියලා. මොකද, මම හිතන විධියට ඔබතුමා මේ සම්බන්ධව තීන්දුවක් ගත්තා නම් මීට වඩා වෙනස් තීන්දුවක් ගන්නේ. චමින්ද විජේසිරි මන්ත්‍රීතුමාගේ පාර්ලිමේන්තුවට එන ගමන, එතුමාගේ කථා කිරීමේ අවස්ථාව, ප්‍රශ්න කිරීමේ අවස්ථාව, කමිටුවලට සහභාගි වීමේ අවස්ථාව කවුද කඩ කළේ? උත්තරයක් දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Sajith Premadasa, that shall be forwarded to the Committee on Ethics and Privileges.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, forward කරලා හරියන්නේ නැහැ. මට උත්තරයක් දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

It will be referred to the Committee. I am not giving a reply to you; the Hon. Speaker will do that. I am going to forward it to the Committee on Ethics and Privileges. Next, Presentation of Bills.

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

### අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත
### ஏற்றுமதிக் கமத்தொழில் ஊக்குவிப்பு (திருத்தம்) சட்டமூலம்
### PROMOTION OF EXPORT AGRICULTURE (AMENDMENT) BILL

"1992 අංක 46 දරන අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවට ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා විසිනි.***

***2026 අගෝස්තු 21වන සිකුරාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர் சார்பாக மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2026 ஓகஸ்ட் 21, வெள்ளிக்கிழமை இரண்டாம்முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் சுற்றாடல், கமத்தொழில் மற்றும் வளங்களின் நிலைத்தன்மை பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. (Dr.) Nalinda Jayatissa on behalf of the Minister of Agriculture, Livestock, Land and Irrigation; to be read a Second time upon Friday, 21st August, 2026 and to be printed;*

*and to be referred to the Sectoral Oversight Committee on Environment, Agriculture and Resource Sustainability.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Notice of Motions, the Hon. (Dr.) Nalinda Jayatissa, Chief Government Whip.

## පාර්ලිමේන්තුවේ කටයුතු
## பாராளுமன்ற அலுவல்
## BUSINESS OF THE PARLIAMENT

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයේ විෂය අංක 1, 2, 3, 4, 5, 6 සහ 7 පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 24(2) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! The ongoing Proceedings of the House shall stay suspended till 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.***
*அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.00 மணிக்கு மீண்டுந் தொடங்கிற்று.*
*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, Public Business. Private Members' Motions Nos. 1 to 7 - P. 72/2025, P. 94/2025, P. 81/2025, P. 88/2025, P. 78/2025, P. 80/2025 and P. 93/2025 - in today's Order Paper.

Private Members' Motion No.1 - P. 72/2025 - to be moved by the Hon. Kanthasamy Prabu. Hon. Member, you have five minutes to present your Motion.

## පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා
## தனி நபர் பிரேரணைகள்
## PRIVATE MEMBERS' MOTIONS

### කිරි නිෂ්පාදන අංශයෙන් ස්වයංපෝෂිත්වය ප්‍රවර්ධනය කිරීම
### பால் உற்பத்தியில் தன்னிறைவினை ஊக்குவித்தல்
### PROMOTING SELF-SUFFICIENCY IN MILK PRODUCTION

[பி.ப. 1.00]

**ගරු කන්දසාමි ප්‍රභු මහතා**
(மாண்புமிகு கந்தசாமி பிரபு)
(The Hon. Kanthasamy Prabu)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே! இன்றைய தினம் இந்த உயரிய சபையிலே, 'பால் உற்பத்தியில் தன்னிறைவினை ஊக்குவித்தல்' தொடர்பான பின்வரும் தனிநபர் பிரேரணையை முன்வைப்பதில் எனது மகிழ்ச்சியைத் தெரிவித்துக் கொள்வதுடன், இந்த வாய்ப்பை வழங்கியமைக்கு நன்றியையும் தெரிவிக்கின்றேன்.

" நாடு தற்போது பால் இறக்குமதியில் தங்கியிருப்பது கணிசமான அந்நியச் செலாவணி இழப்புக்கு இட்டுச் செல்வதாலும், சிறந்த இன மாடுகளுக்கான, கால்நடைச் சேவைகளுக்கான, தீவனத்துக்கான மற்றும் உட்கட்டமைப் புக்கான வரையறுக்கப்பட்ட அணுகல் போன்ற பிரச்சினை களுக்கு விவசாயிகள் முகங்கொடுப்பதாலும், இச்சவால்களைத் தீர்ப்பது உணவுப் பாதுகாப்பை அதிகரித்து, கிராமியத் தொழில்களை உருவாக்கி, இறக்குமதிகளில் தங்கியிருத்தலைக் குறைப்பதாலும், சிறந்த இன மாடுகளுக்கான அணுகல் மற்றும் கால்நடைச் சேவைகளை மேம்படுத்துவதன்மூலமும், தீவனப் பயிர்ச் செய்கையை விரிவாக்குவதன்மூலமும், விவசாயி களுக்கான பயிற்சி மற்றும் உட்கட்டமைப்பை வலுப்படுத்து வதன்மூலமும், பாற்பண்ணை விவசாயிகளுக்கு ஊக்கு விப்புகளை வழங்குவதன்மூலமும், அரச - தனியார் பங்காண்மைகளை ஊக்குவிப்பதன்மூலமும், பால் உற்பத்தி தொடர்பான ஆய்வை ஊக்குவிப்பதன்மூலமும் பால் உற்பத்தியில் தன்னிறைவை அடைவதற்காக அரசாங்கத்தால் தேசிய பால் அபிவிருத்திக் கொள்கை அமுல்படுத்தப்பட வேண்டுமெனவும் சம்பந்தப்பட்ட அமைச்சுகள், மாகாண சபைகள் மற்றும் பால் உற்பத்தியாளர் குழுக்களுடன் ஒருங்கிணைப்பை மேற்கொள்வதற்காக ஒரு பொறிமுறை உருவாக்கப்பட வேண்டுமெனவும் பாராளுமன்றத்தின் சம்பந்தப்பட்ட குழு இதன் அமுல்படுத்தலைக் கண்காணித்து, மேலதிக நடவடிக்கைகளை விதந்துரைக்க வேண்டும் எனவும் இப்பாராளுமன்றம் பிரேரிக்கின்றது."

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இந்தப் பிரேரணையின் நோக்கம், பால் உற்பத்திப் பொருட்களின் இறக்குமதிக்காகச் செலவிடப்படும் எமது அந்நியச் செலாவணி வெளியேற்றத்தைக் குறைத்து அதனை மீதப்படுத்தக்கூடியதாக இருக்குமென்பதுதான். எமது நாட்டிலிருந்து ஒவ்வொரு வருடமும் முழு ஆடைப் பால்மா இறக்குமதிக்காக 300 - 400 மில்லியன் அமெரிக்க டொலர்கள் - இலங்கை ரூபாயின் மதிப்பில் 60 - 100 பில்லியன் ரூபாய் - செலவாகின்றது. இதில் தன்னிறைவு அடைவதன் ஊடாக, எமது அந்நியச் செலாவணி இழப்பீட்டைக் குறைத்துக்கொள்ள முடியும் என்பதைத்தான் நாங்கள் எதிர்பார்க்கின்றோம்.

இலங்கையின் வருடாந்த மொத்த பால் நுகர்வுத் தேவை கிட்டத்தட்ட 1,050 மில்லியன் லீற்றர்களாக இருக்கின்றது. உள்ளூர் உற்பத்தியின்மூலம் 35 - 40 சதவீதம் வரை, அதாவது 400-450 மில்லியன் லீற்றர்கள் வரையான தேவை பூர்த்தி செய்யப்படுகின்றது. எஞ்சிய 60-65 சதவீதத் தேவைக்கு நாங்கள் இறக்குமதியையே நம்பியிருக்கின்றோம். மத்திய வங்கி அறிக்கையின் பிரகாரம் கிடைக்கப்பெற்ற தகவலின் அடிப்படையில், ஒவ்வோர் ஆண்டிலும் இதற்கான இறக்குமதி தொடர்பான செலவினத்தை நாங்கள் ஒப்பிட்டுப் பார்ப்போமாக இருந்தால், 2021ஆம் ஆண்டு காலப் பகுதியில் 318 மில்லியன் அமெரிக்க டொலர்களும், 2022ஆம் ஆண்டில் 212 மில்லியன் அமெரிக்க டொலர்களும், 2023ஆம் ஆண்டில் 235 மில்லியன் அமெரிக்க டொலர்களும், 2024ஆம் ஆண்டில் 270 மில்லியன் அமெரிக்க டொலர்களும், 2025ஆம் ஆண்டில் 295 மில்லியன் அமெரிக்க டொலர்களும் பால் உற்பத்திகளின் இறக்குமதிக்காகச் செலவிடப்பட்டிருப்பதைக் காணலாம்.

எங்களது நாட்டின் மலையகம் உட்பட வடக்கு மற்றும் கிழக்கு ஆகிய மூன்று மாகாணப் பிரதேசங்களிலும் பால் உற்பத்தியை அதிகரிப்பதற்கான சந்தர்ப்பம் இருக்கின்றது.

மலையத்தை எடுத்துக்கொண்டால், நுவரெலியா, பதுளை, கண்டி மாவட்டங்களில் இருக்கின்ற பால் உற்பத்தி யாளர்கள்மூலம் தேசிய பால் உற்பத்திக்கு 20 - 25 சதவீதப் பங்களிப்பைச் சேர்க்கக்கூடியதாக இருக்கின்றது. ஐரோப்பிய கலப்பின 'ஜெர்சி' இனப் பசுவின்மூலம் நாளொன்றுக்கு 12 முதல் 20 லீற்றர் பால் உற்பத்தியைப் பெறக்கூடியதாக இருக்கின்றது. அதனைப் போன்று வட மாகாணத்தின் யாழ்ப்பாணம், கிளிநொச்சி, முல்லைத்தீவு, மன்னார், வவுனியா மாவட்டங்கள் தேசிய உற்பத்தியில் 10 தொடக்கம் 12 சதவீத பங்களிப்பைச் செய்கின்றன. கிட்டத்தட்ட 300,000க்கும் அதிகமான கால்நடைகளை இந்தப் பிரதேசங்களில் நாங்கள் வளர்த்துக் கொண்டிருக்கின்றோம்; அதற்கான கூடுதலான பரந்த நிலப்பரப்புகள் இருக்கின்றன. பசு மாடுகள் மற்றும் எருமைப் பெருக்கமும் போதுமானளவு இங்கே இருக்கின்றது. இந்தப் பிரதேசங்களில் பசு உற்பத்தியைக் கூட்டுவதற்குரிய நிலங்கள் இருந்தாலும் அவற்றுக்குரிய தீவனத்துக்குப் பற்றாக்குறை இருக்கின்றது. Dry areas என்று சொல்லக்கூடிய காய்ந்த வலயங்களாக இந்தப் பிரதேசங்கள் இருக்கின்றன. இங்கு நாங்கள் இந்தியா மற்றும் பாகிஸ்தான் நாடுகளில் இருந்து தருவிக்கப்பட்ட பசு மாடுகளின் உற்பத்தியை அதிகரித்துக்கொள்ளக்கூடியதாக இருக்கும்.

கிழக்கு மாகாணத்தை எடுத்துக்கொண்டால், மட்டக்களப்பு, அம்பாறை, திருகோணமலை போன்ற மாவட்டங்கள் தேசிய பால் உற்பத்திக்கு 20 சதவீதமான பங்களிப்பை வழங்கு கின்றன. அங்கு திறந்த மேய்ச்சல் தரையில்தான் பசு மாடுகள் மேய்ச்சலுக்காக விடப்படுகின்றன. அங்கு மேய்ச்சல் தரைகள் தொடர்பான பிரச்சினைகளும் இருக்கின்றன என்பது உங்களுக்குத் தெரியும்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Kanthasamy Prabu, your time is over.

**ගරු කන්දසාමි ප්‍රභු මහතා**
(மாண்புமிகு கந்தசாமி பிரபு)
(The Hon. Kanthasamy Prabu)
මට විනාඩියක කාලයක් ලබා දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

இந்தப் பிரச்சினைகளைக் கட்டுப்படுத்தி, எங்களிடம் இருக்கும் கூடுதலான இடங்களைப் பயன்படுத்தி பால் உற்பத்தியைக் கூட்டி, அதில் தன்னிறைவை அடைய வேண்டுமென்பதைத்தான் நாங்கள் எதிர்பார்க்கின்றோம். கால்நடைகளுக்கான தீவனக் குறைபாடுகளை நிவர்த்தி செய்துகொண்டு, புதிய அணுகுமுறைகளை மேற்கொண்டு, புதிய தொழில்நுட்ப வசதிகளைப் பண்ணையாளர்களுக்கு வழங்கி, பால் உற்பத்தியை அதிகரிப்பதற்கான வாய்ப்புகளை நாங்கள் ஏற்படுத்திக் கொடுக்க முடியும் என்ற எதிர்பார்ப்புடன் நான் இந்தப் பிரேரணையைச் சபைக்குச் சமர்ப்பிக்கின்றேன்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Kitnan Selvaraj. You have four minutes to second the Private Members' Motion moved by the Hon. Kanthasamy Prabu.

[பி.ப. 1.08]

**ගරු කිට්නන් සෙල්වරාජ් මහතා**
(மாண்புமிகு கிட்ணன் செல்வராஜ்)
(The Hon. Kitnan Selvaraj)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இந்த உயரிய சபையில் தனிநபர் பிரேரணையாக ஏற்றுமதி சார்ந்தும் இந்த நாட்டின் அபிவிருத்தி சார்ந்தும் ஒன்றிணைக்கப்பட்டு இருக்கின்ற கால்நடை அபிவிருத்தி அல்லது பால் உற்பத்தியில் தன்னிறைவினை ஊக்குவித்தல் சம்பந்தமாகக் கொண்டுவரப்பட்டிருக்கும் இந்தப் பிரேரணை தொடர்பான விவாதத்தில் கலந்துகொள்வதையிட்டு நான் சந்தோஷமடை கின்றேன். விசேடமாக, இன்று கொண்டுவரப்பட்டிருக்கும் இந்தத் தனிநபர் பிரேரணையில், இந்த நாட்டின் உற்பத்திப் பொருளாதாரத்தை எதிர்காலத்தில் கட்டியெழுப்புவது விவசாயத் துறையின் ஓர் அங்கமாக இருக்கக்கூடிய கால்நடைத் துறையின் ஊடாகவே என்பது தெளிவாகச் சுட்டிக்காட்டப்பட்டு இருக்கின்றது. அந்த வகையில், இந்தத் துறையை நாங்கள் கட்டியெழுப்ப வேண்டிய தேவை இருக்கின்றது. அதற்கான முழுமையான ஒத்துழைப்பை வழங்கு வதில் இந்த அரசாங்கம் முன்னிற்பதால், அரசாங்கத்துக்கு நன்றி கூறக் கடமைப்பட்டுள்ளேன்.

விசேடமாக, இன்று கால்நடைத் துறையில் கால்நடை வைத்தியர்கள் போதாத நிலைமை காணப்படுவது நம் அனைவருக்கும் தெரியும். இதனை அரசாங்கமும் இனங் கண்டிருக்கின்றது. இலங்கையில் சுமார் 300 கால்நடை வைத்தியர்களுக்கான வெற்றிடம் நிலவுகின்றது. இதற்கான முழுமையான தீர்வை எட்ட அரசாங்கம் முயற்சிக்கும் சந்தர்ப்பத்தில், இலங்கையிலிருந்து 72 கால்நடைத் துறை வைத்தியர்கள் வெளியேறி இருக்கின்ற நிலையில், கிட்டத்தட்ட 36 விண்ணப்பதாரிகள் மட்டுமே அதற்காக விண்ணப்பித் திருப்பது கவலைக்கிடமான விடயமாகும். அதுமட்டுமன்றி, தொழில்நுட்ப முறை இல்லாத, பாரம்பரிய முறையினூடாகக் கால்நடை உற்பத்தித் துறையின் செயற்பாடுகள் மேற்கொள்ளப்படுவதால், எங்களுடைய நாட்டில் விசேஷமாக பாற்பண்ணைத் துறை என்பது மிகவும் பின்னடைவை எதிர்நோக்குகின்ற ஒரு நிலைமையில் இருப்பதைக் காணக் கூடியதாக இருக்கின்றது. இந்தத் துறை கட்டியெழுப்பப்பட வேண்டுமாகவிருந்தால், இது நவீன மயப்படுத்தப்பட வேண்டும்.

அதேபோல், இந்த நாட்டில் பாற்பொருட்கள், பாலேடுகளின் இறக்குமதியானது 2023ஆம் ஆண்டில் கிட்டத்தட்ட 42,746 கிலோகிராமாக இருந்தது. இவ்வாறான நிலைமை என்பது, எமது உற்பத்திப் பொருளாதாரத்தை மட்டுமல்ல, இலங்கையின் ஒட்டுமொத்தப் பொருளாதாரத் தையும் பாதிக்கின்ற நிலைமையாகும். எனவே, இவற்றைக் கருத்திற்கொண்டு, இந்த அரசாங்கத்தால் முன்னெடுக்கப் பட்டிருக்கின்ற வேலைத்திட்டத்தின் ஓர் அங்கமாக முன்வைக்கப்பட்டிருக்கின்ற இந்தத் தனியார் உறுப்பினர் பிரேரணையினூடாக இந்தத் துறையினை நாங்கள் பலப்படுத்த வேண்டிய தேவை இருக்கின்றது.

இன்று நாங்கள் இலங்கையின் உலர் வலயங்களை எடுத்துக்கொண்டால், அங்கு கணிசமானளவு தேசிய இனக் கறவை மாடுகளே இருப்பதால், முழுமையான பால் உற்பத்தியைப் பெறமுடியாத ஒரு சந்தர்ப்பம் நிலவுகின்றது. அதேவேளையில், கடல் மட்டத்திலிருந்து கிட்டத்தட்ட 6,000 அடி உயரத்தில் இருக்கக்கூடிய மத்திய மலைநாட்டில் உள்ள சிறிய நியூசிலாந்தாக வர்ணிக்கப்படுகின்ற அம்பேவெல என்ற

[ගරු කිට්නන් සෙල්වරාජ් මහතා]

கால்நடைப் பண்ணையில் கடந்த 2021ஆம் ஆண்டுக்கு முன்னர் குறிப்பிட்டதொரு வரையறையிலேயே பால் உற்பத்தி நடைபெற்று வந்தது. அவ்வாறிருக்கின்ற நிலையில், இன்று நவீன தொழில்நுட்பத்தைப் பயன்படுத்தி, நவீன முறையினூடாக இந்தப் பால் உற்பத்தியைப் பெருக்குவதற்கும், இந்தத் துறையைக் கட்டியெழுப்புவதற்கும், உற்பத்திப் பொருளாதாரத்தை மேம்படுத்துவதற்குமாக அரசாங்கம் முன்னெடுக்கும் நடவடிக்கைகளுக்கு ஆதரவாக கௌரவ கந்தசாமி பிரபு அவர்கள் கொண்டுவந்த இந்தத் தனியார் உறுப்பினர் பிரேரணையை நான் ஆமோதிப்பதோடு, அதற்கு மேலும் வலுச்சேர்க்கும் வகையில் என்னுடைய உரை அமைந்திருக்கும் என்ற நம்பிக்கையுடன் விடை பெறுகிறேன். நன்றி!

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Gnanamuththu Srineshan. You have three minutes to speak on the Private Member's Motion moved by Hon. Kanthasamy Prabu.

[பி.ப. 1.11]

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்றைய தினம் கௌரவ கந்தசாமி பிரபு அவர்களால் கொண்டுவரப்பட்ட தனிநபர் பிரேரணையை நான் வரவேற்கின்றேன். உண்மையிலேயே இது நல்லதொரு விடயம்!

எமது நாட்டில் தன்னிறைவு அடையவேண்டிய சில துறைகள் காணப்படுகின்றன. அத்துறைகளில் ஒன்றுதான் பால் உற்பத்தி! எமது நாட்டில் பசுக்கள், எருமைகள், ஆடுகள்மூலம் பாலை உற்பத்தி செய்யக்கூடிய வாய்ப்பு அதிகமாக இருக்கின்றது. நாட்டில் பால் உற்பத்தியைப் பெருக்குவதற்கு தொழில்நுட்ப ரீதியாக என்ன செய்ய வேண்டும் என்பதைப் பற்றி அரசாங்கம் சிந்திக்க வேண்டும்.

நமது நாட்டுக்கென பொருத்தப்பாடு அடைந்த பசுக்கள் காணப்படுகின்றன. இந்த நாட்டுக்குரிய பசுக்களை கலப்புப் பிறப்பாக்கம் செய்வதன்மூலம் தரமான பசுக்களை உற்பத்தி செய்வதற்கு வாய்ப்பு இருக்கின்றது. நாங்கள் வெளிநாட்டு காலநிலைக்குப் பொருத்தமான பசுக்களை இறக்குமதி செய்தால், அந்தப் பசுக்கள் எமது நாட்டின் காலநிலைக்கு இசைவாக்கமடைய முடியாமல் இறந்து போகக்கூடிய நிலைமை ஏற்படும். எமது நாட்டில் இருக்கின்ற உள்நாட்டுப் பசுக்களை கலப்புப் பிறப்பாக்கம் செய்வதன்மூலம் உயர்தரப் பசுக்களை உருவாக்கக்கூடியதாகவும், பால் உற்பத்தியைப் பெருக்கக்கூடியதாகவும் இருக்கும். பால் உற்பத்தியில் தன்னிறைவு அடையவேண்டி இருக்கின்ற நாங்கள், வெளிநாடுகளில் இருந்து பாற்பொருட்களை இறக்குமதி செய்து எமது அந்நியச் செலாவணியை விரயம் செய்கின்ற நிலைமையை இல்லாமல் செய்வதற்கு, உள்நாட்டில் பால் உற்பத்தியைப் பெருக்க வேண்டும்.

மட்டக்களப்பில்கூட, பால் தொழிற்சாலைகளை அமைக்கக்கூடிய வாய்ப்பு இருக்கின்றது. எமது பிரதேசத்தில் மரபு வழியில் பண்ணைகளை நடத்துகின்ற, பசுக்களை வளர்க்கின்ற பண்ணையாளர்கள் அதிகமாகக் காணப்படுகின்றார்கள். மயிலத்தமடு - மாதவனை பிரதேசத்தில் எமது பண்ணையாளர்கள் பூர்வீகமாக நீண்டகாலமாக பசுக்களை வளர்த்து வருகின்றார்கள் என்பது கௌரவ கந்தசாமி பிரபு அவர்களுக்குத் தெரியும்! அந்த இடம் பசுக்கள் மற்றும் எருமைகளை வளர்ப்பதற்குப் பொருத்தமான இடமாக இருக்கின்றது. அந்த இடத்தில் மேய்ச்சல் தரைகளை உருவாக்கி, பசுக்களை வளர்ப்பதன்மூலம் நாங்கள் பால் உற்பத்தியைப் பெருக்க முடியும். அங்கு சட்டவிரோதமாகக் குடியேறி, அங்குள்ள காடுகளை அழிக்கின்றவர்களை அங்கிருந்து வெளியேற்றுவதன்மூலம் கால்நடைகளுக்குரிய அந்த மேய்ச்சல் தரையைப் பாதுகாக்க முடியும். இவ்வாறான செயற்பாடுகளைச் செய்வதன்மூலம் பால் உற்பத்தியை அதிகரிக்க முடியும்.

பால் என்பது நிறை உணவு; சமநிலை உணவு! இந்தச் சமநிலையான நிறை உணவை எமது நாட்டிலுள்ள மக்கள் போதியளவு பெறக்கூடியதாக இருந்தால், போஷாக்கின்மையை ஒழிக்க முடிவதோடு, நோய்களற்ற ஆரோக்கியமான பிரஜைகளை உருவாக்கவும் முடியும். எனவே, கௌரவ கந்தசாமி பிரபு அவர்களால் கொண்டுவரப்பட்ட இந்தப் பிரேரணையை நான் ஆதரிக்கிறேன். மட்டக்களப்பு மாவட்டத்தில் பால் உற்பத்திக்குத் தடையாக இருக்கின்ற மேய்ச்சல் தரைப் பிரச்சினையைத் தீர்ப்பதன்மூலம் அங்கு பால் உற்பத்தியை மிகைப்படுத்துவதற்கு வாய்ப்பு இருக்கின்றது. அதுமாத்திரமல்ல, அங்கு பால் தொழிற்சாலைகளை அமைப்பதற்கும் வாய்ப்பு இருக்கின்றது. இதனைச் செயற்படுத்துவதை நாங்கள் மனப்பூர்வமாக வரவேற்கின்றோம். எனவே, இதற்குரிய தடைகளை அகற்ற வேண்டுமெனக் கேட்டு, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. (Dr.) Sellaththamby Thilaganathan. You have three minutes.

[பி.ப. 1.15]

**ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) செல்லத்தம்பி திலகநாதன்)
(The Hon. (Dr.) Sellaththamby Thilaganathan)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்றைய தினம் கொண்டுவரப்பட்டுள்ள பால் உற்பத்தியில் தன்னிறைவை ஊக்குவித்தல் தொடர்பான தனிநபர் பிரேரணையில், நான் ஒரு கால்நடை வைத்தியர் என்ற ரீதியில் உரையாற்றுவதையிட்டு மகிழ்ச்சி அடைகின்றேன்.

இலங்கையில் கிட்டத்தட்ட 1,650,000 பாற்பசுக்கள் காணப்படுகின்றன. வடக்கு, கிழக்கு மாகாணத்தில் 975,000 கால்நடைகள் காணப்படுகின்றன. இலங்கையில் ஒரு நாளைக்கு சராசரியாக 12 இலட்சம் லீற்றர் பால் உற்பத்தி செய்யப்படுகின்றது. இதில் அண்ணளவாக 130,000 லீற்றர் பால் வடக்கு மாகாணத்திலே உற்பத்தி செய்யப்படுகின்றது. வடக்கு மாகாணத்தில் 400,000 கால்நடைகள் காணப்படுகின்றன. இவற்றின் சராசரி பால் உற்பத்தி 2.2 லீற்றராகக் காணப்படுகின்றது. இது மிகவும் குறைந்த அளவாகும். இந்தக் கால்நடைகள் மூலமான பால் உற்பத்தியை அதிகரிக்க

வேண்டுமென்றால், அவற்றை நாங்கள் upgrade பண்ண வேண்டும். எமது வடக்கு, கிழக்கு மாகாணங்கள் உலர் வலயப் பிரதேசங்களாகக் காணப்படுவதால், இந்தியா, பாகிஸ்தான் போன்ற நாடுகளில் இருந்து 'சாஹிவால்', 'சிந்தி' போன்ற இனங்களை இறக்குமதி செய்து, அந்த இனங்களை upgrade செய்வதன்மூலம் அங்குள்ள பசுக்களிலிருந்து பெறப்படுகின்ற பாலின் அளவை அதிகரிக்க முடியும்.

வடக்கு, கிழக்கு மாகாணங்களில் மேய்ச்சல் தரை பிரச்சினை காணப்படுகின்றது. அங்கு இருக்கின்ற கால்நடைகளுக்கு குறிப்பிட்ட சில காலங்களில் மேய்ச்சல் தரை பற்றாக்குறை ஏற்படுகின்றது. நாங்கள் வர்த்தக ரீதியில் புற்களை வளர்த்து, அவற்றை கால்நடைகளுக்கு வழங்குவதன் மூலம் பால் உற்பத்தியை அதிகரிக்க முடியும். வடக்கு, கிழக்கு மாகாணங்களில் இருக்கின்ற கிட்டத்தட்ட 60 சதவீதமான கால்நடைகள் திறந்த வெளியில்தான் மேய்க்கப்படுகின்றன. அவை ஒவ்வொன்றும் கிட்டத்தட்ட 5 கிலோ மீற்றர் தூரம் நடந்து செல்வதால், அவற்றின் பால் உற்பத்தியில் கிட்டத்தட்ட ஒரு லீற்றர் குறைவடைகின்றது. அதுமாத்திரமல்ல, அங்கு இருக்கின்ற கால்நடைகளுக்குப் பல்வேறு பிரச்சினைகளும் காணப்படுகின்றன. பரந்துவிரிந்த அந்தப் பிரதேசங்களில் கால்நடை வைத்தியர்களுக்குப் பற்றாக்குறை காணப்படுகின்றது. தற்பொழுது, இலங்கையில் மொத்தமாக 337 கால்நடை வைத்திய அலுவலகங்கள் காணப்படுகின்றன. அந்த அலுவலகங்களில் கால்நடை வைத்தியர்களுக்குப் பற்றாக்குறை காணப்படுகின்றது. காரணம், கால்நடை வைத்தியர்களுக்குப் பல்வேறு பிரச்சினைகள் காணப்படுகின்றன. அவர்கள் தமக்கென தனியான சேவை பிரமாணக் குறிப்பைக் கோரி நிற்கின்றார்கள். அவர்கள் கோருகின்ற வகையிலான தனியான சேவை பிரமாணக் குறிப்பைத் தயாரிக்கும் பணிகள் தற்பொழுது நிறைவடைகின்ற நிலையில் காணப்படுகின்றதென நான் நினைக்கின்றேன்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. (Dr.) Sellaththamby Thilaganathan, your time is up. You may wrap up now.

**ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) செல்லத்தம்பி திலகநாதன்)
(The Hon. (Dr.) Sellaththamby Thilaganathan)

நன்றி!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The next speaker is the Hon. Kaveenthiran Kodeeswaran. You have three minutes to speak on the Private Members' Motion moved by the Hon. Kanthasamy Prabu.

[பி.ப. 1.18]

**ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveenthiran Kodeeswaran)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்றைய தினம் கௌரவ கந்தசாமி பிரபு அவர்களால் கொண்டுவரப்பட்ட இந்த தனிநபர் பிரேரணை மிகவும் நல்லதொரு பிரேரணையாகும். இருந்தாலும், சில விடயங்களைக் கூறியாக வேண்டும். பால் உற்பத்தியைப் பெருக்குவதில் மிக முக்கிய பிரச்சினையாக இருப்பது, மேய்ச்சல் தரைக் காணிகளை அதிகரிக்காமை ஆகும். மேய்ச்சல் தரைக்குப் போதியளவு காணிகளைக் கொடுக்கும்பொழுதுதான் அந்த இடங்களில் மாடுகளை வளர்த்து, பால் உற்பத்தியைப் பெருக்கக்கூடியதாக இருக்கும். கௌரவ கந்தசாமி பிரபு அவர்கள் பிரதிநிதித்துவப்படுத்துகின்ற மட்டக்களப்பு மாவட்டத்தில் மிக முக்கிய பிரச்சினையாக இருப்பது, மயிலத்தமடு - மாதவனை மேய்ச்சல் தரைக் காணி! இந்தக் காணியைக் கொடுத்தாலே அந்தப் பிரதேசத்தில் இருக்கின்ற பண்ணையாளர்களால் பால் உற்பத்திக்குப் பாரிய பங்களிப்பை பெற்றுக்கொடுக்க முடியும். அதாவது, பால் உற்பத்தியை அதிகரிக்க முடியும். எனவே, நாங்கள் இந்த விடயத்தை முதலில் செய்ய வேண்டும். அரசாங்கத்தைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற கௌரவ கந்தசாமி பிரபு அவர்கள், மயிலத்தமடு - மாதவனை மேய்ச்சல் தரைக் காணியைப் பெற்றுக்கொடுப்பதற்கான முழு நடவடிக்கைகளையும் மேற்கொள்ள வேண்டும்.

அடுத்து, வட்டமடு மேய்ச்சல் தரைக் காணி பற்றி சொல்ல வேண்டும். 1972ஆம் ஆண்டிலிருந்து அதற்கென 4,000 ஏக்கர் காணி ஒதுக்கப்பட்டு இருந்தது. இருந்தாலும், தற்பொழுது அங்கு மாடுகளை மேய்ப்பதற்குத் தடங்கல்கள் ஏற்படுத்தப்பட்டு இருக்கின்றன. நீங்கள் பால் உற்பத்தியை மேற்கொள்ள வேண்டுமெனவும் பண்ணையாளர்களைப் பாதுகாக்க வேண்டுமெனவும் சொல்கின்றீர்கள். ஆனால், வட்டமடுவில் இருக்கின்ற மேய்ச்சல் தரையை இல்லாதொழிப்பதற்கான செயற்பாடுகளை மேற்கொள்வதாக நாங்கள் அறியக்கூடியதாக இருக்கின்றது. அண்மையிலும்கூட, மாவட்ட ஒருங்கிணைப்புக் குழுக் கூட்டத்தில், பண்ணையாளர்களுக்கு அந்த மேய்ச்சல் தரைக் காணியைக் கொடுப்பதில் பல தடங்கல்கள் ஏற்படுத்தப்பட்டு இருக்கின்றன. அந்த இடத்தில் மாடுகளை மேய்ப்பதற்குத் தடங்கல்கள் ஏற்படுத்தப்படுமானால், பால் உற்பத்தியில் பாரிய வீழ்ச்சியை நாடு எதிர்நோக்கவேண்டிய நிலை ஏற்படும். மேய்ச்சல் தரைக்கான காணியில் விவசாயம் செய்வதற்கு அல்லது ஏனைய வேலைத்திட்டங்களை மேற் கொள்வதற்கு அனுமதி வழங்குகின்றபோது, அங்கிருக்கின்ற எருமை மாடுகள், பசு மாடுகள் அழிவடைந்து செல்லக்கூடிய நிலை ஏற்படும். காரணம், அவற்றுக்கான தீவனம் இல்லாமல் போகும். கடந்த காலத்தில் ஏற்பட்ட 'தித்வா' புயல் மற்றும் ஏனைய அனர்த்தங்கள் காரணமாகப் போதியளவு உணவு இல்லாமல் நூற்றுக்கணக்கான மாடுகள் இறந்தன. அதனால் பால் உற்பத்தி குறைவடைந்தது.

அம்பாறை மாவட்டத்தின் வட்டமடு பிரதேசத்தில் மேய்ச்சல் தரைக்காக 1972ஆம் ஆண்டு 4,000 ஏக்கர் காணி கொடுக்கப்பட்டு இருக்கின்றது. அந்தக் காணியைப் பண்ணையாளர்களுக்குக் கொடுத்து, பால் உற்பத்தியைப் பெருக்க வேண்டும். அதுமட்டுமல்ல, அந்தப் பிரதேசத்தில் பால் உற்பத்திமூலம் நாட்டுக்கு வருமானத்தை ஈட்டக்கூடிய வகையில் கைத்தொழில்களையும் ஊக்குவிக்க வேண்டும். அங்கு பால் தொழிற்சாலை ஒன்றை உருவாக்க வேண்டும். அதன்மூலம் வேலைவாய்ப்புகளை ஏற்படுத்த முடியும். இலங்கையிலேயே கிழக்கு மாகாணத்திலுள்ள எருமை மாடுகளிலிருந்து பெறப்படுகின்ற பாலில்தான் fat content அதிகமாக உள்ளது. எனவே, இந்தப் பிரதேசத்தில் பால் உற்பத்தியை அடிப்படையாகக்கொண்டு தொழிற்சாலைகளை உருவாக்கினால் கூடுதலானவர்களுக்கு வேலைவாய்ப்புகளை வழங்கக்கூடியதாக இருக்கும். அந்தப் பிரதேசத்திலுள்ள மக்கள் பொருளாதார ரீதியாக மிகவும் நலிவடைந்த நிலையில் இருக்கிறார்கள்.

[ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා]

அதுமட்டுமல்ல, அங்குள்ள பண்ணையாளர்களும் பாதிக்கப்பட்டு இருக்கின்றார்கள். ஏனெனில், அவர்களுடைய மாடுகள் திட்டமிடப்பட்ட முறையில் சில நபர்களால் கொலை செய்யப்படுகின்றன. அந்தப் பண்ணையாளர்களைப் பாதுகாக்கவேண்டிய கடமையும் பொறுப்பும் இந்த அரசாங்கத்துக்கு இருக்கின்றது. எனவே, வட்டமடுவிலுள்ள பண்ணையாளர்களைப் பாதுகாக்க வேண்டும். அங்கு வழங்கப்பட்டு இருக்கும் 4,000 ஏக்கர் காணி மேய்ச்சல் தரைக்குப் போதாமல் இருக்கின்றது. எனவே, நீங்கள் இன்னும் 2,000 ஏக்கர் காணியைக் கொடுத்து, அதனை 6,000 ஏக்கராக மாற்றும்போது, இன்னும் கூடுதலான கால்நடைகளை குறிப்பாக, எருமை மாடுகளையும் பசு மாடுகளையும் அங்கு வளர்க்கக் கூடியதாக இருக்கும். அதன்மூலம் அந்தப் பிரதேசம் அதிகளவு பால் உற்பத்தியை நாட்டுக்குப் பெற்றுத் தரும். எனினும், அதனைத் தடுப்பதற்கு சிலர் முயற்சி செய்துகொண்டு இருக்கிறார்கள். அந்த முயற்சியை அரசாங்கம் தடுத்து நிறுத்த வேண்டும். அதனைச் செய்ய வேண்டிய பொறுப்பும் கடமையும் இந்த அரசாங்கத்துக்கு இருக்கின்றதெனக் கூறி, எனது உரைய நிறைவு செய்கின்றேன்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Namal Karunaratne. You have eight minutes for the Reply.

[අ.භා. 1.24]

**ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු කන්දසාමි ප්‍රභු මන්ත්‍රීතුමා අද ඉදිරිපත් කළේ ඉතා වැදගත් යෝජනාවක්. අද කථා කළ මන්ත්‍රීතුමන්ලා කිරි ක්ෂේත්‍රයට අදාළ ගැටලු කිහිපයකුත් මතු කළා. රජය විධියට, අමාත්‍යාංශය විධියට කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම තමයි අපේ ඉලක්කය. අපේ කිරි අවශ්‍යතාවෙන් සියයට 35ක, 40ක ප්‍රමාණයක් තමයි අපි දැනට නිෂ්පාදනය කරන්නේ. 2029 පහු වෙන කොට එය සියයට 75ක් දක්වා ගෙන එන එක තමයි අපේ ඉලක්කය. ඇත්තටම අද වනකොට දවසකට කිරි ලීටර් ලක්ෂ 10කට ආසන්න ප්‍රමාණයක් තමයි අපි නිෂ්පාදනය කරන්නේ. අපේ ඉලක්කය තමයි ඒක ලක්ෂ 30ක් නිෂ්පාදනය කර ගන්න තැන දක්වා ඉදිරියට අරගෙන යන එක. ඒක නිසා අපි සැලසුම් කරලා තිබෙන්නේ මේක කර්මාන්තයක් විධියට ඉදිරියට අරගෙන යන්නයි. ඒ සඳහා තිබෙන එක ව්‍යාපෘතියක් තමයි, Dairy Hub ව්‍යාපෘතිය. රට පුරා තිබෙන පශු වෛද්‍ය කාර්යාල පදනම් කරගෙන Dairy Hubs 300කට වැඩි ප්‍රමාණයක් ස්ථාපිත කරන්න සැලසුම් කරලා තිබෙනවා. මේ වනවිට ඉන් යම් ප්‍රමාණයක් ගොඩනගලා තිබෙනවා. ගොවීන් කාට කිරි දුන්නත් ප්‍රශ්නයක් නැහැ. මොකද ඒ හැම ගොවියෙක්ම මේ Dairy Hub එක ඇතුළට ගන්නවා. ගොවියෝ ටික මේක ඇතුළේ සංවිධානගත කරනවා. ඊට පස්සේ අන්න ඒ සංවිධානවලට අපි උදවු කරනවා. තනි තනි පුද්ගලයාට උදව් කරනවා වෙනුවට Dairy Hub එකට, ඒ ගොවි සංවිධානවලට අපි උදව් කරනවා. අන්න ඒ හරහා කිරි ගොවියා මුහුණ දෙන ගැටලුවලට උත්තර සපයන්න තමයි අපි සැලසුම් කරලා තිබෙන්නේ. තණ කොළ කපන මැෂින් එකක් දෙනවා නම්, ඒක දෙන්නේ සංවිධානයට. හවසට කිරි ගන්නකොට ගොවියාට තිබෙන ප්‍රශ්නයක් තමයි, ඒ කිරි කල් තබා ගන්න ක්‍රමයක් නැති එක. ඒ සඳහා ශීතාගාර අවශ්‍යයි. අන්න ඒ කටයුතුවලට මැදිහත් වෙනවා නම්, සංවිධානයට තමයි අපි මැදිහත් වෙන්නේ. විදුලි බිල අඩු කර ගැනීම සඳහා අපට සූර්ය ශක්තිය පාවිච්චි කර ගැනීමට අදාළ ක්‍රම අනුගමනය කරන්න පුළුවන්. ඒ වාගේම ගොවියෝ එකතු වෙලා යම්කිසි කුඩා තණ බිමක් නිර්මාණය කර ගන්නවා නම්, අන්න ඒ සඳහා උදවු කරන්න පුළුවන්. මෙවැනි ක්‍රියාවලියක් එක්ක අපට ඉන්න හරකුන්ගෙන් වැඩි කිරි ප්‍රමාණයක් ලබා ගැනීමට අදාළ තාක්ෂණික ක්‍රම පිළිබඳව අපි අවධානය යොමු කරලා තිබෙනවා. මේක එක පැත්තක්.

ඊළඟ කාරණය මෙයයි. හරක් ප්‍රමාණය වැඩි කරන්න ඕනෑ. ඒකෙදි හොඳ දියුණු සතුන් නිර්මාණය කර ගන්න ඕනෑකම තිබෙනවා. අන්න ඒ සඳහා අපි නිකවැරටිය ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයිති ගොවිපොළ තෝරාගෙන තිබෙනවා. මේ වනවිට ඒකේ මූලික වැඩ ආරම්භ කරලා තිබෙනවා. ඒ ගොවිපොළ වෙනුවෙන් පමණක් ලක්ෂ 10,000ක මුදලක් මේ වෙනකොට වෙන් කරලා තිබෙනවා, ඉතාම දියුණු සතුන් ලබා ගැනීමට අදාළ අභිජනන මධ්‍යස්ථානයක් විධියට ඒ ගොවිපොළ වැඩි දියුණු කිරීම සඳහා. ඊට අදාළ ප්‍රවේශයකට මේ වනවිට ඇවිල්ලා තිබෙනවා.

අනෙක් පැත්තෙන් ගත්තාම, Dairy Hub ව්‍යාපෘතිය ඇතුළු කිරි ව්‍යාපෘතිය වෙනුවෙන් රුපියල් ලක්ෂ 10,000ක මුදලක් වෙනමත් මේ වසරට අදාළව මුදල් වෙන් කරලා තිබෙනවා. ඔන්න ඔය තත්ත්වයත් එක්ක තාක්ෂණිකව අපේ ගොවියා සවිබලගන්වමින් ගන්න කිරි ප්‍රමාණය වැඩි කරගැනීමට අදාළව සහ ගවයාට ඉතාම හොඳ පහසුකම් ලැබෙන විධියට, ගොවියාගේ මහන්සිය අඩු වෙන විධියට මේ කටයුතු කළමනාකරණය කර ගැනීමට අදාළව තමයි ඇත්තටම අපි කල්පනා කරලා තිබෙන්නේ.

මෙතැනදී සාකච්ඡා වුණා, තණ බිම් පිළිබඳව. ඇත්තටම ප්‍රශ්නයක් තිබෙනවා. හම්බන්තොට, මොනරාගල, අම්පාර, මඩකලපුව, ත්‍රිකුණාමලය, පොළොන්නරුව වාගේ ප්‍රදේශවල ඒක ලොකු ගැටලුවක් විධියට තිබෙනවා. හරක් විශාල ප්‍රමාණයක් ඉන්නවා. ඒ සතුන් ආහාරයට ගන්නා තණකොළ තිබෙන තණ බිම්වල ප්‍රශ්නයක් තිබෙනවා. වනජීවී සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයිති ඉඩම් තමයි කැලෑ විධියට තිබෙන්නේ. මේ ආයතන අතරේ සට්ටනයක් තිබෙනවා. මේවා ක්‍රමානුකූලව නිරාකරණය කර ගන්න ඕනෑ. සතුන්ගේ අයිතියත්, පරිසරයේ සුරක්ෂිතතාවත් ආරක්ෂා වන විධියට, ගව සම්පතත් ආරක්ෂා වන විධියට මේ කටයුතු කළමනාකරණය ගැනීමේ වුවමනාව අපි දකිනවා. ඒ පිළිබඳව අපි පරිසර අමාත්‍යාංශය එක්කත් නිරන්තර සාකච්ඡා පවත්වනවා. ඒ අනුව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවලදී මේවා සාකච්ඡා කරලා, ගැළපෙන විධියේ ආකෘතිවලට ඇවිල්ලා අපට තීන්දු තීරණ ගන්න පුළුවන්කම තිබෙනවා.

මේ රටේ කිරි ක්ෂේත්‍රය ගත්තොත්, පසුගිය කාලයේ විශාල කඩා වැටීමකට ලක් කරලා තිබුණේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උදාහරණයක් ලෙස ගත්තොත්, රාජ්‍ය මැදිහත්වීම යටතේ කිරි ක්ෂේත්‍රයට මැදිහත් වෙච්ච ප්‍රධානම ආයතන තමයි, මිල්කෝ ආයතනය හා හයිලන්ඩ් ආයතනය. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට - NLDB එකට - විතරක් අක්කර 822ක ඉඩම් තිබෙනවා. පසුගිය කාලයේ ඒ සමස්ත සම්පත් ඉන්දියානු අමූල් සමාගමට විකිණීමට අදාළ සියලු සැලසුම් සකස් කරලා තිබුණේ. ඒ අවසාන ගිවිසුම අත්සන් කරන්න විතරයි තිබුණේ. ඊට විරුද්ධව අපට ශ්‍රේෂ්ඨාධිකරණයට යන්න සිද්ධ වුණා, අභියාචනාධිකරණයට යන්න සිද්ධ වුණා, උද්ඝෝෂණ, පෙළපාළි යන්න සිද්ධ වුණා. අපි ඒවාට නායකත්වය

දුන්නා. එහෙම කරලා තමයි, එදා අපට ඒවා බේරා ගන්න පුළුවන් වුණේ. ඒ විධියට විකිණීමට සැලසුම් කරලා තිබුණු නිසාම ඒ ආයතන වැඩි දියුණු කළේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අන්න ඒ ආයතනවලින් එකක් තමයි නිකවැරටිය ගොවිපළ. ඒ ගොවිපළේම මේ කිරි කර්මාන්තය ඉස්සරහට ගෙන යෑම සඳහා රුපියල් ලක්ෂ 10,000ක් වෙන් කරලා, දියුණු වැස්සි පැටියෙක් අපේ ගොවි ජනතාවට ලබා ගැනීමට අදාළ ක්‍රමවලට අපි ඇවිල්ලා තිබෙනවා.

අනෙක් පැත්තෙන් ගත්තාම, කිරි නිෂ්පාදනය වැඩි කරගෙන තිබෙනවා. මිල්කෝ ආයතනය ගත්තොත්, අපි භාර ගන්න කොට රුපියල් ලක්ෂ 35,000ක් මිල්කෝ ආයතනයේ ණය ගෙවන්න තිබුණා. ගොවීන්ට විතරක් රුපියල් ලක්ෂ 17,000ක් ගෙවන්න තිබුණා. ඇමතිවරු දෙදෙනෙක් සිටියදී මගේම මූලිකත්වයෙන් එදා ගොවි ජනතාවත් එක්ක ගිහිල්ලා ඒ අමාත්‍යාංශ වටලන්න සිද්ධ වුණා, ඒ සල්ලි ගන්න. ඒ සත පහක් ගන්න බැරි වුණා; ගොවියාට සල්ලි දුන්නේ නැහැ. ගොවියා ආණ්ඩුවට කිරි විකුණුවා; ආණ්ඩුව ගොවියාට පොලු තිබ්බා.

මේක තමයි ඉතිහාසයේ තිබුණු ඇත්ත තත්ත්වය. හැබැයි, අපි මේක භාරගෙන මාස කිහිපයක් යනකොට ඒ සියලු මුදල් ගෙවා අවසන් කළා; ණය ලක්ෂ 35,000ම බේරුවා. ණය බේරුවා විතරක් නොවෙයි, පාඩු ලබමින් ණය කරලා තිබුණු මේ මිල්කෝ ආයතනය ගොඩක් ඉස්සරහට ගෙනාවා. පසුගිය දෙසැම්බර් 31වෙනි දා වෙනකොට මිල්කෝ ආයතනයේ වැඩ කරන සේවකයන්ගේ ප්‍රමාණය 1,228ක් වනවා. ඒ සුදුසුකම් ලත් සියලු සේවකයන්ට රුපියල් 75,000 ගාණේ බෝනස් දුන්නා. ඊළඟට ගොවීන් කැඳෙව්වා. අගමැතිතුමියගේ මූලිකත්වයෙන් ගොවීන්ට රුපියල් කෝටි 18ක් බෝනස් දුන්නා; ලාභාංශ බෙදුවා. මේ අවුරුද්දේත් අපි එහෙම දෙන්න බලාපොරොත්තු වෙනවා. ඉතින් මේ තත්ත්වයත් එක්ක අද මිල්කෝ ආයතනය එතැනට ගෙනැල්ලා තිබෙනවා.

ඒ වාගේම ලබන අවුරුද්ද ඇතුළත මිල්කෝ ආයතනය යටතේ බඩල්ගම කිරි ෆැක්ටරිය විවෘත කරන්න අපට පුළුවන් වෙයි කියා අපි විශ්වාස කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ කිරි ෆැක්ටරිය විවෘත කළාට පස්සේ, ඒ ෆැක්ටරි එකේ වැඩ කරන්න එක දවසකට විතරක් කිරි ලීටර් ලක්ෂ දෙකක් ඕනෑ වෙනවා. එහෙම නම් කිරි ලීටර් ලක්ෂ දෙකක් නිෂ්පාදනය කිරීමේ කටයුත්ත අපේ කිරි ගොවීන්ට පැවරෙනවා. ඇත්තටම අපේ කන්දසාමි ප්‍රභූ මන්ත්‍රීතුමාගේ යෝජනාවට අදාළව ගත්තොත්, ඒ තුළින් අපේ රටින් කිරි ක්ෂේත්‍රයට අදාළව පිටට යන ඩොලර් ප්‍රමාණයෙන් සැලකිය යුතු පංගුවක් අඩු කර ගන්න අපට පුළුවන් වෙනවා. බඩල්ගම කිරි ෆැක්ටරිය විවෘත කළාට පස්සේ කිරිවලට අගයක් එකතු කරලා විවිධ නිෂ්පාදන සඳහා අපි අනිවාර්යයෙන්ම ප්‍රවේශයක් ගන්නවා.

එහෙම නම් මෙන්න මේ කරුණු සඳහන් කරමින් මම කථාව අවසන් කරන්නම්. අපේ කන්දසාමි ප්‍රභූ මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනාව ඉතාම වැදගත්. විශේෂයෙන් තණ බිම් ප්‍රශ්නය තමයි එතුමාගේ පැත්තෙන් ගොඩක්ම මතු වුණේ. විශේෂයෙන්ම ඒ පිළිබඳව අපේ අවධානය යොමු කරනවාය කියන කාරණය මතක් කරනවා. අපේ රට කිරියෙන් ස්වයංපෝෂිත කිරීම සඳහා ඊට අදාළ සැලැස්මක් සහිතව අපි වැඩකටයුතු කරගෙන යනවා. අන්න ඒ කටයුතුවලට තමුන්නාන්සේලා සියලුදෙනාගේම සහයෝගය ලබා දෙන්න කියන කාරණයත් මතක් කරමින්, මේ යෝජනාව පිළිබඳව අපේ විශේෂ අවධානය යොමු කරන බවත් ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Kanthasamy Prabu. You have four minutes to make the Mover's wind-up speech.

[பி.ப. 1.33]

**ගරු කන්දසාමි ප්‍රභූ මහතා**
(மாண்புமிகு கந்தசாமி பிரபு)
(The Hon. Kanthasamy Prabu)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நன்றி! இந்தப் பிரேரணைக்கு ஆதரவு வழங்கி எனக்கு ஒத்துழைப்பு வழங்கிய கௌரவ பிரதி அமைச்சர் நாமல் கருணாரத்ன அவர்கள், பாராளுமன்ற உறுப்பினர்களான கௌரவ கிட்ணன் செல்வராஜ், கௌரவ ஞானமுத்து ஸ்ரீநேசன், கௌரவ (வைத்தியர்) செல்லத்தம்பி திலகநாதன் மற்றும் கவீந்திரன் கோடீஸ்வரன் ஆகியோருக்கு இந்நேரத்தில் நான் நன்றி தெரிவித்துக் கொள்கின்றேன்.

தேசிய மக்கள் சக்தி அரசாங்கத்தின் கொள்கைப் பிரகடனத்திலே, பால் உற்பத்தி அதிகரிப்பு மற்றும் பால் உற்பத்தியில் தன்னிறைவை அடைவது தொடர்பான விடயங்கள் உள்வாங்கப்பட்டிருந்தன. அந்த அடிப்படையிலே, மயிலத்தமடு - மாதவனை மேய்ச்சல் தரை தொடர்பான விடயம் இப்போது பேசப்பட்டிருந்தது. மாண்புமிகு அநுர குமார திஸாநாயக்க அவர்களின் தலைமையிலே இடம்பெற்ற மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டத்திலே, நாங்கள் இந்த மேய்ச்சல் தரையை விடுவிக்க வேண்டும் என்பது தொடர்பாகக் கேட்டுக்கொண்டதற்கு இணங்க, அந்தப் பகுதியிலிருந்து 3,000 ஏக்கர் காணிகளை விடுவிப்புச் செய்வது தொடர்பான உயர்மட்ட நடவடிக்கையை மேற்கொள்வதற்கான அனுமதியை வழங்கியிருக்கின்றார். அந்த 3,000 ஏக்கர் காணியிலே பகுதியளவையேனும் வெகுவிரைவாக வழங்க முடியும் என நான் நினைக்கின்றேன். மீதிக் காணிகளையும் குறிப்பிட்ட காலப்பகுதிக்குள் வழங்கத் தயாராக இருக்கின்றோம் எனக் கூறிக் கொள்கின்றேன்.

அதுமாத்திரமன்றி, இன்னும் சில முன்மொழிவுகளை நான் தயாரித்திருக்கின்றேன். அவற்றின் மூலம் பெண்கள் தலைமைதாங்கும் குடும்பங்களுக்கும் அதேபோன்று இளம் தொழில்முயற்சியாளர்களுக்கும் பால் உற்பத்திப் பண்ணைகளை அமைப்பதற்கான சந்தர்ப்பத்தை உருவாக்கும் நடவடிக்கைகளை அரசு மேற்கொள்ள வேண்டும் என்றும், பால் உற்பத்திப் பண்ணையாளர்களுக்குச் சுகாதாரக் காப்புறுதிகளை வழங்க வேண்டும் என்றும் நான் எதிர்பார்ப்பதுடன், கால்நடைகளுக்கான தொற்று நோய்களைத் தடுப்பதற்கான புதிய வேலைத்திட்டங்களையும் உருவாக்க வேண்டும் என்றும் நான் அரசிடம் கேட்டுக்கொள்வதுடன், இந்தப் பிரேரணைக்கு ஆதரவு வழங்கித் தம் கருத்துகளை முன்வைத்த பலருக்கும் மீண்டும் எனது நன்றியைக் கூறி, அரசால் மேற்கொள்ளப்படுகின்ற அனைத்துத் திட்டங்களுக்கும் அனைத்துப் பாராளுமன்ற உறுப்பினர்களும் ஆதரவு வழங்க வேண்டும் எனவும் கேட்டுக்கொண்டு, இந்தப் பிரேரணையைச் சபையில் முன்வைக்கின்றேன்.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Private Members' Motion No. 2 - P. 94/2025 - to be moved by the Hon. Hector Appuhamy. You have four minutes.

## කඩොලාන පරිසර පද්ධතිය ආරක්ෂා කර ගැනීමට වැඩසටහනක් සකස් කිරීම
## கண்டல் தாவர சூழல்தொகுதியைப் பாதுகாப்பதற்கான வேலைத்திட்டமொன்றைத் தயாரித்தல்
## DEVELOPING A PROGRAMME TO PROTECT THE MANGROVE ECOSYSTEM

[අ.භා. 1.35]

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පරිසර සමතුලිතතාවයට හා ධීවර කර්මාන්තයට අතිශය වැදගත් වන කඩොලාන පරිසර පද්ධතිය ආරක්ෂා කර ගැනීම සඳහා වැඩසටහනක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි. "

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කඩොලාන ශාකය අපේ ශ්‍රී ලංකාවට ඉතාම වැදගත් ශාකයක්. මේවා mangroves කියලා නම් කෙරෙනවා. විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ පාරිසරික සහ ආර්ථික ඒ වාගේම කාලගුණික සුරක්ෂිතතාව ආරක්ෂා කර ගන්න ඉතාම වැදගත් සාධකයක්. ඒ වාගේම එල් නිනෝ තත්ත්වයත් එක්ක අද රටේ බරපතළ විධියට වියළි කාලගුණයක් එන්න පුළුවන්. එහෙම නැත්නම් වර්ෂාපතනය වැඩි වෙන කාලගුණයක් ඇති වෙන්න පුළුවන් බව අපි දන්නවා. විශේෂයෙන්ම පරිසරය සම්බන්ධව බරපතළ ප්‍රශ්න ටිකක් ඉදිරි කාලයේ එනවා කියලා තිබෙනවා. අපි දන්නවා, මේ ශාකය විශේෂයෙන්ම ස්වාභාවික ආරක්ෂක පවුරක් හැටියට තිබෙන ශාකයක් බව.

ඒ කියන්නේ natural buffer එකක් හැටියට ක්‍රියා කරන ශාකයක්. එම ශාකයේ මුල පද්ධතිය සහ අතු විහිදිලා තිබෙන ආකාරය නිසා සෝදාපාළුවෙන් පස ආරක්ෂා වීම සම්බන්ධයෙන් විශේෂත්වයක් දක්වනවා. ඒ තුළින් භූමිය ආරක්ෂා වෙනවා. ඒ වාගේම තවත් විශේෂ කාරණාවක් තිබෙනවා. විශේෂයෙන් මේ ශාකවල වෙනත් ශාකවලට වඩා කාලගුණික විපර්යාසවලදී කාබන් අත්පතනය සිදු වෙනවා. මේ ශාක blue carbon ගබඩාවක් හැටියට ක්‍රියා කරනවා. සාමාන්‍ය රක්ෂිතයක, එහෙම නැත්නම් කැලයක තිබෙන ගස් කොළන්වලට වඩා, ගොඩබිම තිබෙන වනාන්තරවල තිබෙන ගස් කොළන්වලට වඩා හතර පස්ගුණයක කාබන් ප්‍රමාණයක් උරාගෙන, පසේ තැන්පත් කරනවා. ඒ නිසා අද මේ රට, ලෝකය මුහුණ දෙන පාරිසරික විපර්යාස, දේශගුණික විපර්යාස පාලනය කිරීමට මේ කඩොලාන පරිසර පද්ධතිය ආරක්ෂා කර ගැනීම ඉතාම වැදගත් වෙනවා, කාබන් උරාගෙන ගබඩා කිරීමත්, ඒ වාගේම පවුරක් - buffer එකක් - විධියට ක්‍රියා කරමින් සෝදාපාළුව පාලනයට ක්‍රියා කිරීමත් නිසා.

වෙරළබඩ තීරයේ කඩොලාන ශාක පද්ධතිය ගත්තොත්, බොහෝ වෙලාවට ඒ ආශ්‍රිතව තමයි මුහුදු ජීවීන් බෝ වීම සිද්ධ වෙන්නේ. ඒ නිසා මේ ශාකය මත්ස්‍යයන් බෝ කිරීමටත් ඉතාම වැදගත් වන ශාකයක්. ඒ වාගේම සමහර අවස්ථාවලදී වතුර පෙරනයක් - water filter එකක් - විධියටත් ක්‍රියා කරනවා. ඒ නිසා සමස්තයක් හැටියට ගත්තාම මේ රටේ තිබෙන ඉතාම වැදගත් ශාකවලින් ප්‍රධාන එකක් හැටියට මේ ශාකය හඳුන්වන්න පුළුවන්. හැබැයි මේ සම්බන්ධව තිබෙන බොහෝ තොරතුරු අරගෙන බැලුවාම අපේ දිස්ත්‍රික්කයේත් - පුත්තලම දිස්ත්‍රික්කයේ - මේ ශාකය සම්පූර්ණයෙන්ම ගලවා දමලා, ඒ ඉඩම් අත්පත් කර ගන්නා ජාවාරම්කරුවන් සිටින බව අනාවරණ වෙනවා. සමහර වෙලාවට ඒ ජාවාරම්කරුවන්ට උදව් කරන බොහෝදෙනෙකුත් ඉන්න බව පෙනෙනවා. මේ ශාකය ගලවන්න නීතියෙන් තහනම් නිසා හොරෙන් ගලවා දමා, එහෙම ශාක පද්ධතියක් තිබුණේ නැති විධියට අත්පත් කර ගත්ත ස්ථානත් තිබෙනවා. ඒ නිසා දැන් මේ ශාකය වැඩිපුර වගා කරන්න ඕනෑ. අපේ ප්‍රදේශයේම මේ විෂයයට සම්බන්ධ අමාත්‍යතුමෙක් ඉන්නවා. ඒ නිසා විධිමත් වැඩ පිළිවෙළක් සකස් කරලා, මේ කඩොලාන ශාක පද්ධතිය ආරක්ෂා කරගෙන, පාරිසරික සහ දේශගුණ විපර්යාසවලට මුහුණ දීම සඳහා ශක්තිමත් අත්තිවාරමක් දමයි කියලා විශ්වාස කරමින් තමයි අද මේ යෝජනාව මා ඉදිරිපත් කළේ.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Amirthanathan Adaikkalanathan. You have four minutes to second that Private Members' Motion moved by the Hon. Hector Appuhamy.

[பி.ப. 1.40]

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)

நன்றி, கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே!

இன்றைய தினம் கௌரவ ஹெக்டர் அப்புஹாமி அவர்கள் கொண்டுவந்த, 'கண்டல் தாவர சூழல்தொகுதியைப் பாதுகாப்பதற்கான வேலைத்திட்டமொன்றைத் தயாரித்தல்' சம்பந்தமான பிரேரணையை நான் வழிமொழிகின்றேன். மன்னார் மாவட்டத்திலே கண்டல் தாவரங்கள் கூடுதலாகக் காணப்படுகின்றன. குறிப்பாக, என்னுடைய பிறந்த இடமான விடத்தல்தீவிலே இந்தக் கண்டல் தாவரங்கள் அதிகமாகக் காணப்படுகின்றன. மன்னார் மாவட்டத்திலே காணப்படுகின்ற இந்தத் தாவரங்கள் கூடுதலாக எங்களுடைய மீனவர்களுக்கு வளம் சேர்க்கின்ற வகையிலே மிகவும் ஓர் உத்வேகத்தைக் கொடுப்பதை நாங்கள் சொல்லியாக வேண்டும். கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, விடத்தல்தீவிலே அட்டைப் பண்ணை செய்வதற்காகப் பல ஏக்கர்களை ஒதுக்கியிருக்கின்ற காரணத்தினால், இந்தக் கண்டல் தாவரங்கள் அழிக்கப்படுகின்ற ஒரு சூழலை நாங்கள் காணக்கூடியதாக இருக்கிறது. ஆகவே, கௌரவ அமைச்சர் அவர்கள் இதிலே கவனமெடுக்க வேண்டும்.

அதேபோல, மன்னார் நகரப்புறங்களில் தனியார் கடற்கரை வரை சென்று அந்தக் காணிகளில் உள்ள இந்தக் கண்டல் தாவரங்களை அழிக்கின்ற செயற்பாடுகளைச் செய்கிறார்கள். ஒருபுறம் எங்களுடைய மீனவர்கள் இந்தக் கண்டல் தாவரங்களை உற்பத்தி செய்கின்ற விடயங்களைச் செய்தாலுங்கூட, மறுபுறத்தில் மன்னார் மாவட்டத்திலே இந்தக் கண்டல் தாவரங்கள் கூடுதலாக அழிக்கப்படுவதை நீங்கள் கவனத்திற்கொள்ள வேண்டும் என்பது எங்களுடைய கருத்து. அங்குள்ள விடத்தல்தீவைப் பொறுத்தமட்டில் நான்

முன்னர் குறிப்பிட்டதுபோன்று அது விசேடமாக கண்டல் தாவரங்கள் வளர்கின்ற ஒரு பிரதேசமாக இருக்கின்றது. இயற்கையாக அந்த வளம் எங்களுக்கு அமைந்திருக்கின்றது. அந்த வகையில், அங்கே மீன் உற்பத்தி கூடுதலாக இருக்கின்றது. ஆனால், அங்கு கிட்டத்தட்ட 75 ஏக்கர் அளவிலான இடத்தில் அட்டைப் பண்ணை அமைப்பதற்கான ஒரு முயற்சி டக்ளஸ் தேவானந்தா அவர்கள் கடற்றொழில் அமைச்சராகப் பதவி வகித்த காலத்திலே செய்யப்பட்டு, பின்னர் அதற்கெதிராக எங்களுடைய மக்கள் போராடியதனால் அது நிறுத்தப் பட்டிருக்கின்றது என நான் நினைக்கின்றேன். அந்தத் திட்டத்தை நீங்கள் நடைமுறைப்படுத்தக் கூடாது என்பது என்னுடைய கருத்தாக இருக்கிறது.

இந்தக் கண்டல் தாவரப் பகுதிகள் மீன்கள் உற்பத்தி செய்யப்படுகின்ற இடமாகும். இன்றைக்கு வடக்கை நோக்கி - மன்னாரை நோக்கி - இந்திய ரோலர் படகுகள் வருவதனால் இந்த உற்பத்திகள் அழிக்கப்படுகின்ற நிலை காணப்படு கின்றது. ஆகவே, நீங்கள் மன்னார் மாவட்டத்திலுள்ள இந்தக் கண்டல் தாவரங்கள் சம்பந்தமான விடயங்களில் கூடுதலாகக் கவனமெடுத்து, அதன் அழிவுகளை நிறுத்த வேண்டும். கூடுதலாகத் தனியார் இந்த விடயத்தில் மிக மோசமாகச் செயற்படுகிறார்கள். அந்தக் காணிகளின் உரிமையாளர்கள் தாமே என்று சொல்லிக்கொண்டு, அவற்றை அபகரித்து கடற்கரைப் பிரதேசத்தில் உள்ள கண்டல் தாவரங்களை அழிக்கின்ற நிலை காணப்படுகின்றது. இந்த விடயம் தொடர்பாக நீங்கள் கவனத்தில் எடுக்கவேண்டும். உண்மையிலேயே நான் இந்தப் பிரேரணையைக் கொண்டு வந்த கௌரவ பாராளுமன்ற உறுப்பினருக்கு நன்றி சொல்லுகின்றேன். இது யாருமே முன்கொண்டுவராத ஒரு விடயமாக இருக்கின்றபடியால், இது தொடர்பாக அரசாங்கம் கவனத்தில் எடுக்கவேண்டுமென்று மீண்டும் கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இந்த விவாதத்திற்கு அப்பால், ஒரு விடயத்தைக் குறிப்பிடலாம் என்று நினைக்கின்றேன். ஏனென்றால், பேசுவதற்குச் சந்தர்ப்பம் கிடைப்பது குறைவு. அதாவது, எங்களுடைய மன்னார் மாவட்டத்தை எடுத்துக்கொண்டால், அங்கு இரவில் மின்சார விநியோகம் படுமோசமான நிலையில் உள்ளது. இரவில் அடிக்கடி electricity தடைப்படுகின்ற நிலை காணப்படுகின்றது. எனக்குத் தெரிந்த காலந்தொட்டு இந்த நிலை தொடர்கின்றது. இதற்கு ஏன் இன்னும் தீர்வு காணப்படவில்லை? எங்களுடைய மாணவர்களுக்கு A/L Exam நடைபெறவிருக்கிறது. அங்குள்ளவர்களை யாரும் மனிதர்களாகக்கூட பார்ப்பதில்லையோ தெரியவில்லை. ஆனால், இந்தக் காற்றாலைகளை எதிர்ப்புகளுக்கு மத்தியிலும் கொண்டுவந்து அங்கே நிறுவி வருகின்றனர். அங்கு இருக்கின்ற எல்லோரும் வசதியானவர்கள் அல்லர். மின்சாரம் அடிக்கடி தடைப்பட்டு வருவதால், அவர்கள் பயன்படுத்துகின்ற தொலைக்காட்சிகள், fridges, குளிரூட்டிகள் உட்பட electronic சாமான்கள் எல்லாம் அடிபட்டுப் போகின்றன. இதில் மின்சார சபை மெத்தனப் போக்கைக் கையாள்கிறது என்பதே என்னுடைய கருத்தாக இருக்கிறது. ஆகவே, மன்னார் மாவட்டத்தையும் மனிதர்கள் வாழுகின்ற இடமாக மதித்து, மின்சார சபை இந்த விடயத்தைக் கவனத்தில் எடுக்க வேண்டுமென்று இந்தச் சந்தர்ப்பத்திலே கேட்டு, வாய்ப்பளித்தமைக்கு நன்றி கூறி அமர்கின்றேன்.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. (Mrs.) Hiruni Wijesinghe. The Floor is yours and you have three minutes to speak on this Private Members' Motion.

[අ.භා. 1.44]

**ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) ஹிருனி விஜேசிங்ஹ)
(The Hon. (Mrs.) Hiruni Wijesinghe, Attorney-at-Law)

අද ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා ඉතා වැදගත් පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. කඩොලාන පරිසර පද්ධතිය ආරක්ෂා කිරීමට වැඩසටහනක් සකස් කිරීම තමයි එතුමා මේ මඟින් යෝජනා කරලා තිබෙන්නේ. ඇත්තටම පරිසරයට ආදරය කරන ප්‍රජාවක් හැටියට මේක අපට ඉතා වටිනා යෝජනාවක්. අපි දන්නවා, කඩොලාන පරිසර පද්ධතියක් කියන්නේ ඉතා වේගවත්ව ප්‍රභාසංස්ලේෂණ ක්‍රියාවලියට දායක වන පරිසර පද්ධතියක් බව. මොකද, සාමාන්‍ය වැසි වනාන්තරවලට වඩා වේගයෙන් කාබන් අවශෝෂණය කර ගැනීමේ හැකියාව කඩොලාන පරිසර පද්ධතියකට තිබෙනවා. කඩොලාන ශාකයේ මුල් ඔස්සේ පසටද කාබන් අවශෝෂණය කර ගැනීමේ හැකියාවක් තිබෙන නිසා මෙම කඩොලාන ශාක පද්ධතිය "නිල් කාබන් පරිසර පද්ධතියක්" - blue carbon ecosystem එකක් - හැටියටත් හඳුන්වනු ලබනවා. මොකද, එම ශාකයට හැකියාව තිබෙනවා, ජීවිත කාලය පුරාම, ඒ කියන්නේ වසර 100කට වැඩි කාලයක් කාබන් අවශෝෂණය කරලා තබාගන්න. හැබැයි, අපි යම් කිසි අවස්ථාවක එම ශාක කපා දැමුවොත් මොකද වෙන්නේ? ඒ ශාක අවශෝෂණය කරගෙන තිබුණු සම්පූර්ණ කාබන් ප්‍රමාණය නැවත වායුගෝලයට මුදා හැරෙනවා.

මම මේ අවස්ථාවේදී කියන්න කැමැතියි, 1977 ඉඳලා 2018 දක්වා තමයි ලංකාවේ කඩොලාන පරිසර පද්ධතියට ඇති වුණු විශාලම තර්ජනය සිද්ධ වෙලා තිබෙන්නේ කියන එක. එම කාල සීමාව තුළ ඉස්සන් වගාව සඳහා, ඒ වාගේම ලුණු කර්මාන්තය සඳහා කඩොලාන පරිසර පද්ධතිය විශාල වශයෙන් විනාශ කරලා එම ආර්ථික කටයුතුවලට දායක කර ගැනීම නීති විරෝධී ආකාරයට බහුල වශයෙන් සිද්ධ වෙලා තිබෙනවා. විශේෂයෙන්ම 1992 ඉඳලා 2012 අතර කාලය බලද්දී ඉස්සන් කොටු, නීති විරෝධී ඉඩම් ගොඩ කිරීම් සහ ලුණු ලේවා ආශ්‍රිත කටයුතු නිසා පුත්තලම් දිස්ත්‍රික්කයේ කඩොලාන සංයුතිය සියයට 34ක් විනාශ කරලා, ඒ කඩොලාන පද්ධතිය අඩු කිරීමට කටයුතු කරලා තිබෙනවා. මෙහිදී විශේෂත්වය වන්නේ, 1992 ඉඳලා 2012 දක්වා කාල සීමාව තුළ එම දිස්ත්‍රික්කයේ තිබුණු ඉස්සන් කොටු ප්‍රමාණය සියයට 2,777කින් ඉහළ ගිහිල්ලා තිබීමයි. ඒ වාගේම ලුණු ලේවා ප්‍රමාණය සියයට 60කින් ඉහළ ගිහිල්ලා තිබෙනවා. ඒත් එක්කම කඩොලාන පරිසර පද්ධතියේ ප්‍රමාණය සියයට 40කින් පහළ ගිහිල්ලා තිබෙනවා. මෙවැනි තත්ත්වයක තමයි ඒ කඩොලාන පරිසර පද්ධතිය තිබුණේ. අපට මතකයි, ආනවිලුන්දාව, රැම්සා තෙත් බිම් ආශ්‍රිතව ඇති කඩොලාන පරිසර පද්ධතිය විනාශ කරලා අක්කර 136කට ආසන්න ප්‍රමාණයක් ඉස්සන් කොටු වෙනුවෙන් බලහත්කාරයෙන් රඳවාගෙන තිබුණු බව. අපේ ආණ්ඩුව ආ පසු, විශේෂයෙන්ම අජිත් ගිහාන් මන්ත්‍රීතුමා මැදිහත් වෙලා ඒ පරිසර පද්ධතියේ ඉස්සන් කොටුවලට අවශ්‍ය කොටස් ටික මහජනතාවට ලබා දීලා විනාශ කළ ඉතිරි ස්ථානවල නැවත කඩොලාන ස්ථාපිත කිරීමට කටයුතු කරලා තිබෙනවා. එවැනි ව්‍යාපෘති රාශියක් මේ වෙද්දි ක්‍රියාත්මක වනවා.

[ගරු නිතිඥ හිරුනි විජේසිංහ මහතා]

මම කලින් කිව්වා වාගේ, කඩොලාන පරිසරය විනාශ කරලා අත්පත් කරගෙන තිබුණු පරිසර පද්ධතිවලින්, ඒ කියන්නේ සියයට 2,777ක ප්‍රමාණයකින් වැඩි වුණු ඉස්සන් කොටුවලින් සියයට 70ක් පමණ මේ වන විට අත හැර දමා තිබෙනවා. ඉතින් අපි ආණ්ඩුවක් හැටියට කියන්න කැමැතියි, අමාත්‍යාංශය මැදිහත් වෙලා ආර්ථික කටයුතු වෙනුවෙන් අවශ්‍ය ප්‍රමාණය මහජනතාව වෙනුවෙන් නිදහස් කරලා, ඉස්සන් වගා කටයුතුවලට යොදා ගැනීමට හැකියාව නැති භූමි ප්‍රදේශවල නිසි ක්‍රමයකට සහ සැලසුම් සහගතව නැවත කඩොලාන වගා කිරීම අපි ආරම්භ කරලා තිබෙන බව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජූලි 26වැනි දාට තමයි ජාත්‍යන්තර කඩොලාන දිනය යෙදිලා තිබුණේ. ඒ අවස්ථාවේ අපි 2026 වර්ෂයට අදාළව විශේෂයෙන්ම පුත්තලම දිස්ත්‍රික්කයේ නිල්ලිඅඩිය, සම්මට්ටවාඩිය, කුඩාව, කන්දකුලිය වාගේ ප්‍රදේශවල කඩොලාන රක්ෂිත නම් කරලා තිබෙනවා. ඒ වාගේම අපි 2025දීත් මැරවල, වවුල්කැලේ, මරම්බැට්ටිය මූකලාන වාගේ ප්‍රදේශ ආශ්‍රිතව කඩොලාන රක්ෂිත රාශියක් ප්‍රකාශයට පත් කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අවසන් වශයෙන් කියන්න කැමැතියි, මේ කඩොලාන ආරක්ෂා කර ගැනීම සඳහා අපේ ආණ්ඩුවට ප්‍රතිපත්තියක් තිබෙන බව. ඉතින් ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමාගේ යෝජනාවත් එකතු කරගෙන ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් සහයෝගයෙන් යුතුව මේ කඩොලාන පරිසරය ආරක්ෂා කිරීම සඳහා කටයුතු කරන්න ඕනෑ. ඒ අනුව අපි මේ කඩොලාන පරිසර පද්ධතිය 2027 ඉඳලා 2029 දක්වා කාලය තුළ අවුරුද්දකට හෙක්ටයාර 20කින් ඉහළ දැමීමට කටයුතු කරගෙන යනවා. ඒ වාගේම ජාතික වෙරළ කලාප ආශ්‍රිතව ක්‍රියාත්මක වන වෙරළ සංරක්ෂිත කළමනාකරණ සැලැස්ම යටතේ විශේෂයෙන්ම කඩොලාන සහ කඩොලාන රක්ෂිත ආරක්ෂා කිරීම සඳහා මූලිකත්වය ගෙන කටයුතු කරන්න කියලා උපදෙස් ලැබී තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසන් වශයෙන් ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාවටම ඌන පූරණයක් එක් කරමින් මා ඉල්ලා සිටින්න කැමැතියි, කාබන් ගබඩා කිරීම ජාතික දේශගුණික ප්‍රතිපත්තිවලට ඇතුළත් කිරීම සඳහා වූ අවස්ථාවක් අපේ පරිසර අමාත්‍යාංශය මැදිහත් වෙලා ලබා දෙන ලෙස.

මෙම වැදගත් යෝජනාව ඉදිරිපත් කිරීම වෙනුවෙන් හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Kaveenthiran Kodeeswaran. You have three minutes to speak on the Motion.

[பி.ப. 1.50]

**ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveenthiran Kodeeswaran)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, கண்டல் தாவரங்கள் அழிக்கப்படுவதனால் கடற்றொழிலுக்கு ஏற்படு கின்ற பாதிப்பு, அதனால் ஏற்படுகின்ற சுற்றுச்சூழல் சமநிலை பாதிப்பு மற்றும் காலநிலை மாற்றம் போன்றவற்றால் பாரியதோர் ஆபத்து ஏற்படக்கூடிய ஒரு சூழ்நிலை இருக்கின்ற இந்தச் சந்தர்ப்பத்திலே, உண்மையில் இன்று கௌரவ ஹெக்டர் அப்புஹாமி அவர்களால் கொண்டு வரப்பட்டிருக் கின்ற இந்தத் தனியார் உறுப்பினர் பிரேரணை சிறந்ததொரு பிரேரணையாகக் காணப்படுகின்றது. இந்தக் கண்டல் தாவரங்கள் விசேடமாக அம்பாறை மாவட்டத்தின் கரையோரப் பிரதேசங்களில், அதிலும் திருக்கோவில் பிரதேசத்தின் கரையோரங்களில் அதிகளவாகக் காணப் படுகின்றன. ஆனால், இன்று அந்தப் பிரதேசங்களிலே மேற்கொள்ளப்பட்டு வருகின்ற கனிய மணல் அகழ்வதற்கான முயற்சிகளால் அங்குள்ள கண்டல் தாவரங்கள் அழிவடைந்து செல்லுகின்ற ஒரு சூழ்நிலை ஏற்படும். அப்படி அந்தக் கண்டல் தாவரங்கள் அழிவடைந்து செல்வதால், சூழல் சமநிலை என்பது பாதிப்படையக்கூடியதாகக் காணப்படுகின்றது.

அதுமாத்திரமன்றி, கனிய மணல் அகழ்வினாலே மீனினங்கள், corals, அங்கிருக்கின்ற மண் திட்டுகள், மண் மேடுகள், sand dunes முதலியன அழிவடையக்கூடிய நிலை உருவாவதோடு, இப்படியான பலதரப்பட்ட பாதிப்புக்கள் அந்தப் பிரதேசத்திலே ஏற்படக்கூடிய ஒரு சூழ்நிலையும் காணப்படுகின்றது. அந்த நேரத்திலே சுற்றுச்சூழல் என்பது பாதிப்புக்குள்ளாகி, சமநிலையற்ற ஒரு சூழ்நிலை ஏற்படும். இதனாலே ஆயிரக்கணக்கான மீனவர்கள் தங்களது தொழில்களை இழக்கக்கூடிய ஒரு துர்ப்பாக்கிய நிலைக்குள் தள்ளப்படக்கூடிய ஒரு சந்தர்ப்பம் ஏற்படும்.

அதுபோல், கனிய மணல் அகழ்வினாலே திருக்கோவில் பிரதேசத்திலே இருக்கின்ற எமது சமூகம் பாரிய விளைவை எதிர்கொள்கிறது. விசேடமாக, கிழக்கு மாகாணத்திலே இருக்கின்ற பல பிரதேசங்களிலே கனிய மண் அகழ்வதற்கான அனுமதி வழங்கப்பட்டிருப்பதாக நாங்கள் அறியக்கூடியதாக இருக்கிறது. சுற்றுச் சூழலுக்குப் பொறுப்பான அமைச்சர் என்கின்ற அடிப்படையிலே தாங்கள் இதனைத் தடுக்க வேண்டும். ஏனென்றால், இந்தக் கண்டல் தாவரங்களை அல்லது நூற்றுக்கணக்கான வருடங்கள் பழமைவாய்ந்த தாவரங்களை அழிக்கின்ற காரணத்தினால், அந்தப் பிரதேசங்கள் இன்னும் ஒரு 10 வருடங்களின் பின்பு வனாந்தரமாக மாறக்கூடிய ஒரு சூழ்நிலை ஏற்படும். அதனால் மக்களின் தொழில் வாய்ப்புகள் இழக்கப்படும்; மக்களுக்குப் பாரிய விளைவை, பாதிப்பை ஏற்படுத்தக்கூடிய ஒரு சூழ்நிலை ஏற்படும். எனவே, கௌரவ அமைச்சர் அவர்கள் இதனைக் கருத்திற்கொண்டு, மேற்குறிப்பிட்ட பிரதேசங்களில் இருந்து கனிய மணல் அகழ்வதற்கான அனுமதியை இரத்துச் செய்ய வேண்டும் எனவும், அவ்வாறு இரத்துச் செய்வதன்மூலம் அங்குள்ள மக்களின் பாதுகாப்பை உறுதிப்படுத்த வேண்டும் என்றும் கோரி, விடை பெறுகின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Gayan Janaka. You have three minutes to speak on the Private Members' Motion.

[අ.භා. 1.53]

**ගරු ගයාන් ජනක මහතා**
(மாண்புமிகு கயான் ஜனக)
(The Hon. Gayan Janaka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා විසින් කඩොලාන පරිසර පද්ධතිය ආරක්ෂා කර ගැනීමේ වැදගත්කම පෙන්වා දෙමින් පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ඉදිරිපත් කිරීම ගැන මම මුලින්ම එතුමාට ස්තුතිවන්ත වෙනවා.

ඔබ-අපි කවුරුත් දන්නවා, කඩොලාන පරිසරය අපට පැති ගණනාවකින් වැදගත් වන බව. ඒ වාගේම මේ මොහොත වනවිට ලෝකයේම දැඩි කථා බහට ලක් වෙලා තිබෙන මාතෘකාවක් තමයි ගෝලීය වශයෙන් උණුසුම වැඩි වීම කියන කාරණය. ගෝලීය උෂ්ණත්වය වැඩි වෙන්න බලපා තිබෙන ප්‍රධානම සාධකයක් තමයි, වායුගෝලයේ කාබන්ඩයොක්සයිඩ් ප්‍රතිශතය වැඩි වීම. කඩොලාන පරිසර පද්ධතියට හැකියාව තිබෙනවා, ඉතාම ඉක්මනින් කාබන්ඩයොක්සයිඩ් වායුව අවශෝෂණය කර ගන්න.

විශේෂයෙන්ම කඩොලාන ශාකවලට කාබන්ඩයොක්සයිඩ් වායුව අවශෝෂණය කර ගන්න පුළුවන්කම තිබෙන නිසා ගෝලීය වශයෙන් අද දවසේ මුහුණ දීලා තිබෙන පරිසර උෂ්ණත්වය පිළිබඳ ප්‍රශ්නයට ඉතාම වැදගත් විසඳුමක් දෙන ශාකයක් ලෙස කඩොලාන හඳුන්වා දෙන්න පුළුවන්. පැති ගණනාවකින් මේ පරිසරය අපට වැදගත් වෙනවා. ගෝලීය උෂ්ණත්වය අඩු කිරීම, වෙරළේ ආරක්ෂාව, ධීවර කර්මාන්තයේ පැවැත්ම, ජලය පිරිසිදු කර ගැනීම, සංක්‍රමණික පක්ෂීන්ගේ පැවැත්ම වාගේම සංචාරක කර්මාන්තය පැත්තෙනුත් ඉතාම වැදගත් පරිසර පද්ධතියක් තමයි මේ කඩොලාන පරිසර පද්ධතිය ආශ්‍රිතව තිබෙන්නේ.

අපේ නව රජය බලයට පත් වුණාට පස්සේ අපි පරිසරය පිළිබඳ දැක්මක් ඉදිරිපත් කරලා තිබෙනවා. "සියලු ජීවීන්ගේ පැවැත්ම තහවුරු කෙරෙන තිරසර පරිසරයක්" කියන එක තමයි අපේ නව රජයේ පරිසර ප්‍රතිපත්තිය. ඒ අනුව අපි සැලසුම් කරලා තිබෙනවා, 2030 වර්ෂය වනකොට අපේ රටේ වන ගහනය අද වනකොට තිබෙන තැන ඉඳලා සියයට 32 දක්වා වැඩි කර ගන්නට. එහිදී අපි සැලසුම් කරලා තිබෙනවා, සමස්ත වන ගහනය තුළට මේ කඩොලාන පරිසරයත් ඇතුළත් කරලා, ඉතාම කඩිනමින් 2030 අවුරුද්ද වනකොට අපේ රටේ වන ගහනය සියයට 32 දක්වා වැඩි කර ගන්න. ඒ වැඩ පිළිවෙළ, ඒ දැක්ම යටතේ කටයුතු කරමින් යන මේ මොහොතේ ගොඩබිම් වනාන්තර 86ක් සහ කඩොලාන වනාන්තර 16ක් රක්ෂිත වනාන්තර බවට අපි පත් කරගෙන තිබෙනවා. කඩොලාන වනාන්තර 16 තුළ හෙක්ටෙයාර 243ක් අපි මේ වනකොට රක්ෂිත වනාන්තර බවට පත් කරලා තිබෙනවා. අපේ දැක්ම සහ අපේ ප්‍රතිපත්තිය අනුව වාගේම, අපි මේ රටට පොරොන්දු වූ විධියට මේ මොහොත වනවිටත් කඩොලාන පරිසර පද්ධතිය ආරක්ෂා කිරීම වෙනුවෙන් නව රජය ලෙස අප කටයුතු කරමින් ඉන්නවා.

ආසන්න වශයෙන් පසුගිය අවුරුදු එකහමාරක කාලය තුළ අපි අක්කර 160,000කට ආසන්න ප්‍රමාණයක් ගොඩබිම් වනාන්තර සහ කඩොලාන වනාන්තර රක්ෂිත වනාන්තර බවට පත් කර ගනිමින් තිරසර පරිසරයක් ගොඩනැඟීම වෙනුවෙන් කටයුතු කරගෙන යනවා. ඊට අමතරව අපි කඩොලාන පරිසර පද්ධති සංරක්ෂණය හා තිරසර භාවිතය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සමාලෝචනය කරමින්, එතැනින් එහාට එය ක්‍රියාත්මක කරමින් සිටිනවා. ඒ වාගේම අපි කඩොලාන පරිසරය රැක ගැනීමට අදාළව සැලකිය යුතු මට්ටමින් නීතිමය ක්‍රියාමාර්ග ගනිමින් සිටිනවා. මේ ආදී වශයෙන් පැති ගණනාවක් ඔස්සේ කඩොලාන පරිසරය ආරක්ෂා කර ගැනීමටත්, එය මතු පරම්පරාවට දායාද කිරීමටත් වර්තමාන රජය කටයුතු කරගෙන යනවා.

විශේෂයෙන් මේ අවස්ථාවේදී මෙම පෞද්ගලික මන්ත්‍රී යෝජනාව ගෙන ඒම වෙනුවෙන් හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමාටත්, මේ යෝජනාවට පක්ෂව අදහස් දැක්වූ සියලුදෙනාටත් මම නැවත වතාවක් ස්තුතිවන්ත වෙනවා. අපි ඔක්කෝම එකතු වෙලා මේ කඩොලාන පරිසරය අනාගත පරම්පරාව වෙනුවෙන් රැක ගැනීමට කටයුතු කරමු. ඒක නව රජයේ ප්‍රතිපත්තිය. අපි මේ මොහොත වනවිටත් ඒ ප්‍රතිපත්තිය අනුව රට තුළ ක්‍රියාත්මක වෙමින් සිටිනවාය කියන කරුණ ඉතාම සතුටින් මේ සභාවට දැනුම් දෙමින්, මට මේ වේලාව ලබා දීම වෙනුවෙන් ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. (Dr.) Ramanathan Archchuna. You have three minutes to speak on the Private Members' Motion.

[பி.ப. 1.58]

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චචුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்றைய தினம் நான் கதைக்கப்போகின்ற விடயம் சுமார் 29.33 இலட்சம் மக்கள் வாழுகின்ற வடக்கு மாகாணத்தைப் பற்றிய, குறிப்பாக, மன்னார், கிளிநொச்சி, முல்லைத்தீவு, வவுனியா, யாழ்ப்பாணம் ஆகிய இந்த 5 மாவட்டங்களிலும் இருக்கின்ற அந்த மக்கள் தொடர்பான பிரச்சினை! உங்களுக்குத் தெரியும், எங்களுடைய அண்ணா - நானா - கௌரவ காதர் மஸ்தான் அவர்கள் பிரதிநிதித்துவப்படுத்துவது, வன்னிப் பிராந்தியத்தின் முல்லைத்தீவு, மன்னார் மாவட்டங்களை ஆகும். அதேநேரத்திலே, எங்களுடைய கௌரவ செல்வம் அடைக்கலநாதன் அண்ணன் பிரதிநிதித்துவப்படுத்துவது மன்னார் மாவட்டத்தை ஆகும். இன்றைக்கு வடக்கு மாகாணத்திலுள்ள 50,000 மீனவக் குடும்பங்களில் கிட்டத்தட்ட 110,000 பேர் மீனவத் தொழிலை மாத்திரம் வாழ்வாதாரமாகக் கொண்டு வாழுகின்றார்கள். அங்கு இந்தக் கனிய மணல் அகழ்வு மிகப்பெரியதொரு பிரச்சினையாகக் காணப்படுவதை நாம் பார்க்கின்றோம். ஆற்றுப் பகுதியில்தான் கனிய மணல் அகழப்படுகின்றது என்று நாங்கள் நினைக்கின்றோம். ஆனால், அவ்வாறில்லை! இப்போது கடற்கரைகளில் இருந்துதான் கனிய மணல் படிமம் அகழப்படுகின்றது. NPP அரசாங்கத்தின் காலத்தில் கொழும்பு மத்தியில் இந்தக் கனிய மணல் கூட்டுத்தாபனத்தை வைத்துக்கொண்டு அதற்கான அனுமதி வழங்கப்படுகிறது. மன்னார், முல்லைத்தீவுப் பகுதிகளில் கடல் மண் அள்ளப்படுகின்றபோது, இந்தக் கண்டல் தாவரங்கள் மிக மோசமாக அழிக்கப்படுகின்றது.

அதைவிட, எங்களுடைய செல்வம் அண்ணன் கதைக்க வேண்டிய ஒரு விடயத்தை, அவர் அதனைப் பேசுவதற்கு நேரம் போதாதபடியால் என்னிடம் பேசுமாறு கேட்டுக் கொண்டதை நான் இங்கே சொல்கின்றேன். இன்றைய தினம் விவசாயத் திணைக்களத்துடன் தொடர்புபடுகின்ற நீர்ப்பாசனத் திணைக்களத்தை மன்னாரில் இருந்து வவுனியாவுக்கு இடமாற்றம் செய்திருக்கிறார்கள். மன்னார் மாவட்டம் அதிகூடியளவு விவசாயம் செய்யப்படுகின்ற ஓர் இடமாகும். ஆகவே, நீர்ப்பாசனத் திணைக்களம் அங்கேயிருந்து மாற்றப்பட்டதை மன்னார் மக்களுடைய மிகப்பெரியதோர் அடிப்படை மீறலாகத்தான் நாங்கள் பார்க்கிறோம்.

அதைவிட, இப்போது மன்னார் மண்ணிலே திரும்பத் திரும்ப எத்தனையோ காற்றாலைகள் அமைக்கப்படுவதைப் பார்க்க முடிகின்றது. அதுபற்றி கதைக்கவேண்டிய, அந்தப் பிரதேசத்தைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற உறுப்பினர்

[ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා]

களுக்குச் சந்தர்ப்பம் வழங்கப்படவில்லை. இந்தச் சபையில் පරිසර ඇමතිතුමා இருக்கின்றார். ஆனால், இவ்வளவு நேரமும் சபையில் இருந்த எங்களுடைய கௌரவ அமைச்சர் சந்திரசேகர் இப்போது எழுந்து ஓடிவிட்டார். நாளைக்கு என்ன நடக்கும் என்று சொன்னால், Jaffna அல்லது கிளிநொச்சி DCC Meetingக்கு நான் போனால், "எழும்பு, எழும்பு! வெளியே போ! ஓடு! ஐயோ!" என்று கத்துவதுதான் எங்களுடைய அமைச்சருடைய நிலைமை! ஒருவர் ஒரு விடயத்தைக் கேட்டால், அல்லது ஐயா, இதில் யாரோ களவு எடுக்கிறார்கள்; அவர்களைக் கண்டுபிடியுங்கள்! எனக் கூறினால், "வெளியே போ! நீ இங்கு இருக்க முடியாது" என்று படுகேவலமாகச் சொல்கின்றார். நான் இதை எங்கே போய் சொல்வது? இதை நாங்கள் சொல்லியிருந்தால், රාජකාරියට බාධා කරනවා කියලා තිරේ. ඒ නිසා අපි කථා කරන්න කැමැති නැහැ. நாங்கள் இதே விடயத்தைச் செய்திருந்தால், பொலிஸ்காரனை முறைத்துப் பார்த்தால், 386! ஆனால், அமைச்சர் "வெளியே போடா!" என்று பேசினால், ஒன்றுமே இல்லை. அதற்கிடையில் அவர் அடுத்த நாள் சொல்கிறார், "நான் அப்படிப்பட்டவன் இல்லை" என்று.

வடக்கு, கிழக்கில் அதிகமானவர்கள் மீன்பிடி சமூகத்தினர். கிழக்கு மாகாணத்தைப் பார்த்தீர்கள் என்றால், அங்கு மீன்பிடித் தொழிலில் முஸ்லிம் சமூகமும், தமிழ் சமூகமும் ஈடுபட்டிருக்கின்றார்கள். மன்னாரில் கூடுதலான முஸ்லிம் மக்கள் மீன்பிடியை வாழ்வாதாரமாகக் கொண்டவர்கள். அந்தச் சமூகத்தினுடைய வாழ்வாதாரம் பாதிக்கப்படுகிறது. நேற்றைய தினம் பார்த்தீர்கள் என்றால், மன்னாரில் மின்சார வெட்டு! அந்த மக்களால் நிம்மதியாக நித்திரை கொள்ள முடியாது. ஆனால், இலங்கையில் அதிகூடிய காற்றாலைகளைக் கொண்ட இடம் மன்னார்தான். மன்னார் என்னுடைய இதயம் போன்றது. உங்களுக்குத் தெரியும், சிந்துஜாவின் மரணத்தினால்தான் நான் முதன்முதலாக சிறை என்றால் என்னவென்று பார்த்தேன் என்பது. சிந்துஜாவைக் கொலை செய்தவர்கள் இன்றைக்கு மன்னார் வைத்தியசாலையிலிருந்து பணிநீக்கம் செய்யப்பட்டிருக்கிறார்கள்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. (Dr.) Ramanathan Archchuna, your time is up.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

முடிக்கிறேன் ஐயா!

கௌரவ உறுப்பினர் ஹெக்டர் அப்புஹாமி அவர்கள் கொண்டுவந்த இந்தப் பிரேரணை முக்கியமானது. கௌரவ கடற்றொழில் அமைச்சர் இங்கே இருந்திருக்க வேண்டும். வாகனங்களின் பின்பகுதியில் 10 கிலோ இறால், 20 கிலோ மீன் என்று ஏற்றுவதை விட்டுவிட்டு, தயவுசெய்து இந்த விடயங்களைக் கருத்தில் எடுக்கச் சொல்லி அவரிடம் சொல்லுங்கள்! நன்றி!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. (Dr.) Dammika Patabendi. You have eight minutes to provide the Minister's Reply.

Order, please! Before he starts, will an Hon. Member propose the Hon. Kitnan Selvaraj to the Chair?

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)

Sir, I propose that the Hon. Kitnan Selvaraj do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කිට්නන් සෙල්වරාජ් මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு கிட்ணன் செல்வராஜ் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. KITNAN SELVARAJ took the Chair.*

[අ.භා. 2.02]

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කඩොලාන පරිසර පද්ධතිය ආරක්ෂා කර ගැනීමට වැඩසටහනක් සකස් කිරීම වෙනුවෙන් ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාවට අදාළ පිළිතුරු කථාව කරන්න මට අවස්ථාව ලබා දීම වෙනුවෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ මේ යෝජනාවේ සඳහන් කටයුත්ත අපේ රජය පත් වුණාට පසු අපි දැනටමත් ක්‍රියාත්මක කරමින් ඉන්නේ. කඩොලාන පරිසර පද්ධතිය ආරක්ෂා කිරීම වෙනුවෙන් විශේෂ වැඩ පිළිවෙළ ගණනාවක්ම ක්‍රියාත්මක කරමින් ඉන්න මොහොතක තමයි එතුමා මේ යෝජනාව ඉදිරිපත් කරන්නේ. කෙසේ නමුත්, මෙම යෝජනාව ඉදිරිපත් කිරීම වෙනුවෙන් අපි එතුමාට ස්තුතිවන්ත වනවා.

මීට කලින් කථා කළ ගරු මන්ත්‍රීවරු අපේ රටේ කඩොලන පරිසර පද්ධතිය ගැන සහ එහි වැදගත්කම ගැන කරුණු ඉදිරිපත් කළා. කඩොලාන පරිසර පද්ධතියට වූ විනාශය පිළිබඳව සාකච්ඡා කිරීමේදී, එම විනාශය වැඩිපුර සිදු වුණු කාල පරිච්ඡේදයක් තමයි, 1977 ඉඳලා 1989 දක්වා වූ කාල පරිච්ඡේදය. අපේ රටේ කඩොලාන පරිසර පද්ධතිය වැඩිපුරම විනාශ වෙච්ච කාල වකවානුවක් හැටියට එම කාල වකවානුව ගැනෙනවා. විශේෂයෙන්ම විවෘත ආර්ථික ක්‍රමය ක්‍රියාත්මක කිරීමෙන් පසුව ඉස්සන් වගාව, සංචාරක කර්මාන්තයට අදාළ ව්‍යාපෘති කඩොලාන පරිසර පද්ධතිය විනාශ වීමට විශාල දායකත්වයක් සැපයුවා. එයට හේතු වුණේ එම මොහොතේ තිබුණු පරිසර නීති ක්‍රියාත්මක කිරීම දුර්වල වීමයි. එම නිසා පුත්තලම, මීගමුව, හලාවත වැනි ප්‍රදේශවල කඩොලාන පරිසර පද්ධති විශාල වශයෙන් විනාශ වුණා.

ඉන් පසුව 1990-1994 කාලය තුළ ඉස්සන් වගාව ව්‍යාප්ත වීම නිසාත්, ඒ සඳහා දේශපාලන ආශීර්වාදය ලැබීම නිසාත්, අපේ රටේ කඩොලාන පරිසර පද්ධතිය විනාශ වුණා. කඩොලාන පරිසර පද්ධතිය විනාශ වීමේ උච්චතම අවස්ථාව හැටියට ඒ කාලය

සැලකෙනවා. 2004දී ඇති වුණු සුනාමි ආපදාවත් සමඟ තවදුරටත් කඩොලාන පරිසර පද්ධතිය විනාශ වුණා. නමුත්, කාලයක් තිස්සේ සිදු වෙමින් පැවති විනාශයෙන් කඩොලාන පරිසර පද්ධතිය ආරක්ෂා කර ගැනීම සඳහා පරිසරවේදීන් වාගේම පරිසර අමාත්‍යාංශයත් යම් යම් ක්‍රියාමාර්ග ගන්න මැදිහත් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ කඩොලාන පරිසර පද්ධතිය විනාශ වීමට ප්‍රධාන වශයෙන් හේතු කිහිපයක් බලපා තිබෙනවා. එකක් තමයි, පසුගිය කාලයේ සිදු වුණු අවිධිමත් සංවර්ධන ව්‍යාපෘති. තවත් එකක්, අපේ රටේ තිබුණු වැරදි දේශපාලන සංස්කෘතිය. දේශපාලනඥයෝ මැදිහත් වෙලා එම සංවේදී පරිසර පද්ධති බලහත්කාරයෙන් අත්පත් කරගෙන, පරිසර ආරක්ෂණ නීති ක්‍රියාත්මක කරන අය නොසලකා හරිමින් එම සංවේදී පරිසර පද්ධති එළි පෙහෙළි කරමින් දැවැන්ත විනාශයක් කර තිබෙනවා. විශේෂයෙන්ම එම විනාශයට උදාහරණයක් තමයි පුත්තලම දිස්ත්‍රික්කයේ ආනවිලුන්දාව අභයභූමිය සම්බන්ධ කාරණය. දේශපාලනඥයෝ සෘජුව මැදිහත් වෙලා සංවේදී පරිසර පද්ධති තිබෙන භූමි අත්පත් කරගෙන දැවැන්ත විනාශයක් සිදු කළා.

අනික් එක තමයි, අපේ මන්ත්‍රීතුමා සාකච්ඡා කළ මන්නාරම් දිස්ත්‍රික්කයේ වෙඩිතලතිව් ස්වාභාවික රක්ෂිතය. ඒ ස්වාභාවික රක්ෂිතයේ හෙක්ටෙයාර 168.55ක ප්‍රමාණයක් ඉවත් කරන්න, degazette කරන්න කටයුතු කළා, ඉස්සන් වගාව වැනි කටයුතු සඳහා. නමුත්, අපේ රජය තේරී පත් වුණාට පසුව පසුගිය කාලය තුළ ඒ විනාශය වැළැක්වීම සඳහා අපි මැදිහත් වුණා. විශේෂයෙන්ම වෙඩිතලතිව් ස්වාභාවික රක්ෂිතයේ degazette කරලා ඉවත් කරපු ප්‍රමාණය නැවත අත්පත් කර ගැනීම සඳහා 2025 ජුනි 16වන දින අපි කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරලා, නැවත එය පවරා ගැනීමට කටයුතු කළා.

ඒ වාගේම කඩොලාන පරිසර පද්ධතිය ආරක්ෂා කර ගැනීම සඳහා අපේ රටේ පරිසර අමාත්‍යාංශය මැදිහත් වෙලා "2022 - 2025 ජාතික උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්ම" අපි දැනටමත් ක්‍රියාත්මක කරමින් ඉන්නවා. ඒ වාගේම කඩොලාන සංරක්ෂණය සහ තිරසර භාවිතය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය අපි ක්‍රියාත්මක කරමින් ඉන්නවා. පරිසර අමාත්‍යාංශය යටතේ තිබෙන ආයතන - වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, මධ්‍යම පරිසර අධිකාරිය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය වැනි ආයතන - මැදිහත් වෙලා මෙම පරිසර පද්ධතිය ආරක්ෂා කර ගැනීම සඳහා, පනත් මඟින් ඒ ඒ අයට පැවරිලා තිබෙන බලතල ක්‍රියාත්මක කරමින් කටයුතු කරමින් ඉන්නවා. ඒ වාගේම පසුගිය වසර එකහමාරක දෙකක කාලය ඇතුළත විශාල රක්ෂිත ප්‍රමාණයක්, කඩොලාන රක්ෂිත ප්‍රමාණයක් අපි ප්‍රකාශයට පත් කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප ගැසට් කරන ලද රක්ෂිත පිළිබඳව සඳහන් ලේඛනය මම **සභාගත*** කරනවා.

අපි විශේෂයෙන්ම 2025 වසරේ පමණක් කඩොලාන රක්ෂිත 9ක් ප්‍රකාශයට පත් කර තිබෙනවා. 2025 වසර තුළ රක්ෂිත 29ක් ප්‍රකාශයට පත් කරලා තිබෙනවා. ඒවායෙන් රක්ෂිත 9ක් කඩොලාන රක්ෂිත හැටියට තමයි තිබුණේ. විශේෂයෙන්ම අම්පාර දිස්ත්‍රික්කයේ පාලකුඩා කඩොලාන රක්ෂිතය, පුත්තලම දිස්ත්‍රික්කයේ මැරවල, වවුල්කැලේ, මරම්බැට්ටිය, කුසල කඩොලාන, මැරවල 01, මැරවල 02, මැරවල 03, කරුප්පනේ 02 කියන කඩොලාන රක්ෂිත අපි ප්‍රකාශයට පත් කළා.

පරිසර අමාත්‍යාංශය ලෙස අපි 2026 මාර්තු 21වන දා ජාත්‍යන්තර වනාන්තර දිනය සමරද්දී, එදින වනාන්තර 50ක් රක්ෂිත හැටියට ප්‍රකාශයට පත් කළා. ඒ වනාන්තර 50 තුළ අම්පාර දිස්ත්‍රික්කයට අයත් අන්නමලෙයි 01 සහ අන්නමලෙයි 02 කියන කඩොලාන ප්‍රදේශ අපි රක්ෂිත බවට පත් කළා. අන්නමලෙයි 01 රක්ෂිතයට හෙක්ටෙයාර 0.59ක සහ අන්නමලෙයි 02 රක්ෂිතයට හෙක්ටෙයාර 1.34ක භූමි ප්‍රදේශයක් අයත් වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2026 ජූලි 26වන දිනට ජගත් කඩොලාන දිනය යෙදී තිබුණා. එදින අපි කඩොලාන ප්‍රදේශ 8ක් රක්ෂිත බවට පත් කළා. ඒ තුළ තිබුණා, හෙක්ටෙයාර 176.67ක භූමි ප්‍රමාණයක්. පසුගිය කාලය තුළ පමණක් අපේ රටේ කඩොලාන භූමි හෙක්ටෙයාර 359.4ක ප්‍රමාණයක් රක්ෂිත බවට පත් කර තිබෙනවා. ඒ තුළ තිබෙනවා, දළ වශයෙන් අක්කර 898.5ක වාගේ ප්‍රමාණයක්. ඒ වාගේම සංඛ්‍යාලේඛනවලට අනුව, පසුගිය කාලය තුළ අපේ රටේ කඩොලාන රක්ෂිත ප්‍රමාණය ඉහළ ගිහින් තිබෙනවා. එය වර්ග කිලෝමීටර 38.47ක භූමි ප්‍රමාණයකින් ඉහළ ගිහින් තිබෙනවා. හෙක්ටෙයාර වශයෙන් ගත්තොත්, හෙක්ටෙයාර 3,837කින් වැඩි වෙලා තිබෙනවා. පසුගිය කාලය තුළ අපි ගත්තු සංරක්ෂිත ක්‍රියාමාර්ග නිසායි අපේ රටේ කඩොලාන රක්ෂිත භූමි ප්‍රමාණය හෙක්ටෙයාර 3,837කින්, එහෙම නැත්නම්, වර්ග කිලෝමීටර 38.47කින් වැඩි වෙලා තිබෙන්නේ කියන එක බොහොම සතුටින් මේ ගරු සභාවට දැනුම් දෙන්න කැමැතියි.

අපි කඩොලාන ආරක්ෂා කිරීම සඳහා වන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරමින් සිටියදී වුවත්, ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීම ගැන නැවත වතාවක් එතුමාට ස්තුතිය පළ කරමින් මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.11]

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පිළිතුරු කථාව කළ අපේ ගරු පරිසර අමාත්‍යතුමාට මම විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම, මෙම යෝජනාව වෙනුවෙන් අදහස් දැක්වූ අපේ ගරු මන්ත්‍රීතුමන්ලාටත්, ගරු මන්ත්‍රීතුමියටත් ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම මේ කඩොලාන ශාකය කොතරම් දුරට ආරක්ෂා කරගත යුතු ද යන්න එතුමන්ලා සඳහන් කළා. ඒ නිසා කඩොලාන පරිසර පද්ධතිය ආරක්ෂා කර ගැනීමට මුළු පාර්ලිමේන්තුවටම අවශ්‍යයි කියන එක මට හැඟුණා.

ගරු අමාත්‍යතුමනි, ඒ කාලයේ පුත්තලමේ සිද්ධ වෙච්ච සමහර සිදුවීම් ගැන මට කියන්න පුළුවන්. ඒ කාලයේ ඇත්තටම ඒ සමහර ප්‍රදේශවල කඩොලාන කපා දමලා ඉඩම් අත්පත් කර ගත්තු අවස්ථා තිබෙනවා. ඒවා ඔබතුමන්ලාගේ ආණ්ඩුවෙන් කළාය

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

කියන කාරණය මම කියන්නේ නැහැ. හැබැයි, එවැනි තැන් දිහා බැලුවාම අප ආරක්ෂා කර ගත්තු හෙක්ටෙයාර ගණන දැන් හරි ද කියන ප්‍රශ්නය මතු වන තැන් තිබෙනවා. හැබැයි, ඒවා නැවත වතාවක් තිබුණු තත්ත්වයට ගන්න දැන් බැරි වෙයි. මොකද, දැන් ඒවායේ එක එක ඉදිකිරීම් කරලා, එහෙම නැත්නම් වගා කටයුතු කරලා ඒ පරිසරය වෙනස් කරලා තිබෙන්නේ.

රටක් හැටියට අපට අවශ්‍යයි කඩොලාන පරිසර පද්ධතිය ආරක්ෂා කර ගන්න. මොකද, මේ රට දේශගුණික විපර්යාසවලට බරපතළ විධියට මුහුණ දුන්නු රටක්. විශේෂයෙන්ම "දිට්වා" සුළි කුණාටුවත් එක්ක, ගංවතුරත් එක්ක බරපතළ හානියට ලක් වෙච්ච රටක්. ඒ වාගේම, "එල් නිනෝ" තත්ත්වයත් එක්ක ඉදිරි කාලය තුළ පරිසරය හා බැඳිච්ච බරපතළ ප්‍රශ්න ටිකක් එයිද කියන සැකයෙන්, ඒ ගැන බලාපොරොත්තුවෙන් ඉන්න රටක්. එම නිසා ඒ කාරණාවලදී විශේෂත්වයක් දක්වන මේ කඩොලාන ශාක පද්ධතිය ආරක්ෂා කිරීම සඳහා ගරු අමාත්‍යතුමා කියපු ආකාරයටම රජය ගෙන යන අලුත් වැඩ පිළිවෙළ ගැන පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු 225 දෙනාම දැනුවත් කරමින් සහ මින් පිටත සිටින, රටට ආදරය කරන සියලු ජනතාව දැනුවත් කරමින් ඉදිරි කාලය තුළ නිවැරදි වැඩසටහනක් සකස් කරමු කියා මා යෝජනා කරනවා.

මෙම යෝජනාව වෙනුවෙන් අදහස් දැක්වූ සියලු දෙනාට නැවතත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
න්‍යාය පත්‍රයේ විෂය අංක 3 - පා. 81/2025 - ඉදිරිපත් කිරීම, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

## රසායන ද්‍රව්‍ය යොදා පලතුරු ඉදවීම නතර කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම
## இரசாயனத் திரவியங்களைப் பயன்படுத்தி பழங்களைப் பழுக்க வைப்பதைத் தடுப்பதற்கான வழிமுறையொன்றைத் தயாரித்தல்
## FORMULATION OF A SYSTEM TO STOP THE RIPENING OF FRUITS USING CHEMICALS

[අ.භා. 2.14]

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි.

විශේෂයෙන්ම මම මේ යෝජනාව ඉදිරිපත් කරන්නේ අපේ රටේ තිබෙන විශාල ප්‍රශ්නයක් පිළිබඳව මේ ගරු සභාවේත්, රටේත් අවධානය යොමු කරවන්නයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අවුරුදු ගණනක් තිස්සේ රසායන ද්‍රව්‍ය යොදා පලතුරු ඉදවීම නතර කිරීම සඳහා විශාල සාකච්ඡාවක් සිදු කරමින් එනවා. නමුත්, ඒක හැමදාම යට යන තැනකට තල්ලු වෙලා තිබෙනවා. එම නිසාම මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "ශ්‍රී ලංකාවේ පලතුරු වෙළෙඳ පොළ තුළ ස්වාභාවිකව පැසී ඉදුණු පලතුරු වෙනුවට, නොපැසුණු පලතුරු රසායන ද්‍රව්‍ය යොදා කෘත්‍රිමව ඉදීමට සලස්වා අළෙවි කරනු ලබන හෙයින් ද, ආනයනික පලතුරු ද රසායනික ද්‍රව්‍ය යොදා කෘත්‍රිමව ඉදීමට සලස්වා අළෙවි කරනු ලබන හෙයින් ද, මෙම පලතුරු වැඩි වශයෙන් දරුවන් විසින් ආහාරයට ගනු ලබන හෙයින් ද, කුට ව්‍යාපාරිකයින් රටේ අනාගතය විනාශ කරමින් ලාභ ලැබීමේ පරමාර්ථයෙන් සිදු කරන මෙම ක්‍රියාව නතර කිරීමට විධිමත් ක්‍රමවේදයක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ කුඩා කාලයේ අපි අමු අඹ කැවේ ලුණු ටිකක් දාලා, ගම්මිරිස් ටිකක් දාලා. සාමාන්‍යයෙන් එහෙම තමයි අපි අමු අඹ කන්නේ. හැබැයි, සමහර වෙලාවල අපි බොහොම අමාරුවෙන් ගහකට නැඟලා ඉදිච්ච පලතුරු ගෙඩියක් අතින් කඩාගෙන කාලාත් තිබෙනවා. අපි සාමාන්‍යයෙන් අඹ ගස්වල තිබෙන අඹ ගැටවලට හානියක් කළේ නැහැ. ඒ අඹ ගැට පැහෙන කල්, ඉදෙන කල් අපි ඒවා තිබෙන්නට හැරියා. හැබැයි, දැන් ලංකාවේ සිද්ධ වෙලා තිබෙන්නේ මොකක්ද?

ලංකාවේ එක එක කාලවලට නොයෙක් නොයෙක් පලතුරු හැදෙනවා. උදාහරණයක් ගත්තොත්, අඹ හැදෙන කාලයට සමහර මිනිස්සු වෙළෙන්දන්ට අඹ ගස් පිටින් විකුණනවා. අපේ ගල්ගමුව, යාපහුව වාගේ ප්‍රදේශවල අඹ ඉදෙන කාලයට ඒ මුළු අඹ ගහම විකුණනවා. එය මිල දී ගත්තු වෙළෙන්දා ඒ අඹ ගහේ තිබෙන ඔක්කෝම අඹ ටික කඩාගෙන බට්ටා ලොරියක පටවාගෙන යටින් කාබයිට් කෑලි 4ක් තියලා කොළඹට අරගෙන එනවා. කොළඹට එනකොට, ඒ ඔක්කෝම අඹ කහම කහ පාටයි. නුවර පැත්තේ එහෙම අලිගැට පේර වැඩි වශයෙන් තිබෙනවා. තමුන්නාන්සේලා කොළඹ ඇවිදලා බලන්න ස්වාභාවිකව ඉදුණු අලිගැට පේර ගෙඩියක් කන්න පුළුවන් තැනක් කොළඹ කොහේ හරි තිබෙනවාද කියලා. නුවර හැදෙන අලිගැට පේර ටික ගස් පිටින්ම විකුණනවා. ගස්වල තිබෙන අමු අඹ සහ අමු අලිගැට පේර ඔක්කෝම කඩලා කොළඹට හෝ එහෙම නැත්නම් වෙනත් ප්‍රදේශවලට අරගෙන ගිහින් විකුණනවා. ගෙදර ගෙනිහින් කපලා බැලුවාම, ඒවා ඇතුළේ පණුවෝ, කන්න විධියක් නැහැ. ගෙඩි 10ක් ගෙනාවොත් ගෙඩියක් දෙකක් තමයි යන්තම් කන්න පුළුවන් තත්ත්වයක තිබෙන්නේ. පිටකොටුව ප්‍රදේශයට වාගේම ලංකාවේ අනෙක් තැන්වලටත් ගිහින් බලන්න, ඒවායේ විකුණන්න තිබෙන ඇපල්, දොඩම් ආදිය මොන වාගේද කියලා. ඔය සුපර්මාර්කට්වල තිබෙන ඒවාත් එහෙමයි. සමහර ඒවා refrigerator එකේ තිබෙන හින්දා, හැම වෙලාවේම වතුර ඉසිමින් තියාගෙන ඉන්න හින්දා හොඳයි වාගේ පෙනෙනවා. එළියට අරගෙන ඇවිත් දවසක් තිබ්බ ගමන් ඒවා ඔක්කෝම කුණු වෙනවා. අපේ පාර්ලිමේන්තුවේ කැන්ටින් එකේ තිබෙන කුඩා තක්කාලි ගෙඩි කන්න පුළුවන්ද කියලා බලන්න. එළියට අරගෙන ඇවිත් බැලුවාම පෙනෙනවා, ඒවා ඔක්කෝම නරක් වෙලා තිබෙන බව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි කන සියල්ලේම වාගේ තිබෙන්නේ වස විස. මේ හේතුව නිසා අද අපේ රටේ විශාල අර්බුද ගණනාවක් මතු වෙලා තිබෙනවා. ඒ නිසා තමයි මම අද මේ කාරණය මතු කළේ. විශේෂයෙන්ම ලංකාවේ අස්වැන්න නෙළීමෙන් පසුව - post-harvesting - ඒ අස්වැන්නෙන් සියයට 30ක්, 40ක් සම්පූර්ණයෙන්ම විනාශ වෙනවා. එමඟින් රුපියල් බිලියන 20ක විතර පාඩුවක් සිද්ධ වෙනවා. ලංකාවේ තත්ත්වය ගැන මම තවදුරටත් ඔබතුමන්ලාට කියන්නම්. ශ්‍රී ලංකාවේ අවුරුද්දකට පලතුරු මෙට්‍රික්ටොන් 540,000ක් හැදෙනවා; එළවලු මෙට්‍රික්ටොන් 710,000ක් හැදෙනවා. අද මේ සියල්ලටම විවිධ

රසායනික ද්‍රව්‍ය පාවිච්චි කරමින් තමයි ඉදවීම සහ කල් තබා ගැනීම කරන්නේ. පලතුරු ඉදවීම සඳහා calcium carbide, acetylene gas, ethylene, propylene ethephon, glycol, ethanol ආදි සියල්ලම වාගේ පාවිච්චි කරනවා. මේවාට සම්බන්ධ නීති ක්‍රියාවලිය තිබෙන්නේ 1980 අංක 26 දරන ආහාර පනතේයි. ඒ පනත අනුව බොහොම පැහැදිලිව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයාට සම්පූර්ණ බලය ලැබී තිබෙනවා. ඔහු තමයි ආහාර උපදේශක කමිටුවේ ප්‍රධාන බලධාරියා. පළාත් පාලන ආයතනවලටත් මේක අදාළ කර ගන්න පුළුවන්. 1993 ඔක්තෝබර් 14වන දා ආහාර (ලේබල් කිරීම සහ විවිධ) නියෝග ගැසට් කරලා තිබෙනවා. ඒ අනුව බොහොම පැහැදිලිව කියනවා, ආහාර වර්ණක යොදා සිදු කරන ඒ ක්‍රියාවලිය සම්පූර්ණයෙන්ම තහනම් බව. ඒ විතරක් නොවෙයි, එහි අංක 26 යටතේ කියන්නේ මොකක්ද? කිසිම තැනැත්තෙකු විසින් කාබයිඩ් ගෑස් යනුවෙන් සාමාන්‍යයෙන් හඳුන්වනු ලබන acetylene gas යොදා ගනිමින් කෘත්‍රිම ලෙස ඉදවනු ලැබූ පලතුරු වර්ගයක් විකිණීම, විකිණීමට භාවිත කිරීම, තැබීම හෝ ප්‍රදර්ශනය කිරීම හෝ විකිණීමේ කාර්යය සඳහා හෝ විකිණීමට අදහස් කරනු ලබන යම් ආහාරයක් පිළියෙල කිරීමේදී භාවිතයට ගැනීම, තම සන්තකයේ තබා ගැනීම නොකළ යුතුයි. ඒවා සම්බන්ධයෙන් නඩු පවරන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1980 අංක 26 දරන ආහාර පනතේ තවත් විශේෂ කාරණයක් තිබෙනවා. එහි 33 වගන්තියේ "අර්ථ නිරූපණය" යටතේ මෙසේ සඳහන් වනවා:

> " 'සනීපාරක්ෂාවට අහිතකර තත්ත්වයක් යන්නෙන්' දූවිලි, කුණු හෝ කසළවලින් ආහාර අපවිත්‍ර වීමට හෝ ආහාර සෞඛ්‍යයට හානිකර වීමට හෝ ඉඩ ලැබෙන තත්ත්වයක් හෝ අවස්ථාගත කරුණු අදහස් වේ;.."

බාල කළ ආහාර සම්බන්ධයෙනුත් එහි බොහොම පැහැදිලිව සඳහන් කර තිබෙනවා. මේ පනත යටතේ නඩු පවරා වැරැදිකරුවන්ට විරුද්ධව පැහැදිලිව ක්‍රියා කරන්න පුළුවන්. හැබැයි, ඒක කරන්න ඕනෑ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු. අද ලංකාවේ ඒ සෞඛ්‍ය නිලධාරීන් සංඛ්‍යාව විශාල වශයෙන් අඩු වෙලා තිබෙනවා. සිටිය යුතු ප්‍රමාණයට වඩා විශාල ප්‍රමාණයක් අද නැහැ. ඒ නිසා මම සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් විශේෂයෙන් ඉල්ලා සිටිනවා, කරුණාකර ඒ අඩුපාඩුව සපුරා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කරන්න කියලා. අද Public Health Inspectorsලා ඉන්නේ 2,162යි. සමහර දිස්ත්‍රික්ක ගැන ඇහුවාම ඒ දිස්ත්‍රික්ක ගැන අපට බයත් හිතෙනවා. මොකද, මේ ක්‍රියාවලිය ඉදිරියට කරගෙන යන්න ඒ දිස්ත්‍රික්කවල ඉන්න නිලධාරීන් සංඛ්‍යාව ප්‍රමාණවත් නැහැ. උදාහරණයක් විධියට, කුරුණෑගල ඉන්නේ Public Health Inspectorsලා 126යි. මේ විධියට ගත්තාම තැන් තැන්වල ඉන්නේ ඉතා කුඩා ප්‍රමාණයක්. ගරු නියෝජ්‍ය ඇමතිතුමාත් සභාවේ ඉන්නවා. ඒ නිසා මම විශේෂ ඉල්ලීමක් කරනවා. අපට පෙනෙනවා, 1980 පනතේ සඳහන් ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමට අදාළව තීන්දු තීරණ අරගෙන නැති බව. ඒ නිසා මේ සම්බන්ධව නිවැරැදි ක්‍රියාමාර්ගයක් හදන්න, ඒ සඳහා අවශ්‍ය පහසුකම් ටික දෙන්න, ඒ ක්‍රියාවලිය මේ රට තුළ ශක්තිමත් කරන්න ඉඩ දෙන්න කියා ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

යෝජනාව ස්ථිර කිරීම, ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.21]

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රසායන ද්‍රව්‍ය යොදා පලතුරු ඉදවීම නතර කිරීම සඳහා ක්‍රමයක් සැකසීම පිළිබඳව පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු මේ වෙලාවේ එය ස්ථිර කරමින් වචන ස්වල්පයක් කථා කරන්න මා බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකාව කියන්නේ, විවිධ දේශගුණික කලාපවලින් සමන්විත, උසස් ගුණාත්මකභාවයකින් යුත්, මිහිරි, රසවත් පලතුරු ඉතාම හොඳින් වැවෙන භූගෝලීය පසුබිමක් තිබෙන රටක්. ඒ වාගේම, දේශීයව වගා කරන කෙසෙල්, අඹ, පැපොල්, රඹුටන්, මැංගුස්, පැෂන්ෆෲට් වැනි පලතුරුවලට මේ රටේ විතරක් නොවෙයි, විදේශවලත් ඉතා ඉහළ ඉල්ලුමක් තිබෙන බව අපි දන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වන කොට අපේ රටේ පලතුරු පරිභෝජනය කරන පිරිසට ගැටලු කිහිපයක් මතු වෙලා තිබෙනවා. එකක් තමයි, වන සතුන්ගෙන් වන හානිය. තවත් එකක් තමයි, පලතුරු ඉදවීම සඳහා අහිතකර විෂ රසායනික ද්‍රව්‍ය යෙදීම. එවැනි ගැටලු කිහිපයක්ම පවතිනවා. අද වන විට වෙළෙඳ පොළේ රසායනික ද්‍රව්‍ය යොදවලා ඉදවපු නැති පලතුරක් සොයා ගැනීම කළුනික හොයනවා වාගේ වැඩක් බවට පත් වී තිබෙනවා. මේ විධියට වාණිජ අරමුණින් පලතුරු අලෙවි කිරීමේදී ඒවා කෘත්‍රිමව ඉදවීමටත්, කල්තබා ගැනීමටත්, කෘමීන්ගෙන් සිදු වන හානිය වළක්වා ගැනීමටත් රසායනික ද්‍රව්‍ය යොදා ගැනීම නිසා ශරීරයට ගුණදායක යැයි සිතා පාවිච්චි කරන පලතුරුවලින් ශරීරයට අහිතකර තත්ත්වයක් ඇති වීම ඉතාම කනගාටුදායක කාරණයක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ පෝෂණීය ආහාරයක් ලෙසත්, විටෙක අතුරුපසක් විධියටත් පලතුරු භාවිත කළත්, විශ්වාසදායී සහ ගුණාත්මක පලතුරු ආහාරයට ගැනීමට නොහැකි තත්ත්වයක් මේ රසායනික ද්‍රව්‍ය යෙදවීම හරහා අද අපිට දකින්න තිබෙනවා. විශේෂයෙන්ම විශ්වාසයෙන් යුතුව වෙළෙඳ පොළෙන් පලතුරු අරගෙන දරුවන්ට දෙන්න බැරි තත්ත්වයක් උදා වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙනකොට අපේ රටේ කෘෂිකර්මාන්තයේ යෙදෙන පිරිසෙන් සැලකිය යුතු පංගුවක් පලතුරු වගාවට වෙන් කර තිබෙනවා. එවැනි පසුබිමක දේශීය අවශ්‍යතාවට අමතරව මැද පෙරදිග රටවලට, යුරෝපා සංගමයට අයත් රටවලට, විශේෂයෙන්ම මාලදිවයින වාගේ රටවලට ලංකාවෙන් පලතුරු අපනයනය කරන්නත් හොඳ අවස්ථාවක් තිබෙන බව අපට පේන්න තිබෙනවා.

අපි කල්පනා කරලා බැලුවොත්, අපේ රටේ පලතුරු සඳහා බොහෝ ප්‍රදේශ ප්‍රසිද්ධියක් දරනවා. ඇඹිලිපිටිය, තඹුත්තේගම, කුරුණෑගල හා යාපනය වාගේ ප්‍රදේශ කෙසෙල් වගාවට ප්‍රසිද්ධයි. ඒ වාගේම, අනුරාධපුරය, යාපනය, කුරුණෑගල, හම්බන්තොට වාගේ ප්‍රදේශ ගත්තොත්, ඒ ප්‍රදේශවල අඹ වගාව තිබෙනවා. හම්බන්තොට, අනුරාධපුරය, මොනරාගල යන ප්‍රදේශවල පැපොල් වගාව තිබෙනවා. රඹුටන් කිව්වාම අපට මතක් වෙන්නේ මල්වාන. මැංගුස්ටීන් ගැන කථා කරනකොට අපට කළුතර ප්‍රදේශය මතක් වෙනවා. ඒ වාගේම, නුවරඑළිය ප්‍රදේශයට ආවේණික පලතුරුත් බහුල වශයෙන් වගා කරනවා. රසායනික ද්‍රව්‍ය භාවිත කිරීම මඟින් පලතුරේ පිටත ලෙල්ල ඉක්මනින් තද කහ පැහැ ගැන්වීම සිදු වෙනවා. දැන් දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ඒ ගැන පැහැදිලි කළා. සාමාන්‍යයෙන් පැසුණු

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

කෙසෙල් කැනක් ස්වාභාවිකව ඉදීමේදී මුල ඇවරියේ සිට අග ඇවරිය දක්වා ඉදීගෙන යන රටාවක් තිබෙනවා. රසායනික ද්‍රව්‍ය යෙදවීම මඟින් මුළු කෙසෙල් කැනම එකවර කහ පැහැ ගැන්වීම මඟින් කෘත්‍රිමව ඉදවීමක් තමයි දැන් කාලයේ සිද්ධ වන්නේ. මෙහෙම රසායනික ද්‍රව්‍ය යොදා ඉදවන පලතුරුවල සුවඳ, රස ඒ වාගේම මෘදු බව නැති වෙනවා. ඒවා ඉක්මනින් නරක් වෙනවා. ඒ නිසා එවැනි පලතුරු පහසුවෙන් හඳුනා ගැනීමට පුළුවන්කම තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉස්සර අපේ ගම්වල දානේ ගෙදරක් වුණාම, මඟුල් ගෙදරක් වුණාම කෙසෙල් ඉදවද්දී කෙසෙල් කැන් වළලලා ඉදවන සිරිතක් තිබුණා. සමහර වෙලාවට ඒවාට දුම් ගහලා ඉදවන සිරිතක් තිබුණා. අද අපට ඒවා ක්‍රමානුකූලව නැති වෙලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ මේ වාගේ අවස්ථාවල මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට හා පාරිභෝගික කටයුතු අධිකාරියට නඩු පවරන්න බලය තිබෙනවා. එහිදී දඬු ගහන්න පුළුවන්කම තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන් වෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් දෙන්න.

දැනටත් එවැනි පියවර ගන්න පුළුවන්කම තිබෙනවා. නමුත් ඒවා සඳහා නීති මදි නම් තව නීති ගෙනැල්ලා හරි මේ ප්‍රශ්නය විසඳන්නට කටයුතු කළ යුතුව තිබෙනවා.

කාලය හරස් වෙන නිසා මම තව එක විනාඩියකින් කථාව අවසන් කරන්නම්. දේශපාලන පක්ෂයකට පමණක් අදාළ වෙන කාරණයක් නොවෙයි අද අපි කථා කරන මාතෘකාව. මේක මේ රටේ හැම පවුලකටම, හැම දරුවෙකුටම, හැම දෙමව්පියෙකුටම අදාළ වෙන ජාතික ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. මේක වර්තමානයට වාගේම අනාගතයටත් අදාළ ප්‍රශ්නයක්. අමාරුවෙන් උපයන මුදලින් තමන්ගේ දරුවන්ට හොඳ දේ දෙන එක තමයි දෙමව්පියන්ගේ ප්‍රාර්ථනාව. නමුත් ඔවුන්ට අද වෙළෙඳ පොළෙන් මිලදී ගන්න ලැබෙන්නේ වස විස මිශ්‍ර පළතුරු තමයි. ඒ නිසා මේක බරපතළ ප්‍රශ්නයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආහාර සුරක්ෂිතතාව කියන්නේ සුඛෝපභෝගී ජීවිතයක් පිළිබඳ මාතෘකාවකුත් නොවෙයි, ජීවත් වීමේ අයිතිය සමඟ බැඳුණු මාතෘකාවක්. ඒක මානව අයිතිවාසිකමක්. පළතුරුවලට පමණක් නොවෙයි, එළවලුවටලත් පළිබෝධ නාශක ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ඇතැම් රසකැවිලිවලට කෘත්‍රිම වර්ණක අධිකව යොදනවා. ක්ෂණික ආහාරවලට ලුණු, සීනි, මේදය, රසකාරක අධිකව යොදනවා. ඒ සියල්ල එකතු වන්නේ අප් රටේ පුරවැසියන්ගේ සහ දරුවන්ගේ ශරීරවලට. කිව යුතු තව කරුණු දෙක, තුනක් තිබුණත් කාලය හරස් වෙන නිසා දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා විසින් ගෙනාපු මේ පෞද්ගලික මන්ත්‍රී යෝජනාව ඉතාම කාලීන අවශ්‍යතාවක් බව සනාථ කරමින්, මට මේ අවස්ථාව ලබා දීම වෙනුවෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සමන්ත රණසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.27]

**ගරු ආර්.එම්. සමන්ත රණසිංහ මහතා**
(மாண்புமிகு ஆர்.எம். சமந்த ரனசிங்ஹ)
(The Hon. R.M. Samantha Ranasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා විසින් පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් හැටියට ගෙනා මේ යෝජනාව පාර්ලිමේන්තුවේත්, රටේත් අවධානයට ලක් කිරීම ඉතාම කාලෝචිත වැඩක් හැටියට මම දකිනවා. පලතුරු ආහාරයට ගැනීම ඉතාම දීර්ඝ කාලයක් තිස්සේ මානව ඉතිහාසයේ කලින් ඉඳන්ම තිබෙන දෙයක්. අපේ ආහාරයේ ප්‍රධාන අංගයක් තමයි පලතුරු. දැන් මේ මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන ගැටලු ඇත්තටම පලතුරුවලට විතරක් සීමා වෙච්ච ඒවා නොවෙයි. අපේ බේකරි කර්මාන්තය, කෙටි කෑම කර්මාන්තය, පලතුරු බීම කර්මාන්තය ඇතුළු ආහාර කර්මාන්තයම වෙළා ගත්ත ප්‍රශ්නයක් තමයි, විෂ රසායනික ද්‍රව්‍ය ආහාරවලට එකතු කිරීම. ඒ නිසා අපි මේ දෙස පුළුල්ව බැලිය යුතුයි. ඒ වාගේම, මේක ඉතාම සංවේදී, සියුම්ව සිතා බැලිය යුතු, දීර්ඝ කාලීනව උත්තර සෙවිය යුතු ප්‍රශ්නයක්.

මෙවැනි විෂ රසායනික ද්‍රව්‍ය යොදලා වෙළෙඳ පොළට පලතුරු දමන්නේ ඇයි කියලා බැලුවොත්, ඒකට පැති කිහිපයක් තිබෙනවා. එකක්, ඉල්ලුම සැපයුම කියන ප්‍රශ්නයේදී හොඳ පලතුරුවලට ඉල්ලුමක් තිබෙනවා. නමුත්, සැපයුම සම්බන්ධ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ වාගේම, අපේ රටේ සමහර පලතුරු හැදෙන කාල වෙනස් වෙනවා. ඒ නිසා වර්ෂය පුරාම ඒවා හොයාගන්න නැහැ. ඒ වාගේම, සමහර පලතුරු සමහර ප්‍රදේශවලට සීමා වෙලා තිබෙනවා. ඒ නිසා අපි මේකට උත්තර හොයන්න ඕනෑ. නිෂ්පාදනය වැඩි කරන්න ඕනෑ. ඒ නිසා අවාරයට පලතුරු හදාගන්නා තාක්ෂණය දැන් ලෝකයේ තිබෙනවා. අපි ඒ පිළිබඳවත් අවධානය යොමු කරන්න ඕනෑ.

ඒ වාගේම, පලතුරු ප්‍රවාහනය සහ ඇසුරුම්කරණය පිළිබඳ තාක්ෂණය අපේ රටේ භාවිත වෙනවා ඉතාම මදි. ඒ තාක්ෂණය ඉක්මනින් මේ කර්මාන්තයට හඳුන්වා දෙන්න අපි දැන් කටයුතු සූදානම් කරගෙන යනවා. ඒ වගේම, අපට තිබෙනවා විශාල ආකල්පමය ප්‍රශ්නයක්. රජයක් හැටියට අපි මේ ගැන අවධානය යොමු කරනවා. අපේ රටේ කියමනක් තිබෙනවා නේ, "බල්ලෝ මරලා හරි සල්ලි හොයන්න ඕනෑ" කියලා. 1977න් පස්සේ - විවෘත ආර්ථිකය ඇති වුණාට පස්සේ - බල්ලෝ මරලා හරි සල්ලි හොයන්න ඕනෑ කියන සංකල්පය තමයි සමාජගත කළේ. ඒ නිසා ඕනෑම දෙයක් විකුණනවා. ඒක පරිභෝජනය කරන්නේ කවුද කියලා හිතන්නේ නැහැ. විශේෂයෙන්ම නිෂ්පාදකයාගෙන් මේවා හදන්නේ මොකටද කියලා ඇහුවොත්, පළමුවෙන් ලැබෙන උත්තරය තමයි "විකුණන්න තමයි හදන්නේ" කියන එක. මෙන්න මේ ආකල්පයෙන් අපි ඔවුන් මුදා ගන්න ඕනෑ. ඒ නිසා අපි මේවා හදන්නේ විකුණන්න නොවෙයි, අපේ ජනතාවට පරිභෝජනය කරන්නයි කියන ආකල්පමය වෙනස අපි හදන්න ඕනෑ. ඒ වගේම, විකුණන කෙනෙකුගෙන් ඇහුවොත්, "ඇයි, ඔයා මේක විකුණන්නේ?" කියලා, "ලාභය සඳහා තමයි විකුණන්නේ" කියනවා. ඒ නිසා අපි ඒගොල්ලන්ගේ ආකල්ප හදන්න ඕනෑ මේවා මිනිසුන්ගේ පරිභෝජනය සඳහායි අළෙවි කරන්නේ කියන තැනට.

ඒ වාගේම, පාරිභෝගිකයාගේ පැත්තෙනුත් විශාල ආකල්මය වෙනසක් අපි කරගන්න ඕනෑ, මෙවැනි වෙළෙඳුන්ගේ කූට ගැටවලට අහුවෙන්නේ නැතිව ඒවා ප්‍රතික්ෂේප කරන්න. ඒ නිසා

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු මේ යෝජනාවට අපට නීතියෙන් පමණක් උත්තර හොයන්න බැහැ කියා මම හිතනවා. රටක් හැටියට අපි මේ සියලු ප්‍රශ්න කෙරෙහි අවධානය යොමු කරලා, විශේෂයෙන්ම කෘෂිකර්ම අමාත්‍යාංශය, සමුපකාර අමාත්‍යාංශය, පරිසර අමාත්‍යාංශය සහ නීති අංශය කියන ඔක්කොම අංශ ඒකාබද්ධ කරගත් දීර්ඝ කාලීන යන්ත්‍රණයකට මේ සාකච්ඡාව ගෙන යමු. ඒ සඳහා අවධානය යොමු කිරීම ගැන ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

அடுத்து, கௌரவ (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா அவர்கள்! உங்களுக்கு 3 நிமிடங்கள் உண்டு.

[பி.ப. 2.31]

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இரசாயனத் திரவியங்களைப் பயன்படுத்தி பழங்களைப் பழுக்க வைப்பதைத் தடுப்பதற்கான வழிமுறையொன்றைத் தயாரித்தல் தொடர்பான தனிநபர் பிரேரணையைக் கொண்டுவந்த எங்களுடைய மதிப்புக்குரிய சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர அவர்களுக்கு என்னுடைய மனமார்ந்த நன்றிகள்! உண்மையில் இது மருத்துவம் சார்ந்த ஒரு பிரேரணை! இதை நான் மிகவும் வரவேற்கின்றேன். ஏனெனில், பழங்களைப் பழுக்க வைப்பதற்குப் பயன்படுத்துகின்ற இரசாயனப் பதார்த்தங் களால் cancerதான் கூடுதலாக வருகின்றது. ஒரு மருத்துவன் என்ற ரீதியில் அது பற்றி எனக்குத் தெரியும். அதேபோல், உங்களுக்கும் நன்றாகத் தெரியும். உதாரணத்துக்கு oral cancer - வாய்ப் புற்றுநோயை - எடுத்துப் பார்த்தால், ஆண்களுக்கும் பெண்களுக்கும் இடையிலான இதன் விகிதம் 4:1. இரசாயனத் திரவியங்களைப் பயன்படுத்தி பழுக்க வைத்த பழங்களிலும் பார்க்க புகையிலையால்தான் இந்தப் புற்றுநோய் கூடுதலாக ஏற்படுகின்றது. புகையிலையுடன் பாவிக்கின்ற சுண்ணாம்பு, புகையிலைக்கு விசிறப்படும் கிருமிநாசினி, அதனைக் காயவைப்பதற்குப் பயன்படுத்தப்படும் எதனோல் போன்ற வற்றால் cancer ஏற்படுகின்றது. இதனால் இந்தப் புற்றுநோய் ஆண்களில் ஏற்படுவதற்கான சாத்தியப்பாடு அதிகம்.

இலங்கையில் ஒரு நாளைக்கு oral cancerஆல் மூன்று பேர் இறக்கிறார்கள். அதாவது, ஓரிலட்சம் மக்களில் 14-16 சதவீதமானவர்கள் இந்தப் புற்றுநோயால் இறக்கிறார்கள். இது சம்பந்தமாக சுகாதார அமைச்சுதான் கவனம் செலுத்த வேண்டும். வடக்கு மாகாணத்தை எடுத்துக்கொண்டால், அங்கு சுதேச மருத்துவ அமைச்சுதான் இந்த விடயத்தைக் கவனிக்க வேண்டும். Food Act - உணவுச் சட்டம் - என்று ஒரு சட்டம் இருக்கின்றது. இதன்படி முக்கியமான விடயங்களைப் பார்க்கவேண்டியது PHI. அதை control பண்ணுவது RDHS. வடக்கு மாகாணத்திலுள்ள RDHSஆக இருக்கலாம், PDHSஆக இருக்கலாம். அனைவரும் கள்வர்கள்! அவர்களால் எப்படி இந்த Food Actஐச் சரியாக implement பண்ண முடியும் என்பது மிகப் பெரிய கேள்விக்குறி!

இதற்கு நல்லதோர் உதாரணம்தான் வடக்கு மாகாணத்தில் இருக்கின்ற ReeCha Organic Farm (Pvt.) Limited. அங்கு உற்பத்தி செய்யப்படுகின்ற பழங்களில் பாவிக்கப்படுவது முழுக்க முழுக்க formalin. சாதாரணமாக body ஒன்றை 3 நாட்களுக்குப் பதப்படுத்தி வைத்திருப்பதற்குத்தான் formalin பாவிக்கப்படுகின்றது. இதனைப் பழங்களுக்குத் தெளிக்கும் போது, அது cancerஐ cause பண்ணும். ஆண்களுக்கு oral cancer கூடுதலாக ஏற்படுவதற்கு முக்கிய காரணம் புகையிலை. வடக்கு மாகாணத்தில் புகையிலை உற்பத்தி செய்வதை தடுக்கக் கூடாதென நேற்று எங்களுடைய கஜேந்திரகுமார் பொன்னம்பலம் அவர்கள் சொல்லியிருக்கிறார். நான் ஒரு மருத்துவன் என்ற ரீதியில் சொல்கிறேன், வடக்கு மாகாணத்திலுள்ள ஆண்கள் அதிகமாக இறப்பது சிகரெட், பீடி போன்றவற்றைப் பாவிப்பதனால்தான். 'பார்சிறீ' எனப்படு கின்றவர் வடக்கு மாகாணத்தில் 22 bars கொண்டுவந்து இருக்கிறார். இதனை control பண்ண வேண்டியது Excise Department. அடுத்து, இங்கு இருக்கின்ற கஜேந்திரகுமார் பொன்னம்பலம்! இவருக்கு வடக்கு மாகாணத்தில் அதிகமாக புகையிலையை உற்பத்தி செய்து மக்கள் சாக வேண்டும்.

யோசித்துப் பாருங்கள்! புகையிலையை தடைசெய்வதால் வடக்கு மாகாண மக்களுடைய வாழ்வாதாரம் பாதிக்கப் படுகின்றது என்றால், வடக்கு மாகாண சபையின் அதிகாரம் என்னுடைய கைகளுக்கு வந்தால், வடக்கு மாகாணத்துக்கு வெளியே அதைச் செய்யுமாறுதான் சொல்வேன். வடக்கு மாகாணத்தில் இருப்பவர்கள் ஒருவரும் இதன்மூலம் சாகக் கூடாது. வேண்டுமென்றால், தெற்கில் கொண்டுபோய் அதனை விற்பனை செய்யுங்கள்! வடக்கு மாகாண மக்களின் வாழ்வாதாரம் புகையிலைச் செய்கையில் தங்கியிருப்பதால் அதனை மேற்கொள்ள வேண்டுமென இவர் சொல்லிக் கொண்டு இருக்கின்றார். குறித்த நபருக்கு மருத்துவ அறிவு இல்லை. சட்டத்தரணி என்று சொல்லிக்கொண்டு இருக்கிறார். ஆனால், அதற்குரிய அறிவும் இல்லை. அவர் Courtsக்குப் போனதையும் நான் காணவில்லை. மருத்துவம் சம்பந்தமாக பாராளுமன்றத்தில் கதைக்கும்போது, ஒன்றில் தெரிந்து கதைக்க வேண்டும் அல்லது தெரிந்தவனிடம் கேட்டுக் கதைக்க வேண்டும். கௌரவ தயாசிறி ஜயசேக்கர அவர்கள் கொண்டுவந்த இந்தப் பிரேரணை முக்கியமானதொன்றாகும்.

ReeCha Organic Farm (Pvt.) Ltd.இல் உற்பத்தி செய்யப்படுகின்ற சகல பழங்களுக்கும் திட்டமிட்ட ரீதியில் formalin தெளிக்கப்படுகின்றது. அவை தெற்குக்குக் கொண்டுவரப்படுகின்றன. வடக்கு மாகாணத்தில் வாழைப்பழ உற்பத்தியும் மாம்பழ உற்பத்தியும் அதிகம் என்பது உங்களுக்குத் தெரியும். மாம்பழ உற்பத்தியை ஊக்குவிக்கின்ற எங்களுடைய இளங்குமரன் தம்பியும் இங்கே இருக்கிறார். எவ்வளவு காணியை கொடுக்கப் போகிறீர்கள்? 500 ஏக்கர் காணியையா, 500 பரப்பு காணியையா? அவரைப் பொறுத்தவரையில், பருத்தித்துறையில் 500 பரப்பு காணியைக் கொடுத்து மாம்பழ உற்பத்தி செய்ய வேண்டும்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுடைய நேரம் நிறைவடைந்துவிட்டது.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම ඉක්මනින් අවසන් කරනවා.

வடக்கு மாகாண சுகாதார அமைச்சின் செயலாளராக புஷ்பராணி அல்லது ஏதோ ஒரு ராணி இருக்கிறார். COVID-19 காலப்பகுதியில் எடுத்த Audit Reportஐத் தரமுடியாத இவர், மருத்துவ அறிவு இல்லாத இவர், வடக்கு மாகாண சுகாதார அமைச்சின் செயலாளராக எப்படி இருக்க முடியும்? இது சம்பந்தமாக நாங்கள் பாராளுமன்றத்தில் கதைத்திருக்கிறோம்; மேலும் ஆராய்வோம். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අසෝක සපුමල් රන්වල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.36]

**ගරු අසෝක සපුමල් රන්වල මහතා**
(மாண்புமிகு அசோக சபுமல் ரன்வல)
(The Hon. Asoka Sapumal Ranwala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා විසින් පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් විධියට ඉදිරිපත් කරන ලද ඉතා වැදගත්, කාලෝචිත යෝජනාව වෙනුවෙන් අදහස් ඉදිරිපත් කරන්නට ලැබීම සතුටට කරුණක්.

පලතුරු වට්ටියෙන්ම පටන් ගත්තොත්, මේ රටේ අනාදිමත් කාලයක සිට පලතුරු සම්බන්ධ සංස්කෘතියක් නිර්මාණය වෙලා තිබෙනවා. අපි රෝගියෙක් බලන්න යනකොට අරගෙන යන්නේ පලතුරු. අපි ගැබිනි මාතාවකට වඩා හොඳ ආහාරයක් විධියට පලතුරු දෙන්නත් උනන්දු වනවා. දරුවෙකුට ලබා දෙන්නෙත් පලතුරු. නමුත් මේ පලතුරු සම්බන්ධයෙන් අද ඇති වෙලා තිබෙන ශෝචනීය තත්ත්වය ගැන තමයි මේ යෝජනාව තුළින් කථා කරන්නේ. දීර්ඝ කාලයක් තුළ මේ විධියට ක්‍රියාත්මක වෙලා අද මේ තත්ත්වය උත්සන්න අවස්ථාවට පත් වෙලා තිබෙනවා. පලතුරු ඉදවන්න දැන් ෆෝමලින් වාගේ දේවලුත් භාවිත කරනවා. ඇත්තෙන්ම ස්වාභාවික ක්‍රියාවලියක් ඇතුළේ පලතුරු ඉදීම තුළින් ඒක ප්‍රණීත සහ රසවත් පලතුරක් වනවා. ඒ වාගේම එය ස්වාභාවික ජීව රසායනික ක්‍රියාවලියක් හරහා සිදු වන නිසා සුවඳවත්, මෘදු පලතුරක් බවට පත් වෙනවා. ඒ පලතුර ක්‍රමානුකූලව මෝරනකොට, එහෙම නැත්නම් ඒ පලතුර පැහෙන්න පටන් ගත්තාම, පලතුර අභ්‍යන්තරයේ තිබෙන පිෂ්ටය ක්‍රමානුකූලව ග්ලූකෝස්, එහෙම නැත්නම් ෆෲක්ටෝස් බවට පරිවර්තනය වනවා. මේක ස්වාභාවික ක්‍රියාවලියක්. මේ සංසිද්ධිය ඇතුළේ ශාක විසින් ඉතා සුවඳ, ප්‍රණීත රසවත් ආහාරයක් බවට පලතුර පරිවර්තනය කරන්නේම ජීවීන් සඳහා; සතුන් සඳහා. ඒ එක්කම, පලතුරු ලබා දෙන්නෙම ගහේ අවශ්‍යතාවකට. එනම්, ගහේ බීජ ප්‍රචාරණය සඳහා. එහෙම නම්, ශාක තමන් වෙනුවෙන් ඒ කරගන්න වැඩේට ප්‍රතිලාභයක් විධියට සතුන්ට ලබා දෙන පලතුර ඒ විධියටම බුක්ති විඳින්න අපි අසමත් වෙලා තිබෙනවා.

ඔබ දන්නවා, මැනිං වෙළෙඳ පොළ තුළින් ලංකාව පුරාම විශාල වශයෙන් පලතුරු බෙදා හරින බව. මේ මැනිං වෙළෙඳ පොළ ඇතුළේ පලතුරු ගබඩා කරන්නත්, ස්වාභාවික ක්‍රමයෙන් ඒ පලතුරු ඉදවීම සඳහා - එතලීන් කියන වායුවෙන් - වායු කාමර හදලා, දුම් ගස්වලා පලතුරු ඉදවන්නත් කාමර තිබුණා. මැනිං වෙළෙඳ පොළ කොළඹින් ගෙනිහිල්ලා පෑලියගොඩ ස්ථාපිත කරනකොට මේ විධියටම කාමර 20ක් වෙන් කර තිබුණා, දුම් ගහන්න. එහෙම නැත්නම් ප්‍රමිතියක් ඇතිව එතලීන් වායුව මුදා හරිමින් ඉදවන්න. ඒක තමයි පලතුරු ඉදවීම සඳහා එතලීන් වායුව භාවිත කරන ලෝකයේ පිළිගත් සම්ප්‍රදාය. හැබැයි, මේ කාමර 20ම පලතුරු විකුණන වෙළෙඳුන් සඳහා ලබා දෙන්න සිද්ධ වුණා. හැබැයි, ඒ වෙලාවේ රජය ඒ ගැන වග කිව්වේ නැහැ. පලතුරු ඉදවන්න තිබෙන වායු කාමර ටික, එහෙම නැත්නම් ඒ දුම් කාමර ටික නිදහස් කරලා ඒ පලතුරු ඉදවීමේ වුවමනාව වෙනුවෙන් යොදවන්න රජය අසමත් වුණා. අඩුම තරමින් මැනිං වෙළෙඳ පොළට එන පලතුරු ටික නිසි ප්‍රමිතියක් ඇතිව ඉදවන්න ක්‍රමයක් හදන්න එදා බැරිවුණා. දැන් ඒක බරපතළ ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. ඒ පලතුරු ටික නිවැරදිව ඉදවන්න ඒ වෙළෙඳ පොළ තුළ වෙළෙඳුන් හුරු කරන්නේ කොහොමද, ඒ සම්බන්ධයෙන් ආකල්පමය වෙනසක් ඇති කරන්නේ කොහොමද කියන ප්‍රශ්නයට විසඳුමක් සෙවීම සඳහා මේ වෙනකොටත් දැවැන්ත උත්සාහයක නියැළෙනවා. හැබැයි, මේ වනකොටත් ඒක කරන්න අසමත් වෙලා තිබෙනවා. ආරම්භයේ කරපු වැරදි වැඩේ නිසා අද වෙනකොට මේ කටයුත්ත නිසි ක්‍රමයකට ගන්න බැරි වෙලා තිබෙනවා. පලතුරක් ඉදවනකොට නිසි ප්‍රමිතියක් සහිතව එතලීන් වායුව භාවිත කරලා කටයුතු කරන්න පුළුවන්කම තිබෙනවා. හැබැයි, වෙළෙඳුන්ට මේ සම්බන්ධව අවබෝධයක් නැහැ. ඔවුන්ගේ ආකල්පය වෙනස් වෙලා නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ගෙනාපු මේ යෝජනාව වටිනා යෝජනාවක් බවට පත් වෙන්නේ අපි සමාජයක් විධියට, පුරවැසියන් විධියට මැදිහත් වෙලා මේ ඛේදවාචකයෙන් අපේ දරුවන්, රෝගීන්, ගැබිනි මාතාවන් බේරා ගන්න පුළුවන් වුණොත් විතරයි. මේක රජයක් විධියට නීති දාලා, PHI මැදිහත් වෙලා, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මැදිහත් වෙලා කරන්න පුළුවන් සරල කටයුත්තක් නොවෙයි. අපි විපක්ෂයේ සිටියදීත් අවුරුදු 30ක වාගේ කාලයක් තිස්සේ ආණ්ඩු පක්ෂයේ සිටි අයත් එක්ක මේ සඳහා කටයුතු කරන්න මැදිහත් වුණා. විශේෂයෙන්ම රතන හාමුදුරුවෝ, චන්න ජයසුමන මහාචාර්යවරයාත් එක්ක එකතු වෙලා මේ කටයුතු නිවැරදි කරන්න, නිරවුල් කරන්න උත්සාහ කළා. ඒ වාගේම දේශපාලන පක්ෂයක් විධියට අපි ඒ ගැන කථා කළාට පස්සේ එවැනි තැන් එක්ක සාකච්ඡා කරලා, ඒක පූජනීය සත්කාරයක් නම් ඒකට දායකත්වය ලබා දෙන්න අපට ඉඩ දීලා තිබුණා. ජාතික ජන බලවේගය විධියට අපි ඒ සඳහා මැදිහත් වන්න සූදානම්. අපි විපක්ෂයේ සිටියදීත් ආණ්ඩු පක්ෂය කරන කාර්යාවලියට උදව් කළා. ඒ නිසා ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට යෝජනා කරනවා, අපි සමාජයක් විධියට මේ යෝජනාව අරගෙන සමාජ වුවමනාවට අනුව පෙළ ගැහිලා සාමූහිකව, පක්ෂ, විපක්ෂ භේදයකින් තොරව මේ රටේ ජනතාවට වසවිස කවන මේ ක්‍රමය වෙනස් කරලා තාක්ෂණික ක්‍රමයකට පරිවර්තනය වෙමු කියලා. ඒ සඳහා අපි සූදානම්. මෙවැනි යෝජනාවක් සැබෑවක් බවට පත් වන්නේ එවැනි ක්‍රියාමාර්ගයකට පුරවැසියන් විධියට අපි මැදිහත් වුණොත් විතරයි කියමින්, මා නිහඬ වනවා.

සියලුදෙනාටම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට කාලය විනාඩි 3ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.40]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ අනාගතය රඳා පවතින ක්ෂේත්‍රයක් තමයි, පලතුරු වගාව. දැන් අපේ රටේ සාම්ප්‍රදායානුකූල වගාව තුළින් ලබා ගන්නා ලාභය අඩු වෙලා තිබෙනවා. තේ, රබර්, පොල් වගාව සඳහා අවශ්‍ය ශ්‍රමය දැන් රටේ ඇත්තේත් නැහැ. ඒ වාගේම විවිධ සාධක හේතුවෙන් ඒවායේ ලාභයත් අඩු වෙලා තිබෙනවා. ඒ වාගේම වගා කළ හැකි ඉඩම් අපේ රටේ හිඟයි. ඒ නිසා අපේ රටේ ආර්ථිකය දියුණු කිරීම සඳහා වියළි කලාපයේ වාගේම තෙත් කලාපයේත් පලතුරු වගාව ව්‍යාප්ත කිරීම ඉතාම සුදුසුයි. නමුත් අද තිබෙන ප්‍රශ්නය තමයි, නවීන තාක්ෂණයෙන් යුතු පලතුරු වගාවක් කරා යොමුවීම ඉතාම අඩුවීම. ඒ වාගේම අද ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා

කියන්නේ අස්වැන්න නෙළා ගැනීමෙන් පසු පාරිභෝගිකයා කරා යන ගමනේ අතරමැද සිදුවන ප්‍රවාහනයේදී සහ වෙළෙඳාමේදී රසායනික ද්‍රව්‍ය යෙදීම නිසා ඇති වන සෞඛ්‍ය ප්‍රශ්න සහ පසු අස්වනු ක්‍රියාදාමය තුළ සිදුවන ආර්ථිකමය හානිය ඉතා බැරෑරුම් තත්ත්වයක පවතින බවයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ පලතුරු වගාවට - අඹ වෙන්න පුළුවන්, අන්නාසි වෙන්න පුළුවන්, කෙසෙල් වෙන්න පුළුවන් - ගැළපෙන විවිධ ප්‍රදේශ තිබෙනවා. මා දන්නවා, අද කළුතර දිස්ත්‍රික්කයේ රබර් වගාවේ ඵලදායීතාව ගොඩක් අඩු වෙලා තිබෙන බව. ශ්‍රම හිඟයත් ඊට බලපා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා අද කළුතර දිස්ත්‍රික්කයේ බොහෝදෙනෙක් අන්නාසි වගාවට යොමු වෙලා තිබෙනවා. ඇතැම් අය අඹ වගාවටත් යොමු වෙලා තිබෙනවා. ඒ වාගේම කෙසෙල් වගාවේ සමහර ප්‍රභේදවලට අපේ දිස්ත්‍රික්කය සුදුසුයි. එම නිසා ඒ සඳහාත් තවත් පිරිසක් යොමු වෙලා තිබෙනවා. ඒ නිසා ඒ, ඒ දිස්ත්‍රික්කයට ගැළපෙන පලතුරු වර්ග තෝරාගෙන වගා කිරීම, ජල සම්පාදනය, පොහොර දැමීම, අස්වැන්න උපරිම කර ගැනීම සඳහා වන නවීන තාක්ෂණික උපාය මාර්ග අනුගමනය කිරීම වාගේම, පසු අස්වනු ක්‍රියාදාමයේදී වස විස නැති දියුණු ලාභදායක ක්‍රියාමාර්ගවලට යොමු වීමත් සිදුවන්න ඕනෑ.

අපට උදාහරණයකට තායිලන්තය ගන්න පුළුවන්. මම අවස්ථා කිහිපයකදීම තායිලන්තයේ තිබෙන මෙවැනි වගා බිම් පරීක්ෂා කරලා තිබෙනවා. පෞද්ගලිකව මගේ විශේෂ උනන්දුවක් තිබෙනවා, වගාව ගැන. තායිලන්තය වාගේ රටවල සාමාන්‍යයෙන් අපට හිතාගන්න බැරි, අපි ප්‍රයෝජනයට නොගන්නා වගුරු බිම්වල පවා විවිධාකාර වගා සිද්ධ කරලා තිබෙනවා. එක පැත්තකින් ජානමය වශයෙන් දියුණු කරපු බෝග, ඒ වාගේම ඉහළ තාක්ෂණික උපාය මාර්ග යොදා ගැනීමෙන් බෝග වගා කරලා වැඩි අස්වැන්නක් ලබා ගැනීමටත් ඔවුන් සමත් වෙලා තිබෙනවා. ඒ නිසා අපේ රට පුරා පලතුරු වගාව දියුණු කිරීම සඳහා විශාල උනන්දුවක් ඇති කළ යුතු අතරම, පසු අස්වනු ක්‍රියාදාමය තුළ වස විස නැති ඵලදායී ක්‍රියාමාර්ග යෙදීම සඳහාත් අපි පෙලඹිය යුතුයි.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ආර්.එම්. ජයවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.44]

**ගරු ආර්.එම්. ජයවර්ධන මහතා (වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன - வர்த்தக, வாணிப மற்றும் உணவுப் பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. R.M. Jayawardhana - Deputy Minister of Trade, Commerce and Food Security)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා, රසායනික ද්‍රව්‍ය යොදා පලතුරු ඉදවීම නතර කිරීම සඳහා. මෙය රට තුළ අද විතරක් නොවෙයි, කාලයක් තිස්සේ සාකච්ඡා වන හොඳ මාතෘකාවක්.

පලතුරක් කියන්නේ ගොඩක් අය කැමැත්තෙන්, සතුටින් ආහාරයට ගන්නා දෙයක්. හැබැයි පලතුරු සතුටින් ආහාරයට ගත් කාල සීමාව තමයි, අපේ පුංචි කාලය. ඒ අත්දැකීම අපට තිබුණු නිසාම අපි දන්නවා, පලතුරක් කියන්නේ රස සහ සුවඳ තිබෙන දෙයක් කියලා. නමුත් වර්තමානයේ වෙළෙඳ පොළ ආර්ථිකයත් එක්ක සැලකිය යුතු පිරිසක් බිස්නස් එක සඳහා පලතුරු වෙළෙඳ පොළට බැස්සා. වෙළෙඳාමට බැස්ස හැමදෙනාටම ප්‍රශ්නයක් තිබෙනවා, ගත්ත බඩු ටික ඉක්මනින් විකුණාගන්නේ කොහොමද කියලා. ඒ නිසාම පලතුරු ස්වාභාවිකව ඉදෙන ක්‍රමය වෙනුවට ඉක්මනින් ඉදවලා වෙළෙඳ පොළට දාන එක තමයි ඔවුන්ගේ ක්‍රමය බවට පත් වෙලා තිබෙන්නේ. තොග වශයෙන් සපයන කෙනාට තමයි ඒ විධියට කටයුතු කිරීමේ ඒකායන බලාපොරොත්තුව තිබෙන්නේ. ඔවුන් තොග වශයෙන් පලතුරු අරගෙන වෙළෙඳ පොළට දානවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පසුගිය දවස්වල ඒ වෙළෙඳාම් කරන අයගෙන් ප්‍රශ්න කළා. පලතුරු ගන්නකොට ඒ අය මුළු ගහම තමයි මිලදී ගන්නේ. අඹ ගහක් නම් අඹ ගහේ ගෙඩි ටික ඔක්කෝම ගහක් හැටියට මිලදී ගන්නවා. වෙනත් පලතුරුත් එහෙම තමයි. එහෙම මිලදී ගත්ත අඹ ගහේ ගෙඩි එක වෙලාවට හැදෙන්නේ නැහැ, එක වෙලාවට පැහෙන්නේ නැහැ, එක වෙලාවට ඉදෙන්නේත් නැහැ. නමුත් ගහේ ගෙඩි ඔක්කෝම එකවර කැඩුවේ නැත්නම් ලාභය අඩුවෙයි කියලා ඒ අය හිතනවා. ඒ නිසා ගහේ තිබෙන ගෙඩි ඔක්කෝම කඩලා මේ කියන විධියට එතිලීන් කියන රසායනික ද්‍රව්‍ය යොදලා, වතුරේ ඔබලා, වාහනයට දාලා, පොහොර කවරයකින් හෝ වෙනත් දෙයකින් වසා තැබුවාම පැය 12ක් යනකොට ඒ ගෙඩි ඉදෙනවා. මේක තමයි බිස්නස් එක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පිළිබඳව විටින් විට සමාජය තුළ කතිකාවක් ආවා; සමාජය තුළ ප්‍රශ්න මතු වුණා. නමුත් අපට තිබෙන ප්‍රශ්නය මෙයයි. අවුරුදු 40කට ආසන්න කාලයක් ක්‍රමානුකූලව වර්ධනය වෙලා අද මේක සමාජ ව්‍යසනයක් බවට පත් වෙලා තිබෙනවා. සමාජ ව්‍යසනයක් බවට පත් වෙච්ච එකක් එකපාරම නවත්වන්නේ කොහොමද කියන ප්‍රශ්නය මෙහිදී තිබෙනවා. ඒකට හේතුව තමයි, මෙවැනි දේවල්වලට පෙලඹිච්ච සමාජයක ඒක වෙනස් කරන්න ගියාම ඉහළ ප්‍රතිවිරෝධතාවක් එන එක.

පසුගිය දවස්වල අපේ අර්ච්චුනා මන්ත්‍රීතුමා මතක් කළා, දුම්කොළ පිළිබඳ ප්‍රශ්නය. දුම්කොළ පිළිබඳ ප්‍රශ්නය සමාජ ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. හැබැයි, අපි ඒක නවත්වන්න තීරණයක් නොගෙන තිබියදීත්, අපි ඒ සම්බන්ධ තීරණයක් ගත්තා කියලා සමාජගත වුණාට පස්සේ ඒ පිළිබඳව ලොකු සංවාදයක් හැදුවා. ඒ වාගේ ප්‍රශ්න මෙහිදීත් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පලතුරු ඉදවීම සඳහා භාවිත කරන රසායනික ද්‍රව්‍ය විද්‍යාත්මකව භාවිත කරන ක්‍රම තිබෙනවා. හැබැයි, ලංකාවේ කවුරුවත් මේවා විද්‍යාත්මකව පාවිච්චි කරන ක්‍රම දන්නේ නැහැ. තමන්ගේ අත්දැකීමෙන් සහ තමන් භාවිත කරන ක්‍රමය ඔස්සේ, එසේ නැත්නම් තමන් විසින්ම හොයා ගත් ක්‍රමයක් අනුව තමයි ඔවුන් ඒවා භාවිත කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රසායනික ද්‍රව්‍ය පලතුරුවලට විතරක් නොවෙයි, වෙනත් දේවලටත් භාවිත කරනවා. එතිලීන් භාවිත කරලා ඉදවන පලතුරු වර්ග හතරක් ගැන තමයි සඳහන් වන්නේ. නමුත් අද වනකොට දූරියන්වලට පවා ඒ රසායනිකය භාවිත කරනවා කියන එක තමයි අපි දන්නේ. වෙන දවස්වල අපි දූරියන් විකුණන තැනක් ආසන්නයෙන් යනකොට සුවඳ දැනෙනවා. අද දූරියන්වල සුවඳ එන්නේ නැහැ. ඒ තරමට මේ රසායනික ද්‍රව්‍ය යොදා පලතුරු ඉදවන එක අපේ සමාජයේ ප්‍රශ්නයක් බවට පත් වෙලා. මේ සඳහා රසායනික වර්ග ගොඩක් භාවිත කරනවා. ඒකෙන් විශේෂයෙන් කාබයිඩ් භාවිත කරන එක තමයි භයානකම තත්ත්වයට පත්ව තිබෙන්නේ.

[ගරු ආර්.එම්. ජයවර්ධන මහතා]

ඒ භයානක තත්ත්වයට ආපු නිසාම ඇමතිතුමා 7වැනි මාසයේ 21වැනි දා මේවාට වගකිව යුතු ආයතන සියල්ලෙහි නිලධාරින් අමාත්‍යාංශයට ගෙන්වා, මේකට කොහොමද මැදිහත් වන්නේ, ඒ මැදිහත් වීම හරහා මේක නවත්වන්න පුළුවන්ද, ඒකට තිබෙන නීති ප්‍රමාණවත්ද කියලා සාකච්ඡා කළා. අපි දන්නවා, ආහාර පනත මඟින් අපේ පළාත් පාලන ආයතනවලට මේ සම්බන්ධ වගකීමක් පැවරිලා තිබෙන බව. අපේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයට, සෞඛ්‍ය අමාත්‍යාංශයට මේ පිළිබඳව වගකීමක් පැවරිලා තිබෙනවා. ඒ වාගේම අපේ අමාත්‍යාංශයට, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට සහ අනෙකුත් ආයතනවලටත් ඒ වගකීම පැවරිලා තිබෙනවා. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම අමාත්‍යාංශය ඇතුළු අමාත්‍යාංශ ගණනාවක් එකට එකතු වෙලා මේ පිළිබඳව සාකච්ඡා කරලා, කොහොමද අපි මේකට මැදිහත් වන්නේ, මොකක්ද ඒ සඳහා වන වැඩ පිළිවෙළ කියන එක පිළිබඳව අවසාන තීන්දුවකට ආවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මෙතැන තිබෙන සැලකිය යුතු ගැටලු ප්‍රමාණයක් හඳුනාගත්තා. පළමුවැනි දේ මෙයයි. පලතුරු වෙළෙඳාම් කරන අය, නැත්නම් තොග වශයෙන් අළෙවි කරන අය එක පැත්තකින් දන්නේ නැහැ, මේකේ තිබෙන අහිතකර ප්‍රතිවිපාක පිළිබඳව. ඒ ගැන හොඳ අවබෝධයක් ඔවුන්ට නැහැ. ඒ අවබෝධය නැතිකම නිසා ඔවුන් ලාභය පමණක් කේන්ද්‍ර කරගෙන මේ විධියට බිස්නස් එක කරනවා. ඒ වාගේම එළියේ සිල්ලරට වෙළෙඳාම් කරන අයත් මේකේ ප්‍රතිවිපාක දන්නේ නැහැ. එම නිසා ඔවුන්ද ලාභය ගැන විතරක්ම විශ්වාස කරනවා. ඒ වාගේම පාරිභෝගිකයන්ට මේ පිළිබඳව තිබෙන අවබෝධයත් අඩුයි. පාරිභෝගිකයන්ට මේ පිළිබඳව තිබෙන දැනුම අඩු නිසාම ගොඩක් පාරිභෝගිකයෝ වර්තමානයේ පලතුරු වැනි දෑ මිලදී ගන්නේම, දැන් අරගෙන ගිහින් දැන් කන්න ඕනෑය කියන මතයේ සිටිමින්. දැන් කන්න තමයි පාරිභෝගිකයෝ පලතුරු අරගෙන යන්නේ. අන්න ඒ නිසාම ඇති වන ප්‍රශ්නයක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පාරිභෝගිකයා දන්නෙත් නැහැ, තොග වෙළෙන්දා දන්නෙත් නැහැ, සිල්ලර වෙළෙන්දා දන්නෙත් නැහැ රසායනික ද්‍රව්‍ය භාවිත කරලා ඉදවන පලතුරුවලට මොකක්ද වෙන්නේ කියලා. මේ සම්බන්ධයෙන් අපි ගැටලු ගණනාවක් හඳුනාගෙන තිබෙනවා. ඒ ගැටලු අනුව ඒවාට උත්තරය හොයන්න ඕනෑ කියලා අපි විශ්වාස කරනවා. අපි මේ වනවිටත් ඒ සඳහා ක්‍රියාමාර්ග කිහිපයක් අරගෙන තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපි තහනම් කරලා තිබෙන්නේ මොනවාද, දැනට තිබෙන අපේ අණපනත්වලින් තහනමට ලක් වෙලා තිබෙන, නීතිරීති මඟින් ආවරණය කරලා තිබෙන්නේ මොනවාද කියන කාරණා පිළිබඳව ජනතාව දැනුවත් කරන්න, ව්‍යාපාරිකයන් දැනුවත් කරන්න වැඩසටහනක් තිබෙනවා. ඒ වැඩසටහන සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් වාගේම කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් කරනවා. ඒ වාගේම පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් නිකුත් කර තිබෙන නීතිරීතිවලට පිටින් ගිහිල්ලා බිස්නස් කරනවා නම්, පලතුරු ඉදවීම සඳහා රසායනික ද්‍රව්‍ය යොදනවා නම් ඒ පිළිබඳව වැටලීම් කරන්න වැඩ පිළිවෙළක් මේ වනවිට අඛණ්ඩව සිදු කරමින් පවතිනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. දැන් ඒ කටයුතු නතර කිරීම වෙනුවෙන් යම් නිශ්චිත වැඩ පිළිවෙළක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය 21වැනි දා අමාත්‍යාංශයේදී රැස් වුණාට පස්සේ අපි තීන්දුවක් ගත්තා, මෙන්න මේ කියන ආයතන ටික ඒකාබද්ධව සාකච්ඡා කරලා ඒ වෙනුවෙන් වැඩ පිළිවෙළක් හදන්න. රසායනික ද්‍රව්‍ය භාවිත කරලා ඉදවන විවිධ වර්ගයේ පලතුරු සමාජය තුළ තිබෙනවා. ලංකාවට ආනයනය කරන පලතුරුත් ඒ අතර තිබෙනවා. ලංකාව තුළ නිෂ්පාදනය කරන පලතුරුත් තිබෙනවා. ගස්ලබු වෙන්න පුළුවන්, අලිගැටපේර වෙන්න පුළුවන්, කෙසෙල් වෙන්න පුළුවන්. මේ හැම පලතුරු වර්ගයක්ම ඉදවීම සඳහා රසායන ද්‍රව්‍ය යොදා ගැනීම නතර කරන්නේ කොහොමද? රසායනික ද්‍රව්‍යවලින් තොර හොඳ පලතුරක් සමාජයට දෙන්න පුළුවන් ක්‍රමය මොකක්ද, ඒ වෙනුවෙන් අනුගමනය කරන්න තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද, නීතිරීති මඟින් මේ කටයුත්ත කරන්න පුළුවන්ද, එහෙම නැත්නම් තිබෙන නීති ප්‍රමාණවත් නැති නිසා මේ කටයුතු වළක්වා ගන්න බැරිද කියන කාරණා පිළිබඳව අධ්‍යයනය කරලා, ආයතන හතර පහක් එකතු වෙලා මේ වෙනුවෙන් නිශ්චිත වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලා අපි යෝජනා කරලා තිබෙනවා. ඒ අනුව කමිටුවක් විධියට එකතු වෙලා, සාකච්ඡා කරලා මේ වෙනුවෙන් තීන්දු තීරණ ගන්න අපි බලාපොරොත්තු වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේක මීට කලින් සාකච්ඡා කරලා විසඳුම් හොයන්න තිබුණු කාරණයක්.

දැන් පිළිකා රෝගීන් විශාල ප්‍රමාණයක් අපේ රටේ ඉන්නවා. අර්ච්චුනා මන්ත්‍රීතුමා කිව්වා, පිළිකා රෝගීන් සැලකිය යුතු ප්‍රමාණයක් මේ කාරණයත් එක්ක නිර්මාණය වෙලා තිබෙනවා කියලා. කුඩා දරුවන්ගෙන් -විශේෂයෙන් අවුරුදු 12ට අඩු දරුවන්ගෙන්- සැලකිය යුතු පිරිසකට පිළිකා රෝගය ඇති වීමට මේ ප්‍රශ්නය බලපානවා. පුංචි දරුවෝ පලතුරු ගොඩක් කන්නේ නැහැ. ඒ දරුවෝ පලතුරු ගොඩක් කනවා නම් මීට වඩා පිළිකා රෝගීන්ගේ ප්‍රමාණය වැඩි වනවා. පිළිකා නිසා සිදු වන මරණ ප්‍රමාණයත් විශාල වශයෙන් වැඩි වෙලා තිබෙනවා. මේ හැම එකකටම බලපාන ප්‍රධානම සාධකය තමයි, රසායන ද්‍රව්‍ය යොදා පලතුරු ඉදවීම.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අපේ අමාත්‍යාංශය යටතේ තිබෙන ප්‍රධානම කාර්යයක් තමයි, ආහාර සුරක්ෂිතතාව. අපට තනියෙන් මේ කටයුත්ත කරන්න බැහැ කියන එක අපි දැන් හොඳටම අවබෝධ කරගෙන තිබෙනවා. ඒ නිසා කෘෂිකර්ම අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය යනාදී ආයතන ඔක්කොම ඒකාබද්ධ කරලා, නිශ්චිත වැඩ පිළිවෙළක් යටතේ පක්ෂ විපක්ෂ භේදයකින් තොරව සමාජයක් හැටියට මෙම දේවල්වලට එරෙහිව කටයුතු කරමින් සංවිධානාත්මක උත්තරයක් හොයන වැඩ පිළිවෙළට ආණ්ඩුව මැදිහත් වෙනවාය කියන කාරණය මතක් කරමින්, මෙම යෝජනාව ගෙන ඒම වෙනුවෙන් ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.54]

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා, අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා, ආර්.එම්. ජයවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා, අසෝක රන්වල මන්ත්‍රීතුමා ඇතුළු මේ සම්බන්ධව අදහස් දක්වපු සියලුදෙනාට මම ස්තුතිවන්ත වනවා. විශේෂයෙන්ම ආර්.එම්. ජයවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා ඉතාම හොඳ කථාවක් කළා, දැන් රසායන ද්‍රව්‍ය යොදා පලතුරු ඉදවීම නතර කරන්න අවශ්‍ය වටපිටාව හදන්න කියලා.

මේ අවස්ථාවේ සභාවේ අපේ සෞඛ්‍ය ඇමතිතුමාත් ඉන්නවා. සෞඛ්‍ය අමාත්‍යාංශයේ Food Control Administration Unit එක කියලා තැනක් තිබෙනවා. මේ Unit එකෙන් 2010දී ගහපු ලියුමක් මට ලැබුණා. ඊට පස්සේ 2011දී ගහපු ලියුමක් ලැබුණා. එතැනින් පසුව නම් මට ලියුමක් ලැබුණේ නැහැ. මම මේ ලියුම් දෙකම කියවමින් තමයි හිටියේ. ආර්.එම්. ජයවර්ධන මැතිතුමා කිව්වා වාගේ සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් මම ඉල්ලීමක් කරනවා. මේ ආයතන සියල්ල එකතු කරලා යම් ක්‍රමයක් හදලා කුඩා පනත් කෙටුම්පතක්, නැත්නම් අඩුම තරමින් ගැසට් පත්‍රයක් පළ කරන්න. මේ ලියුම සියලු පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්, සියලු දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්, ජාතික සෞඛ්‍ය විද්‍යායතනය, සියලු මහ නගර සභා, ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරින් වෙත යවා තිබෙනවා. ඒගොල්ලන්ට තමයි මේ සම්බන්ධයෙන් කටයුතු කරන්න බලය ලබා දීලා තිබෙන්නේ. හැබැයි, මොකක්ද මේ වරද කරන අය අල්ලන ක්‍රමය, මොකක්ද ඒ වැඩ පිළිවෙළ කියලා ඒගොල්ලන් ළඟ මොකක්වත් system එකක් නැහැ. නිකම් ලියුමක් ගහලා යවලා තිබෙනවා. එච්චරයි. ඒ නිසා මේ ගැන සොයා බලන්න ඕනෑ. අපේ සෞඛ්‍ය, ජනමාධ්‍ය සහ කාන්තා සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කමිටුවේ සභාපති නිහාල් අබේසිංහ මැතිතුමාත් මේ සභාවේ ඉන්නවා. එතුමාගෙනුත් මම ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා. මේ සඳහා අපට ප්‍රතිපත්තිමය වශයෙන් යම්කිසි තීන්දුවක් ගන්න පුළුවන්. අපේ රන්වල මැතිතුමාටත් මම ස්තුතිවන්ත වෙනවා. මොකද, එතුමා මේ පිළිබඳව ගොඩක් මහන්සි වුණු කෙනෙක් වාගේම, මේ පිළිබඳව දන්නා කෙනෙක් නිසා.

මම යෝජනා කරන්න කැමැතියි, අපි මේ ඔක්කෝම එකතු වෙලා අඩුම තරමින් ගැසට් පත්‍රයක් මඟින් පළ කරලා හෝ මේ වැරදි අල්ලා ගත යුතු ක්‍රමය මොකක්ද, ඒ නීතිමය තත්ත්වය මොකක්ද කියන කාරණා සම්බන්ධව යම්කිසි වැඩ පිළිවෙළක් හදමු කියලා. එම වැඩ පිළිවෙළට අනුව ප්‍රාදේශීය සභාවලට, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලවලට බලය ලබා දෙන්න පුළුවන්. ගරු ආර්.එම්. ජයවර්ධන මැතිතුමා කිව්වා වාගේ, ඒ විධියේ වැඩ පිළිවෙළක් හැදුවොත් Consumer Affairs Authority එකටත් ලේසියි. මොකද, මේ වාගේ වරදකදී මාස හයකට නොඅඩු සහ අවුරුදු තුනකට නොවැඩි කාලයකට බන්ධනාගාරගත කිරීමටත්, රුපියල් දහසකට නොඅඩු සහ රුපියල් පන්දහසකට නොවැඩි දඩයක් ගහන්නත් මහජන සෞඛ්‍ය පරීක්ෂකට සම්පූර්ණ ඉඩකඩ තිබෙනවා. ඒ නීතිය හදා තිබෙනවා. නමුත් ඒ නීතිය ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ගරු ආර්.එම්. ජයවර්ධන මැතිතුමනි, ඔබතුමා කිව්වා වාගේ ආහාරවලට විවිධ රසායනික ද්‍රව්‍ය යෙදීම මේ රටේ ජනතාවට පිළිකා සහ උදරගත විවිධ රෝග වැලඳීමට හේතුවක් වෙලා තිබෙනවා.

මම මේ අවස්ථාවේදී සියලුදෙනාටම ස්තුතිවන්ත වෙනවා. අපි මේ වෙනුවෙන් ඉදිරියේදී තවදුරටත් ක්‍රියාත්මක වෙමු කියා ඉල්ලා සිටිමින්, විශේෂයෙන්ම අද වනවිට ඇති වෙලා තිබෙන තත්ත්වය ගැනත් සඳහන් කිරීමට බලාපොරොත්තු වෙනවා.

ඊයේ රාත්‍රිය වනකොට මැගසින් බන්ධනාගාරය තුළ ඇති වුණු තත්ත්වය අපි දැක්කා. අද කුරුවිට බන්ධනාගාරයේ. හෙට කොහේ, කොහේ වෙයිද කියලා අපි දන්නේ නැහැ. එසේ ඉතා විශාල,- *[බාධා කිරීමක්]*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
දැන් Batticaloaවල.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
දැන් මඩකලපුවේ. මේක දැන් රැල්ලක් විධියට යනවා. මම කියන්න කැමැතියි, එක පැත්තකින් බන්ධනාගාර නිලධාරින්, අනෙක් පැත්තෙන් ඒවායේ ඉන්න රැඳවියන් කියන සියලුදෙනාම දැන් මේකට හසු වෙලා තිබෙන්නේ කියලා. මම හිතනවා, මේ ක්‍රියාදාමය නවත්වන්න අවශ්‍ය කටයුතු ටික සිදු කළ යුතුයි කියා. අපි බොහොම පැහැදිලිව විශ්වාස භංග යෝජනාවක් ගෙනැල්ලා කිව්වා, මේ ඇමතිවරයාට මේ කටයුතු කරන්න බැහැ කියලා. නමුත් අපි කියන එක ඇහුවේ නැහැ. තමුන්නාන්සේලා 152ක් ඒකට විරුද්ධව ඡන්දය දුන්නා. දැන් වගකීම භාර ගන්න.

ඊයේ බිමල් රත්නායක මැතිතුමා ප්‍රකාශ කරනවා මම අහගෙන හිටියා, අතීතයේ සියලු විනිශ්චයකාරවරුන් පත් කරන්න බලය තිබුණාය කියලා. ඒක නැති කළේ තමුන්නාන්සේලා-අපි ඔක්කෝම එකතු වෙලා කරපු දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන්. දැන් තමුන්නාන්සේලාට ඒක එපාද? ඒ කොමිෂන් සභා එපා වෙලා තමුන්නාන්සේලා කැමැති අග්‍ර විනිශ්චයකාරතුමා තියා ගන්න, තමුන්නාන්සේලා කැමැති විනිශ්චයකාරවරුන් තියා ගන්න කියන ඒවාද දැන් කරගන්න ඕනෑ? ඒකටද, දැන් තමුන්නාන්සේලා 76 වසරක් වෙච්ච දේවල් නැති කළේ? 77වැනි වසරත් දැන් ගත වෙලා තිබෙන්නේ. *[බාධා කිරීමක්]*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
න්‍යාය පත්‍රයේ විෂය අංක 4 - පා. 88/2025 - ඉදිරිපත් කිරීම, ගරු සුසන්ත කුමාර නවරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

## ශ්‍රී ලංකාවේ වනසතුන් කළමනාකරණය කිරීම සඳහා ජාතික ප්‍රතිපත්තියක් සහ ක්‍රමවේදයක් සකස් කිරීම

### இலங்கையில் வன விலங்குகளை முகாமைத்துவம் செய்வதற்குத் தேசியக் கொள்கையொன்றையும் செயன்முறையொன்றையும் வகுத்தல்

FORMULATION OF A NATIONAL POLICY AND METHODOLOGY FOR THE WILDLIFE MANAGEMENT IN SRI LANKA

[අ.භා. 2.58]

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)
මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අවස්ථාවක් නැති සමහරුන්ට පලතුරුවලින් පටන්ගෙන plan එකකට යන බන්ධනාගාර කථාත් දැන් කරන්න සිද්ධ වෙලා තිබෙනවා කියලා තමයි මට නම් තේරුම් යන්නේ. *[බාධා කිරීමක්]*

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ශ්‍රී ලංකාව ජාත්‍යන්තර වශයෙන් ජෛව විවිධත්වයෙන් ඉහළ රටක් ලෙස සැලකෙන හෙයින් ද, වනාන්තර විනාශය, මිනිසුන්ගේ ආක්‍රමණය හේතුවෙන්, නීති විරෝධී වන සතුන් වෙළෙඳාම, මිනිසා සහ වනසතුන්

[ගරු සුසන්ත කුමාර නවරත්න මහතා]

අතර ගැටුම් වර්ධනය වීම නිසා වාර්ෂිකව මෙම සතුන් මෙන්ම මිනිස් ජීවිත ද විශාල වශයෙන් අහිමි වන හෙයින් ද, නව ප්‍රතිපත්ති සහ සැලසුම් මඟින් ජාතික වනසතුන් කළමනාකරණ ප්‍රතිපත්තියක් සකස් කිරීම තිරසර සංවර්ධන අරමුණක් වන හෙයින් ද, එමඟින් සතුන්ගේ වාසස්ථාන ආරක්ෂා වීම, මිනිසා සහ වනසතුන් අතර ගැටුම් අවම වීම, ගොවි ජනතාවගේ ආර්ථික මට්ටම සහ සමාජ ජීවිතය උසස් වීම සිදු වන හෙයින් ද, ඒ සඳහා ක්‍රියාත්මක කළ හැකි ප්‍රායෝගික හා විද්‍යාත්මක නවීන ප්‍රතිපත්තියක් සහ ක්‍රමවේදයක් සකස් කර ක්‍රියාත්මක කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ පසුගිය කාලය පුරාවටම වනසතුන් සහ මිනිසා අතර තිබෙන ගැටුම, වනසතුන්-වනසතුන් අතරම තිබෙන ගැටුම, වනසතුන් සහ පරිසරය අතර තිබෙන ගැටුම, ජනතාව සහ පරිසරය අතර තිබෙන ගැටුම වැනි ගැටුම් නිසාම වර්තමානය වනවිට අපේ රටේ බොහොමයක් ජනතාව ප්‍රශ්නවලට මුහුණ දී තිබෙනවා. ඒ වාගේම වනසතුන් පවා විශාල ලෙස ගැටුම්වලට මුහුණ දී තිබෙනවා.

ප්‍රශ්නය බරපතළ වෙලා තිබෙනවා. ඒක නිසාම තමයි, මෙම යෝජනාව පාර්ලිමේන්තුවට ගේන්න මා අදහස් කළේ. විශේෂයෙන්ම වන සත්ව කළමනාකරණය කියන එක ඉතා වැදගත්. අපේ රටේ භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර 65,610ක් තිබෙනවා. අපේ රටේ ජනතාවට ජීවත් වෙන්න භූමිය වශයෙන් තිබෙන්නේ ඒකෙන් සියයට 48ක වාගේ ප්‍රමාණයක්. ඉතුරු ටික ගත්තොත්, වගුරු බිම් තිබෙනවා, ජලාශ තිබෙනවා. ඒ වාගේම සතුන්ට ජීවත් වෙන්න පුළුවන් ප්‍රදේශත් තිබෙනවා, බැරි ප්‍රදේශත් තිබෙනවා. ඒවාත් එක්ක ගත්තාම, මේ ප්‍රශ්නය බරපතළ වීම විසින් ගැටුම් වර්ධනය වෙලා තිබෙනවා.

මෙහිදී අපි හඳුනා ගන්න ඕනෑ දෙයක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ තමයි වනජීවී කළමනාකරණය කියන්නේ මොකක්ද කියන එක. පසුගිය කාලයේ බලයේ හිටපු පාලකයන් විසින් වනජීවී කළමනාකරණය, එහෙම නැත්නම් වන සත්ව කළමනාකරණය ගැන අවධානය යොමු කරලා තිබෙනවාද? වන සතුන් රැක ගැනීම වෙනුවෙන් අවධානය යොමු වෙලා තිබුණු බව ඇත්ත. අපි ඒකට ගරු කරනවා. ඒක කරන්න ඕනෑ. හැබැයි, වන සතුන් කළමනාකරණය වෙනුවෙන්, ඒ කියන්නේ පරිසර පද්ධතිය, අපේ රටේ භූ ගෝලීය පිහිටීම, ජනගහනයේ වර්ධනය, සත්ව ගහනයේ වර්ධනය එක්ක වන සතුන් කළමනාකරණය කිරීම වෙනුවෙන් ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීමට පසුගිය කාලයේ සමත් වෙලා නැහැ. වනජීවී කළමනාකරණය කියන්නේ "නිශ්චිත ඉලක්ක සපුරා ගැනීම සඳහා වනජීවී ගහනය හැසිරවීමේ විද්‍යාවයි" කියලා තොරතුරු අනුව අපි හඳුනා ගෙන තිබෙනවා. ඒ වාගේම එහි ප්‍රධාන කාරණයක් තිබෙනවා. වනජීවී ගහනයේ කොටසක් වන පරිසර පද්ධතිය සහ භූ දර්ශනවල අඛණ්ඩතාව පවත්වා ගැනීම සහ කළමනාකරණය කිරීම, වනජීවී ගහනය නිසා මානව ආහාර භෝග සහ වත්කම්වලට සිදු වන හානිය අවම කිරීම සඳහා හෝ පරිසර පද්ධතිය යම් කලින් තීරණය කළ තත්ත්වයකට ගෙන ඒම සහ වනජීවීන් පාලනය කිරීම කියන කාරණා එයට අයත්ව තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ වාගේම අනෙක් පැත්තෙන් ගත්තොත්, ලන්ඩන්හි ක්වීන් මේරි විශ්වවිද්‍යාලයේ පරීක්ෂණ වාර්තාවකට අනුව රටවල් කිහිපයක වන සතුන් කළමනාකරණය කරන්නේ කොහොමද කියලා තොරතුරු ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ රටවල් අතර ඇති උතුරු ඇමෙරිකාව, දකුණු අප්‍රිකාව, කෙන්යාව, ඉන්දියාව ආදි රටවල් ගෙන බලමු. උතුරු ඇමෙරිකාවේ වනජීවී හිමිකාරිත්වය තිබෙන්නේ මහ ජනතාවට. දකුණු අප්‍රිකාවේ පෞද්ගලික පාර්ශ්වයට. කෙන්යාවේ සහ ඉන්දියාවේ වනජීවී හිමිකාරිත්වය තිබෙන්නේ පාරිසරික හා සංචාරක ක්ෂේත්‍රයට. ඒ රටවල් වනජීවී කළමනාකරණය සඳහා මූල්‍ය පහසුකම් සපයා ගන්නේ කොහොමද? ඒ සඳහා උතුරු ඇමෙරිකාවේ මහජන බදු මුදල් පාවිච්චි කරනවා. දකුණු අප්‍රිකාවේ පාරිසරික හා සංචාරක ක්ෂේත්‍ර මඟින් මුදල් සපයා ගන්නවා. පාරිසරික හා සංචාරක ක්ෂේත්‍රය මඟින් කෙන්යානු සහ ඉන්දියානු රජය මුදල් සපයා ගන්නවා.

මේ වනකොට අපේ රටේ වනඅලි සහ ජනතාව අතර තිබෙන ගැටුම ප්‍රධාන ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. වනඅලි සහ ජනතාව අතර තිබෙන ගැටුම නිරාකරණය කරන්න නම්, අපි විද්‍යාත්මක ක්‍රමයකට යන්න ඕනෑකම තිබෙනවා. අපි පසුගිය කාලයේ දිගින් දිගටම ඒ සඳහා යෝජනා ඉදිරිපත් කළා. අපි ස්තුතිවන්ත වෙනවා, ගරු ජනාධිපතිතුමා ඇතුළු කැබිනට් මණ්ඩලයට. විශේෂයෙන්ම වනඅලි කළමනාකරණය වෙනුවෙන් කැබිනට් මණ්ඩලයේ අනුමැතිය සහිතව මේ වනකොට කමිටුවක් ස්ථාපිත කරලා තිබෙන එක ගැන.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වනජීවී කළමනාකරණය සඳහා පවතින ක්‍රම මොනවාද? වනජීවී කළමනාකරණය සඳහා පවතින ක්‍රමවලදී, වාසස්ථාන, සම්පත් වෙනස් කිරීම, චර්යාත්මක ක්‍රම, භෞතික ක්‍රම, ජීව විද්‍යාත්මක ක්‍රම, ප්‍රතිශක්තිකරණ සහ උපත් පාලන ක්‍රම සහ සෘජු ගහන පාලනය දැක්විය හැකියි. වනජීවී කළමනාකරණය සඳහා මෙන්න මේ වාගේ ක්‍රම ප්‍රමාණයකුත් තිබෙනවා. හැබැයි, පසුගිය කාලයේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවත්, පරිසර අමාත්‍යාංශයත් මේ ක්‍රම හොඳින් අධ්‍යයනය කරලා අපේ රටේ මිනිසා සහ සත්වයා අතර තිබෙන ගැටුමත්, සත්වයා සහ පරිසරය අතර තිබෙන ගැටුමත්, සතුන්-සතුන් අතර තිබෙන ගැටුමත් පාලනය කිරීම වෙනුවෙන් අවධානය යොමු කරලා නැහැ. ඒ නිසා පරිසර අමාත්‍යාංශය විසින් ඉදිරියේදී ක්‍රියාත්මක කළ යුතු යෝජනාවක් විධියට මේ යෝජනාව ගැන අවධානය යොමු කරලා මේ සඳහා විද්‍යානුකූල ක්‍රමයක් අපේ රටේ ස්ථාපිත කරනවා නම් හොඳයි කියා මම මේ ගරු සභාවට යෝජනා කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
යෝජනාව ස්ථිර කිරීම, ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.04]

**ගරු උපුල් කිත්සිරි මහතා**
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු සුසන්ත කුමාර නවරත්න මන්ත්‍රීතුමා විසින් ගෙන එන ලද පෞද්ගලික මන්ත්‍රී යෝජනාව ඉතා කාලෝචිත යෝජනාවක්. ඒ වාගේම, එතුමා මේ අලි-මිනිස් ගැටුමට මුහුණ දෙන ප්‍රදේශයක් නියෝජනය කරන, එම ජනතාව වෙනුවෙන් පෙනී සිටින මන්ත්‍රීවරයෙක්.

වර්තමානයේ පරිසර අමාත්‍යාංශය මේ කරුණු පිළිබඳව විශේෂ අවධානයක් යොමු කර කඩිනමින් කටයුතු කරමින් ඉන්නවා. ඒ පිළිබඳව අපට සෑහීමකට පත් වෙන්න පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රට ජෛව විවිධත්වය අතින් අවස්ථා විශාල ප්‍රමාණයක් තිබෙන රටක්. ජෛව විවිධත්වය අතින් වැදගත් වාගේම, අපේ රට ඉතා කුඩා රටක්. මේ රට ඇතුළේ විවිධ සතුන්, වැඩි ජනගහනයක් ඉන්නවා වාගේම වනාන්තරත්

තිබෙනවා. අපේ රටේ සංවර්ධනය කරා යන ගමනේදී අපට මේවා ප්‍රධානම කාරණා බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා අපට මේ වනාන්තර මෙන්ම සතුන්ගේ ජීවිත පිළිබඳව අවධානය යොමු නොකර කටයුතු කරන්න බැහැ. මේ වෙනකොටත් අපේ රටේ මුළු භූමියෙන් සියයට 29ක විතර ප්‍රමාණයක තිබෙන්නේ වනාන්තර. ඒ වාගේම ජලාශවලට අයත් භූමිය සියයට 4ක වාගේ ප්‍රමාණයක් යැයි ගත්තොත්, සියයට 33ත්, 35ත් අතර ප්‍රමාණයක් මේ වනාන්තරවලට සහ සතුන්ට වෙන් වෙලා තිබෙනවා. ඉතිරි භූමියේ තමයි අපේ රටේ ජනතාව ජීවත් වෙන්නේ. ජෛව විවිධත්වයෙන් ඉහළ නිසා මේ භූමිය ඇතුළේ විවිධ සතුන් ජීවත් වනවා. ඒ නිසා තමයි වර්තමානය වන කොට අපට මේ තර්ජනය ඇවිල්ලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටක් හැටියට ගත්තත්, ආණ්ඩුවක් හැටියට ගත්තත් අපට මේ ගැටලුවට කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දිගු කාලීන යෝජනා ක්‍රියාත්මක කරන්න වෙනවා. එහිදී විශේෂයෙන් වනඅලි ඇතුළු වනසතුන්ගේ වාසස්ථාන, ඒ සතුන් ජීවත් වන ප්‍රදේශ ආරක්ෂා කරමින් අපට ඒ සතුන්ට අවශ්‍ය පහසුකම් ලබා දෙන්න වෙනවා. නවීන තාක්ෂණය අපට මේ සඳහා පාවිච්චි කරන්න වෙනවා. විශේෂයෙන් ගත්තොත්, AI තාක්ෂණය. ඒ තාක්ෂණය පාවිච්චි කරලා වනසතුන්ගෙන් එන තර්ජන අපට අඩු කර ගන්න පුළුවන්. ඒ වාගේම ගොවි ජනතාවටත් මේ වනසතුන් පිළිබඳව, වනාන්තර ආරක්ෂා කිරීම පිළිබඳව මහ පෙන්වීම ඉතාම වැදගත් වනවා. ඒ මහ පෙන්වීම ඔවුන්ගේ වගා ආරක්ෂා කිරීම සඳහාත්, වනසතුන්ගේ පැවැත්ම සඳහාත් විශේෂයෙන් වැදගත් වෙනවා. සමහර විට මේ ක්‍රියාදාමයේදී, අපට නීති පද්ධතියක් අලුතින් හදන්න වෙයි. මොකද, පරිසරය ආරක්ෂා කරන්න අලුත් නීති පද්ධතියක් අවශ්‍යයි. පරිසරයට වාගේම මිනිසා වෙනුවෙනුත් අපට ඒවා ඇති කරන්න වෙනවා. ඒ නිසා මම මුලින් කිව්වා වාගේම සුසන්ත කුමාර නවරත්න මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාව ඇතුළේ අපි විශේෂයෙන්ම අවධානය යොමු කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා.

අපේ රට මුහුදෙන් වට වූ කුඩා රටක්. විශේෂයෙන් ජෛව විවිධත්වය අතින් අනූන රටක්. ඒ නිසා වනාන්තර වාගේම සතුන් පිළිබඳ මේ සියලු කාරණා අපට අවබෝධ කර ගන්න වෙනවා. කෘෂිකර්මාන්තය අපේ ප්‍රධාන ජීවනෝපායක්. ඒ වාගේම සංචාරක කර්මාන්තය සඳහාත් අපේ මේ පරිසර පද්ධති යොදා ගන්න පුළුවන්. ඒ නිසාම සෑම ආකාරයෙන්ම පරිසර පද්ධතිය ආරක්ෂා කර ගනිමින් ජන ජීවිතය නඟාසිටුවීම සහ වනසතුන් ආරක්ෂා කර ගැනීම සඳහා ගෙන එන ලද මේ යෝජනාව කාලෝචිත යෝජනාවක්. ඉදිරියේදී මේ පිළිබඳව රජයක් හැටියට විශේෂ අවධානය යොමු කරලා, මීට අදාළ අණ පනත් ක්‍රියාත්මක කරලා පරිසරයත්, මිනිසාත්, වනසතුන් හා මේ සියලු දේවල් ආරක්ෂා කර ගනිමින් අපේ රටේ ඒ සංවර්ධන ක්‍රියාදාමය ඉදිරියට ගෙන යන්න ඕනෑය කියන අදහස ඉදිරිපත් කරමින්, ගරු සුසන්ත කුමාර නවරත්න මන්ත්‍රීතුමා විසින් ගෙන එන ලද යෝජනාව මා ස්ථිර කරනවා.

ස්තුතියි.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.08]

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම වැදගත් කාරණයක් අපේ සුසන්ත කුමාර නවරත්න මැතිතුමා මතු කරලා තිබෙන්නේ. ඒ ගැන එතුමාට ඉතාම ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන් අපේ රටේ තිබෙන ජෛව විවිධත්වයත් එක්ක සතුන් විශාල ප්‍රමාණයක් අපේ පරිසර පද්ධතිය තුළ ජීවත් වනවා.

එතුමා මතක් කර තිබෙන තවත් කාරණා තමයි, නීති විරෝධී වනසතුන් වෙළඳාම සහ සතුන් සහ මිනිසුන් අතර ඇති වෙලා තිබෙන ගැටුම පිළිබඳ කාරණා. විශේෂයෙන් human-elephant conflict එක ගැන අපි කථා කළොත්, මම ගන්න කැමැතියි, 2024, 2025ට අදාළ තොරතුරු. ගිය වසරේ ඔක්තෝබර් වෙනකොට ලංකාවේ අලි-මිනිස් ගැටුමෙන් මිනිස්සු 113ක් මිය ගිහිල්ලා තිබෙනවා. ඒ වාගේම අලින් 314ක් මිය ගිහිල්ලා තිබෙනවා. මිය ගිහිල්ලා තිබෙන අලින්ගෙන් 53 දෙනෙක් මිය ගොස් තිබෙන්නේ gunshotsවලින්. ඒ කියන්නේ වෙඩි තියලා තමයි මරලා තිබෙන්නේ. ඊළඟට, විදුලි සැර වැදීමෙන් 44ක්, හක්කපටස්වලින් 35ක්, දුම්රිය අනතුරුවලින් 14ක්, ඒ වාගේම නොදන්නා සහ සාමාන්‍ය තත්ත්ව යටතේ අලින් 168ක් මිය ගිහිල්ලා තිබෙනවා. ඒක ඇත්ත වශයෙන්ම ඉතාම ඛේදජනක තත්ත්වයක්. මොකද එක පැත්තකින් ගත්තාම, ලංකාවේ අලි ගහනය වර්ධනය රටට ලොකු වටිනාකමක් එකතු කරනවා. අනෙක් පැත්තෙන් ගත්තාම, අලින්ගෙන් පරිසරයට හානියක් නොවුණත් මිනිසුන් වන අපේම ක්‍රියාකාරකම් නිසා, එනම් අලි ඇතුන්ට ගමන් කරන්න තිබුණු පාරවල් අහිමි කිරීම ආදිය නිසා අලි පහරදීම්වලින් මරණයට පත්වන මිනිස් ජීවිත සංඛ්‍යාව, විනාශ වන ගෙවල් සංඛ්‍යාව වැඩි වෙලා තිබෙනවා. කෙතරම් අපේක්ෂා කළත් ඒ සඳහා ස්ථිරසාර විසඳුමක් සොයා ගන්න බැරි තැනකට මේ කාරණය තල්ලු වෙලා තිබෙනවා. අද වන කොට ලංකාවේ අලි ගැවසෙන ප්‍රදේශවල, විශේෂයෙන්ම අපේ දිස්ත්‍රික්කයේ ගල්ගමුව, යාපහුව, නිකවැරටිය ආදි ප්‍රදේශවල මිනිසුන් කොටු වෙලා ඉන්නවා. තමන්ගේ ගෙදර වටේ විදුලි වැට ගහගෙන කොටු වෙලා ඉන්නවා, අලි හොඳට ඇවිදිනවා. අපේ ගරු ඇමතිතුමාත් මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. මා හිතන විධියට, එතුමාටත් මේ කාරණය හොඳට තේරෙනවා. දැන් වෙලා තිබෙන්නේ මොකක්ද? මිනිස්සු කොටු වෙලා ඉන්නවා, අලි කැමැති විධියට ඇවිදිනවා. අපි දැන් එතැනට තල්ලු වෙලා ඉන්නේ. ඒ, මෙම ගැටලුවට නිවැරදි විසඳුමක් නොලැබීම නිසායි. එහෙම නම්, මේ ගැටලුවට ස්ථිරසාර විසඳුමක් අවශ්‍යයි. මම වයඹ පළාතේ මහ ඇමතිවරයා හැටියට සිටි කාලයේදීත් කිලෝමීටර 159ක් දිග අලි වැටක් ඉදි කළා, කුරුණෑගල දිස්ත්‍රික්කයේ විශාල ප්‍රදේශයක් ආවරණය වන පරිදි. නමුත් අපට ඒක කර ගන්න බැරි තැනකට තල්ලු වුණා. ඒ නිසා අපි මේ ගැටලුවට ස්ථිරසාර විසඳුමක් සොයා ගන්න අවශ්‍යයි. ඒ වාගේම, සතුන්ගේ වාසස්ථාන ආරක්ෂා වීමත් වැදගත් වනවා.

ශ්‍රී ලංකාවේ වන සතුන් කළමනාකරණය කිරීම සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සම්බන්ධව තමයි ගරු සුසන්ත කුමාර නවරත්න මැතිතුමාගේ මේ යෝජනාවේ තිබෙන්නේ. මේ සම්බන්ධයෙන් අතීතයේ කරපු researches ගණනාවක් තිබෙනවා. ඒවා කරපු අය ඉන්නවා. ඒ අනුව ප්‍රතිපත්ති ගණනාවක් හදලා තිබෙනවා. අපි රජයෙන්, තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිනවා ඒවා ක්‍රියාත්මක කරන්න පුළුවන් ස්ථිරසාර වැඩ පිළිවෙළක් හදන්න කියලා. එම යෝජනාවත් කරමින් මේ යෝජනාව ගෙන ඒම ගැන ගරු සුසන්ත කුමාර නවරත්න මැතිතුමාට ස්තුතිය පුද කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.12]

**ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා**
(மாண்புமிகு (கலாநிதி) நந்தன மில்லகல)
(The Hon. (Dr.) Nandana Millagala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

ශ්‍රී ලංකාවේ වන සතුන් කළමනාකරණය කිරීම සඳහා වන ජාතික ප්‍රතිපත්තියක් සහ ක්‍රමයක් සකස් කිරීම සඳහා ගරු සුසන්ත කුමාර නවරත්න, අපේ සහෝදර මන්ත්‍රීතුමා ඉදිරිපත් කර තිබෙන මේ යෝජනාව මඟින් මා හිතන විධියට එතුමා බලාපොරොත්තු වන්නේ, කෙටි කාල සීමාවක් තුළ වුවත් මේ පාර්ලිමේන්තුව තුළ ඉදිරිපත් වන විවිධ අදහස් ඇසුරින් මේ ප්‍රශ්නය විසඳා ගැනීම සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා වන වැදගත් අදහස් ටිකක් ගොනු කර ගැනීමටයි. ඒ නිසා මා මෙහි පසුබිම පිළිබඳව පැහැදිලි කරන්න යන්නේ නැහැ. නමුත් මම යෝජනා කිහිපයක් ඉදිරිපත් කරන්න කැමැතියි.

මේ කියන ජාතික ප්‍රතිපත්තිය ප්‍රධාන වශයෙන් කරුණු කිහිපයක් පදනම් කරගෙන සකස් වෙනවා නම් ඉතා වැදගත් කියලා මා හිතනවා, ගරු සුසන්ත කුමාර නවරත්න මන්ත්‍රීතුමනි. එකක් තමයි විද්‍යාත්මක හා තාක්ෂණික විසඳුම් භාවිතය. ඒ යටතේ සාම්ප්‍රදායික අලි වැට මත පමණක්ම යැපෙන්නේ නැතුව GPS තාක්ෂණය වාගේ නවීන තාක්ෂණය යොදා ගැනීම, ඩ්‍රෝන තාක්ෂණය සහ කෘත්‍රිම බුද්ධිය සහිත කැමරා පද්ධති මඟින් වන සතුන්ගේ ගමන් මාර්ග කල් තියා හඳුනා ගැනීම, ජනාවාස වට නොකර වනාන්තර සීමා නිවැරැදිව ලකුණු කරමින් විදුලි වැට ඉදි කිරීම සහ ප්‍රජා නඩත්තු සහා හරහා ඒවා ශක්තිමත්ව පවත්වාගෙන යෑම වාගේ ක්‍රියාමාර්ග ගන්න අපට පුළුවන්. ප්‍රතිපත්තිමය වශයෙන් මෙවැනි යෝජනා ගෙනෙන්න අපට පුළුවන්. ඒ වාගේම, වනජීවී වාසස්ථාන සුරක්ෂිත කිරීම හා සංවර්ධනය කිරීම සඳහාත් අපි ප්‍රතිපත්ති සකස් කළ යුතු වෙනවා.

විශේෂයෙන් වනාන්තර කැබැලි වීම නිසා තමයි ගොඩක් වෙලාවට වන සතුන් සහ මිනිසුන් අතර මේ කියන ගැටලුව ඇති වෙලා තිබෙන්නේ. ඒ තත්ත්වය පාලනය කර ගැනීම සඳහා වනාන්තර අභ්‍යන්තරයේ වන සතුන්ට අවශ්‍ය ආහාර භෝග සහ ජල මූලාශ්‍ර නිර්මාණය කිරීමෙන් එම සතුන් ගම් වැදීම විශාල වශයෙන් අවම කර ගන්න අපට පුළුවන්කම තිබෙනවා.

ඊළඟට, සාධාරණ වන්දි ක්‍රමයක් හා රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීම වැදගත් වනවා. අපි ඒ දිහා මානව කේන්ද්‍රීය දෘෂ්ටියකින් බැලුවොත්, මිනිසුන්ගේ විනාශ වන භෝග සඳහා සාධාරණ වන්දි ක්‍රමයක් වාගේම, වන සත්ව හානි රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීම වාගේ දෙයකුත් මේ ප්‍රතිපත්ති අතරට එකතු කිරීම වැදගත් වනවා. ඒ වාගේම, ප්‍රජාව මුල් කරගත් කළමනාකරණය කියලා ප්‍රතිපත්ති සීමාවක් හඳුන්වා දෙන්නත් අපට පුළුවන්. විශේෂයෙන් වනජීවී සංරක්ෂණය කියන්නේ නිලධාරින්ට විතරක් කරන්න පුළුවන් දෙයක් නොවෙයි. ප්‍රදේශයේ ජනතාව, ගොවි සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන ඒකාබද්ධ කරගත් කමිටු හරහා වන සතුන් පාලනය සහ පරිසර සංරක්ෂණය සමගාමීව කළ යුතුයි. එම නිසා ඒ පැත්ත ගැනත් අපේ අවධානය යොමු කරන එක වැදගත්.

විශේෂයෙන්ම මෙහිදී නීතිමය සහ පාරිසරික සමතුලිතතාව පවත්වා ගැනීමත් වැදගත් වනවා. මෙහිදී තමයි අප කලින් සඳහන් කළ ගහන පාලනය වාගේ දේවල් ජාත්‍යන්තර ප්‍රමිතිවලට අනුව සකස් කිරීම වැදගත් වන්නේ. ඉතින් අප සකස් කරන කළමනාකරණ ප්‍රතිපත්තිවලදී මෙන්න මේ වාගේ පැති කෙරෙහි ද අවධානය යොමු කරලා කරුණු එකතු කර ගැනීම වැදගත් කියා මම කල්පනා කරනවා.

මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.16]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු සුසන්ත කුමාර නවරත්න මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ මෙම යෝජනාව ඉතාම කාලීන, ඒ වාගේම ඉතාම වැදගත් යෝජනාවක්. මක් නිසාද, අපේ රටේ තිබෙන සීමිත ඉඩම් ප්‍රමාණයත්, ජනගහනය පැතිර යෑමේ ස්වභාවයත්, කෘෂි කාර්මික රටක් හැටියට අපේ සාම්ප්‍රදායානුකූල පරිචයනුත් එක්ක වන සතුන් සහ මිනිසුන් අතර වූ අරගළය අද ඉතා බැරෑරුම් තත්ත්වයට පත් වෙලා තිබෙනවා. අපට වන සතුන් සිටිය යුතුයි. ඒ වාගේම මිනිසුන්ගේ යහපත ගැනත් කල්පනා කළ යුතුයි. අපේ මූලික ආහාර අවශ්‍යතා සපුරා ගැනීමේදී එක පැත්තකින් වගා කටයුතු සඳහා සශ්‍රීක භූමි භාවිත කරන අතරම, අනෙක් පැත්තෙන් මේ පද්ධතියේම ඉතා වටිනා කොටසක් වන වන සතුන් ආරක්ෂා කිරීම ගැනත් අපේ අවධානය යොමු විය යුතුයි. විශේෂයෙන්ම අද අලි-මිනිස් ගැටුම ඉතා ගැඹුරු ලෙස පවතින අතරම, අනෙක් අතට විවිධ සතුන්ගෙන් ගොවීන්ට සිදු වන හානිය ද වැඩි වෙමින් තිබෙනවා. එම නිසා එම අර්බුද කළමනාකරණය ඉතා වැදගත් වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම රටේ දේශපාලනික කළමනාකරණය පැත්තෙනුත් ගැඹුරු අර්බුදයක් මතු වෙලා තිබෙනවා. ඒ තමයි, විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙන එනවා කියා ආණ්ඩුව බොහොම දැඩිව ප්‍රකාශ කිරීම. නීතිපතිවරයාට යොමු කළ එම කෙටුම්පත කැබිනට් මණ්ඩලය සඳුදා අනුමත කළා. සඳුදා රාත්‍රියේ ගැසට් පත්‍රයේ පළ කරනවා කිව්වත්, අද වනකල්ම විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අදාළ පනත් කෙටුම්පත ගැසට් පත්‍රයේ පළ කරලා නැහැ. ඒ වාගේම, එය අඟහරුවාදාත් පළ කරලා නැහැ, බදාදාත් පළ කරලා නැහැ, බ්‍රහස්පතින්දාත් පළ කරලා නැහැ. අපි බලාපොරොත්තු වෙනවා, එය අදවත් ගැසට් පත්‍රයේ පළ කරයි කියලා. මොකද, මේ තිබෙන තත්ත්වය ඉතාම අවිනිශ්චිත තත්ත්වයක්. ආණ්ඩුවටත් ෂුවර් නැහැ, මොකක්ද කරන්නේ කියලා. මොකක්ද ඉදිරිපත් කරන යෝජනාව, මොකක්ද ඉදිරිපත් කරන කෙටුම්පත කියලා අවබෝධයක් ආණ්ඩුවටත් නැහැ. ඒකට කොටස් එකතු කරනවා, වැඩි කරනවා, මාරු කරනවා, type කරනවා, ආපහු දානවා, ආපහු ගෙන්වා ගන්නවා, ගැසට් එක ගහන්න එපා කියනවා, ඒ වාගේම රජයේ මුද්‍රණාලයාධිපතිට උපදෙස් දෙනවා ඒක ආපහු අරගෙන එන්න කියලා. ඒ කියන්නේ, ආණ්ඩුව කරන්නේ මොකක්ද කියලා ආණ්ඩුවටම තේරුමක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විෂය භාර ඇමතිතුමා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ අක්ෂර වින්‍යාස හදද්දී රටේ බන්ධනාගාර පුපුරනවා. ඒක කුමන්ත්‍රණයක් කියලා සරලව ගන්න බැහැ. 10,000කට ආසන්න සිරකරුවන්ට ප්‍රමාණවත් වන පරිදි හදලා තිබෙන බන්ධනාගාර පද්ධතිය තුළ රැඳවියන් 42,000ක් සිර කරලා තිබෙනවා. ඒක අලුත් ප්‍රශ්නයක් නොවෙයි. හැබැයි, මේ ආණ්ඩුව ආවාට පස්සේ ප්‍රශ්නය වැඩි වෙලා තිබෙනවා; කළමනාකරණය පැත්තකට ගිහින් තිබෙනවා. නීතියේ ඇති අඩුපාඩුවක් නිසා ඇප දීම සම්පූර්ණයෙන් අත්හිටුවා තිබෙනවා. නිර්දෝෂීභාවයේ පූර්ව නිගමනයක් තිබුණත්, නිර්දෝෂීභාවයේ පූර්ව නිගමනය සහිත පුද්ගලයෝ ආසන්න වශයෙන් 22,000කට වැඩි පිරිසක් බලාපොරොත්තුවක් නැතිව බන්ධනාගාරවල ඉන්නවා. අධිකරණවල විනිශ්චයකාරවරුන්ට තීරණ ගන්න බැහැ, නීතියේ තිබෙන අවුල නිසා. ආණ්ඩුව නීතියේ තිබෙන අඩුපාඩු හදන්නේත් නැහැ, ඒවා විසඳන්න ඉක්මනින් මැදිහත් වන්නේත් නැහැ. හැබැයි, ඒවා ඔක්කෝම තිබියදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත ගැන ආණ්ඩුව උදේ සවස කල්පනා කරමින් ඉන්නවා. එම නිසා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, අඩු ගණනේ අද රාත්‍රියේදීවත් ඊට අදාළ ගැසට් එක ගහන්න කියලා. මොකද, රටේ මිනිසුන් දැන ගන්න ඕනෑ, විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා මොකක්ද කරන්න යන්නේ කියලා. ඉක්මන් කරලා ඒ ගැසට් එක ගහන්න. එතකොට අපි දන්නවා කරන්නේ මොකක්ද කියලා. නැත්නම් අපට අන්ධකාරයේ අතපත ගාමින් තමයි කථා කරන්න වෙන්නේ. ඔබතුමන්ලා එකක් කියනවා, අපි එකක් කියනවා. මොකක්ද හරියටම කරන්න යන්නේ කියලා දැනගන්න අද රාත්‍රියේවත් ඒ ගැසට් එක ගහන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දම්මික පටබැඳි ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.20]

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු සුසන්ත කුමාර නවරත්න මන්ත්‍රීතුමා වනසතුන් කළමනාකරණය සඳහා ජාතික ප්‍රතිපත්තියක් සහ ක්‍රමයක් සකස් කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කිරීම ගැන අපි එතුමාට ස්තුතිවන්ත වෙනවා. මෙවැනි යෝජනාවක් ඉතාම කාලෝචිතයි. අපේ රජය යටතේ ඒ සඳහා කටයුතු කරමින් ඉන්නවා.

පසුගිය කාලයේ අපේ රටේ පැවති පාලනයන් අනුගමනය කළ ප්‍රතිපත්ති විසින් අද වෙනකොට අපේ රටේ මිනිසා සහ වන සතුන් අතර ගැටුම උග්‍ර වෙලා තිබෙනවා. මේ ගැන කරුණු දක්වමින් ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා බොහොම උද්වේගයෙන් කථා කළා; සංඛ්‍යා ලේඛන ගණනාවක් ඉදිරිපත් කළා. ඒ සංඛ්‍යා ඒ තරම් ඉහළ අගයකට ගෙන ඒව සම්බන්ධයෙන් එතුමාත් වග කියන්න ඕනෑ. කුරුණෑගල දිස්ත්‍රික්කයේ අලි-මිනිස් ගැටුම ඉතාම ඉහළ අඩියක තිබෙනවා, ඉතාම තීව්‍ර වෙලා තිබෙනවා. එතුමාත් පසුගිය පාලන කාලවල ඇමති ධුර දරමින් කටයුතු කළා. ඒ මිනිස් මරණ, ඒ අලි මරණ ඒ තරම් ඉහළ අගයකට ඒම සම්න්ධයෙන් එතුමාත් වග කියන්න ඕනෑ. දෛවරයේ සරදම වෙලා තිබෙන්නේ මේකයි. එතුමන්ලා වසර ගණනාවක්, දශක ගණනාවක් මේ රට පාලනය කරලා, ඒ ප්‍රශ්න තීව්‍ර කරලා අද එතුමන්ලාට සිද්ධ වෙලා තිබෙනවා ජාතික ජන බලවේග ආණ්ඩුවෙන් ඒ මිනිස් මරණ, අලි මරණ අඩු කරලා දෙන්න කියලා ඉල්ලන්න. *[බාධා කිරීමක්]* ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, අපි ඒ වෙනස කරනවා. ඒ වෙනස කරන්න තමයි අපි මේ රජය භාරගෙන තිබෙන්නේ, ඒ වෙනස කරන්න තමයි මේ රටේ ජනතාව අපට මේ ජන වරම ලබා දීලා තිබෙන්නේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා මගේ නම කිව්වා.

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාව ඉවර කළාට පස්සේ, පිළිතුරු කථාව කළාට පස්සේ එතුමාට අවස්ථාව දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
හැම එකකටම තිබුණු ආණ්ඩුවලට බණින්න නොවෙයි නේ ඔබතුමන්ලා ගෙනාවේ මහත්තයෝ. ඔය වැඬේ කරන්න එපා. මම හිතුවා ඔබතුමා ටිකක් ඉගෙන ගත්ත මනුස්සයෙක් කියලා. ඔබතුමා වෛද්‍යවරයෙක් නේද? අපි හොඳ කාරණයක් කිව්වේ. අවුරුදු දෙකක් තිස්සේ තමුන්නාන්සේලා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

විකාර කථා කරන්නේ නැතිව වෙන මොකක් හරි කියන්න.

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, කේන්ති ගන්න එපා. මම කිව්වේ ඇත්ත; මම කිව්වේ සත්‍ය කරුණු. ඒ සත්‍ය ප්‍රකාශ කිරීම ගැන කේන්ති ගන්න එපා. කරුණාකරලා සාවධානව අහගෙන ඉන්න. අපි මේ ප්‍රශ්නය විසඳනවා. ඔබතුමන්ලා මිනිස් මරණ වැඩි කළ එක, ඔබතුමන්ලා අලි මරණ වැඩි කළ එක අඩු කරලා, අපි ඒ ප්‍රශ්නයට නිවැරදි පිළිතුරක් ලබා දෙනවා. කේන්ති ගන්න එපා, ඔබතුමාට කේන්ති ගන්න තිබුණේ මීට කලින්. ඔබතුමන්ලා මේ රට පාලනය කරන සමයේ දේශපාලන බලපෑම් කරලා අලි මරණ, මිනිස් මරණ වැඩි කරන්න කටයුතු කළා. ඒ කාලයේ ඔය කේන්තිය ගත්තා නම්, ඒ කාලයේ වැඩිපුර අවධානය යොමු කළා නම්, අලි මරණ මිනිස් මරණ අඩු කරන්න තිබුණා. අපි දැන් ඒ දේ කරනවා. ඒ වෙනස කිරීමට අදාළ ක්‍රියාමාර්ග දැන් අපි අරගෙන තිබෙනවා. මම ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ කරුණාකරලා මේ සභාව අපකීර්තියට නොකර, කේන්ති නොගෙන මේ කියන පැහැදිලි කිරීම අහගෙන ඉන්න කියලායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි පිළිගන්නවා අද වන සතුන් සහ මිනිසුන් අතර ගැටුම යම් තීව්‍රතාවකට ඇවිල්ලා තිබෙනවා කියලා. ඒ සඳහා හේතු වූ කාරණා බොහොමයක්

[ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා]

තිබෙනවා. අපි ඒ කාරණා හඳුනාගෙන තිබෙනවා. කාලයක් තිස්සේ, දශක ගණනාවක් තිස්සේ අපේ රටේ පැවතුණු වැරදි දේශපාලන සංස්කෘතිය, අපේ රටේ ජනගහන වර්ධනය, නාගරීකරණය, අවිධිමත් සංවර්ධනය, දේශගුණික විපර්යාස වාගේ හේතු නිසා අපේ රටේ අලි-මිනිස් ගැටුම ඇතුළු ගැටලු උග්‍ර වෙලා තිබෙනවා. නමුත්, අලි-මිනිස් ගැටුම විසඳීම සඳහා පසුගිය කාලයේ විවිධ ප්‍රයත්න දරා තිබෙනවා. විශේෂයෙන්ම 1990 වසරේදී පළමුව ජාතික වනජීවී සංරක්ෂණ ප්‍රතිපත්තිය හඳුන්වා දීලා, 2000 වසරේදී එම ප්‍රතිපත්තිය යාවත්කාලීන කරලා ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය අරගෙන තිබෙනවා. වන සතුන් කළමනාකරණය සඳහා අපේ රටේ නීති ගොඩක් තිබුණා. විශේෂයෙන්ම වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක පනත, ජාතික පාරිසරික පනත, වන සංරක්ෂණ ආඥා පනත, ධීවර හා ජලජ සම්පත් පනත හා වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනත වාගේ අණපනත් ගොඩක් තිබුණා. ඒ වාගේ නීති ගොඩක් තිබුණා. නමුත්, එම අණපනත් ඇතුළු නීති ඒ ආකාරයෙන් ක්‍රියාත්මක කරන්න ප්‍රධාන බාධාව වෙලා තිබුණේ එවකට අපේ රටේ පැවැති දේශපාලන සංස්කෘතියයි. ඒ කාලයේ මේ රට පාලනය කළ දේශපාලනඥයන් එම නීති, අණපනත් හරිහැටි අපේ රටේ ස්ථාපිත කරන්න, ක්‍රියාත්මක කරන්න ඉඩකඩ ලබා දුන්නේ නැහැ. ඒ නිසා මේ ගැටලු සැලකිය යුතු පමණින් උග්‍ර වෙලා තිබෙනවා. අපේ රට මීට අදාළ ජාත්‍යන්තර සම්මුති ගණනාකාවකට එළැඹිලා තිබෙනවා. විශේෂයෙන්ම ජෛව විවිධත්වය පිළිබඳ සම්මුතිය, අන්තරායට ලක් වූ වන සත්ව හා ශාක විශේෂවල ජාත්‍යන්තර වෙළෙඳාම පිළිබඳ සම්මුතිය - CITES, රැම්සාර් සම්මුතිය, සංක්‍රමණික වන සත්ව විශේෂ සංරක්ෂණය පිළිබඳ සම්මුතිය, ලෝක සංස්කෘතික හා ස්වාභාවික උරුමයන් ආරක්ෂා කිරීමේ යුනෙස්කෝ සම්මුතිය ආදි සම්මුති ගණනාවකට අපි රටක් හැටියට එකඟ වෙලා, අත්සන් කරලා තිබෙනවා. මෙන්න මේ සම්මුති ඇතුළේත්, අපේ රටේ තිබෙන විවිධ අණපනත් ඇතුළේත් පවතින නීති ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කරමින් ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු සුසන්ත කුමාර නවරත්න මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ මෙම යෝජනාව පරිදිම කටයුතු කරන්න අපි දැනටමත් ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. විශේෂයෙන්ම ඒ සඳහා අපි මේ රටේ දේශපාලන සංස්කෘතිය වෙනස් කරලා තිබෙනවා. ඒ අනුව අද අපේ රටේ පාරිසරික අණපනත් නිවැරදි ලෙස ස්ථාපිත කරන්නත්, ඒවා ක්‍රියාත්මක කරන්නත් පුළුවන් විධියේ වටපිටාවක් අපි සකස් කරලා තිබෙනවා. ඒ වාගේම අපේ රටේ මෙතෙක් කල් සිදු වුණු අවිධිමත් සංවර්ධනය නවත්වලා විධිමත් ක්‍රමයක් සහිතව මේ රටේ සංවර්ධන ක්‍රියාමාර්ග සැලසුම්ගත කරන්න අපි කටයුතු කරමින් ඉන්නවා.

වනසතුන් කළමනාකරණය කිරීමේදී ප්‍රධාන ගැටලුවක් වෙලා තිබුණා අපේ රටේ වනසතුන්ගේ ස්වාභාවික වාසභූමි විනාශ වෙච්ච එක. එම විනාශ වළක්වන්න අපි ක්‍රියාමාර්ග ගණනාවක් අරගෙන තිබෙනවා. ඉන් ප්‍රධාන ක්‍රියාමාර්ගය තමයි "වන සුරැකුම" කියන ඒකකය පිහිටුවීම. එම ඒකකය පිහිටෙව්වේ ත්‍රිවිධ හමුදාව, පොලිස් විශේෂ කාර්ය බලකාය, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සම්බන්ධ කරගනිමින්. ඒ, ඒකකය පිහිටුවලා පැය 24 පුරාම ක්‍රියාත්මක වන විධියට ලංකාවේ ඕනෑම තැනක වනඅපරාධයක් සිදු වනවා නම් 1995 කියන අංකයට දැනුම් දීලා, ඒ හරහා වනඅපරාධය වැළැක්වීමේ ක්‍රියාවලියක් අපි ආරම්භ කරලා තිබෙනවා. ඒ එක්කම අපි පසුගිය කාලය තුළ අපේ රටේ වන විනාශය වළක්වා තිබෙනවා. එපමණකින් නොනැවතී, අපි අපේ රටේ වනාන්තර රක්ෂිත ලෙස ප්‍රකාශයට පත් කරමින්, අපේ වන ගහනය වැඩි කරන්න වනාන්තර ආරක්ෂා කිරීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරලා තිබෙනවා. අපගේ පාලනයේ වසර දෙකක කාලය තුළ පමණක් රක්ෂිත 94ක් ප්‍රකාශයට පත් කරන්න අපි සමත් වෙලා තිබෙනවා. ඒ සඳහා අපට හැකියාව ලැබිලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අලි-මිනිස් ගැටුම අවම කරන්න අපි පසුගිය ජූනි 5වැනි දා අලි කොරිඩෝ තුනක් ප්‍රකාශයට පත් කළා. ඒ වාගේම අපි අභයභූමි ප්‍රකාශයට පත් කරලා තිබෙනවා. අපේ රටේ අලි-මිනිස් ගැටුම විසඳීම සඳහා-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)
මට තව පොඩි කාලයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

වනඅලි-මිනිස් ගැටුම විසඳීමට අපි නව ජාතික ක්‍රියාකාරී සැලැස්මක් සෑදීම සඳහා විශේෂඥ කමිටුවක් පත් කළා. එම කමිටුව රැස් කරලා ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. අපේ රටේ වඳ වී යන සත්වයෙක් වන ශ්‍රී ලාංකික දිවියා ආරක්ෂා කර ගැනීම සඳහා අපි මහ බළල් පවුලට අයත් සතුන් ආරක්ෂා කර ගැනීම සඳහා වන International Big Cat Alliance කියන සන්ධානයට සම්බන්ධ වෙලා තිබෙනවා. අපි ජාතික පාරිසරික පනත සංශෝධනය කරන්නත් බලාපොරොත්තු වනවා. අපේ රටේ සංරක්ෂණ ක්‍රියාදාම වැඩිදියුණු කරන්න අවශ්‍ය සංශෝධන අප එම පනත් කෙටුම්පතට ඇතුළත් කරලා තිබෙනවා.

ඒ නිසා ගරු සුසන්ත කුමාර නවරත්න මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ මෙම යෝජනාව අනුමත කරමින්, ඒ සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා කටයුතු කරන බවට සහතික වෙමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුසන්ත කුමාර නවරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.30]

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින ඉදිරිපත් කළ මාගේ පෞද්ගලික මන්ත්‍රී යෝජනාව ස්ථිර කරමින් කථා කළ උපුල් කිත්සිරි මන්ත්‍රීතුමාටත්, මේ යෝජනාව වෙනුවෙන් කථා කළ දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාටත්, අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමාටත්, ඇමතිතුමා විධියට කටයුතු කරන දම්මික පටබැඳි මැතිතුමාටත් මගේ ස්තුතිය පුද කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වනකොට අපේ රටේ වර්ධනය වෙලා තිබෙන ප්‍රශ්නය අපි කවුරුත් දන්නවා. වනඅලි ප්‍රශ්නය සහ වනඅලි කළමනාකරණයේ යම් යම් ගැටලු ඉතා බරපතළ තැනකට ඇවිල්ලා තිබෙනවා. මීට කලින් කථා කළ

මන්ත්‍රීතුමන්ලා ඉලක්කම් එක්ක ඒ තොරතුරු ඉදිරිපත් කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහර ඒවා ගැන කථා කරනකොට, ඇත්ත කියනකොට ගැරඬින්ට බූමිතෙල් ගහනවා වාගේ තමයි.

මම උදාහරණයක් කියන්නම්. බදුල්ල දිස්ත්‍රික්කයේ හල්දුම්මුල්ල බෝගහපැලැස්ස ප්‍රදේශයේ රක්ෂිතයේ හේන් වගාවේ නිරත පාරම්පරික ජනතාවක් ඉන්නවා. ඒ හේන් වගා කරන ජනතාවට මේ රක්ෂිතය වෙන් කරලා දීලා අලි වැටක් ගහලා තිබුණා. අලි වැටක් ගහලා රක්ෂිතය වෙන් කළා. ඒ වෙන් කරපු රක්ෂිතය පසුගිය කාලයේ අල්ලාගෙන බලහත්කාරකම් කළේ කවුද? රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාගේ උපදේශකයෙකු ඒවා අල්ලා ගෙන, අලි මරලා විවිධ දේවල් කළා. දැනට සති දෙකකට ඉස්සෙල්ලාත් වෙඩි තැබීම නිසා අලියෙක් මැරිලා තිබෙනවා. එහෙමයි ඒ අය ක්‍රියා කළේ.

2015-2019 කාලයේ නිවාස ඉදි කරනකොට අනුරාධපුර දිස්ත්‍රික්කයේ - මගේ දිස්ත්‍රික්කයේ - ශ්‍රාවස්තිපුර ප්‍රදේශයේ ඒ කාලයේ ඉඳලාම නම් කරපු අලි කොරිඩෝවක් තිබුණා. දැන් අපි ඒවා නැවත නම් කරමින් තිබෙනවා. අලි කොරිඩෝව කියලා තමයි ජනතාව ඒක හඳුනාගෙන තිබෙන්නේ. ඒ අලි කොරිඩෝව මැද්දේ නිවාස ව්‍යාපෘතියක් හැදුවා. ඒ වාගේම කහටගස්දිගිලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් වනජීවී කලාපය ඇතුළේ කනදරා රත්මලේ කියන ග්‍රාම නිලධාරි වසම තුළ නිවාස ව්‍යාපෘතියක් හදලා තිබෙනවා. මම ඊයේත් මේ පිළිබඳව පාර්ලිමේන්තුවේ ප්‍රශ්නයක් ඇහුවා. ඒ සමහර නිවාස හැදුවේ වන සංරක්ෂණ කලාප ඇතුළේ. මේ ප්‍රශ්නය වැඩි කරලා තිබෙන්නේ එහෙම. සමහර ඇත්ත කියනකොට ගැරඬින්ට බූමිතෙල් ගහනවා වාගේ තමයි කියලා මම කිව්වේ ඒකයි.

තව වෙලාවක මට ප්‍රශ්නයක් ආවා. මේ ඉදිරිපත් කරපු යෝජනාව සහ වන සත්ව කළමනාකරණය වෙනුවෙන් ප්‍රතිපත්තියක් හදන්න කියන එකයි, බන්ධනාගාරයයි අතර තිබෙන සම්බන්ධයයි මොකක්ද? මේ වෙලාවේ වන සිදුවීම් ඇතුළේ දැන් අපට තේරෙනවා, බන්ධනාගාර ඇතුළේ සැලසුම් සහගත ක්‍රියාවලියක් සිදු වන බව. දැන් මේ සිදුවෙමින් තිබෙන්නේ මොකක්ද කියලා අහනවා. ඒවාත් ප්‍රශ්න.

வடக்கு எங்களுடைய மாகாணம்; தமிழ், முஸ்லிம் மக்கள் மட்டுமன்றி வவுனியாவில் சிங்கள மக்களும்கூட வாழுகின்ற எங்களுடைய மாகாணம். ஆகவே, நீங்கள் மாகாண சபைத் தேர்தலை நடத்தினால், எங்களுடைய வடக்கு மாகாணத்தின் அபிவிருத்தியை நாங்களே பார்த்துக் கொள்வோம்! நீங்கள் பாராளுமன்றத்தில் வந்திருந்துகொண்டு, "வடக்கு மாகாணத்தில் 13,000 வீடுகளைக் கட்டித் தருவோம்" என்று 'பவ' அடிக்கிறீர்கள் ஐயா! தகரம் சேதமடைந்தால்கூட நட்ட ஈடு 500,000 ரூபாய் என்கின்றீர்கள்; 1,000,000 ரூபாய் என்கின்றீர்கள். ஆனால், ஒன்றுமே கொடுக்கவில்லை. போதாக்குறைக்கு சனாதிபதி அவர்களும் சொல்லியிருக் கின்றார்; "வடக்கு, கிழக்கில் போரால் இடம்பெயர்ந்த மக்களுக்கு 13,000 வீடுகள் கட்டிக் கொடுப்போம்" என்று. ஆனால், முல்லைத்தீவு கேப்பாப்புலவில் தங்கள் காணிகளைக் கேட்டுப் போராடுகிறார்கள். ரஜீவன் அண்ணா, எங்கே போகுறீங்கள்? நில்லுங்கள்!

பலாலியில் போய்ப் பாருங்கள், மக்கள் அங்கே உண்ணாவிரதம் இருக்கிறார்கள்! ஆகவே, சும்மா இங்கு வந்திருந்து, "நாடு வளர்ந்தால் வடக்கு வளரும்; வடக்கு வளர்ந்தால் வயிறு வளரும்" என்று கதைப்பதில் எந்தப் பிரயோசனமும் இல்லை. யாழ்ப்பாணத்தில் இருந்து ஒரு பாராளுமன்ற உறுப்பினராக வந்தவர் நீங்கள். உங்களுக்கு மனச்சுத்தியோடு கதைக்கத் தெரிய வேண்டும். முதலில் என்ன கதைக்கின்றோம் என்பது விளங்க வேண்டும். யாரோ எழுதித் தருவதை வாசிப்பதற்குத்தான் பாராளுமன்றத் துக்கு வருகிறீர்கள் என்று சொன்னால், பாராளுமன்றம் தேவை யில்லை! அதனால்தான் நான் இந்தப் பாராளுமன்றத்தில் இருந்து விடைபெற்றுச் செல்வதற்குத் தயாராக இருக்கிறேன்.

2009இல் தேசியத் தலைவர் பிரபாகரன் இல்லாமற்போன பிறகு, வடக்கு மாகாணத்தில் 17 வருடங்களாக நம்பிக்கை யில்லாமல் வாழுகின்ற ஒரு சமூகத்துக்கு நம்பிக்கையைக் கொண்டுவர வேண்டுமென்றுதான் நான் உங்களிடம் கேட்கின்றேன். அங்கு உங்களுடைய சனாதிபதி வந்தார்; Jumperருடன் நடந்தார். அவரிடம் கேளுங்கள், வடக்கு மாகாண சபைத் தேர்தலை நடத்தச் சொல்லி. ரஜீவன் அவர்கள் எழுந்து வெளியில் ஓடிவிட்டார். வடக்கு மாகாணத்தை இவர்கள் அபிவிருத்தி செய்வார்கள் என்று, மூன்று பேருக்கு 93,000 வாக்குகளை அளித்த எங்களுடைய தமிழ்ச் சமூகம் இன்றைக்கு பலாலியில், கேப்பாப்புலவில், தையிட்டியில் போய் அழுது, பிச்சை எடுக்கிறார்கள். அங்கு வசாவிளானில், மயிலிட்டியில் நடப்பது எதுவுமே உங்களுக்குத் தெரிவதில்லை. இதுதான் எங்களுடைய நாட்டில் இருக்கின்ற நிலைமை! சும்மா வந்து அங்கே 'මුල්ගල්' வைக்கிறது; இங்கே 'මුල්ගල්' வைக்கிறது;

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම කථාව අවසන් කරන්නම්, තත්පර 20ක් දෙන්න.

அதற்குப் பிறகு வயிற்றைத் தள்ளிக்கொண்டுபோய் நெடுந் தீவில் நிற்பது; அதற்குப் பிறகு மற்றவனைத் தள்ளிக்கொண்டு வந்து திரும்ப யாழ்ப்பாணத்தில் நிற்பது. இவற்றை விட்டுவிட்டு மக்களுக்காக மனச்சுத்தியோடு ஏதாவது நான்கு வசனங்களைக் கதைக்கப் பழகுங்கள்! நன்றி!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු දිනේෂ් හේමන්ත මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි තුනක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.08]

**ගරු දිනේෂ් හේමන්ත මහතා**
(மாண்புமிகு தினேஷ் ஹேமந்த)
(The Hon. Dinesh Hemantha)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගරු ෂාණක්කියන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා අද දවසේ පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ඉදිරිපත් කර තිබෙන්නේ, සංවර්ධනයේ විෂමතා තිබෙන පළාත් දෙකක් වන උතුරු පළාත සහ නැඟෙනහිර පළාතත්, දිස්ත්‍රික්ක වශයෙන් ගත්තොත්, නුවරඑළිය වාගේ දිස්ත්‍රික්කත් සංවර්ධනය කිරීම සඳහා වන අරමුදලක් ගොඩ නැඟීම සම්බන්ධයෙනුයි. නමුත් ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ යෝජනාව ඇතුළේ එතුමා කොතැනකවත් සඳහන් කර නැහැ, උතුරට වෙනම මුදල් ඒකකයක් හදලා දෙන්න ඕනෑය කියන එක. එතුමාගේ යෝජනාව තුළ තිබෙන්නේත් සංවර්ධනයේ විෂමතා තිබෙන ප්‍රදේශ කීපයක් හඳුනා ගෙන ඒ විෂමතා අවම කිරීම සඳහා වෙන් වූ විශේෂ සංවර්ධන අරමුදලක් පිහිටුවන්න කියලායි. එතුමා එහි උතුර කියා විශේෂ කරලා සඳහන් කරලා නැහැ, නැඟෙනහිර කියා විශේෂ කරලා සඳහන් කරලාත් නැහැ. එතුමාගේ යෝජනාව තුළ සඳහන් කර තිබෙන්නේ උතුර, නැඟෙනහිර, නුවරඑළිය, මොනරාගල වශයෙන් සමස්ත ශ්‍රී ලංකාව තුළ එතුමා හඳුනා ගත් ප්‍රදේශ කිහිපයක්. නමුත් සමහර මන්ත්‍රීවරු මේ යෝජනාව තුළිනුත් තමන්ගේ දේශපාලන වුවමනාව ඉෂ්ට කර ගන්න, තමන්ගේ දේශපාලන වුවමනාව අනුව ජාතිවාදය අවුස්සන්න, මෙතැනත් බෙදීමක් ඇති කරන්න කථා කළාට ඒ වාගේ යෝජනා සම්මත කර ගන්න අවස්ථාව දෙන්න ආණ්ඩුව විධියට අපට බැහැ.

ගරු රාසමාණික්කම් මන්ත්‍රීතුමා ඉදිරිපත් කර තිබෙන යෝජනාව ඉතාම හොඳ එකක්. එතුමා දැකපු කෝණය අනුව යෝජනාවක් ගෙනැවිත් තිබෙනවා, මෙන්න මේ මේ ප්‍රදේශ දියුණු කරන්න වෙනම අරමුදලක් ඕනෑ කියලා. මේ සියල්ල ඇතුළත්

[ගරු දිනේෂ් හේමන්ත මහතා]

කරලා තුලිත ආර්ථික සංවර්ධනයකට - for balanced economic development - අදාළ ආර්ථික නිර්ණායක අපි දැනටමත් ආණ්ඩුවක් විධියට ක්‍රියාත්මක කරගෙන යනවා. තුලිත ආර්ථික සංවර්ධනයේදී ප්‍රාදේශීය තුලිතතාව තිබෙන්න ඕනෑ. ප්‍රදේශ වශයෙන් ගත්තාම කොළඹ, වවුනියාව, නුවරඑළිය, කිලිනොච්චිය කියලා හිතන්නේ නැතුව සෑම ප්‍රදේශයකටම සමානව සම්පත් බෙදී යෑමක් සිදු වෙන්න ඕනෑ.

අනෙක් පැත්තෙන්, ක්ෂේත්‍ර විධියට ගත්තාම, කෘෂි කාර්මික සහ සේවා කියන අංශ ඔක්කෝම එක වාගේ දියුණු වෙන්න ඕනෑ. සමාජයීය වශයෙන් ගත්තාම සිංහල, දෙමළ, මුස්ලිම් කියා හෝ දුප්පත්, පොහොසත් කියා හෝ අනෙක් අතට ග්‍රාමීය, නාගරික සහ වතු කියා හෝ භේදයක් නැතිව ඒ සියලු ජනතාව වෙත සමානව සංවර්ධනය බෙදී යන්න ඕනෑ. පරම්පරා විධියට ගත්තත් වර්තමාන පරම්පරාවට වාගේම අනාගත පරම්පරාවටත් සංවර්ධන අවස්ථා භුක්ති විඳින්න තුලිත සංවර්ධනයක් ඇති වෙන්න ඕනෑ. මේ ගැන තමයි ගරු රාසමාණික්කම් මන්ත්‍රීතුමා සංකල්පයක් විධියට කොටසක් අරගෙන කථා කරලා තිබෙන්නේ. ආණ්ඩුව විධියට අපි එතුමාගේ සංකල්පයත් ඇතුළත් කරලා ඒකට තවත් කොටස් එකතු කරගෙන කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා. අපි උදාහරණයක් ගනිමු. සංවර්ධනයේදී යම් දිස්ත්‍රික්කයක් සංවර්ධන දර්ශකයේ උඩින් තිබුණාට, ඒ දිස්ත්‍රික්කය තුළ තිබෙන්න පුළුවන් විෂමතාවට ලක් වුණු ප්‍රදේශ. මා නියෝජනය කරන මාතලේ දිස්ත්‍රික්කය ගත්තොත්, එය යම් ප්‍රමාණයකින් සංවර්ධනයට දායක වෙන්න පුළුවන්. හැබැයි, ආසනයක් විධියට ගත්තොත්, ලග්ගල ආසනයේ ලග්ගල, අඹන්ගඟකෝරළය ආදි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ ඉතාම දුප්පත්, සංවර්ධනයේ විෂමතා තිබෙන ප්‍රදේශ. ඒ නිසා සමස්ත ශ්‍රී ලංකාවේම තිබෙන විෂමතා සහිත සහ සංවර්ධනය කළ යුතු ප්‍රදේශ හඳුනාගෙන ගරු රාසමාණික්කම් මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ මේ සංකල්පය තුළටම ඒවාත් ඇතුළත් කරලා ශ්‍රී ලංකාවටම ගැළපෙන ව්‍යුහයක් හදලා ඒ ඔස්සේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හොඳ යෝජනාවක් විධියට මා දකිනවා. එහෙම නැතුව, උතුරට වෙනම මුදල් ඒකකයක් ලබා දෙන්න, උතුරේ ජනතාව සතුටු කරන්න විතරක් වැඩ කරන්න අපි මේ ජනවරම අරගෙන නැහැ. සිංහල, දෙමළ, මුස්ලිම් භේදයකින් තොරව, උතුර, නැඟෙනහිර, වයඹ, ගිනිකොන කියලා හිතන්නේ නැතුව සමස්ත ශ්‍රී ලාංකික ජනතාවගේම ජීවන තත්ත්වය උසස් කරන්නයි ආණ්ඩුව විධියට අපි කටයුතු කරන්නේ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 5.12]

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)
நன்றி, கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே!

பின்தங்கிய பிராந்தியங்களின் அபிவிருத்தி தொடர்பில் விசேட அபிவிருத்தி நிதியத்தை நிறுவுதல் சம்பந்தமாக இன்றைய தினம் கௌரவ உறுப்பினர் சாணக்கியன் அவர்களால் கொண்டுவரப்பட்ட தனிநபர் பிரேரணைமீதான விவாதத்தில் சில விடயங்களைச் சொல்லலாம் என நினைக்கின்றேன். உண்மையில் இதுவொரு நல்ல விடயம். இங்கே எனக்கு முன்னர் பேசிய கௌரவ உறுப்பினருக்கு இது சரியாக விளங்கவில்லை என்று நினைக்கிறேன். கௌரவ உறுப்பினர் சாணக்கியன் அவர்கள் இலங்கை பூராவும் உள்ள பின்தங்கிய இடங்களில்தான் இதனைச் செய்ய வேண்டும் என்று இதில் சொல்லியிருக்கிறாரேயொழிய, வடக்கு, கிழக்கில் மட்டும்தான் செய்ய வேண்டும் என்று சொல்லவில்லை என்பதைக் கூறிக் கொள்கின்றேன்.

இந்த அபிவிருத்தி நிதியத்தைத் தாபித்தல் என்பது உண்மையிலேயே வரவேற்கத்தக்க ஒரு விடயம். ஆனால், வெளிநாட்டிலிருக்கின்ற எங்களுடைய புலம்பெயர்ந்த உறவுகள் இந்த நிதியத்துக்கு ஆதரவுதர வேண்டுமாக விருந்தால், முதலில் இந்த நாட்டில் உள்ள பயங்கரவாதத் தடைச்சட்டம் நீக்கப்பட வேண்டும். உண்மையில் பயங்கரவாத தடைச் சட்டத்தை நீக்கிப் பாருங்கள்! எங்களுடைய புலம்பெயர்ந்த உறவுகள் இந்த நாட்டில் முதலீடு செய்வதற்கு முண்டியடித்துக்கொண்டு வருவார்கள். அவர்கள் இங்கு வந்து முதலீடு செய்யும்போது, ஏதோவொரு வழியில் அவர்களைக் கண்காணித்து, விடுதலைப் புலிகளின் மீளுருவாக்கம் என்றோ பயங்கரவாத தடைச் சட்டத்தின் ஊடாக எவ்வாறு அதனை முடக்கலாம் என்றோ பார்க்கின்ற நிலைதான் இந்த நாட்டிலே இருக்கிறது. எங்களுடைய கௌரவ உறுப்பினர் சாணக்கியன் அவர்கள் சொன்னதுபோல, இந்த நிதியத்தின் ஊடாகப் பின்தங்கிய பிரதேசங்களில் வாழும் எங்களுடைய ஏழை, எளிய மக்களின் வாழ்வாதரத்தை நாங்கள் மேம்படுபத்த முடியும் என்பதே என்னுடைய கருத்தாகும்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, வல்வெட்டித்துறையில் தமிழீழ விடுதலை இயக்கத்தின் தலைவர்களான தங்கத்துரை, குட்டிமணி ஆகியோரின் சிலைகளை வைப்பதற்கான முயற்சி எடுக்கப்பட்டபோது, வல்வெட்டித்துறைப் பொலிசார் அதற்கெதிராகப் பருத்தித்துறை நீதிமன்றில் வழக்குத் தொடர்ந்தனர். அந்த வழக்கில் எமக்காக வாதாட முன்வந்த வழக்கறிஞர்களான சிறிகாந்தா, மணிவண்ணன் ஆகிய இருவருக்கும் இந்தச் சந்தர்ப்பத்தில் நான் நன்றி சொல்ல விரும்புகின்றேன். தற்போது கிளிநொச்சியிலும் இது சம்பந்தமாக வழக்குத் தாக்கல் செய்யப்பட்டிருக்கிறது. இந்த இரண்டு வழக்குகளிலும் குறிப்பாக, அன்புத் தம்பி கந்தசாமி சதீஸ் அவர்கள் பிரதான சந்தேக நபராக வலிந்து சேர்க்கப்பட்டிருக்கிறார். இந்தச் சிலை வைக்கும் முயற்சி தொடர்பான நீதிமன்ற வழக்கு நடவடிக்கை களினூடாகத் துன்பங்களை அனுபவிக்கின்ற அவர்களுக்கு உண்மையில் நாங்கள் உறுதுணையாக இருப்போம் என்பதை இந்த இடத்தில் நான் சொல்லிக்கொள்ள விரும்புகின்றேன். இதுபோன்ற விடயங்கள் நிவர்த்தி செய்யப்பட்டால்தான் நாங்கள் இந்த நாட்டைக் கட்டியெழுப்ப முடியும் என்பதை நான் இங்கே குறிப்பிட விரும்புகின்றேன்.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)
இன்னுமொரு விடயத்தையும் நான் சொல்லி முடிக்கின்றேன். வவுனியாவில் கன்னாட்டி, பெரியதம்பனை பகுதிகளில் கிரவல் அகழ்வதால் பாதிக்கப்பட்டுள்ள கிராம மக்கள் மற்றும் குளங்கள் சார்பாக, அந்த area மக்களை வவுனியா அரசாங்க அதிபரிடம் நேரடியாக அழைத்துச் சென்று பேசியபோது, அவர் அதற்கான தடை உத்தரவை வழங்கியிருந்தார்.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)
கௌரவ சாணக்கியன் அவர்களே, எனக்கு time தருவீர்களா?

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ஒரு நிமிடம் எடுத்துக் கொள்ளுங்கள்!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න. *[බාධා කිරීමක්]* වැඩිපුරත් විනාඩියක් ගතවෙලා තිබෙන්නේ.

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)
ஆனால், மீண்டும் அங்கு கிரவல் அகழ்வதற்கான முயற்சிகள் மேற்கொள்ளப்படுவதாக மக்கள் குறை கூறுகின் றார்கள். கிரவல் அகழ்வதால் கன்னாட்டி, பெரியதம்பனை, மருக்காரம்பளை, கூழாங்குளம், கணேசபுரம் போன்ற கிராமங்கள் உட்பட கிட்டத்தட்ட 10 குளங்கள் பாதிக்கப் படுவதுடன், மக்களின் விவசாய நடவடிக்கைகளும் பாதிக்கப்படும். அரசாங்க அதிபர் சொன்ன விடயங்களுக்கு மாறாகச் செயற்படுகின்ற ஒரு நிலையே அங்கு காணப் படுகிறது. ஆகவே, அந்த மக்களின் விவசாயத்தையும் அக்கிராமங்களையும் காப்பாற்ற வேண்டுமென இந்தச் சபையில் கேட்டு நிறைவு செய்கின்றேன். நன்றி!

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Hon. Deputy Chairperson of Committees, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මගේ point of Order එක මෙකයි. මට පසුව කථා කරපු අර NPP මන්ත්‍රීතුමා මම දෙමළ භාෂාවෙන් කියපු දෙයක් වැරැදියට තේරුම් අරගෙන කථා කළා. මම ඒක දන්න සිංහලෙන් කියන්නම්. උතුර, නැඟෙනහිර වාගේ දුෂ්කර ප්‍රදේශ රටේ අනෙක් ප්‍රදේශවලට සමාන විධියට develop කරන්න ඕනෑ කියන කථාව තමයි මම දෙමළෙන් කිව්වේ. නමුත් මම හිතන විධියට, ඒ මන්ත්‍රීතුමාට ඒක වැරදියට වැටහිලා, උතුර වෙනම හදන්න යනවා කියන මතයක් මම කියනවා කියලා එතුමා ප්‍රකාශ කළා. මම එහෙම එකක් දෙමළෙන් කිව්වේ නැහැ. මම කිව්වේ දුෂ්කර ප්‍රදේශ හැටියට තියෙන උතුරයි, නැඟෙනහිරයි, මධ්‍යම පළාතයි ගත්තාම, එතැන තමයි වෙනස තියෙන්නේ, ඒ නිසා ඒවා ටික අපි බලාගන්නම් කියලායි. එහෙම නැතුව රට බෙදන්න කියලා මම කිව්වේ නැහැ. ඒ නිසා වැරැදි මතයක් ගන්න එපා.

Thank you.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
අපි ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමාගේ කථාව නැවත විශ්ලේෂණය කර බලා, interpretation එකෙන් අපට ඇහුණු විධියේ ප්‍රශ්නයක් තිබෙනවා නම්, ඒක නිවැරැදි කරන්න උත්සාහ කරන්නම්.

**ගරු දිනේෂ් හේමන්ත මහතා**
(மாண்புமிகு தினேஷ் ஹேமந்த)
(The Hon. Dinesh Hemantha)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු දිනේෂ් හේමන්ත මන්ත්‍රීතුමා.

**ගරු දිනේෂ් හේමන්ත මහතා**
(மாண்புமிகு தினேஷ் ஹேமந்த)
(The Hon. Dinesh Hemantha)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, interpretation එකෙන් කියැවුණා, වෙනම මුදල් ඒකකයක් ස්ථාපනය කරන්න කියන වචනය. ඒ නිසා තමයි ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම එසේ සඳහන් කළේ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මම එතුමාට ඒක පැහැදිලි කරලා දුන්නා.

මීළඟට, ගරු නිශාන්ත ජයවීර නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.18]

**ගරු නිශාන්ත ජයවීර මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிசாந்த ஜயவீர - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Nishantha Jayaweera - Deputy Minister of Economic Development)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන මේ යෝජනාවේ පිටුපස තිබෙන අරමුණ, අභිලාෂය ඇත්තටම ඉතාම වැදගත්. සංවර්ධන විෂමතා තිබෙන අය හඳුනාගෙන, ඔවුන්ට විශේෂ අවධානය යොමු කරලා, ඒ අය සංවර්ධනයේ සමාන මට්ටමකට ගන්නවාය කියන අරමුණ, අභිලාෂය ඉතාම වැදගත්. මේ වනවිට රජය විසින් රේඛීය අමාත්‍යාංශය මඟින් සිදු කරන සංවර්ධන ව්‍යාපෘතිවලට අමතරව, එක එක පළාත් පාදක කොටගෙන වෙන විශේෂ වූ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරමින් පවතිනවා.

[ගරු නිශාන්ත ජයවීර මහතා]

ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘති ගණනාවක් මේ වනවිට හඳුනාගෙන තිබෙනවා. මේ මොහොත වනවිටත් විවිධ මට්ටම්වලින් ඒවා ක්‍රියාත්මක වෙමින් පවතිනවා. ඒ වාගේම 2027 වෙනුවෙන් ඉදිරිපත් කිරීමට නියමිත අය වැයේදීත් මෙන්න මේ වාගේ විශේෂිත, ඒ කියන්නේ සංවර්ධනයට දායක වෙන්න අවශ්‍ය විශේෂ ප්‍රදේශ, විෂමතා තිබෙන ප්‍රදේශ හඳුනාගෙන තිබෙනවා. එක ප්‍රදේශයක් නොවෙයි, මුළු ලංකාවම ආවරණය වන විධියට එවැනි ප්‍රදේශ හඳුනාගෙන, ඒ ප්‍රදේශවලට වැඩි අවධානයක් යොමු කරලා, ඒ ප්‍රදේශවලට වැඩි මුදල් ප්‍රමාණයක් යොමු කරලා, ඒවායේ පවතින විෂමතා අවම වන විධියට වැඩ පිළිවෙළක් රජය විධියට මේ වනකොට ක්‍රියාත්මක කරමින් පවතිනවා. මේ ව්‍යාපෘතිවල මූලික අරමුණ වන්නේ විෂමතා අවම කරගෙන ඒ ප්‍රදේශවල භෞතික සහ මානව සම්පත වැඩි දියුණු කිරීමයි. එයයි රජයේ අභිලාෂය වෙන්නේ.

කෘෂිකර්මය, ධීවර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය යන ක්ෂේත්‍රවලට විශේෂ අවධානයක් යොමු වෙමින් පවතිනවා. ඊට අමතරව රජය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් හඳුනාගෙන, ඒ ව්‍යවසායයන් නඟා සිටුවීම සඳහා විශේෂයෙන්ම ඒගොල්ලන් වෙනුවෙන්ම ණය යෝජනා ක්‍රම රාශියක් ඉදිරිපත් කරලා තිබෙනවා. 2025 අය වැයේදී රුපියල් බිලියන 95ක වාගේ මුදලක් වෙන් කළා, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් නඟා සිටුවන්න. රජය විධියට අපි ඒ ගැටලුව හඳුනාගෙන, විශේෂයෙන් ඔවුන්ට බලපාන ප්‍රශ්න විසඳාගෙන ඒ ව්‍යවසායයන් නඟා සිටුවා ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය ආධාර දෙන්නත් බිලියන 95ක වාගේ මුදලක් වෙන් කරලා තිබෙනවා. ඒ සඳහා ණය ක්‍රමයක් ඉදිරිපත් කරලා තිබෙනවා.

ඒ ණය ක්‍රමය යටතේ විශේෂයෙන්ම උතුරු, නැඟෙනහිර ප්‍රදේශ සියල්ල ආවරණය වෙන විධියට, විවිධ sectors ආවරණය වන විධියට - කෘෂිකර්ම ක්ෂේත්‍රය, value chain financing, communication sector, development projects ඇතුළත් වන විධියට - ඒවා ලබා දෙනවා. ඊට පස්සේ pledge loan scheme එකක් small and medium-scale paddy millersලා වෙනුවෙන්, co-operative societies වෙනුවෙන් New Comprehensive Rural Credit Scheme එකක් වාගේ විවිධ schemes යටතේ රුපියල් බිලියන 95ක වාගේ මුදලක් රජය විධියට පසුගිය අය වැයෙනුත් වෙන් කරලා තිබෙනවා, විශේෂයෙන්ම විෂමතා තිබෙන අයට විශේෂ ආධාරයක් විධියට ඒක රුකුලක් වෙයි කියලා හිතලා. ඊට අමතරව අපි ඊළඟට ඉදිරිපත් කරන්න තිබෙන අය වැයෙනුත් මේ ගැන විශේෂ අවධානය යොමු කරලා තිබෙනවා.

ඔබතුමා නියෝජනය කරන ප්‍රදේශය ඇතුළුව අනෙක් සෑම ප්‍රදේශයකටම ඒ පහසුකම ලැබෙනවා. ඔබතුමා සඳහන් කළ උතුරු, නැඟෙනහිර, මොනරාගල, අනුරාධපුර, කඳුකර ප්‍රදේශ සහ කලින් කථා කරපු ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ රටේ අනෙක් ප්‍රදේශවලටත් ඒ පහසුකම් ලබා දෙනවා. යම් ප්‍රදේශයක සංවර්ධනය තිබුණාට මේ වාගේ විෂමතා තිබෙන යම් යම් කලාප තිබෙනවා. අන්න ඒ සියලු කලාප හඳුනාගෙන රටක් විධියට, රජය විධියට ඒවාට විශේෂ අවධානය යොමු කරලා ඒ සඳහා මූල්‍ය ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. ඒත් එක්කම, මෙවර ඉදිරිපත් කරන්න නියමිත අය වැයෙනුත් ඒ වැඩසටහන් වෙනුවෙන් ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් වියදම් කරන මුදලත් විශාල වශයෙන් වැඩි කරන්න අපි රජය විධියට අදහස් කරලා, මේ වෙනකොට සැලසුම් සකස් කරලා, ඒ වෙනුවෙන් කටයුතු කරමින් යනවා.

ඔබතුමා සඳහන් කළ අරමුදල ගැන කථා කළොත්, අපට මෙන්න මෙහෙම දෙයක් කියන්න පුළුවන්. රාජ්‍ය මූල්‍ය විනය සහ වගවීම ශක්තිමත් කිරීමේ අරමුණින් 2014 අංක 44 කියන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත ආවා. මෙන්න මේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ ව්‍යවස්ථාපිත අරමුදලක් ස්ථාපනය කිරීම, පවත්වාගෙන යෑම හා කළමනාකරණය කිරීම සම්බන්ධ පැහැදිලි ප්‍රතිපාදන දක්වලා තිබෙනවා. ඒ ප්‍රතිපාදන අනුව ව්‍යවස්ථාපිත තත්ත්වයේ අරමුදලක් විතරයි පිහිටුවන්න වෙන්නේ. වෙනත් අරමුදලක් පිහිටුවන්න බැහැ. ඒක ව්‍යවස්ථාපිත අරමුදලක් වෙන්න ඕනෑ. ඒක පාර්ලිමේන්තුවට විශේෂ පනත් කෙටුම්පතක් ගෙනැල්ලා කරන්න ඕනෑ. ඒ වෙනුවෙන් විශේෂ පනත් කෙටුම්පතක් සකස් වෙන්න ඕනෑ. ඒ විධියට තමයි කරන්න වෙන්නේ. නමුත්, ඒකාබද්ධ අරමුදලෙන් බැහැරව සාමාන්‍යයෙන් විවිධ අරමුදල් යටතේ සිදු කරනු ලබන ගනුදෙනුවල විනිවිදභාවය පිළිබඳ ප්‍රශ්න ඇති වෙනවා. ඒ කියන්නේ විශේෂ අරමුදල් යටතේ ඇති වත්කම් ජාතික ගිණුම් තුළට ඇතුළත් නොවන බැවින්, ඒ ආදායම් සහ වියදම් සමස්ත රාජ්‍ය ආදායම සහ වියදම තුළට ඇතුළත් නොවීමෙන් රජයේ සමස්ත ආදායම් හා වියදම් නිවැරැදිව ගණනයවීමක් සිදු නොවන බව මේ වෙනකොට නිරීක්ෂණය වෙලා තිබෙනවා. අපි අරමුදලක් පිහිටුවීමේදී මෙම කරුණුත් සැලකිල්ලට ගන්න ඕනෑ. එම පසුබිම තුළ අරමුදලක් ස්ථාපනය කළ යුතු වන්නේ, ලැබෙන අය වැය ප්‍රතිපාදනවලින් අපේක්ෂිත අරමුණු ඉෂ්ට කර ගන්න බැරි වෙනවා නම් ඒ වාගේ අවස්ථාවකදී තමයි. රජය විධියට අපි දකින්නේත්, අපි ඉදිරිපත් කරපු ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් කියලා තිබෙන්නේත්, කිසිවෙක් අත් නොහැරෙන විධියට ප්‍රතිලාභ ජනතාව වෙත ගලා යෑම තමයි අපේක්ෂා කරන්නේ කියලා. ඒ කියන්නේ ජාතිවාදයකින් තොරව, සිංහල, දෙමළ, මුස්ලිම් කියලා බලන්නේ නැතුව, ශ්‍රී ලාංකික කියන පදනමින් සහ අවශ්‍යතාව වැඩියෙන් දැනෙන කෙනාට, විෂමතා වැඩියෙන් තිබෙන තැනට වැඩි මුදලක් වෙන් කරන පදනමින් තමයි, සමස්ත රජය විධියට හිතලා මේ වෙනකොට කටයුතු කර ගෙන යන්නේ.

ඊට අමතරව, ඔබතුමා සඳහන් කළ පරිදි පෞද්ගලික ආයෝජකයන්, පරිත්‍යාගශීලීන් ඇතුළු අනෙකුත් පාර්ශ්වයන්ගේ දේශීය හා විදේශීය ප්‍රදාන ලබා ගැනීම සම්බන්ධයෙන් මම කලින් සඳහන් කරපු පනතේ 37 වගන්තිය යටතේ විධිවිධාන සලසා තිබෙනවා. ඒ අනුව වෙනම අරමුදලක් පිහිටුවන්නේ නැතුව ඒ වාගේ ප්‍රදාන සම්බන්ධයෙන් පොදු තැන්පත් ගිණුම භාවිත කරලා කටයුතු කරන්න පුළුවන්. පොදු තැන්පත් ගිණුමට ඒවා අරගෙන, ඔබතුමා බලාපොරොත්තු වෙන සංවර්ධන කටයුතු ඉටු කර ගැනීමේ හැකියාව තිබෙනවා. ඒ සම්බන්ධයෙන් නිකුත් කර තිබෙන චක්‍රලේඛවලට, විධිවිධානවලට යටත්ව ඔබතුමා කියන වෙනත් පෞද්ගලික ආයෝජන, ඒ පොදු තැන්පත් ගිණුමකට දාලා ඒ කටයුතු කර ගැනීමේ හැකියාවක් තිබෙනවා. ඒකට බාධාවක් නැහැ. විශේෂයෙන්ම ඔබතුමා ඉදිරිපත් කරන කාරණය තුළ තිබෙන, ඒක පිටුපස තිබෙන අරමුණ, අභිලාෂය ඉතා වැදගත්. ඒක අපි පිළිගන්නවා. කොහොම වුණත්, අපි ඔබතුමා විසින් ඉදිරිපත් කරන ඉල්ලීම ඉවත දමන්නේ නැහැ. ඒ ගැන වැඩිදුර අවධානය යොමු කිරීම සඳහා මම ඔබතුමාගේ ඉල්ලීම මුදල් ඇමතිතුමා වෙතත් යොමු කරන්නම්. සලකා බලා ඒ ඉල්ලීම යථාර්ථයක් බවට පත් කර ගන්න පුළුවන් නම් ඉදිරියේදී ඒක ඉටු කර ගන්න බලමු. නමුත්, දැනට මේ ගැන රජයේ දැක්ම විධියට තිබෙන්නේ, සමස්ත රටක් විධියට ඒ ඒ කරුණු අවබෝධ කරගෙන, රටේ ජනතාවට සංවර්ධනයේ ප්‍රතිලාභ ගලා ගෙන යෑමට අවශ්‍ය කටයුතු කිරීමයි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.26]

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

අද දින මම ඉදිරිපත් කරපු යෝජනාව ස්ථිර කරපු ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මන්ත්‍රීතුමාටත්, ඒ වාගේම පිළිතුර ලබා දුන්නු ගරු නිශාන්ත ජයවීර නියෝජ්‍ය ඇමතිතුමාටත් ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මගේ හිතවත්, ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මන්ත්‍රීතුමා, ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා, ගරු දිනේෂ් හේමන්ත මන්ත්‍රීතුමා, ගරු අම්ර්තනාදන් අඩෛක්කලනාදන් මන්ත්‍රීතුමා ඇතුළු සියලුදෙනාටත් ස්තුතිවන්ත වෙනවා, මෙම යෝජනාව වෙනුවෙන් අදහස් දැක්වීම පිළිබඳව.

ගරු රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමාගේ කථාවේ interpretation එක සම්බන්ධ ගැටලුවක් එතුමා කියලා තිබෙනවා. ගරු දිනේෂ් හේමන්ත මන්ත්‍රීතුමාත් කිව්වා වාගේ මම පිළිගන්නවා, සංවර්ධන අරමුදලක් හදනවා කියන ඒකේදී දිස්ත්‍රික් මට්ටමින් සමහර ප්‍රාදේශීය ලේකම් කාර්යාල පොඩ්ඩක් පිටුපසින් ඉන්නවාය කියන එක. හැබැයි, අපට එහෙම දිස්ත්‍රික්ක මට්ටමින් ගිහිල්ලා, ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ගිහිල්ලා poverty line එක යට ඉන්න lagging areas හොයා ගෙන වැඩ පිළිවෙළක් කිරීමේදී යම් ප්‍රායෝගික අපහසුතාවක් තිබෙන්න පුළුවන්. මුළු දිස්ත්‍රික්කයේම යම් මට්ටමකින් අඩුවෙන් ඉන්න කොට ඒක යම්තාක් දුරට ලෙහෙසියි. ඒ නිසා තමයි, අපි ඒක දිස්ත්‍රික් මට්ටමින් හඳුනා ගත්තේ. අපි කිසිම අවස්ථාවක ආණ්ඩුව කරන වැඩ පිළිවෙළකට විරුද්ධත්වයක් දක්වන්න, එහෙම නැත්නම් ආණ්ඩුව කරන වැඩ පිළිවෙළ එපා කියලා හෝ එහෙම නැත්නම් සංවර්ධන අරමුදලක් හදලා ආණ්ඩුවට වඩා හොඳට අපට වැඩ කරන්න පුළුවන් කියන අදහසකින් කියපු එකක් නොවෙයි මේ. ඒ ව්‍යාපෘති private sector එකේ සංවර්ධන ව්‍යාපෘති වෙන්න පුළුවන්. ඒ කියන්නේ, private sector එකට අවශ්‍ය ගොඩක් දේවල් තිබෙනවා. ආයෝජන හරහා ඒ වාගේ ව්‍යාපෘති කරලා, ඒ ක්ෂේත්‍රය දියුණු කිරීමේ අරමුණින් තමයි මේ යෝජනාව කළේ. මම හිතන විධියට, ශ්‍රී ලංකාව අද තිබෙන තත්ත්වය තුළ අපේ සියලු අවශ්‍යතා අය වැයෙන්ඉෂ්ට කර ගන්නට මුදල් වෙන් කරන්න පුළුවන් තත්ත්වයක නැහැ. අය වැය හරහා අපට කරන්න පුළුවන් දේවල් තිබෙනවා. ඉදිරි අනාගතයේ කරන්න පුළුවන් දේවල් තිබෙනවා. හැබැයි, මේ වාගේ අරමුදලක් ස්ථාපනය කිරීම තුළින් තවදුරටත් ඒක ශක්තිමත් කරන්න පුළුවන්. ඒක නිසා තමයි මේ යෝජනාව අපි ඉදිරිපත් කරලා තිබෙන්නේ. විශේෂයෙන්ම මෙවැනි අරමුදලක් ස්ථාපනය කිරීම තුළින් මට පෞද්ගලිකව ලාභයක්, එහෙම නැත්නම් මගේ හිතවතෙකුට ලාභයක් හෝ ඇති වෙයි කියන බලාපොරොත්තුවකින් නොවෙයි මේ යෝජනාව කළේ. මේ යෝජනාව ඉදිරිපත් කළේ එවන් අරමුදලක් තුළින් විශාල මෙහෙවරක් මේ මම කියන ප්‍රදේශවල ජනතාවට කරන්න පුළුවන් නිසා. අන්න ඒ පදනම මත තමයි මෙම යෝජනාව ඉදිරිපත් කළේ. ඉතින්, මේ යෝජනාව වෙනුවෙන් අදහස් ඉදිරිපත් කරපු සියලුදෙනාටම ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

# කල්තැබීම
# ஒத்திவைப்பு
# ADJOURNMENT

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

සභාව කල් තබන අවස්ථාවේ ප්‍රශ්න, ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මන්ත්‍රීතුමා.

# කල්තැබීමේ ප්‍රශ්න
# ஒத்திவைப்பு வினாக்கள்
# ADJOURNMENT QUESTIONS

**ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, பின்வரும் வினாக்களை கௌரவ கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரிடம் கேட்கின்றேன்.

1. பாடசாலை முறைமைகள் அமைப்பினுள் மின்சாரக் கட்டணத்தைச் செலுத்துவதானது தற்போது பிரச்சினையான நிலைமையை தோற்றுவித்துள்ளது. இதனால் தேசிய பாடசாலைகளைவிட, மாகாணப் பாடசாலைகள் பாரிய நெருக்கடிகளை எதிர்கொண்டுள்ளன.

   கல்வி அமைச்சானது, 2025.01.01ஆம் திகதி முதல் செயற்படும்வண்ணம் அனைத்து தேசிய பாடசாலைகளுக்குமான மின்சாரக் கட்டணத்தைச் செலுத்துவதற்காக மாதாந்தப் படியை 25,000 ரூபாய் வரை அதிகரித்துள்ள நிலையில், மாகாணப் பாடசாலைகளுக்கும் அத்தகைய திருத்தம் மேற்கொள்ளப்பட்டுள்ளதா? இது தொடர்பான சுற்றறிக்கையின் பிரதியை நான் சபைக்குச் ***சமர்ப்பிக்கின்றேன்.**

2. தற்போதைய நிலையில் மின்சாரக் கட்டணத்தைச் செலுத்தித் தீர்ப்பதற்காக மாகாணப் பாடசாலைகளுக்கு ஒதுக்கப்பட்டுள்ள நிதி போதுமானதாக இல்லை என்பதை ஏற்றுக்கொள்கின்றீர்களா?

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා]

3. தற்போது கிழக்கு மாகாணத்தின் மாகாணப் பாடசாலைகளுக்கான மின்சாரக் கட்டணத்தைச் செலுத்துவதற்கு வழங்கப்படும் நிதி போதுமானதாக இல்லாத நிலையில், மின்சாரத்தைக் கையாள்வது தொடர்பாக கட்டுப்பாடுகளை விதித்து, 2011.03.01ஆம் திகதியிடப்பட்டு அறிவுறுத்தல் கோவை வழங்கப்பட்டுள்ளது. இவ்வறிவுறுத்தல் கோவையின்படி, கிழக்கு மாகாணத்தில் 1AB பாடசாலைகளுக்கு 1,500 ரூபாயும், 1C பாடசாலைகளுக்கு 1,200 ரூபாயும், Type II பாடசாலைகளுக்கு 800 ரூபாயும், Type III பாடசாலைகளுக்கு 400 ரூபாயும் வழங்கப்படுகின்றது. இவற்றை நடைமுறை ரீதியாகச் செயற்படுத்த முடியும் என்பதை ஏற்றுக் கொள்கின்றீர்களா? இது தொடர்பான சுற்றிக்கையின் பிரதியை நான் சபையில் ***சமர்ப்பிக்கின்றேன்.**

4. அவ்வாறாயின், மின்சாரக் கட்டணத்தை பெற்றோர்கள் அல்லது பாடசாலை அபிவிருத்திச் சபைமீது மேலும் சுமையாகச் சுமத்துவதற்கு நடவடிக்கை மேற்கொள்ளப்படுகின்றதா?

5. மின் கட்டணத்துக்கான நிதியை ஒதுக்கையில், தேசிய பாடசாலைகளுக்குச் சமாந்தரமாக மாகாணப் பாடசாலைகளின் மின் கட்டணத்தைச் செலுத்தித் தீர்ப்பதற்காக வழங்கப்படும் நிதியை அதிகரிப்பதற்கு நடவடிக்கை மேற்கொள்ளப்படுமா?

6. இல்லையெனில், ஏன்?

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன - கல்வி, உயர் கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Madhura Senevirathna - Deputy Minister of Education and Higher Education)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, සභාව කල් තබන අවස්ථාවේදී ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරනු ලැබූ ප්‍රශ්නයට මා පිළිතුරු ලබා දෙනවා.

1. ගරු මන්ත්‍රීතුමනි, ඒ ඒ අදාළ පාසල්වලට ගෙවන දීමනා සම්බන්ධයෙන් අදාළ පළාත් විසින් ගන්නා තීන්දු තමයි ක්‍රියාත්මක වෙන්නේ කියන එක මුලින්ම මා කිව යුතුයි.

 බස්නාහිර පළාත් පාසල් සඳහා රුපියල් 4,000ට අඩු විදුලි ගාස්තු සම්පූර්ණයෙන් ගෙවනු ලබන අතර, රුපියල් 4,000 සිට රුපියල් 9,000 දක්වා වූ බිල්පත්වලින් සියයට 75ක් දක්වා ගෙවීමට හැකිවන පරිදි සංශෝධනයක් සිදු කර ඇත. උතුරු මැද පළාත ද 2025.08.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි විදුලි ගාස්තු ගෙවීම වැඩි කර ඇත. අනෙකුත් පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ විසින් පළාත් පාසල් සඳහා ගෙවනු ලබන මුදල් වෙනුවෙන් එවැනි සංශෝධනයක් කරලා නැහැ. සමහර පළාත්වලින් කරලා තිබෙන වෙනස්කම් මම ඉදිරියේදී ඉදිරිපත් කරන්නම්.

2. මෙතැනදීත් අපට පළාත් වශයෙන් තමයි ගන්න වෙන්නේ.

| පළාත | |
|---|---|
| බස්නාහිර | ඉහත 1 ප්‍රශ්නය පරිදි ප්‍රමාණවත් මුදලක් මේ වන විට වෙන් කර ඇති බව පෙනී යයි. |
| දකුණ | වෙන් කර ඇති මුදල ප්‍රමාණවත්ය |
| මධ්‍යම | වෙන් කර ඇති මුදල ප්‍රමාණවත්ය |
| සබරගමුව | වෙන් කර ඇති මුදල ප්‍රමාණවත්ය |
| ඌව | වෙන් කර ඇති මුදල ප්‍රමාණවත්ය |
| වයඹ | ශිෂ්‍ය සංඛ්‍යාව පදනම් කර ගනිමින් පාසල් සඳහා උපරිම සීමා නම් කරලා තිබෙනවා. මෙම වසර සඳහා වෙන් කර ඇති මුදල බිල්පත් ප්‍රතිපූරණය කිරීම සඳහා ප්‍රමාණවත්ය. |
| උතුරු මැද | ඔව්. කලින් විධියට ගෙවීම් කරනවා. |
| උතුර | වෙන් කර ඇති මුදල ප්‍රමාණවත් නොවන බව තමයි නිරීක්ෂණය වෙන්නේ. වැඩි කළ යුතුය. |
| නැගෙනහිර | වෙන් කර ඇති මුදල ප්‍රමාණවත් නොවන බව තමයි නිරීක්ෂණය වෙන්නේ. |

3. මේ සම්බන්ධවත් පළාත් මට්ටමින් තීරණයක් ගත යුතුයි.

| බස්නාහිර පළාත | **මා කලින් සඳහන් කළ පරිදි 2026 වර්ෂය සඳහා පාසල් විදුලි බිල් පියවීමට ප්‍රතිපාදන වැඩි කර ඇත.** |
|---|---|
| දකුණ පළාත | වෙන් කර ඇති මුදල ප්‍රමාණවත්ය. |
| මධ්‍යම පළාත | වෙන් කර ඇති මුදල ප්‍රමාණවත්ය. |
| සබරගමුව පළාත | වෙන් කර ඇති මුදල ප්‍රමාණවත්ය. |
| ඌව පළාත | වෙන් කර ඇති මුදල ප්‍රමාණවත්ය. |
| වයඹ පළාත | මා කලින් සඳහන් කළ නිර්ණායක උපයෝගී කර ගනිමින් වැඩි කර ඇත. පාසල් සඳහා ලබා දෙන මුදල වැඩි කරන්නේ නම්, අමතර ප්‍රතිපාදන අවශ්‍ය වේ. |
| උතුරු මැද පළාත | ප්‍රතිපත්තිමය තීරණයක් ලබා ගත යුතුය. |
| උතුරු පළාත | පාසල් වෙත ලබා දෙන මුදල ඉහළ දැමීම සම්බන්ධව අදාළ බලධාරීන් සමඟ සාකච්ඡා කරමින් පවතී. |
| නැගෙනහිර පළාත | නිශ්චිතව, ගැළපෙන පරිදි ගෙවීම වැඩි කිරීම සඳහා සාකච්ඡා කරමින් පවතී. |

4. දැනට ක්‍රියාත්මක වෙන්නේ මෙන්න මේ මුදල. නමුත් මේ මුදල ප්‍රමාණවත් නැහැ. එම නිසා එම මුදල වැඩි කළ යුතු බව නිරීක්ෂණය කරලා තිබෙනවා.

5.

| බස්නාහිර පළාත | **පාසල් සඳහා ප්‍රමාණවත් මාසික විදුලි ගාස්තුවක් සඳහා මුදල් ලබා දෙන අතර, එකී සීමාව ඉක්මවා යන විට පමණක් එසේ ඉක්මවා යන මුදල පමණක් පාසල් සංවර්ධන සමිතිය මඟින් ගෙවිය යුතුය.** |
|---|---|
| දකුණ පළාත | බරක් වෙන්නේ නැහැ. |
| මධ්‍යම පළාත | බරක් වෙන්නේ නැහැ. |
| සබරගමුව පළාත | බරක් වෙන්නේ නැහැ. |
| ඌව පළාත | බරක් වෙන්නේ නැහැ. |
| වයඹ පළාත | සමහර විට ලබා දී ඇති සීමාවන් ඉක්මවන විට එම මුදල පාසල් සංවර්ධන සමිතියෙන් ගෙවිය යුතුය. |
| උතුරු මැද පළාත | ප්‍රතිපත්තිමය තීරණයක් ලබා ගත යුතුය. |
| උතුර පළාත | නිශ්චිත තීරණයක් ගත යුතුව තිබෙනවා. දැනට පාසල් සංවර්ධන සමිති මඟින් යම් යම් පාසල්වල විදුලි බිලෙන් කොටසක් ගෙවනු ලබන නමුත් දැනට කරනු ලබන සාකච්ඡාවලින් පසු යම් සහනයක් ලැබෙනු ඇත. |
| නැගෙනහිර පළාත | නිශ්චිත තීරණයක් ගත යුතුව තිබෙනවා. ඔව්. ලබා දෙන ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන විට පාසල් සංවර්ධන සමිතිය විසින් ගෙවිය යුතු වේ. |

***පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

6.

| බස්නාහිර පළාත | ප්‍රතිපාදන මුදල් යාවත්කාලීන කරලා තිබෙනවා. |
|---|---|
| දකුණ පළාත | වෙන් කර ඇති මුදල ප්‍රමාණවත්ය. |
| මධ්‍යම පළාත | වෙන් කර ඇති මුදල ප්‍රමාණවත්ය. |
| සබරගමුව පළාත | වෙන් කර ඇති මුදල ප්‍රමාණවත්ය. |
| ඌව පළාත | වෙන් කර ඇති මුදල ප්‍රමාණවත්ය. |
| වයඹ පළාත | කලින් සඳහන් කළ පරිදි තීරණයක් අරගෙන තිබෙනවා, සීමාවන් සහිතව. |
| උතුරු මැද පළාත | යාවත්කාලීන කිරීම සුදුසු බව නිරීක්ෂණය වෙලා තිබෙනවා. |
| උතුර පළාත | මේ සම්බන්ධව අදාළ බලධාරීන් සමඟ සාකච්ඡා කරමින් පවතී. |
| නැඟෙනහිර පළාත | මෙම පාසල් සඳහා දැනට මාසිකව ගෙවන මුදල වැඩි කිරීම සඳහා පළාත් බලධාරීන් සමඟ සාකච්ඡා කරමින් පවතී. |

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟ ප්‍රශ්නය, ගරු විජේසිරි බස්නායක මන්ත්‍රීතුමා.

**ගරු විජේසිරි බස්නායක මහතා**
(மாண்புமிகு விஜேசிறி பஸ்நாயக்க)
(The Hon. Wijesiri Basnayake)
සභාව කල් තබන අවස්ථාවේ මෙම ප්‍රශ්නය යොමු කරන්නට කාලය ලබා දීම ගැන බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

රජයක් වාර්ෂිකව සිදු කරනු ලබන විවිධ ක්‍රියාකාරකම් සඳහා අරමුදල් අවශ්‍ය බව අපි දන්නවා. බදු ආදායම විධියට, බදු නොවන ආදායම විධියට තමයි ඒ අරමුදල් සම්පාදනය වෙන්නේ. ජාතික ආර්ථික දේහයට බදු මඟින් ලැබෙන ශක්තිය අතිමහත් බව අපි දන්නවා. රජය බදු ආදායම් වැඩි කර ගැනීමේදී විශේෂ කටයුතු කිහිපයක් කරන්න ඕනෑ. බදු ආදායම ශක්තිමත් කර ගන්න අපට බැරි වුණොත්, විදේශ ණය උගුල්වලට හිර වෙන්න අපට සිදු වෙනවා. පසුගිය කාල පරිච්ඡේදය පුරාම ඒක සිද්ධ වුණා, අපි දැක්කා. එහෙම නම්, රටක බදු ආදායම වැඩි කිරීමේදී බදු පදනම හරි වැදගත්. බදු පදනම සකස් කර ගැනීම සඳහා අදාළ පිරිස් බදු කාර්යය සඳහා ලියාපදිංචි කිරීම, වාර්තා නිකුත් කිරීම කළ යුතුයි. ඒ වාගේම අදාළ බදු වර්ගවලට අනුකූලතාවකින් යුතුව - with tax compliance - කටයුතු කිරීමත් අවශ්‍යයි. බදු පදනම පුළුල් වීමත් එක්ක බදු පරතරය අඩු වෙනවා. බදු අනුකූලතාවත් රටකට හරි වැදගත්.

බදු අනුකූලතාව සම්බන්ධයෙන් මම ප්‍රශ්න කිහිපයක් යොමු කරනවා. රාජ්‍ය ආදායම ඉහළ නංවාගන්නත්, ආර්ථිකයේ ස්ථාවරත්වය ඇති කරගන්නත් සුදුසුකම් ලත් සියලු පුද්ගලයන් සහ ආයතන සම්බන්ධ කරගෙන බදු අනුකූලතාව පවත්වාගෙන යෑම සඳහා කටයුතු කළ යුතුයි.

එම නිසා මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙත මා පහත සඳහන් ප්‍රශ්න යොමු කරනවා.

(I) මෙරට පුරවැසියන් සහ ව්‍යාපාරිකයන් අතර බදු ගෙවීමේ අනුකූලතාව ඉහළ නැංවීමට සහ කාර්යක්ෂම කිරීමට ගෙන ඇති පියවර මොනවාද?

(II) බදු අනුකූලතාව දුර්වල වීමෙන් රටේ මූල්‍ය තත්ත්වයට ඇති විය හැකි බලපෑම කුමක්ද?

(III) බදු අනුකූලතාවේ ප්‍රධාන අංගයක් වන, බදු වාර්තා අනුකූලතාවේ ප්‍රගතිය සහ එය තවදුරටත් වර්ධනය කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග මොනවාද? ඒ සඳහා ඇති නීතිමය ප්‍රතිපාදන මොනවාද?

(IV) චේතනාන්විතව බදු පැහැර හරින්නන් සහ බදු නොගෙවන්නන් සඳහා පනවා ඇති නීතිමය ප්‍රතිපාදන මොනවාද?

(V) රාජ්‍ය ආදායම සුරක්ෂිත කර ගැනීම උදෙසා හිඟ බදු මුදල් කඩිනමින් අය කර ගැනීමට සහ බදු සහන අක්‍රමවත් ලෙස භාවිත කිරීම වැළැක්වීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සතු වැඩ පිළිවෙළ කුමක්ද?

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විශේෂයෙන්ම මේ වනකොට සමාජයේ සාකච්ඡා වනවා, මන්ත්‍රීවරුන්ගේ වැටුප් වැඩිවෙලා කියලා. විශේෂයෙන්ම ගරු අර්චුනා මන්ත්‍රීතුමා ඒ පිළිබඳව ප්‍රකාශයක් කරලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම එවැනි වැටුප් වැඩි වීමක් සිදු වුණාද? ඒ වාගේම තව මතයක් තිබෙනවා, මන්ත්‍රීවරුන්ගේ වැටුපෙන් PAYE tax අය කරන්නේ නැහැ කියලා. එය නිවැරදිද කියාත් මා විමසනවා.

**ගරු නිශාන්ත ජයවීර මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிசாந்த ஜயவீர - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Nishantha Jayaweera - Deputy Minister of Economic Development)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

ඇත්තටම ගරු විජේසිරි බස්නායක මන්ත්‍රීතුමා අහන්නේ කාලීන සහ ඉතා වැදගත් ප්‍රශ්නයක්. මොකද, බදු ආදායම තමයි අපේ රජය ස්ථාවරව පවත්වාගෙන යන්න ඉවහල් වන්නේ. ඒ අනුව, 2025 අවුරුද්දේ බදු ආදායම ඉතා හොඳින් රැස් කිරීම රජය ස්ථාවරව පවත්වාගෙන යන්න ඉවහල් වුණු ප්‍රධානම කාරණයක් වුණා. ඒ ඇසුරින් ගරු මන්ත්‍රීතුමා කාලීන සහ ඉතා වැදගත් ප්‍රශ්නයක් මතු කිරීම පිළිබඳව එතුමාට ස්තුතිවන්ත වනවා.

(I)

- බදු අනුකූලතාව කියන්නේ, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත බදු ගෙවන්නෙකු විසින් ලබා දිය යුතු බදු වාර්තා නිසි වෙලාවට ලබා දීලා, අදාළ බදු මුදල් නියමිත වෙලාවට ගෙවලා, බදු නීතියට අනුව ඉතාම නිවැරදිව කටයුතු කිරීමයි. අන්න ඒක ඉහළ නංවන්න මේ වනකොට අපි විශේෂ ක්‍රියාමාර්ග කිහිපයක් අරගෙන තිබෙනවා.

  ප්‍රධාන වශයෙන්ම දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ආදායම් මට්ටම් අනුව බදු ගෙවන්නන් වර්ගීකරණය කර තිබෙනවා. එය විශාල බදු ගෙවන්නන්ගේ අංශය, සංස්ථාපිත ඉහළ බදු ගෙවන්නන්ගේ අංශය, මධ්‍යම බදු ගෙවන්නන්ගේ අංශය හා නගර හා ප්‍රාදේශීය කාර්යාල ලෙස පෙළගස්වා, ඒ එක් එක් අංශවල අනුකූලතාව වෙන වෙනම කළමනාකරණය කරන්න සහ සියලු නිලධාරීන්ට ඒ වෙනුවෙන් විශේෂ අවධානයක් යොමු කරලා කටයුතු කරන්න කියලා වෙනම වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවා.

- ඊට අමතරව, හඳුනාගත් ක්ෂේත්‍ර සඳහා ආර්ථික ක්‍රියාකාරකම් කිරීමේදී බදු ගෙවන්නා හඳුනා ගැනීමේ අංකය - TIN එක - අනිවාර්ය කරලා ඒ අනුව ඉදිරි කටයුතු සිදු වෙමින් පවතිනවා.

[ගරු නිශාන්ත ජයවීර මහතා]

- ඊටත් අමතරව බදු නීතිය පැත්තෙන් ගත්තාම, විශේෂයෙන්ම පසුගිය කාලයේ දේශීය ආදායම් පනතට සංශෝධනයක් ගෙනාවා, කවුරුන් හෝ කෙනෙක් මේ අවුරුද්දේ ගෙවන බදු මුදලට වැඩිය සියයට 20ක බදු මුදලක් ඊළඟ අවුරුද්දේ ගෙවනවා නම්, ඔහු හෝ ඇය - ඒ බදු ගෙවන්නා - කිසිම විගණනයකට යටත් වන්නේ නැහැ කියලා.
- විශේෂයෙන්ම ප්‍රචාරක මාධ්‍ය සහ සමාජ මාධ්‍ය යොදාගෙන මේ සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු වනවා.
- දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය හා සියලු නගර/ප්‍රාදේශීය කාර්යාල ඇතුළත්ව ඒ සෑම කාර්යාලයකම බදු ගෙවන්නන් දැනුවත් කිරීම සඳහා බදු සේවා අංශ පවත්වාගෙන යනවා. ඊටත් අමතරව බදු ක්‍රමය සරල කරන්න අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන රජය විධියට පසුගිය කාලයේ අපි ගෙනැල්ලා තිබෙනවා. විශේෂයෙන්ම බදු ක්‍රමය වඩාත් සරල කරන්න නවීන තාක්ෂණය යොදා ගන්නත් මේ වනකොට කටයුතු කරලා තිබෙනවා.

ඔන්න ඔය කරුණු කාරණා තමයි බදු අනුකූලතාව වැඩි කරන්න විශේෂයෙන් අරගෙන තිබෙන පියවර වන්නේ.

(II) ඇත්තටම ප්‍රධානම බලපෑම තමයි, රජයේ ආදායම අඩු වීම. රජයේ ආදායම අඩු වනවා කියන්නේ ලොකු ගැටලුවක්. මොකද, රජයේ ආදායම තමයි අනෙක් පැත්තෙන් ජනතාව වෙත ප්‍රතිලාභ විධියට ගලාගෙන යන්නේ. ඉතින්, ආදායම අඩු වුණොත් ප්‍රතිලාභ ලබාදීමේ අඩුවක් කරන්න වෙනවා. ඊට අමතරව රාජ්‍ය ආයෝජන අඩුවීමක් සිද්ධ වන්නත් පුළුවන්. අපි කවුරුත් දන්නවා, අය වැයකින් ප්‍රාග්ධන වියදම් විධියට මුදල් වෙන් කරන බව. පසුගිය අය වැය දෙකේදීම ඒ සඳහා විශාල මුදලක් වෙන් කළා. බදු ආදායම අඩු වුණොත් මොකද වෙන්නේ? රාජ්‍ය ආයෝජන වෙනුවෙන්, ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් යොදවන්න පුළුවන් මුදල් ප්‍රමාණය අඩු වනවා. අන්න ඒ වාගේ දේවල් වෙන්න පුළුවන්. එතකොට රජයකට වැඩියෙන් ණය ගන්න වෙනවා. ණය වැඩියෙන් ගන්නවා කියන්නේ, රජයේ ණය බර වැඩි වෙනවා, ඒ ණය වෙනුවෙන් පොලී ගෙවන්න වෙනවා. ඒ වාගේ දුර්විපාක මෙහිදී ඇති වෙන්න පුළුවන්. ඒකේ අවසාන ප්‍රතිඵලය විධියට ආර්ථික වර්ධනයේ මන්දගාමීවීමක් තමයි සිදු වන්නේ.

(III) බදු අනුකූලතාවේ ප්‍රධාන අංගයක් වන බදු වාර්තා අනුකූලතාවේ ප්‍රගතිය පිළිබඳව තිබෙන ලැයිස්තුව සභාගත කරන්න මා බලාපොරොත්තු වනවා. ඊට අමතරව ඒ ප්‍රගතිය වර්ධනය කිරීම සඳහා බදු ගෙවන්නන්ගේ තොරතුරු යාවත්කාලීන කිරීම, බදු වාර්තා නියමිත දිනයට ඉදිරිපත් නොකරන බදු ගෙවන්නන් සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීම වැනි කාරණා සිදු කරනවා.

ඊටත් අමතරව වාර්තා ලබා නොදීම වෙනුවෙන් දඩයක් පනවන්න පුළුවන්. කවුරුන් හෝ බදු ගෙවන්නෙක් නියමිත දිනට බදු වාර්තාව ලබා නොදෙනවා නම් රුපියල් ලක්ෂ 4ක උපරිම දඩයකට යටත් කරන්න පුළුවන්. ඒ වාගේ නීතිමය ප්‍රතිපාදනත් තිබෙනවා. බදු වාර්තාවක් ඉදිරිපත් නොකළ කාලපරිච්ඡේදය වෙනුවෙන් තවදුරටත් බදු වාර්තා ඉදිරිපත් නොකරන්නේ නම්, ඒ බදු ගෙවන්නාගේ ආදායම ඇස්තමේන්තු පදනමින් තක්සේරු කරලා ඔහුට ඇස්තමේන්තු පදනමින් තක්සේරුවක් නිකුත් කරන්න පුළුවන්. ඔන්න ඔය වාගේ ක්‍රියාමාර්ග ගන්න පුළුවන්.

(IV) හිතාමතා බදු ගෙවීම පැහැර හරිනවා නම් ඊට එරෙහිව පනවන දණ්ඩන තිබෙනවා. කවුරු හරි කෙනෙක් නියමිත දිනට බදු මුදල් ගෙවන්නේ නැත්නම්, උදාහරණයක් විධියට සෘජු බදු ගත්තොත්, සෘජු බදු ප්‍රමාද වන හැම මාසයක් සඳහාම 1.5ක පොලී ප්‍රතිශතයක් ඒ ගෙවිය යුතු බදු මුදලට එකතු වනවා. ඊට අමතරව දණ්ඩනයක් ද එකතු වනවා.

එකතු කළ අගය මත බද්ද සහ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද නියමිත දිනට කවුරු හරි කෙනෙක් ගෙව්වේ නැත්නම් ඒ ගෙවිය යුතු බදු මුදලින් සියයට 10ක් දඩයක් ලෙස එකතු වනවා, ඊට අමතරව ප්‍රමාද වන හැම මාසයක් සඳහාම සියයට 2 ගාණේ දණ්ඩන මුදල වැඩි වනවා. පැහැර හරින ලද බදු මුදලේ ප්‍රමාණයට යනකම් ඒ දණ්ඩන මුදල වැඩි වන්නත් පුළුවන්. ඒ වාගේ නීතිමය ප්‍රතිපාදන තමයි තිබෙන්නේ.

ඊට පස්සේ තක්සේරුවක් නිකුත් කරන්න පුළුවන්. පුද්ගලයෙකුට යම් මුදලක් අය වෙන්න තිබෙනවා නම්, උදාහරණයක් විධියට බැංකුවක තැන්පතු මුදලක් තිබෙනවා නම් හෝ යම් වෙනත් ප්‍රභවයකින් බදු ගෙවන්නාට අය විය යුතු යම් මුදලක් තිබෙනවා නම් ඒ මුදල ඒ ආයතනයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ලබා ගැනීමේ හැකියාව තිබෙනවා. අවසාන වශයෙන් තවදුරටත් හිතාමතා නොගෙවා ඉන්නවා නම් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ හැකියාව තිබෙනවා.

(V) මේ ක්‍රියාවලිය සඳහා දෙපාර්තමේන්තුව තුළ වෙන වෙනම අංශ පිහිටුවා තිබෙනවා. බදු පනත්වල ක්‍රියාවලියට අනුගතව තමයි මේ අය කිරීම් සිද්ධ වන්නේ. අය විය යුතු බදු වර්ගය සහ බදු ගෙවන්නා අනුව දැනට ක්‍රියාත්මක කළ හැකි සුදුසුම අය ක්‍රියාමාර්ගය මඟින් එම බදු අය කර ගැනීම් සිදු කරනවා. අර මා කලින් කියපු මාර්ගවලින් බදු මුදල් අය කර ගැනීම හෝ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමක් සිදු වනවා. ඊටත් අමතරව නිරන්තරයෙන්ම ඒ හිඟ බදු අය කර ගැනීමේ කටයුතු ඉතාම කාර්යක්ෂමව සිදු වෙමින් පවතිනවා. මේ පාර්ලිමේන්තුව සම්මත කරලා තිබෙනවා, දේශීය ආදායම් (සංශෝධන) පනත. ඒ පනත යටතේ කවුරු හරි කෙනෙකුට සෘජු බද්දක්, ඒ කියන්නේ දේශීය ආදායම් පනත යටතේ බලාත්මක වන බද්දක් තිබෙනවා නම්, ඒක තවදුරටත් ගෙවලා නැත්නම් ඒ බදු ගෙවන්නාට පුළුවන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට පැමිණ ඒ බදු මුදල මාස 6ක් ඇතුළතදී ගෙවා නිම කරනවා කියලා එකඟතාවකට ඇවිල්ලා ඒ විධියට ගෙවන්න. එහෙම ගෙව්වොත් මාසයකට එකතු වන සියයට 1.5 බැගින් වූ පොලී මුදල - මේ වනකොට ලොකු මුදලක් එක්කහු වෙලා තිබෙන්න පුළුවන් - ගෙවන්නේ නැතිව හිඟ බදු මුදල විතරක් ගෙවලා තමන්ගේ බදු බැඳියාව සමථයකට පත් කර ගන්න අවස්ථාව ලබා දීලා තිබෙනවා.

බදු සහන විශේෂයෙන් දීලා නැහැ. බදු සහන අක්‍රමවත් ලෙස භාවිත කිරීමට ඇති හැකියාව අඩු අතර, පවතින බදු සහනවල අඩුපාඩු පැවතිය හැකි වන්නේ ව්‍යවස්ථාපිත වගන්තිවල අඩුපාඩු මතය. එවැනි අඩුපාඩු හඳුනා ගන්නා ලද අවස්ථාවලදී ඒවා නිවැරදි කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගනු ලබනවා.

තවද, ජාත්‍යන්තරව පිළිගත් බදු ක්‍රම අනුව බදු මඟ හැරීම්වලට - tax avoidanceවලට - එරෙහිව භාවිත කළ හැකි බදු මඟ හැරීම් ප්‍රතිපාදන හඳුන්වා දීම සිදු කරලා තිබෙනවා.

එවැනි බදු ප්‍රතිපත්තිවල අරමුණුවලට සහ බදු ප්‍රතිපාදනවලට පටහැනිව සහන ඉල්ලා ඇති බදු ගෙවන්නන්ගේ වාර්තා විගණන ක්‍රියාවලියකදී හඳුනා ගැනීම ඔස්සේ තක්සේරු නිකුත් කිරීමටද කටයුතු කර තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඒක තමයි ඔබතුමා අසා තිබූ (V)වන ප්‍රශ්නයට පිළිතුර.

ඊට අමතරව ඔබතුමා විමසුවා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වැටුප් වැඩි කරලා තිබෙනවාද කියලා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වැටුප කිසිසේත්ම වැඩි කරලා නැහැ. නමුත්, රජයේ විධායක නිලධාරින්ට ඉන්ධන දීමනාවක් ලබා දෙනවා. ඉන්ධන දීමනාව හිමි නිලධාරින්ට මාසයකට ලබා දෙන ඉන්ධන ලීටර් ප්‍රමාණය අනුව ඒ වෙනුවට ලබා දෙන මුදලක් තිබෙනවා; ප්‍රවාහන දීමනාවක් තිබෙනවා. නමුත්, මැද පෙරදිග යුද්ධයත් එක්ක පසුගිය වකවානුවේදී රට මුහුණ දුන් ආර්ථික අර්බුදය නිසා රජය විසින් තීරණයක් අරගෙන තිබුණා, ඒ දීමනාව වර්තමාන මිලට ගළපන්නේ නැහැ කියලා. නමුත්, රටේ ආර්ථික තත්ත්වය යම් යහපත් තත්ත්වයකට පත්වීමත් එක්ක මෑතකදී රජය විසින් නැවත තීරණය කළා, වර්තමාන මිලට ඒ ඉන්ධන දීමනාව ගළපනවා කියලා. ඉන්ධන දීමනාව වර්තමාන මිලට ගැළපීම නිසා ඉන්ධන දීමනාව හිමි රජයේ නිලධාරින්ගේ වැටුපේ යම් වැඩි වීමක් වෙලා තිබෙනවා. ඒ අනුව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ දීමනාත් යම් ප්‍රමාණයකින් වැඩි වෙලා ඇති. එහෙම නැතුව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වැටුප කිසිසේත්ම වැඩි කරලා නැහැ.

ඊටත් අමතරව ඔබතුමා විමසුවා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වැටුපෙන් PAYE Tax එක අඩු කරන්නේ නැද්ද කියලා. එහෙම නීතියක් නැහැ. ඉන්ධන දීමනාව හිමි රජයේ සියලු නිලධාරින්ට පවතින බදු නීතිරීතින්ට අනුකූලව ලැබෙන ඉන්ධන දීමනාවෙන් සියයට 25ක ප්‍රමාණයක් තමයි බද්දට යටත් වෙන්නේ. ඒ අනුව ඉන්ධන දීමනාව හිමි සියලු නිලධාරින්ට ලැබෙන ඉන්ධන දීමනාවෙන් සියයට 25ක ප්‍රමාණයක් බද්දට යටත් කරනවා. ඒක පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ටත් අදාළයි. ඒ සියලුදෙනා බද්ද ගෙවන්න ඕනෑ. කිසිවෙකු ඒ බද්දෙන් නිදහස් කරලා නැහැ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ඇතුළුව ඉන්ධන දීමනාව - ප්‍රවාහන දීමනාව - ලැබෙන රජයේ සියලු නිලධාරින්ට ඒ ලැබෙන දීමනාවෙන් සියයට 25ක ප්‍රමාණයක් PAYE Tax එකට යටත් කරනවා.

බොහොම ස්තුතියි.

***එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 5.52ට, 2026 අගෝස්තු 18වන අඟහරුවාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 5.52க்கு, பாராளுமன்றம் 2026 ஓகஸ்ட் 18, செவ்வாய்க்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 5.30 p.m., THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 5.52 p.m. until 9.30 a.m. on Tuesday, 18th August, 2026.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.